

# ඕලන්ද නෞකාව

## සහ තවත් ෂර්ලොක් හෝම්ස් කථා

පැහැරගෙන යාමේ සිද්ධියක්

ශල්‍යාගාරයේ මිනීමැරුම

චෞරික්ෂයරයේ අත්දැකීමක්

මුහුදු වෙරළේ බෙදවාචකය

මුතු මාලය

ඕලන්ද නෞකාවේ අබිරහස

ISBN 978-955-1262-29-7

මිල රු. 375/-

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන



ෂර්ලොක් හෝම්ස්ගේ රහසිගත ලිපිගොනු 14

පරිවර්තනය චන්දන මෙන්ඩිස්

ඕලන්ද නෞකාව

සහ තවත් ෂර්ලොක් හෝම්ස් කථා


"........ තවමත් ප්‍රචණ්ඩව පැවැති කුණාටුව
නෞකාවට එල්ල කළේ දරුණු ප්‍රහාරයකි. නැව සම්පූර්ණයෙන්ම
සුනුවිසුනු වී මුහුදුබත් වීමට ඉඩ ඇති බැව් කපිතාන්ට වැටහිණි..
........ සාගරය මැද දීම නැංගුරම් දැමීම වහා අරඹන
මෙන් කපිතාන් අණ දුන්නේය"

චන්දන මෙන්ඩිස්ගේ නිර්මාණ හා පරිවර්තන

All That Glitters

නවකතා - නිශ්චල චංචල දේපළ

විද්‍යා ප්‍රබන්ධ - ජුරාසික් දඩයම

කෙටි කතා - චින යෙහෙළිය, නාඳුනන්නිය

යොවුන් නවකථා - අභිරහස් දූපතේ නිධානය, නිල් දියමන්ති අභිරහස

පරිවර්තන (ෂර්ලොක් හෝම්ස් කථා)

බැස්කවිල් රුදුරු බල්ලා
සිව් රහස් සලකුණ
බිහිසුණු නිම්නය
මළගිය ඇත්තෝ සාක්කි දෙති
ලේ සලකුණ
අන්තරාය අඩවියක
මහ රෑ ආ මාරයා
ඉන්ද්‍රනීල මාණික්‍යය
දියමන්ති ඔටුන්න
ලෝහිත පරීක්ෂණය
ඔබෙන් සමුගනිමි
ෂර්ලොක් හෝම්ස් ආපසු එයි
පුද්ගලිකයි රහසිගතයි
චරිතසුලාට එරෙහිව
භයානක මිනිසා
කළු වෘෂභයා
රතුවන හැඳි කත
ප්‍රදීපාගාරයේ වික්‍රමය
අභිරහස් දොස්තර
ගින්දර සමග සෙල්ලම්
සමුදුරේ සටන
භීෂණයක්
රුසියානු ඔත්තුකාරයා
මර උගුල
ඊජිප්තු ශාපය
හදිසි අනතුර
අද්භූත ආගන්තුකයා
ඕලන්ද නෞකාව

පරිවර්තන (අනෙක්)

සැඟවුණු ලොවේ සවාරියක්
ඇලන් ක්වාටමෙන්ගේ වීරචාරිකාව
වියරු විද්‍යාඥයා
යකාගේ නවාතැන
හරිම පුදුමයි!
සිහිනයක රැඳි රහසක්
චාලි සහ අරුම පුදුම චොකලට් කම්හල
මෝරා
රහස් පරීක්ෂකයා අතුරුදන්
රක්ත මාණික්‍යයේ අභිරහස
ගැටකපන පුංචා
ගිනිකන්දක් හරහා........ලෝකය වටේ අසූ දවසකින්
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා - (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2008)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා II - සොඳුරු සිතුවම්
- (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2009)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා III - සඳ දියේ පාවී ගියා
- (රාජ්‍ය සම්මාන නිර්දේශිත - 2010)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා IV - මුතු ඇටය
- (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2011)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා V - කෝකිල මැදුර
- (රාජ්‍ය සම්මාන නිර්දේශිත - 2012)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා VI - වීණා වාදකයා
- (රාජ්‍ය සාහිත්‍ය සම්මාන - 2013)
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා VII - මායාකාරී
ශ්‍රේෂ්ඨ ලේඛකයන්ගේ විශිෂ්ට කෙටිකතා VIII - ආදර කැදැල්ල



G.V.R.B.L Chandrarat
21/09/2015

# ඕලන්ද නෞකාව

සහ

## තවත් ෂර්ලොක් හෝම්ස් කථා

සම්පූර්ණ
අසංක්ෂිප්ත පරිවර්තනය

**චන්දන මෙන්ඩිස්**

**චන්දන මෙන්ඩිස් ප්‍රකාශන**

ඔලන්ද නෞකාව සහ තවත් ෂර්ලොක් හෝම්ස් කථා



හිමිකම ඇවිරිණි

© චන්දන මෙන්ඩිස් 2015



ISBN 978-955-1262-29-7

පළමු මුද්‍රණය - 2015



මෙම නිවේදනය වංචනික පොත් මුද්‍රණකරුවන් වෙතය.

2003 වර්ෂයේ අංක 360 F දරණ දේපළ හිමිකම් පනත අනුව ව්‍යාජ පොතක් මුද්‍රණය කිරීම, විකිණීම, වෙළඳසලක තබාගැනීම රුපියල් පන් ලක්ෂයක (රු: 500,000) දඩයක් හෝ මාස හයක සිර දඬුවමක් හෝ ඒ දෙකම දඬුවම් ලෙස ලැබිය හැකි වරදක් වන්නේය.

අපගේ කිසිදු පොතක පිටු අන්තර්ජාලයෙන් කියවීමට හැකි පරිදි එයට මුදා හැරීමට කිසිදු ආයතනයකට අවසර දී නොමැත. එසේ කිරීම ජාත්‍යන්තර නීති උල්ලංඝනය කිරීමකි. තමන්ට ලාභයක් ඇතිව හෝ නොමැතිව එසේ මුදා හරින WEB PIRATES වරුනට එරෙහිව නීතිමය පියවර ගනු ලැබේ. මාස හයක සිරදඬුවම් සහ රු 500,000 දඩය ඔවුනට ද වලංගු වේ.

ANY PERSON OR WEBSITE DOING ANY UNAUTHORISED ACT IN RELATION TO THIS PUBLICATION MAY BE LIABLE TO CRIMINAL PROSECUTION AND CIVIL CLAIMS FOR DAMAGES, IN ACCORDANCE WITH THE PROVISIONS OF THE COPYRIGHT ACT 2003 & 2014 (AS AMENDED)



පිටකවරය නිමැවුම
හා අක්ෂර සංයෝජනය
ප්‍රසාද් සමරසේකර

මුද්‍රණය
තරංජි ප්‍රින්ට්ස්
නාවින්න,
මහරගම.

ප්‍රකාශනය
**චන්දන මෙන්ඩිස් ප්‍රකාශන**
141/2, දුව පාර
බැද්දගාන, කෝට්ටේ




# ෂර්ලොක් හෝම්ස් සහ මගේ ජීවිතය

දෛවය විසින් අපේ ජීවිත හසුරුවන්නේ මොන තරම් පුදුමාකාර අන්දමකටද. ඒ ගැන මම බොහෝවිට කල්පනා කර ඇත්තෙමි. ඉදිරියේදී කෙනෙකු මුහුණ දෙන ඉරණම ගැන ඔහු කිසිවක් නොදනී. ඒ පිළිබඳව තීරණයක් ගැනීමට, ඔහුට ලැබෙන්නේ මොන තරම් සුළු අවස්ථාවක්ද. ඒ ගැන මා ඔබට කියන්නේ මගේම අත්දැකීම් වලිනි.

වෛද්‍යවරයෙකු ලෙස සුදුසුකම් ලබා, වෛද්‍ය විද්‍යාලයෙන් පිටවී කිසිදු රැකියාවක් නොකොට, මා ගත කළේ ඉතාමත් සුළු කාලයක් පමණි. යුද්ධ හමුදාවට සහකාර ශල්‍ය වෛද්‍යවරුන් බඳවා ගැනීම ඒ වන විට ඇරඹී තිබිණ. ශල්‍ය වෛද්‍යවරයෙකුට, යුද පෙරමුණේ සේවයෙන් ලබාගත හැකි පුහුණුව හා අත්දැකීම් ඉතා ඉහළ බැව්, මගේ ඥාති සොහොයුරු ලෝරන්ස් විශ්වාස කළේය. මගේ අනාගතයට එය ඉතාමත් ප්‍රයෝජනවත් වනු ඇතැයි ඔහු කීය. පස්වැනි නොදම්බලන්ඩ් පාබළ හමුදාවේ, සහකාර ශල්‍ය වෛද්‍ය තනතුරට මා අයදුම් කළේ, ලෝරන්ස් මට දුන් උපදෙස් අනුවය. මා රැකියාවට බැඳී තවත් මාසයකින් ඇෆ්ගනිස්ථානයේ යුද පෙරමුණට මා යවනු ඇතැයි, ඔහු කෙසේ අනුමාන කරන්නද? ඒ කුමක් නිසාද යත්, දෙවැනි ඇංග්ලෝ ඇෆ්ගන් සංග්‍රාමය නමින් හැඳින්වුණු සටන, ඒ වන විටත් ඇරඹී නොතිබිණි. නමුත් මයිවාන්ඩ්හි සටනේදී මිනීමරු ඝාසියකු එල්ල කළ වෙඩි පහරකින්, මා බරපතළ තුවාල ලබතැයි සිතන්නේ කෙලෙසද? එදා සටනේදී අපේ හමුදාවේ, බ්‍රිතාන්‍ය හා ඉන්දියානු භටයෝ නවසීයක් දෙනා ජීවිතක්ෂයට පත්වූහ. බරපතළ තුවාල ලබා මා බිම ඇද වැටුණු බව සැබෑය. එහෙත් මගේ සහායකයා වූ ජැක් මරේ මගේ ජීවිතය බේරා ගත්තේය. විටෙක මා සිය කර මත හොවාගෙන, විටෙක අශ්වයෙකුගේ කරමත, ඔහු බ්‍රිතාන්‍ය හමුදා පෙරමුණ වෙත සැතපුම් දෙකක දුරක් පැමිණ තිබුණේ, සතුරු ඝාසියන්ගේ පාලනය යටතේ තිබූ භූමිය මැදිනි.

ඒ අවුරුද්දේම සැප්තැම්බර් මාසයේදී කන්දහාර්හි සටනේදී, මරේ ජීවිතක්ෂයට පත්විය. ඒ අසා මම දැඩි ශෝකයකට පත්වීමි. තුවාල ලැබීම නිසා ආපසු එංගලන්තයට එවනු ලැබූ මට ලැබුණේ වැටුපෙන් අඩක් පමණි. ලන්ඩන් සමාජ ජීවිතයට එය ප්‍රමාණවත්

නොවූ නිසා මා සිතමින් සිටියේ එංගලන්තයේ දකුණු දිග වෙරළ තීරයේ නගරයක පදිංචියට යාමටයි.

ඉක්මන් සුවයක් ලැබීමට මුහුදු සුළඟ මට වඩාත් යෝග්‍ය වනු ඇතැයි විශේෂඥ මතයක්ද පළවිය. කුලිය අඩු බෝඩිමක නවාතැන් ගතහැකි නම්, මේ ප්‍රශ්නය විසඳෙනු ඇතැයි මම කල්පනා කළෙමි. යූස්ටන් පාරේ බෝඩිමක කාමරයක් ඇති බව මට ආරංචි වූයේ මේ අතරය. එහි සිටි අනෙක් නේවාසිකයා, කොටස් වෙළෙඳපොළේ තැරැව්කරුවෙකි. ඔහු සමග කතාබහ කළෙමි. එම බෝඩිමේ ජීවිතය සතුටුදායක එකක් නොවන බව එවිට මට වැටහිණ. ජීවිතය බ්‍රයිටන්හි තරම් විනෝදජනක නොවුණත්, තවත් මුහුදුබඩ නගරයක් වූ හේස්ටිංග්ස් වෙත යාමටද මම සිතා බැලුවෙමි. ඒ එහිදී මගේ වියදම අඩකින් අඩුවන නිසයි. පෞද්ගලික බඩු බාහිරාදිය පෙට්ටිවල අසුරාගෙන හේස්ටිංග්ස් වෙත යාමට මම සූදානම් වුණෙමි.

සාන්ත බාතොලමියු රෝහලේදී මා සමග එකට සේවය කළ වෛද්‍යවරයෙකු වූ, ජෝජ් ස්ටැම්ෆඩ් මට හමුවූයේ මේ අතරය. එකල ඔහු මගේ සමීප මිතුරෙකු වූයේද නැත. කලින් දවසේ මැදියම් රැය ළංවන තුරු සාදයකට සහභාගි වීම නිසා, ස්ටැම්ෆඩ්ට තද හිස කැක්කුමක් වැළඳී තිබිණි. තමා රාජකාරි කළ රසායනාගාරයේ සේවයට නොගොස්, ඔහු එදින නිවාඩු ගෙන තිබුණේ එබැවිනි. තම බිරිඳගේ උපන්දිනය ළංවෙමින් තිබූ බැවින්, ඇයට දීමට ත්‍යාගයක් ගතයුතු බැව් එදා ඔහුට සිහිවිය. මේ සඳහා තමා යා යුත්තේ පෝල් හාඩිගේ ඔරියන්ටල් පැලස් නම් වෙළෙඳසලට බැව්, ස්ටැම්ෆඩ් හදිසියේ තීරණය කළේය. තෑග්ග මිලට ගෙන ගෙදර යනු වෙනුවට, ඔහුගේ දෙපා එසවුණේ ක්‍රයිටීරියන් අවන්හල දෙසටයි. එම අවන්හලේම සිටි මා එයින් පිටවීමට සූදානම් වෙද්දී, ස්ටැම්ෆඩ් මුහුණට මුහුණ හමුවීම මොන තරම් පුදුමාකාරද? එය මගේ අනාගතය තීරණය කළ ආශ්චර්යමත් සන්ධි ස්ථානයයි. එදා ඒ මොහොතේ මට ස්ටැම්ෆඩ් හමුනොවන්නට, මට කිසි දිනෙක ෂර්ලොක් හෝම්ස් හමු නොවන්නට ඉඩ තිබිණ!

නේවාසිකාගාරයක හවුලේ පදිංචි වීමට කෙනෙකු සොයන පුද්ගලයකු ගැන, එදා මට කීවේද ස්ටැම්ෆඩ්ය. එම තැනැත්තා තමා සේවය කළ රෝහලේ, රසායනික විශ්ලේෂකයකු විය යුතු යයි ස්ටැම්ෆඩ් විශ්වාස කළේය. ඔහු හෝම්ස්ට මා හඳුන්වා දුන්නේ



එයින් පසුවය. ඒ දිනවල හෝම්ස් සිටියේ මිනිස් ලේ හඳුනාගැනීමට ම, සුවිශේෂ පරීක්ෂණයක යෙදෙමිනි. අපේ මුල් හමුවීම අමුතු එකක් වුවත් එය අමතක නොවන එකකි. ඉදිරියේදී මට මුහුණ දීමට සිදුවන සමහර දේ ගැන සලකුණු, එදා මම දුටුවෙමි.

මගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය වූයේ එය නොවේද? ලේඛකයෙකු වීමට එදා මගේ සිතේ කිසිම බලාපොරොත්තුවක් නොවීය. මා අනාගතයේදී සුප්‍රකට ලේඛකයෙකු වන බව කවුරුන් හෝ කීවා නම්, එදා මා හඬනගා සිනාසෙන්නට ඉඩ තිබිණ. ෂර්ලොක් හෝම්ස් නම් මේ ශ්‍රේෂ්ඨ විද්වතාගේ වික්‍රමාන්විත අභිරහස් පරීක්ෂණ ගැන, මා ලියා ඇති ලේඛන සංඛ්‍යාව කොපමණද?

තමා සතු කුසලතා මගේ කථාන්තරවල අතිශයෝක්තියෙන් දක්වා ඇතැයි, හෝම්ස් කීවේ වරක් දෙවරක් නොවේ. තමා කළ විසඳීම මුලදීම පාඨකයා වෙත දැනුම් දීමට හැකියාව තිබුණත්, මා එසේ නොකළ බව ඔහුගේ තවත් චෝදනාවක් විය. කුතුහලයෙන් පිරුණු අද්භූත ලොවකට පාඨකයා ගෙන යාමේ අරමුණෙන් මා මුලදී සත්‍යය සැඟවූ බව ඔහු කීය. මා සිතන්නේ ඒ විවේචනය අසාධාරණ බවයි. මා ඔහු ආශ්‍රය කළ කාලයේ නම්, හෝම්ස් ප්‍රබන්ධ සාහිත්‍යය රසවිඳි බවක් මම කවදාවත් නුදුටුවෙමි. කෙසේ වෙතත් මා ස්ට්‍රැන්ඩ් සඟරාව හරහා පාඨකයන් වෙත ඉදිරිපත් කළ කථාන්තර හැටකින් පමණක්, ඔවුන්ගේ ප්‍රසාදය දිනා ගැනීමට මට හැකිවිය. මා ලියූ තවත් කථා රැසක්, අතිශය රහසිගත යයි නම් කොට, ට්‍රන්ක පෙට්ටියක එක් රැස් කිරීමට මට සිදුවිණි. ඒවා පාඨකයන් වෙත ඉදිරිපත් කිරීම කවදා සිදු කළ හැකිවේද යන්න දන්නේ දෙවියන් පමණි. ලෝකයේ බිහිවූ ප්‍රමුඛතම විශිෂ්ටතම අපරාධ පරීක්ෂකයාගේ වාර්තාකරු වීමට, මා තෝරාගනු ලැබීම දෛවෝපගත සිදුවීමකි. එහෙත් මා ඉහළින්ම අගය කරන්නේ, මේ ශ්‍රේෂ්ඨ මිනිසා සමග දීර්ඝ මිත්‍රත්වයක් පවත්වාගෙන යාමට මා ලැබූ භාග්‍යයයි.

රහස් පරීක්ෂක ජීවිතයෙන් විශ්‍රාම ගෙන ජීවිතයේ සැඳෑ සමය විශ්‍රාමයෙන් ගත කිරීමට, මගේ මිත්‍රයා තෝරා ගත්තේ සසෙක්ස් ප්‍රාන්තයේ ඈත පිටිසර ගමක් බැව් රහසක් නොවේ.

වෛද්‍යවරයෙකු ලෙස මා කළ සේවය අගයා, 1908 දී මහා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ එම්ප්‍රදෝරු සත්වැනි එඩ්වඩ් රාජෝත්තමයාණන් විසින්, මා වෙත පිරිනමන ලද Order of

Merit සම්මානයෙන් පිදුම් ලැබීම; විවාහ දෙකකින් පසු දරුවන් තිදෙනෙකුගේ, මුණුබුරු මිණිබිරියන් සත්දෙනෙකුගේ ආදර ගෞරවයට පාත්‍රවීමට ලැබීම, කෙනෙකුට සෑහීමට පත්විය හැකි කරුණුය. එහෙත් මට එසේ නොවේ.

"වොට්සන්, සෙල්ලම පටන් අරගෙන!" යනුවෙන් හෝම්ස් පවසන ආකාරය මට තවමත් මැවී පෙනේ. බේකර් වීදිය හරහා සුළඟේ සෙමෙන් පාවී ආ ඝන මීදුම මැදින්, හමුදා රිවෝල්වරය අතැතිව, හෝම්ස් සමග ගිය යුගය යළි උදා නොවනු ඇත. ඇෆ්ගන් යුද්ධයෙන් මට ඉතිරි වූ එකම සිහිවටනය - ජසායිල උණ්ඩයෙන් ඇතිවූ තුවාලය, නැවත නැවතත් වේදනා ගෙන දෙයි.

මතකයෙන් ගිලිහී යමින් ඇති සිද්ධීන් යළි සිහිකරමින්, ඒවා සටහන් කිරීමට, මා මෙසේ පෑන අතට ගත්තේ ඇයි? ඒ මගේ දරුවන් වැනි තරුණ වෛද්‍ය විශේෂඥයන්ගේ ඉල්ලීම නිසයි. මේ ආකාරයෙන් මතක සටහන් ලිවීම, මනස සුවපත් කිරීමට එක් ප්‍රතිකාරයක් බව ඔවුහු පවසති.

අප බේකර් වීදියේ ජීවත්ව සිටි යුගයේ ඔහු යෙදුණු පරීක්ෂණ වලින් විශාල ප්‍රමාණයක්, ප්‍රසිද්ධියට පත් කිරීමට මට නොහැකි විය. ඊට හේතු වූයේ මා කලින් ද පවසා ඇති පරිදි, ප්‍රසිද්ධිය ගැන ඔහු දැක්වූ අකමැත්තය; පරීක්ෂණ වලට අදාළ සමහර පුද්ගලයන්, පාර්ශ්ව ජීවතුන් අතර සිටීමය.

එබැවින් මගේ සටහන් වලින් කොටසක් ට්‍රන්ක පෙට්ටියක දමා, චාරිංක්‍රොස්හි කොක්ස් සහ සමාගමේ සුරක්ෂිතාගාරයේ තැන්පත් කළෙමි. ඉදිරියේදී මා විසින් ලියනු ලබන ලිපිලේඛන සියල්ල තවත් ට්‍රන්ක පෙට්ටියක එකතු කරමි. එයද සුරක්ෂිතාගාරයට යවන මෙන්, මගේ දරුවෙකුට හෝ මුණුබුරෙකුට භාර කරන්නෙමි. සිහිකල්පනාව තිබියදී මා ඒ කටයුතු සම්පූර්ණ කළ යුතුය. වයෝවෘද්ධතා ව්‍යසනයට ගොදුරු වෙමින් ඇති මගේ මොළය සම්පූර්ණයෙන්ම විනාශ වීමට පෙර, මෙම කටයුතු සම්පූර්ණ කළ යුතුය.

දැන් කථා කළා ඇති. බේකර් වීදියේ 221 B හි අපේ නිවහනේ දොරටුව දැන් විවෘත කළ යුතුයි. තම පයිප්පය අතට ගෙන ඔහු බලා සිටින්නේ තරප්පු දහ හතක් ඉහළට නැග මා එතැනට ළඟා වෙන තුරුයි. "මගේ හිතවත් වොට්සන්..........!" ඔහු පවසන්නේ සුපුරුදු සිනාව මුවග රඳවාගෙනයි.

ජෝන්. එච්. වොට්සන්





ෂර්ලොක් හෝම්ස්

මෙම පොතේ ඇතුළත් වන්නේ පහත සඳහන් කථාවල පරිවර්තනය.

1. A Case of Kidnapping
2. Murder in the Surgery
3. A Mystery in Warwickshire
4. Blood in the Beach
5. The Pearl Necklace
6. The Dangerous Adventure of the Dutch Ship Friesland



## පටුන


1. පැහැරගෙන යාමේ සිද්ධියක් 15
2. ශල්‍යාගාරයේ මිනීමැරුම 42
3. වොරික්ෂයරයේ අත්දැකීමක් 83
4. මුහුදු වෙරළේ ඛේදවාචකය 111
5. මුතුමාලය 159
6. ඕලන්ද නෞකාවේ අබිරහස 188

## වොට්සන් කළ නිරීක්ෂණයක්........

"එන්න එපා! ළඟට එන්න එපා! ඈතට වෙලා ඔහොමම ඉන්න. ඔබ මගේ ළඟට ආවොත් මට අණ කරන්න සිද්ධ වෙනවා, ඔබට ගෙයින් පිටවෙලා යන්න කියල!" හෝම්ස් මා වෙත කඩා පැන්නේ අනුකම්පා විරහිත අයුරෙනි. එහෙත් ඔහුගේ ක්ෂය වී ගිය සිරුර දුටු මගේ සිතට ඇතිවූයේ දැඩි සංවේගයකි.

"හෝම්ස්. ඔබ පත්වෙලා ඉන්න බරපතළ රෝග තත්ත්වය ගැන ඔබට වැටහීමක් නෑ. අසනීපයෙන් පෙළෙන ඔබ පුංචි ළමයෙක් වගෙයි. ඒ නිසා මං ඔබේ රෝගයට ප්‍රතිකාර කරන්නම්. ඔබ කැමැති වුණත්, අකමැති වුණත් මං ඔබව පරීක්ෂා කර බලල ප්‍රතිකාර කරනවා කරනවාමයි."

ඔහු මා වෙත හෙළුවේ කෝපාවිෂ්ඨ බැල්මකි.

"හරි මට අසනීපයි නෙ. එහෙනම් ගෙන්වන්න මට විශ්වාසය තියන්න පුළුවන් වෛද්‍යවරයෙක්."

"ඒ කියන්නෙ මගේ වෛද්‍ය දැනුම පිළිබඳව ඔබට කිසිම විශ්වාසයක් නෑ?"

"මිත්‍රයෙක් හැටියට ඔබ හොඳ විශ්වාස කටයුතු කෙනෙක්. ඒක සහතිකයි. නමුත් වෛද්‍යවරයෙක් හැටියට ඔබට තිබෙන්නේ සුළු දැනුමක් නේ වොට්සන්. ඔබ මේ කැස්සට හෙම්බිරිස්සාවට බෙහෙත් දෙන, පුංචි ඩිස්පැන්සරියක් පවත්වාගෙන යන, සාමාන්‍ය වෛද්‍යවරයෙක් පමණයි. බරපතළ රෝග ගැන ඔබ මොනවද දන්නෙ? මේව කියන්න මට හිතට අමාරුයි. ඒත් මොනව කරන්නද? ඇත්ත ඒකයි."

මගේ හිතේ දැඩි වේදනාවක් මෙන්ම කලකිරීමක් ද ඇතිවිය.

"ඔබ ඔය විධියට කථා කරන එක වැරැදියි හෝම්ස්. ඔය කතා වලින්ම පෙනෙනවා, රෝගය නිසා ඔබේ සිහි කල්පනාව පත් වී ඇති තත්ත්වය. ඔබේ කැමැත්තක් නැත්නම් මං බලෙන්ම ඔබට ප්‍රතිකාර කරන්න හදන්නෙ නෑ. එහෙම නම් ලන්ඩනයේ ඉන්න හොඳම විශේෂඥයෙක් මං කැඳවා ගෙන එන්නම්. කවුරු හරි වෛද්‍යවරයෙකුට ප්‍රතිකාර කරන්න, ඔබ ඉඩදිය යුතුමයි. ඒකෙ වචන දෙකක් නෑ. ඔබ හිතනවද ඔබට ඔහේ මැරෙන්න ඉඩ දීල මං මෙතන නිකං බලා ඉඳීවි කියලා? එහෙනම් ඔබ මං ගැන තේරුම් අරගෙන තියෙන හැටි වැරැදියි මිත්‍රයා!"

ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්ගේ රහස් පරීක්ෂකයාගේ මරණ මංචකය කථාවෙනි, (අන්තරාය අඩවිය ග්‍රන්ථය)



## පැහැරගෙන යාමේ සිද්ධියක්

ලෝකයේ සිටි විශිෂ්ටතම විශේෂඥ අපරාධ පරීක්ෂකයා ෂර්ලොක් හෝම්ස් බව අවිවාදයෙන් පිළිගැනෙන කරුණකි. ඔහු කළ පරීක්ෂණ සියයකට අධික ප්‍රමාණයක් පාඨකයන් වෙත ඉදිරිපත් කිරීමට මට හැකි විය. එසේ කිරීමට මට හැකියාවක් ලැබුණේ දිගු කලක් ඔහු සමීපයේම වෙසෙමින් එම පරීක්ෂණවල යෙදීමට මා අවස්ථාවක් ලැබූ නිසාය. හෝම්ස් යෙදුණු මෙම පරීක්ෂණ බොහොමයක අපට හමුවන්නේ තියුණු බුද්ධියක් තිබූ කෛරාටික අපරාධකරුවන් විසින්, සංකීර්ණව සැලසුම් කළ අපරාධයන්ය. මේවා විසඳීමට මගේ මිත්‍රයාට හැකිවූයේ ඔහුට තිබූ සුවිශේෂ බුද්ධිය නිසාය.

කෙසේ වෙතත් ඔහු යෙදුණු පරීක්ෂණ රැසක් පාඨකයා වෙත ඉදිරිපත් නොකොට සඟවා තැබීමට මට සිදුවිය. ඊට හේතුව කුමක්ද? ඒවා සිත් ඇදගැනීමට අසමත් අභිරහස් වීමද? නැත. ඒවා බොහොමයක් අතිශයින්ම සිත් ඇදගන්නා අභිරහස්ය. නමුත් ප්‍රශ්නය වූයේ ඒවායේ තිබූ සංවේදීතාවයයි. මේවා සමහරක් ප්‍රසිද්ධියට පත්වුණොත් ඒවාට අදාළ පුද්ගලයින්ගේ පෞද්ගලික ජීවිතයට යම් යම් අපහසුතා ඇතිවීමට ඉඩ තිබූ නිසා, ඒවා සැඟවීමට මට සිදුවිණි. තවත් සමහරක් එවක පැවැති බ්‍රිතාන්‍ය රජයේ අතිශයින්ම රහසිගත සිදුවීම්වලට සම්බන්ධ ඒවා විණි. ඒවා හෙළි වුවහොත් ජාත්‍යන්තර ප්‍රශ්න පවා ඇතිවීමට ඉඩකඩ තිබූ බැවින් මම ඒවා සඟවා තැබීමට කටයුතු කළෙමි.

මෙම ලිපි ලේඛන කියවීමට අවස්ථාව ලැබෙන අය වෙත විශේෂ දැනුම් දීමක් කිරීමට කැමැත්තෙමි. එනම්, මේවා මා ජීවත්ව සිටින කාලය තුළදී හෝ ක්‍රි. ව. 1949 න් පෙර මහජනයා වෙත ඉදිරිපත් නොකළ යුතුය යන්නයි.

ස්ට්‍රෝබෙරි ජෑම්, බටර්, බැදපු බිත්තර සහ බේකන්වලින් සමන්විත වූ ප්‍රණීත උදෑසන ආහාර වේලක් අපි එදා භුක්ති විඳිමින් සිටියෙමු. කිසිවෙකු ඉතා වේගයෙන් අපේ විසිත්ත කාමරයේ දොර

වෙත ඇවිද ආ ශබ්දය අපට අසන්නට ලැබිණ. හෝම්ස් සූදානම් වූයේ එම ශබ්දය ගැන යම් විමසීමක් කිරීමටයි. එහෙත් ඊට පෙර එක්වරම දොර විවෘත විය. ඇතුළට පිවිසියේ මගේ පැරණි පාසල් මිත්‍රයෙකු වූ පර්සි ෆෙල්ප්ස්ය. මීට පෙර මොහු ගැන "නාවික ගිවිසුමේ අභිරහස" කතන්දරයේ ද ඔබට මා තොරතුරු ඉදිරිපත් කළ බැව් සැබෑ ය. එහෙත් එම කථාව කියවන්නට නොලැබුණු හා එම කරුණු අමතක පාඨකයන්ගේ යහපත සඳහා, කාරණා කිහිපයක් යළි මතක් කරදීම ප්‍රයෝජනවත් වේ යයි සිතමි.

පාසල් ගිය කාලයේ මා සමීපව ඇසුරු කළ පර්සි ෆෙල්ප්ස් වයසින් මට සමාන විය. නමුත් ඉගෙනීමේ අතිදක්ෂයෙකු වූ නිසා ඔහු සිටියේ මට වඩා පංති දෙකක් ඉහළින්ය. එකල අනෙක් සිසුන් විසින් ඔහු හඳුන්වනු ලැබුවේ "ඉස්ගෙඩියා" යන අන්වර්ථ නාමයෙනි. සෑම වසරකම තෑගි රැසක් දිනාගත් ඔහු අවසානයේ ශිෂ්‍යත්වයක් ලබා කේම්බ්‍රිජ් සරසවියට ඇතුළු විය. කොන්සවටිව් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු වූ හෝල්ඩහර්ස්ට් සාමි, පර්සිගේ මාමා කෙනෙකු බැව් අපි කුඩා අවදියේදීම දැන සිටියෙමු. මේ නෑ සබඳකම නිසා ඔහුට විශාල වාසියක් සැලසිණි. ඔහුගේ දක්ෂකම, උගත්කම සමඟ එකතු වූ ඥාතිත්වය නිසා පර්සිට විදේශ අමාත්‍යාංශයේ ඉහළ තනතුරක් හිමිවිය. මීට අවුරුදු හතරකට පමණ පෙර ඔහු භාරයට පත්ව තිබූ නාවික ගිවිසුමක් අස්ථාන ගත විය. මේ සිද්ධියෙන් සිහි විකල් වීමේ බරපතළ අවදානමකට ලක්ව සිටි පර්සි ෆෙල්ප්ස්ගේ පිහිටට ආවේ ෂර්ලොක් හෝම්ස්ය.*

ඉදිරියට ආ පර්සි ෆෙල්ප්ස් ඉවතට තල්ලු කරමින් විසිත්ත කාමරයට පිවිසුණේ ඔහුගේ බිරිඳ වූ ඇනී ෆෙල්ප්ස් මහත්මියයි. (එවක ඇනී හැරිසන් මෙනෙවිය) නමුත් මේ පර්සිගේ විවාහ මඟුලේදී මට දකින්නට ලැබුණු සන්සුන් ප්‍රීතිමත් තරුණිය නොවේ. මෙතැන සිටියේ කෝපයටත් ශෝකයටත් පත් කාන්තාවකි. ඇයගේ කළු පැහැති දෙනෙත් භීතියෙන් තැතිගෙන තිබූ අතර කළු කෙස් වැටිය අවුල් ගොඩක් වී තිබිණි.

පර්සිගේ පෙනුමේද ඊට වඩා යහපත් බවක් නොවීය. තම ඇඳුම් කට්ටලය පිටින්ම නිදාගත් කෙනෙකු කාණුවකට වැටී රවුමක්

* නාවික ගිවිසුමේ අභිරහස නම් එම කථාන්තරය ඔබට කියවීම හැකිවන්නේ "ඔබෙන් සමුගනිමි." ග්‍රන්ථයේය.





දෙකක් පෙරළුණු පසු ලැබෙන පෙනුමක් ඔහුට ලැබී තිබිණ. ඊට අමතරව පැය ගණනාවකින් කෑමක් බීමක් නොලැබී, කුසගින්නේ කාලය ගත කළ පුද්ගලයෙකුගේ පෙනුමද ඔහු වෙතින් දිස්විය. මුහුණ තදින්ම සුදුමැලි වී තිබූ අතර, ඉදිරියට නෙරා ආ දෙනෙත් වලින් කියැවුණේ විස්තර කළ නොහැකි භීතියයි. අප ඉදිරියට පැමිණ සිටි මේ යුවළ වචනයෙන් විස්තර කළ නොහැකි තරම් දැඩි කම්පාවකට, සාංකාවකට මෙන්ම භීතියකට පත්ව සිටි බැව් තේරුම් ගැනීමට හෝම්ස්ගේ නිරීක්ෂණ හෝ නිගමන අවශ්‍ය නොවීය.

අප කිසිවෙකුට යමක් කීමට පෙර ඇනී හෝම්ස්ගේ දෙපා ඉදිරියේ දණින් වැටුණාය. අනතුරුව සිය වෙවුළන ඇතින් හෝම්ස් ගේ අතක් අල්ලාගත් ඇයගේ මුවින් කියැවුණේ මෙවැන්නකි.

"දෙවියනේ! අර තිරිසනා මගේ පුතා පැහැරගෙන ගිහිං හෝම්ස් මහත්මයා! දෙවියන්ගේ නාමයෙන් මගේ පුතා මට හොයලා දෙන්න! මගේ පුතා! අනේ දෙවියනේ!" කී ඇය මුව විවර කරගෙන හුස්ම ගත්තේ නාසයෙන් හුස්ම ගැනීම අපහසු වූ කලක මෙනි.

ඔහුගේ හිසට පහරක් එල්ල වූ කලක මෙන් හෝම්ස්ගේ සිරුර දරදඬු වී තිගැස්සුණු අයුරු මම දුටුවෙමි.

"මොනවා?" හෝම්ස්ට කෑගැසිණ. "ඔබේ අයියා ජෝසෆ් ඔබේ පුත්‍රයා පැහැරගෙන ගිහින් ද? කෑමක් බීමක් නැතුව ඉඳලා ඔබ දෙදෙනා හොඳටම දුර්වල වෙලා බවයි මට පෙනෙන්නෙ. ඒ නිසා ඔබ ක්ලාන්ත වුණොත් අපේ වැඩ කටයුතු ප්‍රමාද වෙනවා. දරුවා හොයා ගැනීමට බාධාවක් තමයි සිදුවෙන්නේ. ඒ නිසා හැමදේකටම කලින් ඔබ දෙදෙනා කෑම ටිකක් කාලා මොනවා හරි බීල ඉන්න. ඔබ ක්ලාන්ත වෙලා වැටෙන්න කලින් සියලුම විස්තර දැනගන්න මට උවමනායි. වොට්සන්........!" කී මගේ මිත්‍රයා මගෙන් අපේක්ෂා කළේ කුමක්දැයි මම තේරුම් ගතිමි.

මම සීනුව නාද කොට මුළුතැන්ගෙයි සේවිකාව වහා කැඳවීමි. අප ගත් උදෑසන ආහාරයම තවත් දෙදෙනෙකු සඳහා වහා පිළියෙල කරන ලෙසත් කෝපි පෝච්චියක් ගෙන එන ලෙසත් ඇයට දැන්වීමි. බුද්ධිමත් මෙන්ම කාරුණික තැනැත්තියක වූ හඩ්සන් මහත්මිය මෙවැනි අවස්ථාවලදී අපගේ පිහිටට ආවේ මවක විලසිනි. මා ඇණවුම් කළාටත් වැඩි ආහාර ප්‍රමාණයක් ඇය අප්‍රමාදව උඩුමහලට එව්වාය.

හෝම්ස් කී කාරණය තදින්ම සිතට ගත් ෆෙල්ප්ස් යුවළ ශෝකය මොහොතකට අමතක කොට ආහාර ගැනීමට පටන් ගත්හ. ඒ වේල් දෙක තුනක් කුසගින්නේ පසුවූවන් විලසිනි. උණුසුම් කෝපි පානය කොට පිපාසය සංසිඳවා ගත් පසු ඔවුහු තම කථාව ඇරඹූහ. මුලින් කථා කළේ ඈනී ෆෙල්ප්ස් මහත්මියයි.

"මගේ සැමියා තවමත් රාජකාරි කරන්නේ විදේශ අමාත්‍යාංශයේ බව සමහරවිට ඔබ දන්නවාත් ඇති. ඒ කාලයේ අපට මුහුණ දීමට සිදුවුණු ගැටලු මොනවා වුණත් සියලුම ප්‍රශ්න සමථයකට පත්වුණානේ. ඉතින් ඔහුගේ මාමා හෝල්ඩ්හර්ස්ට් සාමි දිගටම අපට අනුග්‍රහය දැක්වූවා. මගේ අයියා ජෝසෆ් නිසා පර්සිගේ ජීවිතය එදා අවුරුදු 4 කට පෙර අවදානමකට ලක්වුණු බව ඇත්තයි. නමුත් ඒ හැමදෙයක්ම අමතක කර දමලා පර්සි ඔහුගේ ආදරය නොඅඩුව මා වෙත ලබා දුන්නා. අපේ විවාහයෙන් පසු අපි ගෙව්වේ ඉතාම සුන්දර කාලයක්. ඉතින් අවුරුදු තුනකට කලින් මට ලැබුණු දරු සම්පතෙන් අපේ ජීවිතවල තිබූ ආලෝකය තවත් දීප්තිමත් වුණා. ඒ මගේ පුතා නයිජල් නිසා........." කී ඇය කථාව නවත්වා ඉකි බිඳිමින් වැලපීමට පටන් ගත්තාය. ඇයගේ අත තදකර ගත් පර්සිගේ දෙනෙතින් ද කඳුළු කඩා හැළුණු අයුරු මම දුටුවෙමි.

"ඊයේ උදේ" ඇය කථාව යළි ඇරඹුවේ තත්පර කිහිපයක නිහඬතාවයකින් පසුවය. "අපේ ගෙදරට තරමක් දුරින් නගරයේ තිබෙන වික්ටෝරියා උද්‍යානයට, මං පුතාව අරගෙන ගියේ තාරාවන්ට කෑම දාන්න. උද්‍යානය මැදින් තිබෙන වීදිවල ඊයෙ ලොකු සෙනඟක් ගැවසුණා. සෙනසුරාදාට කොහොමටත් සෙනඟ වැඩියි. දැන් දඟ වයස නිසා පුතා හරි කැමතියි මගේ අතෙන් නිදහස් වෙලා තනියම ඉදිරියට දුවගෙන යන්න. යාර දහයක් පමණ ඉදිරියට යන ඔහු නැවතී මං එනතුරු බලාගෙන ඉන්නවා. සමහර වෙලාවට සෙනග අතරින් අත දමල මං නයිජල්ගේ අත තදින් අල්ලා ගන්නවා. සෙනග අතරින් ඉදිරියට යද්දී භය නොවුණොත්, ඔහු කොයි වෙලාවකවත් "අම්මා" කියා කෑ ගහන්නේ නෑ. මෙහෙම යද්දී සෙනග අතරින් පිටුපසට දිගුවුණු පුංචි අතක් මං තදින් අල්ලා ගත්තා. "සෙනග හුඟක් වැඩියි. රේස් අස්සයා වගේ දුවන්න එපා.





මාත් එක්කම යමු" කියූ මම, පියවර දෙකක් ඉක්මනින් ඉදිරියට ගියා. ඊළඟට මං බැලුවේ පුතාගේ මුහුණ දිහා. හෝම්ස් මහත්මයා. මගේ සිතේ ඇතිවුණු භීතිය ඔබට හිතාගන්න පුළුවන්ද? මං අතින් අල්ලාගෙන හිටියේ වැරහැලි ඇඳුම් ඇඳගත් අපිරිසිදු කොලුවෙකු මිස මගේ පුතා නෙමෙයි.

විකාර සිනාවක් පා මා දිහා බැලූ කොලුවා සතෙකු වගේ හඬක් නගලා පැන දිවුවා. ඒ සිදුවුණේ මොකක්ද කියා මං හිතාගන්නත් කලින්. "නයිජල්! නයිජල්!!" කියා කෑගසමින් මං ඉදිරියට දිව්වේ පිස්සුවෙන් වගේ. යළිත් වරක් ඔහුගේ නම කියමින් මං යාර කිහිපයක් ආපසු දිව ගියා. නමුත් ඔහු ගැන කිසිම සලකුණක් දකින්න ලැබුණේ නෑ. අන්තිමේදී මං දිව ගියේ පොලීසියට. මගේ පුතා සොයා දෙන මෙන් මං ඔවුනට ආයාචනා කළා. ඔවුනට පුළුවන් සම්පූර්ණ උත්සාහය පොලීසිය යෙදූ බව මං දන්නවා. නමුත් මගේ පුතා මට ආයෙමත් හම්බවුණේ නැහැ හෝම්ස් මහත්මයා" කී ෆෙල්ප්ස් මහත්මිය යළිත් හඬා වැලපීමට පටන් ගත්තාය.

මේ මොහොතේ පර්සි ෆෙල්ප්ස් කථාව ඇරඹුවේය.

"පුතා අතුරුදන් බව මට කිව්වේ පොලිස් පණිවුඩකරුවෙක්. මං වහාම පොලීසියට ආවා. මුලින් අපට හිතුණේ මේක විශාල සෙනගක් අතරේ දරුවා මඟහැරී යාමක් විය යුතුයි කියලයි. ලොකු මුදල් ත්‍යාගයක් සමග ඔහුගේ විස්තර ප්‍රසිද්ධියට පත් කළොත් දරුවා හොයාගන්න බැරි වෙන්නෙ නැහැ කියලයි පොලීසියේ නිලධරයන් අපට කිව්වේ. මටත් හිතුණේ එයමයි. ඊට පස්සේ අපි දෙන්නා ගෙදර ගියා.

අපි දෙන්නා විතරක් ගෙදර විසිත්ත කාමරයේ ඉන්න වෙලාවේ කවුදෝ දොරට වේගයෙන් තට්ටු කරන ශබ්දයක් ඇහුණා. දොර විවෘත කළ වහාම මගේ අතට ලියුමක් දික් කෙරුණා. ලියුම ගෙන ආ පුද්ගලයා එක් මොහොතෙන් එතැනින් පැන දිව්වේ මං ඔහුගෙන් එක වචනයක් වත් විමසීමට පෙර."

"ඔබ ළඟ තියෙනවාද ඒ ලියුම?" හෝම්ස් විමසුවේය.

තම කබා සාක්කුවට අත දැමූ පර්සි කඩදාසියක් ඉවතට ගෙන එය මගේ මිත්‍රයා අතට දුන්නේය. හෝම්ස් එය දිගහැරියේය. ඒ අසලට ගිය මම ඒ දෙසට දෙනෙත් යොමු කළෙමි. සුදු පැහැති

කඩදාසියක කළු තීන්තෙන් ලියා තිබුණේ පැහැදිලි අකුරෙනි. එහි මෙසේ සඳහන් විය.

මගේ ආදරණීය සොහොයුරිය සහ මස්සිනා වෙතයි.

ඔබේ ආදරණීය දරුවා මගේ නිවසේ කෙටි නිවාඩුවක් ගත කරන්නේ ඉමහත් සතුටෙනි. මීට පෙර අප හමු වූ අවසන් වතාවේදී මා වෙත ලැබීමට තිබූ විශාල මුදලක් ඔබ මට අහිමි කළෝය. එබැවින් මගේ අලාභය පියවා ගැනීමට දැන් කාලය පැමිණ ඇති බව මගේ විශ්වාසයයි.

හදිසි අවස්ථාවකදී ප්‍රයෝජන ගැනීමට සූදානම් කරගත් මුදලක් ඔබ සතුව ඇති බව මම දනිමි. නමුත් ගිය වර මට අහිමි වූයේ විශාල මුදලකි. ඊට සමාන මුදලක් මා වෙත ගෙවීමට ආදරණීය පර්සි ඉදිරිපත් වේ යයි මම විශ්වාස කරමි. ඊට අමතරව ඔහුගේ කාර්යාලයේ ආරක්ෂක සේප්පුවක තැන්පත්ව ඇති යමක් ගැනත් මම දනිමි. එම ලියවිල්ලේ පිටපතක් මට ලැබෙන්නේ නම් එය බොහෝ දෙනෙකුගේ ඇගයීමට ලක්වෙනු ඇත.

නයිජෙල් දරුවාට ආරක්ෂාව සැලසීමටත්, ඔහු ඔබේ තුරුලට ආරක්ෂිතව ගෙන ඒම සඳහාත්, යම්කිසි මුදලක් මා ඉල්ලා සිටියොත්, එය අසාධාරණ ඉල්ලීමක් නොවන බව ඔබ පිළිගත යුතුය. එම මුදල වෙනුවට පර්සිගේ කාර්යාලයේ අල්මාරිය තුළ ඇති ලියවිල්ලට සාකල්‍යයෙන්ම සමාන, එහි සම්පූර්ණ පිටපතක් මා වෙත ලබා දෙන්නේ නම්, එය කලින් සඳහන් මුදලට හිලව් කිරීමට මම කැමැත්තෙමි. මගේ මේ අතිශය සාධාරණ ඉල්ලීම ගැන ඔබ පොලීසිය දැනුම්වත් නොකරනු ඇතැයි මම විශ්වාස කරමි. එසේ කළහොත් ඔවුන් මගේ පෞද්ගලික කටයුතුවලට ඇඟිලි ගසනු නිසැකය. මගේ ආදරණීය ඥාතීනි. එවැනි ඇඟිලි ගැසීමක් මා සලකන්නේ මා වෙත කරනු ලබන බරපතළ නින්දාවක් අපහාසයක් ලෙසය.

කෙසේ වෙතත් ඉහත සඳහන් ලියවිල්ලේ පිටපතක් සැපයීමට ඔබ අපොහොසත් වුවොත් සිදුවන්නේ කුමක්ද? එයට ඔබ කැමති කරවා ගැනීම සඳහා, ඔබේ පුත්‍රයාගේ ශරීරයේ කොටස් වරකට එක බැගින් ඔබට ඉදිරිපත් කිරීමට මට සිදුවනු ඇත.





මගේ ඉල්ලීමට ඔබ එකඟ වන්නේ නම් කරුණාකර පුවත්පත්වල පහත සඳහන් දැන්වීම පළ කරන්න.

"1856 දී ප්‍රංශ භාෂාවෙන් පළවූ විශ්ව කෝෂයේ සම්පූර්ණ පොත් කට්ටලයම අලෙවිය සඳහා ඇත."

වැඩි කාලයක් ගන්න එපා. එසේ කළහොත් මා නොඉවසිලිමත් වෙවි.

සැමදාමත් ඔබට ආදරය<br>
කරන සොහොයුරා<br>
ජෝසෆ්.

මා අසුනේ ඉහළට විසිවූයේ මා නොදැනුවත්ව ම ය.

"හෝම්ස්!" මට කෑගැසිණ. "අපි කොහොමද මෙහෙම දේකට ඉඩ දෙන්නෙ? මේ මිනිහා මහා භයානක අපරාධකාරයෙක්. පුංචි ළමයෙකුගේ ජීවිතය අනතුරේ!"

නිහඬව මා දෙස බලා සිටි හෝම්ස්ගෙන් දක්නට ලැබුණේ සුපුරුදු තැන්පත් සන්සුන් බව ය. මඳ වේලාවක් කල්පනා කරමින් සිටි ඔහු නිහඬතාවය බිඳ අප ඇමතීය.

"අපි කෝපයට පත්වෙලා කලබල වීමෙන් වැඩක් නෑ. අපි පළමුවෙන්ම දරුවාව හොයාගන්න ඕන. ෆෙල්ප්ස් මහත්මයා. ඔබ යෙදිල ඉන්න හැම කටයුත්තක් ගැනම ජෝසෆ් හොඳ අවධානයකින් ඉන්නා බවයි පෙනෙන්නෙ. ඔහු ලන්ඩනයෙන් පැනගියේ අවුරුදු හතරකට කලින්. මොනවද ඔබට ඊට පස්සේ ඔහු ගැන දැනගන්න ලැබුණේ?"

දකුණු අත මුව හරහා තබාගත් පර්සි කල්පනාවට වැටුණේය. ඔහුගෙන් වචනයක් පිටවූයේ මිනිත්තු කිහිපයකට පසුව ය.

"පොලිසියට ජෝසෆ් ගැන දැනගන්න ලැබුණු කාරණා ඔවුන් සෑහෙන කාලයක් යනතුරු මට වාර්තා කළා. මගේ මාමා - හෝල්ඩ්හර්ස්ට් සාමිවරයාගේ සම්බන්ධය නිසයි ඒ වාසිය ලැබුණේ.

එංගලන්තයෙන් පැනගිය ජෝසෆ් හැරිසන් ඇමරිකා එක්සත් ජනපදයට ළඟාවුණාලු. ඔහු ඉක්මනින්ම නිව්යෝක් නගරයේ පාතාල ලෝකය සමග එකතුවෙලා තියෙනවා. එතැනින් එහාට ඔහු සිටි තැන් සහ කළ කී දේ ගැන නිශ්චිත ආරංචියක් ලැබුණේ

නැහැලු. බෘක්ලින්හි දුම්රිය ප්‍රකෝටිපතියකු වන ඇලෙක්ස් වාල්ටන් සම්බන්ධ සිදුවීමක් ගැන සැකකරන්නේ ජෝසෆ්ව. වාල්ටන්ගේ රහස් හෙළිකරන බවට තර්ජනය කරලා කෝටි ගණනක කප්පම් ජෝසෆ් අරගෙන තියෙනවා. බ්‍රොන්ක්ස් ප්‍රදේශයේ දියමන්ති වෙළෙඳසලක් ආයුධ සන්නද්ධව මංකොල්ල කෑ හොරුන් අල්ලා ගැනීමට පොලිසියට හැකිවුණේ නැහැලු. ඒ ගැන සැකය එල්ල වෙලා තිබුණෙත් ජෝසෆ්ට හා ඔහුගේ සගයෙකුට.

ඊටපස්සෙ ජෝසෆ් චිකාගෝවලට සංක්‍රමණය වෙලා බවයි පෙනෙන්නේ. රාත්‍රී කාලයේ උත්සව සඳහා ගමන්ගත් කෝටිපතියන් තමා ඔහුගේ ඉලක්කය වී තිබෙන්නේ. කාන්තාවන් දෙදෙනෙකු ගේ වටිනා ආභරණ මංකොල්ල කාලා. එක තැනකදී ඔහුට එරෙහි වෙන්න හැදූ කාන්තාවකගේ සැමියාට වෙඩි තබා මරණීය තුවාල සිදුකර තිබෙනවා.

මේ සිද්ධියෙන් පසුව ඇමරිකන් පොලීසිය ජෝසෆ් සෙවීමේ උත්සාහය දෙගුණ තෙගුණ කරාලු. නමුත් ඔහු චිකාගෝවෙන් අතුරුදන්වෙලා.

ඊළඟට ඔහු මතුවුණේ මැන්හැටන් ප්‍රදේශයෙන්. අපනයන සමාගමක කළමනාකරුවෙකුගේ අවුරුදු හයක දියණිය පොරකම් කරගෙන ගිහින් කප්පම් ඉල්ලීමක් සිදුවුණාලු. විශාල මුදලක් ගෙවලත් තියෙනවා. නමුත් දරුවා හමුවෙද්දී ඇය ජීවතුන් අතර හිටියේ නෑ........"

මේ මොහොතේ ඇනී ඉකිබිඳිමින් වැලපීමට පටන් ගත්තාය.

"දෙවියනේ.........! මගේ පුතා නයිජල්! හෝම්ස් මහත්මයා. ජෝසෆ් මනුෂ්‍යයෙක් නෙමෙයි තිරිසනෙක්. ඔහු අල්ලා ගැනීමට ඔබට කළ හැකි දෙයක් නැද්ද?"

හෝම්ස්ගේ මුහුණේ ප්‍රකාශ වූයේ බැරෑරුම් හැඟීම් බව මම දුටුවෙමි. ජෝසෆ් සැබැවින්ම තිරිසනෙකුට අන්ත පුද්ගලයෙකි. නිසැකවම විදුලි පුටුවට යැවෙන ඔහු ඇමරිකාවෙන් පැන එන්නට ඇත්තේ මැන්හැටන්හි අපරාධයෙන් පසුව විය යුතුය. එක්වරක් මෙබඳු අපරාධයක් කළ ඔහු තවත් වරක් එවැන්නක යෙදීමට පසුබට වේවිද?

"ඔහු කියා තිබූ විදියට ඔබ මේ තොරතුරු පොලීසියට හෙළි කළේ නැද්ද?"





"අපි පොලීසිය දැනුම්වත් කළේ නැහැ හෝම්ස් මහත්මයා" පර්සි කීය. "ඒ මොකද දරුවා ගැන අපේ හිත්වල තියෙන භය නිසා. මෙක කවුරු හරි අපරාධකාරයෙකුගෙ වැඩක් කියලා පොලිසිය සැක කරන්නේ නෑ. ඔවුන් කියන්නේ දරුවෙකු නැති පවුලක කෙනෙක්, මේ ළමයා ගන්න ඇතිලු හදාගන්න. මේ ළමයා කාගෙ කවුද කියන එක ගැන ඔවුනට වැටහීමක් නැති නිසාලු එහෙම කරන්න ඇත්තෙ."

"හොඳයි. දැනට අප කළ යුත්තේ මේ විදියේ වැඩක්" හෝම්ස් කීය. "අර කියූ දැන්වීම මේ විදියට පුවත්පත්වල පළ කරන්න.

"1856 දී ප්‍රකාශයට පත් කළ ප්‍රංශ භාෂාවෙන් ලියැවුණු සම්පූර්ණ විශ්වකෝෂය ළඟදීම විකිණීමට"

එහෙම කරලා ගෙදරට වෙලා සූදානමෙන් කල්පනාවෙන් ඉන්න. ඒ අතරේ ඔබ දෙදෙනා කැමති නම් අපට බොහොම ප්‍රයෝජනවත් වීමට ඉඩ තිබෙන වැඩක යෙදෙන්න පුළුවනි. ඊට කැමතිද?"

"හෝම්ස් මහත්මයා. ඔබ කියන ඕනෑම දෙයක්" ඇනී කීවේ කඳුළු පුරවා ගත් දෙනෙතිනි.

"බොහොම හොඳයි." හෝම්ස් කීය. "මට උවමනා කරනවා ජෝසෆ් ගැන අප්‍රසිද්ධ තොරතුරු ටිකක් දැනගන්න. ඔබ දෙදෙනාට කරන්න තියෙන්නේ මේසයක් ළඟ වාඩිවෙලා, මේ තොරතුරු අඩංගු ලේඛනයක් හදන එකයි. මොනවද දන්නවද මට උවමනා? ඔහුගේ පුරුදු, සිරිත් විරිත්, ඔහු කැමැති දේවල් සහ අකමැති දේවල්. ඔහු ලන්ඩනයේ ජීවත්වුණු කාලෙ ඔහු ගැවසුණු තැන්; ඔහුගේ මිත්‍රයන් සහ ආශ්‍රය කළ, ගනුදෙනු කළ පුද්ගලයන්ගේ නම්; ඔවුන් පිළිබඳ මොනවා හරි තොරතුරු ඔබ දන්නවා නම් ඒවා. ඔබගේ පුතා ගැන සෙවීමේදි මේ තොරතුරු මට හුඟක් ප්‍රයෝජනවත් වේවි. මේ වාර්තාවට කිසියම් දෙයක් ඇතුළු කළ යුතුද නැත්නම් එය නොලියා ඉඳිමුද කියා, සමහරවිට ඔබේ හිතේ සැක සහිත තැන් මතුවෙන්න ඉඩ තියෙනවා. එහෙම වෙලාවට ඒවා ඇතුළු කරන්න; ඉවත දමන්න එපා. ඔබට තේරුණාද?"

ඔවුන් එම රාජකාරිය ඉතා කැමැත්තෙන් භාරගත් බව මම තේරුම් ගතිමි. තමන්ගේ දරුවා බේරා ගැනීමට කුමක් හෝ මාර්ගයක් තිබේ නම් ඔවුන් ඊට සම්පූර්ණ උත්සාහය යොදනු ඇත. යම් බලාපොරොත්තුවක් සිතේ ඇතිකර ගැනීමට සමත්වීම නිසා

ඔවුන්ගෙන් දිස්වූයේ ධෛර්යයට පත් බවකි. පිටත් වී යන ඔවුන් කුලීරියකට නංවා මම ආපසු නිවසට පැමිණියෙමි.

"හෝම්ස්. මෙතැනදි මොනවද ඔබට මගෙන් කෙරෙන්න ඕනැ?" මම ඇසීමි. "ඔබ ෆෙල්ප්ස්ලට යම් රාජකාරියක් පැවරුවා. ඒ වගේ කළයුතු යමක් මට පවරනවා නම්, මං එය කැමැත්තෙන්ම කරන්නම්"

"බොහොම හොඳයි වොට්සන්. ඔබ කැමති නම් පුළුවන් මෙන්න මේ වැඩ කොටස කරන්න. ජෝසෆ් හැරිසන්ගේ වැඩ ගැන අපට නිව්යෝක් නගරයෙන් අන්තිමට අහන්න ලැබෙන්නේ මීට අවුරුද්දකට පමණ කලින්. මට හිතෙනවා ඒ වහාම ඔහු යළිත් වරක් ආපහු එංගලන්තයට එන්න ඇති කියලා. එහෙම ආව ඔහු නිකම්ම ඉන්න නෑ. සුපුරුදු වැඩ කටයුතුවලම යෙදෙන්න ඇති.

වොට්සන් ඔබ කළ යුත්තේ මෙයයි. ප්‍රධාන පුවත්පත් කාර්යාලවලට යන්න. හරියටම අවුරුද්දක් කලින් ඉඳලා පටන් ගන්න. ජෝසෆ් යෙදුණා කියල අපට සැක හිතන්න පුළුවන් අපරාධ ගැන වාර්තා වී තිබෙනවාද කියා පිටුවෙන් පිටුව පෙරළා බලන්න.

ඒ තොරතුරු සියල්ලක්ම සටහන් කරගන්න. ආයුධ පෙන්වා කළ මංකොල්ලකෑම්, රාජ්‍ය රහස් ලේඛන සොරකම් කිරීම වගේම දරුවන් පැහැරගෙන යාම් හෝ සොරකම් කරගෙන යෑම් ගැනත් වැඩි අවධානයක් යොමු කරන්න."

"හෝම්ස්. ඒ අතරෙ ඔබ මොනවද කරන්නෙ?"

මගේ මිත්‍රයාගේ මුවගට මඳ සිනාවක් නැඟිණ. "ගිය සැරේ ජෝසෆ් හැරිසන්ට ලොකු වැරදීමක් වුණා. වැඩි මුදලක් ලබාගන්න පුළුවන් කාගෙන්ද කියල හොයමින් ඔහු අර ලියවිල්ල ළඟ තබාගත්තා. නමුත් මේ වාරයේ ඒකෙ වෙනසක් ඇතිවෙලා කියලයි මට හිතෙන්නෙ. ඔය ලියවිල්ල මිලට ගැනීමට කැමැති ගැනුම්කාරයෙකු ඔහු දැනටමත් හොයාගෙන ඇති. ඒ පුද්ගලයාට අලෙවි කළ හැකි බඩු තමයි දැන් හැරිසන් හොයන්නෙ. මං බලාපොරොත්තු වෙනවා දිගටම ප්‍රශ්න කරගෙන යන්න. මේ කාලයේ අපේ රටේ ගැවසෙන ඔත්තුකාරයින් කවුද, ඔවුන් වාසය කරන්නෙ මොන තානාපති කාර්යාලවල ආධාරයෙන්ද කියල හොයා බලන්න ඕන."





මගේ රාජකාරිය සඳහා හෝම්ස්ගෙන් සමුගෙන මම පිටත්වී ගියෙමි. පුවත්පත් කාර්යාල කිහිපයකට ගොස් ඔවුන්ගේ විමර්ශන අංශවල තිබූ පසුගිය කාලයේ පුවත්පත් පෙරළා බැලුවෙමි. දවස අවසාන වන විට මට සෑහෙන තරම් සතුටුදායක ප්‍රතිඵල ලැබී තිබිණ. මට හමුවූ සැක සහිත ප්‍රවෘත්ති දෙකක් ගැන, විස්තර සහිතව කරුණු සටහන් කරගත්තෙමි. ආපසු නිවහන වෙත පැමිණි මට දකින්නට ලැබුණේ හෝම්ස් කුලීරියක පැමිණ එයින් බසින ආකාරයයි. අපේ කතාබහ ඇරඹුණේ හඩ්සන් මහත්මිය උඩුමහලට එවූ කේක් සහ තේ භුක්ති විඳීමෙන් අනතුරුවය.

"හෝම්ස්. ජෝසෆ් හැරිසන් මෙවර එංගලන්තයේ වැඩ ඇරඹූ මුල්ම කටයුතු ගැන තොරතුරු මට ලැබුණා කියලයි මට නම් හිතෙන්නේ. කොහොමද ඔබේ වැඩ කටයුතු සාර්ථකද?"

"අංක එකේ රහස් ඔත්තුකාරයන් කීප දෙනෙක් මේ දිනවල ලන්ඩන් නගරයේ සැරිසරනවාලු. ඒ අතරින් සැකයකින් තොරව හඳුනාගෙන තියෙන්නේ ජර්මනියේ ජූර්ගන් හිම්ලර්, ස්පාඤ්ඤයේ ෆ්‍රැන්සිස්කෝ පැබ්ලෝ සහ ප්‍රංශයේ ඇන්ටොයිනේ ෂැපූවී කියන තිදෙනා. දඩයම් කළ සත්ත්ව මළකුණු තිබෙන බවක් ඉව වැටුණාම තමා, ගිජුලිහිණියන් ආකාසයේ සැරිසරන්න පටන් ගන්නේ." යයි හෝම්ස් දුන් උදාහරණයට මට සිනා පහළ විය.

"මගේ පැත්තෙන් කිව්වොත් තත්ත්වය මේ වගෙයි හෝම්ස්" මම කීවෙමි. "අවුරුද්දකම පුවත්පත් විමර්ශනය කර අවසන් කරන්න නම් මට බැරිවුණා. තවත් මාස තුනක පුවත්පත් ඉතිරිවෙලා තියෙනවා. ඒ කටයුත්ත සම්පූර්ණ කරන්න හෙට උදේම යන්න මං බලාපොරොත්තු වෙනවා. නමුත් මට වැදගත් සිද්ධීන් දෙකක් හමුවුණා."

"ඔබ සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නා බව මං හොඳින්ම දැන සිටියා වොට්සන්. මොනවද ඔබට ලැබුණෙ?"

"පළමුවැනි සිද්ධිය වෙලා තිබුණේ පහුගිය දෙසැම්බර් මාසයේ. ඒක මහමග සිදුවූ කුරිරු මංකොල්ලයක්. විම්බල්ඩන් ප්‍රදේශයේ පැවැත්වුණු බාල් නැටුමකට සහ රාත්‍රි භෝජන සංග්‍රහයකට ගිහින් තිබුණා කිංස්වුඩ් සාමිවරයා, ඔහුගේ ආර්යාව සහ ඔවුන්ගේ දියණිය. ඔවුන්ගේ නිවස තිබුණේ සම්භාෂණය පැවැත්වුණු තැනට සැතපුම් තුනක් පමණ දුරින්. වැසි සහිත කාලගුණයක් තිබුණත්

ඔවුන් තීරණය කරල තිබෙනවා ආපසු ගෙදර එන්න. වෙලාව එතකොට පාන්දර හතර පමණ වී තිබුණු බවයි කියැවෙන්නෙ. ඔවුන් තුන් දෙනාටම නින්ද ගිහින් තිබුණලු. අශ්ව කරත්තය පදවාගෙන ආ රියැදුරා පවා ඇවිත් තියෙන්නේ නිදිමතේ. මංකොල්ලකරුවන් පාරට පැනල වෙඩිල්ලක් පත්තු කරන තුරු කවුරුවත් කිසි දෙයක් දැකල නෑ.

වෙඩි පහර එල්ල වී තියෙන්නේ රියැදුරාට. එක් වෙඩි උණ්ඩයක් ඔහුගේ උරහිසක් පසා කරගෙන ගිහින් තියෙනවා. මරලතෝනි නැගූ ඔහු අසුනින් පහළට ඇද වැටුණලු. රියැදුරා ඇදවැටුණේ කුමන හේතුවක් නිසාද කියන කරුණවත් කිංස්වුඩ්ලා තේරුම් අරගෙන නැහැ. කරත්තයෙන් බිමට බැස්ස ඔවුන් හිම මත වැටී සිටි රියැදුරා ඔසවා කරත්තයෙන් තැබුවාලු. ඊළඟට ඔහුගෙන් විමසුවාලු කරත්තයෙන් බිමට ඇද වැටීමට හේතුව. එතකොට කිංස්වුඩ්ලට දකින්න ලැබුණා. මූහුණු ආවරණය කරගෙන, ගිනිඅවි අමෝරා ගෙන පැමිණි හයදෙනෙක් තමන් වටකරගෙන සිටින ආකාරය.

මේක මහ නින්දා සහගත තත්ත්වයක්." මම කීවෙමි. "යහළුවෙකුගේ ගෙදර උත්සවයකට සහභාගී වෙලා ආපහු තමන්ගේ ගෙදරට යන්න, වැදගත් පවුලකට ඉඩක් තියෙනවද? ආයුධ ගත්තු මැරවරයින් පිරිසක් මේ අසරණ මිනිසුන්ව වටකරගෙන"

"ඔබේ කතාව ඇත්තයි වොට්සන්. ජෝසෆ් හැරිසන් මෙතැනට සම්බන්ධ ඇති කියලා මටත් හිතෙනවා. ඔබේ කතාව දිගටම කියන්න"

"කිංස්වුඩ් පවුලේ අය ළඟ තිබූ ආභරණ සෑම එකක්ම හොරු පැහැරගෙන. වෙන එකක් තියා තුවාල ලබා බිම ඇදවැටුණු රියැදුරාගෙ සාක්කුවල තිබූ සුළු මුදලත් අරගෙන. කාන්තාවන් දෙදෙනා සීතලෙන් වළකින්න ඇඳගෙන හිටි ලෝම කබා දෙකත් උදුරා ගත්තාලු. කිංස්වුඩ් සාමිවරයාගෙ කෝපය ඉහවහා ගියේ අශ්ව කරත්තයට බැඳල හිටි අශ්වයින් හතර දෙනාගෙන් එකෙක්වත් හොරු පැහැර ගත්තාම.

"මේකව අපි අරගන්නේ තමුසෙලා ඉක්මනින් ආපසු ගෙදර යන එක නවත්වන්නයි" එක හොරෙක් මේ ප්‍රභූවරුන්ට කිව්වලු."

"පසුව ඔවුන්ට අශ්වයා හමුවුණාද?"





"ඔව්. මංකොල්ලය සිදුවුණු තැනට බටහිර දෙසින් සැතපුම් හය හතක් ඈත තැනක පිදුරු මඩුවක බැඳ සිට අශ්වයා හමුවුණාලු. උෟට නම් තුවාල කිසිවක් සිදුවී තිබුණේ නෑ."

"වෙන මොනවද එහි සඳහන්ව තිබුණේ?"

"තවත් කාරණා ස්වල්පයක් පමණයි. අපරාධකාරයන් ගැන කිසිම සලකුණක් ආරංචියක් නෑ. වටිනා දේ අහිමි වුණත් කිංස්වුඩ් පවුලට ජීවිත හානියක් හෝ තුවාල සිදුනොවීම වාසනාවක්. රියැදුරාටත් ඉක්මනින් සුවය ලැබුණාලු" කී මම මා සටහන් කරගත් ඊළඟ සිද්ධිය කියවීමට සූදානම් වූයෙමි.

"අනෙක් සිද්ධිය වාර්තාවෙන්නෙ ලන්ඩන් නගරයෙන් ම යි" මම කීවෙමි. "මේක වෙලා තියෙන්නෙ විම්බල්ඩන් සිදුවීමට, මාස හතරකට පමණ පසුව. මේකට ගොදුරු වෙලා තියෙන්නෙ ජෙරල්ඩ් නම් ගෙවල් කුලී එකතු කරන්නෙක්. හෙන්ට්ලි සහ හඩසන් කියන්නේ ගෙවල් කුලියට දෙන විශාල සමාගමක් බව ඔබ දන්නවා. මේ සමාගමට අයත් ගෙවල් රාශියක් තිබෙනවාලු තේම්ස් ගංගාව දෙපස ගංඉවුරුවල. ගංගාවේ සුන්දරත්වය නරඹමින් ගංවතුරේ සිසිලස විඳිමින් ජීවත් වීමට කැමැති අය අතර මේ නිවාස හරි ජනප්‍රියයි. ජෙරල්ඩ් ගේ රැකියාව තමයි එක් අඩවියක ගෙයක් පාසා ගිහින් හෙන්ට්ලි හඩසන් සමාගම වෙනුවෙන් ගෙවල් කුලී එකතු කිරීම. එම කටයුත්තේ යෙදෙමින් ගමන් කරන වෙලාවක, කවුරු හරි පිටුපසින් ඇවිත් ඔහුගේ හිසට පහර දීල තියෙනවා. ඒ පහරින් ඔහු බිම ඇද වැටී තිබෙන්නේ සිහි විසඥව. ඒ වෙලාවෙ අපරාධකාරයා ජෙරල්ඩ්ගේ මුදල් බෑගය පමණක් නොවෙයි; ගෙවල් කුලියට අරගෙන ඉන්නා අයගේ විස්තර අඩංගු පොත සහ මුදල්වලට ලදුපත් දෙන පොතත් අරගෙන ගිහිං.

හොරා මේ විදියට මුදල්වලට අමතරව කුලී නිවැසියන්ගේ තොරතුරු අඩංගු පොත අරගෙන ගියේ ඇයි කියන එක පොලීසියට තේරුම් ගන්න බැරිලු. ඒ ගැටලුවට ඔවුන්ගේ පිළිතුරක් නෑ. ඔවුන් අනුමාන කරන්නේ මෙතරම් කලක් ගෙවල් කුලී නිසිලෙස ගෙවා නැති කෙනෙක්, තමන්ගේ අඩුපාඩුව වසාගන්න එහෙම දෙයක් කරන්න ඇති කියලයි. අපරාධකාරයා මේ කටයුත්තට සෑහෙන වෙලාවක් ගත කරන්න, ඇති කියලා හිතන්න පුළුවනි. ඒ මොකද මෙම පොත තිබුණේ ජෙරල්ඩ්ගේ කබායේ ඇතුළ පැත්තේ

බොත්තමකින් වසන සාක්කුවක. තරමක් ලොකු පොතක් වුණු එය එක්වරම සාක්කුවෙන් එළියට ගන්නත් අමාරුයිලු. ඒ නිසා එය සොරකම් කිරීමට තරමක වෙලාවක් වගේම අමතර උත්සාහයකුත් යොදන්න වෙනවලු. මුදල් මල්ල අරගෙන පහසුවෙන් පලායන්න පුළුවන්කම තියෙද්දී අර පොත ගැනීමට කාලය ගත කළේ ඇයි කියන එක පොලීසියට ප්‍රශ්නයක්."

හෝම්ස්ගේ දෙනෙත් දීප්තිමත් වුණු ආකාරය මම දුටුවෙමි.

"මං හිතුවා හරිද හෝම්ස්" මම ඇසීමි. "මේක ජෝසෆ් හැරිසන්ගේ වැඩක් වියහැකියි නේද?"

"මටත් එහෙම හිතෙනවා වොට්සන්. ඒක කළේ ඔහු නම්, එය මොන අදහසකින් කළාද කියල මට හිතාගන්න අමාරුයි. මොකක් හරි හොඳ සැලැස්මක් ඇතිව තමයි ඔහු ඒ දේ කරන්න ඇත්තෙ. ඔබගේ ඉව නිවැරදියි කියලා මටත් හිතෙනවා"

පසුවදා මම යළිත් වරක් පුවත්පත් පරීක්ෂාව සඳහා ගියෙමි. දැඩි කැපවීමෙන් හා උනන්දුවෙන් මා ඒ කටයුත්තේ යෙදුණත් එදා සැලකිය යුතු තවත් යමක් සොයාගැනීමට මට නොහැකි විය.

හෝම්ස් ද දින දෙකක් පුරා හෝඩුවාවක් සොයා ගැනීමට දැඩි පරිශ්‍රමයක් දැරූ බව මම දැන සිටියෙමි. ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ අපරාධකරුවන්ගේ තොරතුරු හා ඡායාරූප අඩංගු දත්ත ගබඩාව යළිත් පිරික්සීම ඔහු ඉතා උනන්දුවෙන් කර තිබිණි. මීට අමතරව එංගලන්තයේ ගැවසුණු විදේශීය රහස් ඔත්තුකරුවන් ගැන තව තවත් තොරතුරු ඔහු මයික්‍රොෆ්ට් හෝම්ස්ගේ මාර්ගයෙන් සොයා බැලුවේය. මේ අන්දමින් පැය 48 ක් ගතවී ගියේය. එහෙත් ගැටලුව විසඳීම සඳහා ඉදිරියට පියවරක් තැබීමට නොහැකිව අපි දුර්මුඛ වී සිටියෙමු. තුන්වැනි දිනයේ සවස ආපසු නිවහන බලා එමින් සිටි අපට, යම් බලාපොරොත්තුවක ඡායාවක් ඈතින් දිස්විය. ඒ අප එනතුරු බේකර් වීදියේ මඟ බලා සිටි පර්සි ෆෙල්ප්ස් දකින්නට ලැබීමෙනි.

"මහත්වරුනි" පර්සි කීය. "දෙවියන්ගේ නාමයෙන් කියන්න. අපේ හිතට සැනසීමක් ගෙන දෙන කිසිම දෙයක් කියන්න, තවමත් ඔබට හැකියාවක් නැද්ද?" මේ මොහොතේ ඔහුට හැඬුම් ආ නිසා ඔහුගේ කතාව මොහොතකට නැවතිණි. "මගේ බිරිඳ හඬා වැලපෙනවා. නයිජල්ගේ ජීවිතයට මොකක් හරි කරදරයක්ද කියල අපේ හිත්වලට බයයි"





අපගේ විසිත්ත කාමරය වෙත අපි ඔහු කැඳවාගෙන ගියෙමු.

"ෆෙල්ප්ස් මහත්මයා" හෝම්ස් කීය. "වොට්සන් සහ මම අපට පුළුවන් හැම දෙයක්ම කරනවා. අපේ සම්පූර්ණ කාලයම අපි මේ කටයුත්තට යොදවලයි තියෙන්නෙ. ජෝසෆ් කැමති අකමැති දේවල් ගැන ඔබ දෙදෙනා සකස් කළ වාර්තාව අපට දෙන්න. ඔබ ලබාදෙන තොරතුරු අපට හුඟක් ප්‍රයෝජනවත් වේවි. සතුරා ලුහුබැඳ යාමෙ අධිෂ්ඨානය අපි කොහොමටවත් අත්හැරලා නැහැ. අපට ඇති ප්‍රශ්නය ඔහු ඉන්නා ඉසව්වක් සොයා ගැනීමට නොහැකිවීමයි."

පර්සි තමා අතේ තිබූ ලිපි ගොනුව හෝම්ස් අතට දුන්නේය.

"අපි රෑ දවල් නොබලා මේ කටයුත්තෙ යෙදුණා" ඔහු කීය. "ඔවුන් කුඩා අවදියේ ඉඳලා වුණු වැදගත් සිදුවීම් හැම එකක්ම වගේ ඈනී ලිව්වා. ජෝසෆ් මා සමග ඒ කාලේ කියල තිබෙන දේවල් මං ලිව්වා. ඈනීගේ ඥාතීන් සමගත් කථාකරල මේකට කරුණු එකතු කළා. මං හිතන්නේ අපි දන්නා හැම දෙයක්ම මෙතැන තියෙනවා. අපි හැමදෙනාම හිරවී ඉන්නා අන්ධකාරයෙන් එළියට එන්න, මේක ඔබට ආලෝකයක් වේවා කියා මං ප්‍රාර්ථනා කරනවා"

එය අතට ගත් හෝම්ස් අසුනක හිඳගෙන වහා එය කියවීමට පටන් ගත්තේය. මඳ වේලාවකින් හිස ඔසවා බැලූ ඔහු පර්සි වෙත ප්‍රශ්නයක් යොමු කළේය. "ඔබේ බිරිඳ කියනවා ජෝසෆ් ළමා කාලයේ බොහොම දරුණු විදියේ දඩබ්බර වැඩවල යෙදිලා සිනාමුසු මුහුණෙන් බලා ඉඳපු කෙනෙක් කියලා. ඔබ හිතන්නේ ඔහුගේ නියම ස්වභාවය ගැන ඇය මේ කරල තියෙන විස්තරය සම්පූර්ණයෙන්ම නිවැරදියි කියලද?"

"ඒකෙ කිසිම වැරැද්දක් නැහැ හෝම්ස් මහත්මයා" පර්සි කීය. "ඔහුගේ කුඩා කාලයේ ස්වභාවය ගැන, හැරිසන් පවුලේ සමීප ඥාතීන් කියූ දේවල් මට අහන්න ලැබිල තියෙනවා"

හෝම්ස් යළිත් වරක් එම ලියවිලි කියවීම ඇරඹුවේය. පර්සි සහ ඈනී ලියා තිබූ සියලුම දේ කියවීමට හෝම්ස්ට බොහෝ වේලාවක් ගතවීමට ඉඩ ඇති බැව් මට වැටහිණි. ඔහු තදින්ම ඒ ගැන සිත යොමුකරගෙන සිටියේය. තවමත් දැඩි කම්පාවකින් සිටි පර්සිගේ මනස වෙනත් අතකට යොමු කිරීම යෝග්‍ය යයි මම සිතුවෙමි.

එබැවින් මම පර්සි සමග මෘදු හඬින් කතාබහ ඇරඹීමි. හෝම්ස්ගේ කියවීමට බාධාවක් නොවන අයුරින් අප කථා කළේ පාසල් සමයේ අපට සිටි මිතුරන් ගේ වත්මන් තොරතුරුය. සෑහෙන වේලාවක් ගතවී ගියේය. පර්සි වෙත මගේ  මිත්‍රයාගෙන් ප්‍රශ්නයක් එල්ල විය.

"ළඟදී ඔබගේ පදිංචිය වෙනස් කළ බව ඔබ කිව්වා. මොකක්ද ඔබේ අලුත් ලිපිනය? කොයි හරියටද ඔබ ගියේ?"

"අපි ගියේ තේම්ස් ගගේ ඉවුර කිට්ටුව නිස්කලංක පෙදෙසකට." පර්සි කීය. "ඒකෙ නම් ප්ලෙසන්ට් මාවත. ඒක සැබැවින්ම ප්‍රියමනාප පෙදෙසක්. මං මේ පළාත ගැන කලින් දැනගෙන හිටියා. ඒ ගෙවල් හොඳ සුඛෝපභෝගී ඒවා. තේම්ස් නදිය හැම නිවසකටම ඉතා අලංකාර ලෙස දිස්වෙනවා. අපේ ගෙවල් වලට පිටුපසින් උස තාප්පයක් තිබෙනවා. ඒකට පිටුපසින් ඉදිකර ඇති ගෙවල්වල පිටුපස කොටස ඉදිකර තිබෙන්නේ ගංඉවුරටම සිටින විදියට. ඒකෙ තියෙන අඩුපාඩුව තමයි ඒ ගෙවල් ඇතුළෙ තෙතමනය හුඟක් වැඩියි. ඒ නිසා ඒවට ඉල්ලුමත් අඩුයි; කුලියත් සෑහෙන්න අඩුයි. ගෙවල් කුලී හුඟක් වැඩිවුණත් අපේ ගෙවල්වල ලොකු වාසියක් තියෙනවා; මහවැහි කාලෙට වුණත් ගේ ඇතුළ වියළියි. පහුගිය දවස්වල මහවැහි වැහැලා තේම්ස් ගඟ උතුරලා ගංවතුර ගැලුවා. ඒ වුණත් අපට කරදරයක් වුණේ නෑ. ඇතුළත වියළිව........"

මේ කථාවට සවන් යොමුකරගෙන නිහඬව සිටි හෝම්ස් එක්වරම කෑගැසුවේ සතුටෙනි.

"වොට්සන්. මට මේ කාරණා ඒ තරම් ඉක්මනට පෙනුණෙ නෑ. මේකෙ ගෞරවය හිමිවෙන්නෙ ඔබටයි. ඔබ තමයි මට නිවැරදි මඟ පෙන්වා දුන්නෙ. කාරණා එකින් එක මතුවෙන කොට, ඒවා එකිනෙකට ගැලපෙන හැටි දැන් මට පෙනෙනවා. ජෝසෆ්ගෙ සිරිත් විරිත්, කැමති අකමැති දේ සමග ෆෙල්ප්ස් මහත්මයා අලුතෙන් පදිංචි වී සිටින තැන, මේවා සම්බන්ධ වෙන අයුරු මට පෙනෙනවා. නමුත් ඒක අපි ස්ථිර කරගත යුතුයි. ඊට පස්සේ අපට පොලීසියේ උදව් උවමනා වෙනවා. ලෙස්ට්‍රේඩ් මට හුඟක් ණයගැතියි. ඒ නිසා මට ඔහුගේ උදව් අප්‍රමාදව ලබා ගැනීමට හැකිවේවි."





පර්සිට සහ මට නිවහනෙන් පිටවී යෑමට සිදුවූයේ හෝම්ස්ගෙන් කිසිදු පැහැදිලි කිරීමක් ලබාගැනීමටත් පෙරය. අපි ගොඩනැගිල්ලක් සමීපයේ රිය නවත්වාගෙන සිටියෙමු. එම ගොඩනැගිල්ල වෙත පිවිසුණු මගේ මිත්‍රයා මිනිත්තු දහයක් ගතවීමට පෙර ආපසු ආවේය. ඒ ගොඩනැගිල්ලේ ආලින්දයේ සිටි මිනිසෙකුට අතට අතදී ආචාර කරමිනි.

"උදව් ගැන ඔබට ස්තුතියි. ඔබ මුහුණ දී තිබෙන ගැටලුව විසඳාගැනීමට කියූ කරුණුවලින් ලොකු පහසුවක් ලැබේවි."

එසේ කියූ හෝම්ස් යළිත් වරක් කුලීරියට නැගී ස්කොට්ලන්ඩ්යාඩ් හි ලිපිනය රියැදුරාට ලබා දුන්නේය. ඒ සමග ගමන හැකි ඉක්මනින් කළ යුතු බවද පැවසුවේය. මේ ගමනේදී තවත් වරක් රිය නවත්වන ලදි. අපිරිසිදු ඇඳුම්වලින් සැරසී සිටි කොලුවෙකු තමා වෙත කැඳවූ හෝම්ස් ඔහුට යම් යම් උපදෙස් දුන්නේය. ඒ පර්සිට හෝ මට ඇසීමටත් නොහැකි තරම් මෘදු හඬකිනි. ඒ කොලුවා කවරෙක්දැයි හඳුනාගැනීමට මට හැකිවිය. එතැනින් වහා පිටත් වී ගිය ඔහු සෙනග අතරේ නොපෙනී ගියේය. රිය ස්කොට්ලන්ඩ්යාඩ් වෙත ළඟාවුණු පසු රියෙන් බැස්සේ හෝම්ස් සහ මා පමණකි. තවදුරටත් රියේ රැඳී සිටින මෙන් ඔහු පර්සිට සංඥා කළේය.

"නැහැ ෆෙල්ප්ස් මහත්මයා. මේ වෙලාවේ ඔබ මා සමග එන්න එපා. මට තියෙනවා ඔබ ලවා කරගත යුතු තවත් වැඩ. මුලින්ම ඔබ යා යුත්තේ ඔබේ කාර්යාලයට. ඊළඟට යන්න පුවත්පත් කාර්යාලයකට. ඔබ පුවත්පත් දැන්වීමක් පළකළ යුතු බවට ජෝසෆ් ඔබට මුලින් බල කළා නේ. අර රහස් ලියවිල්ලේ පිටපතක් ඔබ ළඟ තිබෙන බව කියමින් ඒ දැන්වීම දැන් පළකරන්න"

"ඒ වුණාට ඔහු ඉල්ලා සිටින ලියකියවිලි මා ළඟ නැහැ නේ?"

"හරි. මට තේරෙනවා" හෝම්ස් කීය. "බැලූ බැල්මට සත්‍ය ලියවිල්ලක් වගේ පෙනෙන ව්‍යාජ ලියවිල්ලක් ඔබ කාර්යාලයට වෙලා සකස් කර ගන්න. ඒක මිලට ගන්න එන්නේ ජෝසෆ් හැරිසන් වෙන්න පුළුවනි. ඔහුගේ අවධානය මඳ වේලාවකට හෝ ඉවතට ගත හැකි යමක් අප ළඟ තිබිය යුතුයි."

"හොඳයි මහත්මයා. එතකොට ඊළඟට?"

"ඊළඟට යන්න ගෙදර......... ඔබේ බිරිඳ ළඟට." හෝම්ස් කීය. "එතකොට මං දෙන මේ අවවාද, අදහස් හොඳින් හිතට ගන්න. ඒවගේම ඒවා පුළුවන් තරම් හොඳින් පිළිපදින්න. ඔබට හැකිද මං කියන දේට එකඟ වෙන්න?"

"හෝම්ස් මහත්මයා. අපි ඔබ කියන ඕනෑම දෙයක් කරන්නම්. අපට ඕන කරන්නේ අපේ දරුවා"

"හරි. ඔබ ගෙදරට යා යුත්තේ ඉතාම කලකිරුණු ස්වභාවයෙන්. ඇඩි කම්පාවකට පත්වී ඉන්නා බව ඔබේ මුහුණෙන් දිස්වෙන්න ඕන. ඔබේ බිරිඳ හඬා වැලපෙමින් නිවසෙන් එළියට බැහැලා උද්‍යානයට පිවිසිය යුතුයි. ඔබ පෙන්වන්න ඕන ඔබ දැඩි ශෝකයකට පත්ව සිටින බවත්; හඬා වැලපෙන ඔබේ බිරිඳ සනසන්න උත්සාහ කරන බවත්. මේ විධියේ රඟපෑමක් අත්‍යවශ්‍යයි. මං ඒ බව ඔබට අවධාරණය කරනවා. එහෙම රඟපෑමක් සතුටුදායක විදියට කරන්න බෑ කියල හිතෙනවා නම් කරුණාකරල ගේ ඇතුළට වෙලා ඉන්න. ඇඳිරි වැටුණට පස්සෙ මං ඔබේ නිවසට එනවා ඔබ හමුවෙන්න."

"හෝම්ස් මහත්මයා. දෙවියන්ගේ නාමයෙන් මට කියන්න. අපට පුළුවන්ද බලාපොරොත්තු තියාගන්න? මගේ පුතා ආරක්ෂා සහිතව ඉන්නවා කියල ඔබට විශ්වාසද?"

"මෙහෙමයි. ඔබ දැන්වීම පළකළ සවස පුවත්පත් මුද්‍රණයෙන් පිටවූ වහාම ජෝසෆ් දැන්වීම දකීවි. ඔහු ඔබට මොනයම් ක්‍රමයකින් හෝ ලිපියක් එවාවි කියල මගේ ලොකු විශ්වාසයක් තියෙනවා. ජෝසෆ්ගේ සැලැස්ම මොකක්ද කියල දැනගන්න තුරු අපට මොනම සැලසුමක්වත් කරන්න බෑ. ඒක දැනගත්තට පස්සේ අපේ සැලසුම සකස් කරමු. ඔබේ අතින් රහස් ලියවිලි ටික ලබාගන්න ඔහුට ඉතාම හදිස්සියි. ඒක මට සෑහෙන්න විශ්වාසයි. මං කියන හැටියට හැම දෙයක්ම කරන්න. ඒක ඉතාම වැදගත්"

හිස සෙලවූ පර්සි මගේ මිත්‍රයා කියූ දේට එකඟත්වය පළ කළේය. අශ්වකරත්ත රියැදුරාට පර්සි දුන් උපදෙස් අනුව රිය පිටත් විය.

"දැන් අපට උවමනා කරන්නෙ ලෙස්ට්‍රේඩ්ගෙ සහයෝගය" හෝම්ස් කීවේ ස්කොට්ලන්ඩ්යාඩ් ගොඩනැගිල්ල දෙසට හැරෙමිනි. "බලමු ඔහු ඉන්නවද කියලා"





එම කාරණා දෙක සම්බන්ධයෙන්ම අපි වාසනාවන්ත වීමු. ලෙස්ට්‍රේඩ් කාර්යාලයේ සිටියේය. හෝම්ස් තම සැලැස්ම විස්තර කළ විට ලෙස්ට්‍රේඩ් ඊට අදිමදි කළේය. ඊට හේතුව හෝම්ස්ගේ සැලැස්මේ තිබූ අවිධිමත් ස්වභාවයයි. සිද්ධිය පිටුපස ගැබ්වූ රහස් හෙළිකළ විට පොලිස් නිලධරයා හෝම්ස්ට උදව් කිරීමට කැමැත්ත පළ කළේය.

"එහෙනම් මෙතැන ප්‍රධාන සිදුවීම ළමයෙකු අතුරුදන්වීම නෙමෙයි?" ලෙස්ට්‍රේඩ් කීවේ බැරෑරුම් ස්වරයෙනි. "අපේ හිත්වලත් ලොකු සැකයක් ඇතිවුණේ මුලදීමයි. නමුත් ඒ ගැන කිසිවක් නොකියා ඉන්න අපි තීරණය කළා. මීට අදාළ දෙමව්පියන්ගේ වචන ගැන අපේ විශ්වාසයක් ඇතිවුණේ නෑ. අපි කොහොමද හෝල්ඩ්හර්ස්ට් සාමිවරයාගේ බෑනා අපහසුවට පත්කරමින් තදින් ප්‍රශ්න අහන්නෙ? ඔහු ඒ විදියේ හිරිහැරයකට ලක්කිරීමක් ගැන මගේ ඉහළ නිලධරයන් කීයටවත් කැමැති වෙන්නෙ නෑ.

හොඳයි හොඳයි. එතකොට මේක විශාල කප්පමක් ඉල්ලා දරුවෙකු පැහැරගෙන යාමක්. ඔය වැඩේ නම් මං තදින්ම පිළිකුල් කරන වැඩක් හෝම්ස් මහත්තයා. ඇමරිකාවේ කෙරෙන නින්දිත අපරාධ මේ රටටත් බෝවෙලා. ඔය වැඩේට ඉඩ දෙන්න නම් අපට කොහොමටවත් හැකියාවක් නෑ. හෝම්ස් මහත්මයා ඔබට කරන්න තියෙන්නෙ නියෝග නිකුත් කිරීම පමණයි. මාත් මගේ නිලධාරීනුත් සූදානම් ඔබේ නියෝග පිළිපදින්න. උසස්වීම් කීපයක්ම මට ලැබුණේ ඔබේ සැලැසුම්වලට අනුව කටයුතු කිරීම නිසා. ඒකට මං ඔබට ණයගැතියි. මහත්මයා මේ ලෙස්ට්‍රේඩ් හැමවිටම ණය ගෙවන කෙනෙක්"

ලෙස්ට්‍රේඩ් ඉතා ඕනෑ කමෙන් සවන් දීගෙන සිටියදී හෝම්ස් තමාට කීමට තිබූ දේ විස්තර කළේය. පොලිස් නිලධරයා ඊට ප්‍රතිචාර දැක්වූයේ විටෙක නිදිබර වූ කලක මෙන් දෙනෙත් අඩවන්ව පියාගෙනය; විටෙක මවිතයට පත්ව දෙනෙත් විශාලව විවෘත කරගෙනය. සියල්ල තේරුම් ගත් පසු අපගේ කටයුත්ත සඳහා පොලිස් රියක් ලබාදීමට ලෙස්ට්‍රේඩ් කැමැත්ත පළ කළත් හෝම්ස් එය ප්‍රතික්ෂේප කළේය.

"මේක ළමයෙකුගේ ජීවිතය අවදානම් තත්ත්වයක තිබෙන වෙලාවක්." හෝම්ස් කීය. "ඒ නිසා අවදානම් විධියට පියවර

තබන්න අපට පුළුවන් කමක් නෑ. දරුවාගේ දෙමව්පියන්ගේ නිවස ගැන අපරාධකාරයා ඉන්නෙ සෝදිසියෙන්. මං එහෙම නිගමනයකට එන්නෙ මට ලැබී තිබෙන සාක්ෂිවලට අනුව. නැහැ ලෙස්ට්‍රේඩ්. වාහන එපා. අපි ඇඳිරි වැටිලා පැයකට පස්සේ පයින්ම එතැනට යනවා. ඒ කියන්නෙ මායි වොට්සනුයි. ඔබට පුළුවනි පොලිස් භටයන් රැගෙන කුලී රිය දෙකකින් ඒ හරියට යන්න. දෙමව්පියන්ගේ ගෙදර පිහිටි තැනට කලින් වංගුවේදී අපි හමුවෙමු"

ලෙස්ට්‍රේඩ් සහ ඔහුගේ භටයන්ට බලා සිටීමට ඉඩ හැර අපි පැයකින් පිටත්වූයෙමු. පර්සි ෆෙල්ප්ස්ගේ නිවසේ පිටුපස දොරටුවෙන් අපි එහි ඇතුළු වූයෙමු. පර්සි සහ ඇනී අප එනතුරු බලා සිටියහ. අතක් එසවූ හෝම්ස් නිශ්ශබ්දව සිටින මෙන් ඔවුනට සංඥා කොට ඔවුන් ඇමතුවේය.

"අපට තියෙන්නෙ තවත් ටික වෙලාවයි. හැන්දෑවෙ පුවත්පත් නිකුත් වුණේ මීට පැයකට කලින්. මං ඉන්නේ කොයි මොහොතෙ හරි පිළිතුරක් ලැබේවි කියන බලාපොරොත්තුවෙන්. එහෙම වුණත් ජෝසෆ් තමන් හැංගිලා ඉන්න තැනින් ඔළුව එළියට දමාවි කියල මං හිතන්නෙ නෑ. පොලීසිය හැංගිලා බලාගෙන ඉඳීවි කියන සැකය ඔහුගේ හිතේ ඇති."

මගේ මිත්‍රයාගේ එම වචන ක්‍රියා කළේ සංඥාවක් විලසිනි. කිසිවෙක් මෘදු හඬින් ඉදිරිපස දොරට තට්ටු කළේය. හෝම්ස් සහ මම සැඟවුණෙමු. ඇනී ඉදිරි දොර වෙත ගොස් එය විවෘත කළාය. අවුරුදු අටක හෝ නවයක පිරිමි ළමයෙකු එතැන සිටි බැව් අඳුරේ සිටි අපි දුටුවෙමු. ලියුම් කැබැල්ලක් ඇනී අතට දුන් ඔහු වහා එතැනින් ඉවත්ව අඳුරේ නොපෙනී ගියේය. පර්සි දොර වසා දැමූ පසු එතැනට ගිය හෝම්ස් ඇනීගේ අතේ තිබූ ලිපිය ගත්තේය.

එය කෙටි ලිපියක් විය. කලින් සඳහන් කළ ලියකියවිලි රැගෙන පර්සි එක්තරා ස්ථානයකට පැමිණිය යුතු බැව් එහි සඳහන් විය. පර්සි පැමිණෙන තුරු බලා සිටින්නා අතට එම ලියවිලි පත්කළ යුතු බවද එහි ලියා තිබිණ. මේ ලිපිය ලියන්නාට යම්කිසි වංචාවක් කිරීමට පර්සි උත්සාහ කළහොත් ඔහුගේ පුත්‍රයාට එයට දඬුවම් විඳීමට සිදුවන බවද එහි පැවසිණ. සුදුමැලිව සිටි මගේ පාසල් මිතුරා හෝම්ස් දෙසට හැරුණේය.





"දැන් මං මොකක්ද කරන්නේ?"

"ඔබ යා යුතුයි" හෝම්ස් කීවේ තීරණාත්මක හඬිනි. "නමුත් තනිවම නෙමෙයි. ඔබ ඒ නිවසට ඇතුළු වෙන්න කලින් ලෙස්ට්‍රේඩ්ගේ භටයන් ගිහින් නිවස වට කළ යුතුයි. නොසැලකිලිමත් ලෙස කටයුතු නොකරන්න ඔවුන් ප්‍රවේසම් වෙන්න ඕන. ඔබ හමුවෙන පුද්ගලයා කවුරු වුණත්, ආරක්ෂා සහිතව ඔහු අත්අඩංගුවට ගන්න පොලීසියට හැකි නම් එහෙම කිරීමේ වරදක් නැහැ. එහෙම කරන්න පුළුවන් කමක් නෑ කියල හිතමු. එහෙම නම් ඔබට කරන්න තියෙන්නේ මුණ ගැහෙන පුද්ගලයා අතට ලියවිල්ල දී ආපසු හැරී එන එකයි.

"නමුත් මේ වෙලාවෙ ඔබ සහ වොට්සන් කොතැනකද ඉන්නෙ?"

"ඔබේ පුත්‍රයා හිරකරගෙන ඉන්න පුද්ගලයාගෙන්, අපි පුතාව නිදහස් කරගනිමින්" හෝම්ස් කීය. "කාලය නාස්ති කරන්න එපා. වහාම පිටත්වෙන්න. ඔබ පමා වුණොත් ඔවුන් සැක හිතන්න පුළුවනි. ඔවුන්ගේ නියෝගයට ඔබ කීකරු වෙනවාද කියලා ඔවුන් හොඳ සෝදිසියෙන් බලාගෙන ඇත්තෙ. ඉක්මන් කරලා යන්න.

ඉස්සරහ තැනක ලෙස්ට්‍රේඩ්ගෙ මිනිස්සු ඉඳීවි. ඔවුන් එක්ක කතා කරන්න ප්‍රමාද වෙන්න එපා. ඒ දිහා බලන්නවත් එපා. ඔබට කරන්න තියෙන්නේ කෙළින් බලාගෙන ඉදිරියට යෑම. කාටවත් නොපෙනෙන නොදැනෙන විදියට ඔවුන් පිටුපසින් ඒවි"

හිත ධෛර්ය කරගත් පර්සි දොරෙන් පිටවී අභීතව ඉදිරියට ගියේය. ඇනී අප දෙස බැලුවාය. අප මුහුණ දී තිබූ අවස්ථාවේ බැරෑරුම් තත්ත්වයත් ඊට මුහුණ දිය යුතු ආකාරයත් හෝම්ස් තේරුම් කළේය.

"මං දන්නවා. මේ වෙලාවෙ ඔබට උවමනා කරන්නේ අපිත් එක්ක ඇවිත්, ඔබේ පුතාව ඔබේ භාරයට ගන්න. මං කරන්න සිතාගෙන සිටියේ අපි දරුවා රැගෙන ආපසු එනතුරු ඔබට ගෙදර ම රැඳී ඉන්න කියන්නයි. එහෙම කියන එකෙන් වැඩක් වෙන්නේ නැති බව දැන් මට තේරෙනවා.

ෆෙල්ප්ස් මහත්මිය. ඔබ ආවට කමක් නෑ. නමුත් මං දෙන සෑම නියෝගයකටම ඔබ ප්‍රශ්න නො අසා කීකරු විය යුතුයි. ඒක ඉතාම වැදගත්. ඔබ කලබල වෙලා හිතුමතේට යමක් කරන්න

උත්සාහ කිරීම හරිම භයානකයි. එහෙම කළොත් ඔබ අවදානමට ලක් කරන්නෙ නයිජල්ගෙ ජීවිතේ. ඒ කාරණා ඔබට තේරුම් ගන්න පුළුවන්ද?"

ඇනී හිස නමා ඊට එකඟත්වය පළ කළාය. නමුත් ඇගේ සුදුමැලි මුහුණේ තිබූ දෙනෙත්වල දැල්වුණු ගිනිජාලාව මම දුටුවෙමි. ඒ ඇගේ සොහොයුරා වූ ජෝසෆ් කෙරෙහි වෛරයෙන් හා ද්වේශයෙන් ඇවිළී තිබූ ගිනිජාලාවය. කෙසේ වෙතත් ඇය අප සමග නිහඬවම පා නැගුවාය. ඒ හෝම්ස්ගේ නියෝගවලට යටහත්ව කීකරු වෙමිනි.

අපට බොහෝ දුරක් මෙලෙස යාමට සිදු නොවීය. කලින් සාකච්ඡා කරගෙන තිබූ අයුරෙන් ලෙස්ට්‍රේඩ් සහ ඔහුගේ භටයෝ පස්දෙනෙක් අප සමග එකතු වූහ. පර්සි එතැන පසු කර යද්දී අනෙක් භටයන් ඔහු පසුපස ගොස් තිබිණ.

"මීළඟට අපි යන්නෙ කොහේටද?" ලෙස්ට්‍රේඩ් මගේ මිත්‍රයාගෙන් විමසුවේය.

හෝම්ස්ගේ දෙනෙතේ දැල්වුණු දීප්තියක ලකුණු මම දුටුවෙමි.

"හුගක් ඈතකට නෙමෙයි" ඔහු කීය. "නමුත් එතැනට අපට යන්න සිදුවෙලා තියෙන්නෙ වට රවුමක් ගහලා"

ඔහු නිහඬව ෆෙල්ප්ස්ගේ නිවස පිටුපසින් අප කැඳවාගෙන ගියේය. කඳු බෑවුමට තැනූ පියගැට පෙළක් එහි විය. එහි ඉහළට නැග මීළඟට වීදියට පිවිස එය දිගේ ඉදිරියට ගියෙමු. ඉන්පසු අපට වට මාවතකින් යාමට සිදුවූයේ ගංඉවුරේ පහළටය.

එය අවසන් වූයේ තේම්ස් ගංගාවේ ජලය වේගයෙන් ගලා ගිය තැනක පිහිටි පෞද්ගලික බෝට්ටු තොටුපොළකිනි. මෙහි ජැටිය අඩක් ජලයෙන් වැසී තිබූ අතර, එහි බෝට්ටුවක් නවත්වා තිබිණි. එය අයිතිකරුවා නිහඬ පුද්ගලයකු බැව් මට පෙනිණ. ඔහු විවිධ අවස්ථාවලදී හෝම්ස්ට සහාය වූ විශ්වාස කටයුතු පුද්ගලයෙකු බැව් මම හඳුනාගතිමි. ඔහුගේ සහායට සිටි අනෙක් අයද එවැන්නන් බැව් සිතාගැනීමට හැකි විය.

අපි බෝට්ටුවට නැගී ගඟ පහළට ගමන් කළෙමු. එය යාත්‍රා කළේ ගංඉවුරට ඉතාම සමීපයෙනි. මඳ දුරක් ගිය පසු බෝට්ටුවේ ගමන නවත්වන ලදී. එය දිය පාරේ පහළට ගසාගෙන යාම වළක්වන ලද්දේ ගංඉවුරට විසිකළ කඹයක ආධාරයෙනි.





ගඟේ ජලය වේගයෙන් බැස ගියේය. බෝට්ටුව එහි ගසාගෙන යාම වළක්වා ගන්නා ලද්දේ බෝට්ටුකරුවන් එයට දැක්වූ දක්ෂතාවය නිසාය. අප සිටි තැනට මඳක් ඉදිරියෙන් ගංඉවුරේ ඉදිකොට තිබූ නිවසක කොටසක් අඩ අඳුරේ අපට දකින්නට ලැබිණි. ලෑලි වලින් ශක්තිමත්ව ඉදිකර තිබූ නිවසේ පිටුපස කොටස, ගඟේ ජල පහරට මඳක් ඉහළින් එළියට නෙරා තිබිණි. මෙය ගඟේ සුන්දරත්වය නැරඹීමට යොදා ගත් තැනක් ද, නැතිනම් සොර බඩු ප්‍රවාහණය පහසු කර ගැනීමට යොදාගත් තැනක්දැයි මට සිතා ගැනීමට අපහසු විය. කෙසේ වෙතත් ලෑලිවලින් තැනූ මෙම නිවසේ උඩුමහලෙන් එළියට, සඳලුතලයක් තිබූ බවද එයින් පහළට කඹයක් දමා තිබූ බව ද, සඳ එළියෙන් මට දැකගත හැකි විය.

අප ගමන්ගත් බෝට්ටුවේ සිටි කෙට්ටු සහායක කොලුවෙක් දියට බැස මඳ දුරක් ඉදිරියට පිහිනා ගියේය. අනතුරුව ඔහු පහළට දමා තිබූ කඹයේ කෙළවර අල්ලාගෙන එය දිගේ ඉහළට නැගුණේය. එමගින් ගංඉවුරේ ඉහළට ගිය ඔහු ඉන්පසු නිවසට ඇතුළු වී නිවසේ උඩුමහලේ ජනේලයක පියන විවෘත කර ගත්තේය. අනතුරුව ආපසු පැමිණ සියල්ල ආරක්ෂා සහිත බවත් අපට එහි පැමිණිය හැකි බවටත් සංඥා කළේය. අපගේ පහසුව සඳහා ඔහු ගැට සහිත ගනකම් කඹයක්ද පහළට දැම්මේය.

එහි ආධාරය ද ලබාගෙන මුලින්ම ඉහළට නැගුණේ හෝම්ස්ය. එම දුෂ්කර කටයුත්ත නිම කළ ඔහු ජනේලයෙන් එබී බලා ශබ්ද නොනගා පැමිණෙන මෙන් අපටද සංඥා කළේය. තරමක වේලාවක් ගතවූවත් ඇනී හැර අපි සියලුම දෙනාම කඹයේ එල්ලී එතැනට ළඟාවූයෙමු. කඹයේ එල්ලී ඉහළට නැගීම ඇනීට කළ නොහැකි දුෂ්කර කටයුත්තක් බව අපි තේරුම් ගත්තෙමු. එබැවින් ඇය කඹයේ එල්ලී සිටියදී හෝම්ස් ඇය ඉහළට ඇද්දේය.

හෝම්ස් ඉදිරියට ගොස් දොරක් යන්තමින් විවෘත කොට නෙත් යොමු කළේය. යළිත් වරක් ඔහු සංඥා කළෙන් අපි නිහඬව ඔහු පසුපස ගියෙමු. අප ඉතාම අපිරිසිදු මෙන්ම අඳුරු කොරිඩෝවක ගමන් කළේ නිවසේ ඉදිරිපස තිබූ ලොකු කාමරයක් තුළටයි. එහි අපවිත්‍රව තිබූ ජනෙල් වීදුරුව වෙත ළං වූ හෝම්ස් ඇඟිල්ල දිගු කර පෙන්වීය. එතැනින් එළිය බැලූ ලෙස්ට්‍රේඩ් හුස්මක් ඉහළට ඇදගත් ආකාරය මට ඇසිණ. මම ද එතැනට ළං වී ජනෙල් වීදුරුවෙන්

නෙත් යොමු කළෙමි. පර්සි ෆෙල්ප්ස්ගේ නිවසේ උද්‍යානය සහ ඉදිරි දොර එතැනට පැහැදිලිවම දැකගත හැකි විය.

"මං බොහොම පරෙස්සම් වුණේ ඇයි කියල දැන් ඔබට තේරෙනව ඇති" හෝම්ස් කීවේ කෙඳිරිලි හඬෙනි.

එහෙත් වටපිට බලමින් සිටීමට කාලයක් නොවීය. ශබ්දයක් නොනැගෙන සේ පියවර තබමින් හෝම්ස් පියගැට පෙළේ පහළට බැස්සේ අප සැමට ඉදිරියෙනි. මීළඟට ලෙස්ට්‍රේඩ් ද ඊට පිටුපසින් මා ද පහළට බැස්සේ අමෝරා ගත් රිවෝල්වර අතැතිවය. පියගැට පෙළ සිමෙන්තියෙන් ඉදිකළ එකක් නිසා අපේ පියවරවලින් එතරම් ශබ්දයක් නොනැගිණ. ලෙස්ට්‍රේඩ්ගේ පොලිස් භටයෝ ද අප පිටුපස පැමිණියහ.

හෝම්ස්ගේ රහසිගත ආක්‍රමණය පහසුවෙන්ම ඉතා සාර්ථක ලෙස කෙළවර වීමට ඉඩ තිබිණ. නමුත් අවාසනාවන්ත ලෙස සිදුවූයේ කුමක්ද? පහළට බසිමින් සිටි පොලිස් භටයෙක් අන්ධකාරයේ තම පියවර වැරදී ඉදිරියට ඇද වැටුණේය. ශබ්දයක් නැගුණේ ඔහු තරප්පුවෙන් තරප්පුව පහළට රෝල් වෙමින් ගිය හඬෙන් පමණක් නොවේ; නොනවත්වාම ඔහුගේ මුවෙන් නිකුත් වූ ශාප කිරීම් වල ශබ්දයේ ද අඩුවක් නොවීය.

"වහාම පැනල ඔහුව අල්ලා ගන්න!" හෝම්ස්ට කෑගැසිණ. "ඔය එළියක් තිබෙන කාමරය!"

හෝම්ස් "ඔහු" යනුවෙන් හැඳින්වූයේ පොලිස් භටයා නොව ජෝසප් බව අමුතුවෙන් කීමට අවශ්‍ය නොවීය. නිවසේ පිටුපසින් ගඟ දෙසට නෙරා ගොස් තිබූ කොටසේ එළියක් දැල්වුණු කාමරයකි. අපි එහි දොර දෙසට පැන්නෙමු. ගඟේ ජලය කැළතෙමින් බැසගිය හඬ අපට කාමරය තුළින් ඇසුණේ උච්ච ස්වරයකිනි. මෙහි පොළොවේ ලෑලි සවිකර තිබුණේ ගඟේ ජල මට්ටමට මඳක් ඉහළින් බව වටහා ගැනීම අපහසු වූයේ නැත.

කාමරයේ මඳ ආලෝකය තුළින් නිකුත් වූයේ යක්ෂාවේශ වූවෙකුගේ වියරු සිනාවකි. ඒ ජෝසප් හැරිසන්ගේ මුවෙන් නිකුත් වූ පිළිකුල් සහගත සිනාවය. ඖෂධ වලින් මත් කරනු ලැබූ දරුවා ඇඳේ නිදා සිටි අයුරුත්, ජෝසප් එක් ක්ෂණයකින් දරුවා ග්‍රහණය කරගෙන තමා වෙතට ඇදගත් හැටිත්, අපි භීතියෙන් බලා සිටියෙමු. ඔහු දරුවා අල්ලා ගත්තේ





දෙපා පහළට සිටින අයුරෙනි. අනතුරුව කාමරයේ ලෑලි පොළොවේ තිබූ දොරටුවක් එහි අගුළෙන් පන්නා විවෘත කිරීමට ඔහුට ගතවූයේ එක් මොහොතකි. එක් පැත්තක් අඩි හතරක් පමණ වූ මේ හතරැස් විවරයට ඉහළින් දරුවා අල්ලාගෙන ඔහු පෑවේ වියරු සිනාවකි.

"මං හැමවිටම ක්‍රීඩාවේ අවසානය දක්වාම තුරුම්පුවක් අතේ ඉතිරි කරගන්නා බව හෝම්ස් මහත්තයා දන්නවා" ජෝසප් කීය. "මේක තේම්ස් ගඟ දිගේ රට තුළට හොර බඩු ගෙන ආ හොර දෙටුවෙකුගේ ගෙයක්. මෙන්න මේ දොර නිසාමයි මේ ගේ පාවිච්චියට ගන්න මං තීරණය කළේ. ඔහේලට උවමනා නම් අපට වෙඩි තියන්න. වෙඩි පාර මට වැදුණත් දරුවට වැදුණත් අපි දෙන්නා ගඟට වැටෙන්නේ එකටමයි. අපි දෙන්නගෙ මිනී හොයාගන්න එක ඔහේලට ලේසි වැඩක් වෙන්නෙ නෑ. මේ හරියට කිට්ටු වුණොත් මං ළමයාව ගඟට අත අරිනවා. ඒකට කැමතිද?"

එවේලේ අපට ගැනීමට තිබුණේ කුමන පියවරක් ද යන්න දැන් මට කීමට නොහැක. එක්කෝ ඔහුගේ ඉල්ලීමට ඉඩදී ඔහුට පැන යාමට ඉඩ දෙනවාද? එසේත් නැතිනම් ඔහු දරුවා ගඟට දැමීමට පෙර දරුවාට වෙඩි වැදීමේ අවදානම නොසලකා ඔහුට වෙඩි තබනවාද? එහෙත් අප එවැනි කිසිදු උත්සාහයක් කිරීමට පෙර වෙනත් බලවේගයක් ක්‍රියාත්මක විය.

ඈනී අප අතරින් රිංගා විදුලි වේගයෙන් එතැනට පැන්නේ එක් ක්ෂණයකිනි. දැඩිව කෝපාවිෂ්ටව සිටි ඇය වඩාත් ළංව සිටියේ වියරු ස්වභාවයට යයි මම සිතමි. කුරිරු ශාපයක් මුවින් පිටකළ ජෝසප් හැරිසන් දරුවා ගඟට මුදා හරිද්දීම, ඈනී එතැනට පැන්නේ ගොදුරක් වෙත කඩා පතින ව්‍යාඝ්‍ර ධේනුවක පරිද්දෙනි. එක් අතකින් තම දරුවා දැඩිව ග්‍රහණය කරගත් ඇය, සම්පූර්ණ ශක්තිය යොදා, එතැන මරු කපොල්ලට ජෝසප් ඇද දැම්මාය. සමබරතාවය රඳවා ගැනීමට නොහැකි වූ ඔහු වේගයෙන් ගලාගිය ගඟේ සැඩපහරට ඇද වැටුණේ මර ළතෝනියක් නගමිනි.

ඈනී ආපසු නිවස වෙත ආවේ ජයග්‍රාහී ලීලාවෙනි. ඇයට අහිමිව සිටි ඇගේ ආදරණීය පුත්‍රයා නයිජල් මවගේ ඇකයේ උණුසුමට තුරුළු වී සිටියේය. පර්සි ෆෙල්ප්ස් ආපසු පැමිණියේ ලෙස්ට්‍රේඩ්ගේ භටයන්ට ජුර්ගන් හිම්ලර් නම් ජර්මන් රහස් ඔත්තුකරුවෙකු අසුවූ

බව පවසමිනි. තම සිරකරුද රැගෙන ලෙස්ට්‍රේඩ් ස්කොට්ලන්ඩියාඩ් වෙත යද්දී අපි ආපසු බේකර් වීදියට පැමිණියෙමු.

"ජෝසප් හැරිසන් හැංගිලා හිටියෙ කොහේද කියන එක ඔබ කොහොමද හෝම්ස් දැනගත්තෙ?" මා විමසුවේ අප ආපසු එමින් සිටියදීය.

"ඒ ගැන මට හෝඩුවාවන් කීපයක්ම හොයා ගන්න හැකිවුණා වොට්සන්. ජෝසප් මොකක් හරි කෲර වැඩක් දඩබ්බර වැඩක් කළාම, එහි සාර්ථකත්වය දැකගන්න ඒ ළඟටම වී සිටීම ඔහුගේ සිරිතක් බව, ඈනී ඇයගේ වාර්තාවෙ ලියා තිබුණා. අවුරුදු හතරකට කලින් ෆෙල්ප්ස්ගේ කාර්යාලයෙන් සොරකම් කළ ලියවිල්ල ජෝසප් සඟවා තිබූ තැනෙන්ම ඒ කරුණ ඔප්පු වෙනවා නේ.

යම්කිසි කුරිරු කටයුත්තක යෙදෙන ගමන් එය හොඳින් නිරීක්ෂණය කිරීම ඔහුට තිබුණු මානසික විකෘතියේ එක් පැත්තක්. ඒ නිසා ඔහුගේ තර්ජනයට ලක්වෙන පුද්ගලයන් ඔහුට හොඳින් නිරීක්ෂණය කරන්න පුළුවන් තැනක ජෝසප් ඇති කියලා මං විශ්වාස කළා. කොහොම වුණත් ඇමරිකාවෙ ගත කළ කාලයේදී ඔහු වඩාත් පරෙස්සම් සහිත පුද්ගලයෙකු බවට පත්වී තිබුණා. දරුවාත් හංගාගෙන රැඳී ඉන්න එවැනි තැනක් හොයාගන්න ඔහුට කොහොමද හැකිවුණේ? කිසිම හෝඩුවාවක් ඉතිරි නොකර ඔහු ඒ දේ කර තිබුණා.

ඔබට හමුවී තිබුණු පුවත්පත් වාර්තාව තමයි මාව ඒ දිශාවට යොමු කළේ. ඔහු අර ගෙවල්කුලී එකතු කළ මිනිහගෙන් කුලී නිවැසියන්ගේ වංහුං තොරතුරු අඩංගු පොත හොරකම් කරගත්ත නේ. කුලී ගෙවපු අයගේ නම් ලැයිස්තුවත් එක්ක ගැළපුවාම හිස්ව තිබෙන ගෙවල් මොනවාද කියා සොයාගැනීම පහසු කටයුත්තක්. එයින් එකක් කඩා විවෘත කරගෙන දරුවා එහි රඳවා ගැනීම දුෂ්කර වැඩක් වුණේ නෑ. ඒ සමගම තමන් වෛර කළ තමන්ගේ සොහොයුරිය හඬා වැලපෙන හැටි කම්පා වෙන හැටි බලාගෙන ඉඳලා සන්තෝස වෙන්නත් ඔහුට හැකියාව ලැබුණා.

විගින්ස් ඇතුළු බේකර් වීදියේ අවිධිමත් රහස් පරීක්ෂක කොලුවන්ගෙනුත් මට ලොකු උදව්වක් ලැබුණා. මං ඒ පැත්තෙ ගැවසෙන්න යන්නේ නැතුව මට හැකි වුණා, කුලියට ගත් අය ඉන්න ගෙවල් මොනවාද, අයිතිකරුවන්ටම හිමි ගෙවල් මොනවාද කියන කරුණ හොයාගන්න. හිස්වෙලා තිබෙන්නෙ මොන ගෙවල්ද කියන එක ළමයි මට ඇවිත් කිව්වා. ෆෙල්ප්ස්ලගෙ ගෙදරට කෙළින්ම අනෙක් පැත්තේ ගෙය හිස්වී ඇති බවත් ඒකෙ පිටුපස කොටස ගඟට සමීප වෙන හැටියට ඉදිකර ඇති බවත් ඔවුන් කීවා. ඒක දැනගත්තාම ජෝසප් හැරිසන් ඇත්තෙ කොහේද කියන එක තේරුම් ගැනීම මට අපහසු වුණේ නෑ. නමුත් ඔහුගේ ජීවිතය මෙ විදියට කෙළවර වේවි කියල නම් මට හිතුණේ නෑ."

"ඒක නම් මටත් හිතුණෙ නෑ" මම කීවෙමි. "ඒ වුණත් ඒක හදිසියේ සිදුවුණු අනතුරක් නේද?"

"මම නම් ඒක ඒ විදියට හිතන්නෙ නෑ වොට්සන්" හෝම්ස් කීවෙ අප අපේ නිවහනට ළංවෙද්දීය. "ලෝකයේ භයානක පුද්ගලයන් අතර ඉතාමත් භයානකම තැනැත්තා තමයි, තමන්ගෙ දරුවා ආරක්ෂා කරන ගැහැනිය. මොන තර්ජනයකටවත් මොන අනතුරකටවත් ඇය භය නැහැ. මැරුම් කන්න සිදුවුණත් අපායට යන්න වෙනවා වුණත් ඒවා නොසලකා ඇය උත්සාහ කරන්නේ තමන්ගේ දරුවා බේරාගන්න. තමන්ගේ සහෝදරයා ජීවත්ව ඉන්න තුරු ඔහු තමන්ගේ දරුවාටත් සැමියාටත් භයානක තර්ජනයක් වන බව ඇයට වැටහුණා. ඒ නිසයි ඇය ඒ විදියට කටයුතු කළේ"

ජෝසප් හැරිසන් සමග කටයුතු කළ විදේශීය රහස් ඔත්තුකරු ජුර්ගන් හිම්ලර්ට දීර්ඝ සිරදඬුවමක් නියම විය. දියේ ගිලුණු තැනට සැතපුම් දෙකක් පමණ ගඟ පහළ තැනක තිබී හැරිසන්ගේ මළ සිරුර හමුවූයේ සතියකට පමණ පසුවය. එය ඔහුගේ බවට හඳුනාගැනීමට හැකි වූයේ මළසිරුරේ තිබූ පච්ච කෙටීමක සලකුණකිනි.

යාචකයන්ගේ මළසිරුරු භූමදාන කරන සොහොන් පිටියක ඔහුගේ සිරුර භූමදාන කරන ලද්දේ පොළොව මතුපිට කිසිදු සලකුණක් නොතබමිනි.

# ශල්‍යාගාරයේ මිනීමැරුම

මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා පැවැත්වූ පරීක්ෂණවලදී වෛද්‍යවරුන් විශාල සංඛ්‍යාවක් අප හමුවට ආ බැව් මගේ පාඨකයන්ට මතක ඇතුවා නිසැකය. අප යෙදුණු භයානකම පරීක්ෂණය වූ බැස්කවිල් අභිරහස අප වෙත ගෙන ආවේ දොස්තර ජෝන් මෝටිමර්ය. ඊටපසු අපට මුණගැසුණු ග්‍රයිම්ස්බි රොයිලොට්, ලියොන් ස්ටර්න්ඩේල්, මුවර් ඒගා, පර්සි ට්‍රෙවල්යාන්, ජේම්ස් සෝන්ඩර්ස් ආදී වෛද්‍ය නම් සියයකට කිට්ටු ගණනක් මට සඳහන් කළ හැක. එහෙත් මේ එකම කථාවකවත් වෛද්‍යවරයකු අභිරහස් ලෙස මරණයට පත්වූ බවක් මම සඳහන් නොකළෙමි. මෙවර මා ඔබ වෙත ඉදිරිපත් කරන්නේ එවැන්නකි. අසූව දශකයේ අවසන් භාගයේ මුළු එංගලන්තයම කැලඹූ දොස්තර ඇන්තනි ඕලැන්ඩෝගේ අභිරහස් මරණය පිළිබඳ සිද්ධිය තවමත් බොහෝ දෙනෙකුට මතක ඇතැයි මම විශ්වාස කරමි.

1887 වසරේ නත්තල් උත්සවය අති උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට ලන්ඩන් නුවරවාසීහු සූදානම් වූහ. එහෙත් උත්තර ධ්‍රැවය දෙසින් හමා ආ හිම කුණාටු අප රටට ගෙන ආවේ අධික ශීතල කාලගුණයකි. හිම වැටීම නොකඩවා සිදුවීම නිසා මංමාවත් සියල්ල අවහිර විය. මගේ බිරිඳ මා සමඟ විවාහ වීමට පෙර කුඩා දරුවන් භාර ගුරුවරියක ලෙස සේවය කළේ සිසිල් ෆොරෙස්ටර් මහත්මියගේ නිවසේය. ඇය සංවිධානය කළ නත්තල් බැති ගී කණ්ඩායමකට එකතු වෙන මෙන් ඇය මගේ බිරිඳ මේරිට ද ඇරයුම් කළාය. මෙය දින කිහිපයක් රාත්‍රී කාලයට එළිමහනේ ඇවිදීමට සිදුවන කටයුත්තකි. මම නිතර සෙම් රෝගවලින් පීඩා විඳි අයෙක්මි. එබැවින් මෙම කටයුත්තට සහභාගිවීමට මගේ කැමැත්තක් නොවීය. මේරි ඒ සඳහා යවා, දින කිහිපයක් බේකර් වීදියේ මගේ පරණ නිවහනේ හෝම්ස් සමඟ නවාතැන් ගැනීමට යාමට මම තීරණය කළෙමි.





"වාසනාවකට මෙන් මේ කාලෙ නම් ඒ තරම් අපරාධ සිදුවෙන්නෙ නෑ" මගේ මිත්‍රයා කීවේ තම වයලීනයක් අතට ගෙන විසිත්ත කාමරයේ අසුනක හිඳ ගනිමිනි. "මහජනයාගෙ පැත්තෙන් බැලුවාම ඒක ඉතාම හොඳයි. නමුත් ඒකෙන් පාඩුව මටයි. විසඳන්න ගැටලුවක් නොමැතිවීම නිසා මට කාලය ගෙවන්න සිදුවෙලා තියෙන්නෙ අලසව. එතකොට හිතේ හරි කලකිරීමක් ඇතිවෙනවා"

"ඔබට එහෙම කලකිරීමක් ඇතිවුණත් ඒකෙන් සමාජයට යහපතක් සිදුවෙනවා නම්......."

මගේ කතාව අතරමග නැවැත්වීමට සිදුවූයේ කිසිවෙකු ඉතා වේගයෙන් උඩුමහලට නැඟුණු ශබ්දය අසන්නට ලැබීම නිසයි. දෙතුන් වරක් දොරට තට්ටු කළ අමුත්තා ඉක්මනින් දොර විවෘත කරගෙන ඇතුළට ආවේය. ඒ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ ඇතල්නි ජෝන්ස් නම් රහස් පරීක්ෂකයාය.

"හෝම්ස් මහත්මයා. මේ විදියට ඔබේ නිවසට කඩා වැදුණු එක ගැන මට සමාවෙන්න" ඔහු කීය. "නමුත් පමාවෙන්න වෙලාවක් නෑ. ස්කිනර්ෆීල්ඩ්හි වෛද්‍යවරයා ඝාතනය ගැන ඔබට ආරංචි ඇතිනෙ? මොනවා ඔබට ආරංචි වුණේ නෑ? එක අතකින් ඒකෙ පුදුමෙකුත් නෑ. ඒ මොකද අපට දැනගන්න ලැබුණෙත් එහේ පොලීසියෙන් එවූ විදුලි පුවතකින් නෙ......."

ඇතල්නි ජෝන්ස් යනු එතරම් බුද්ධිමතෙකු ලෙස මගේ මිත්‍රයා නොසැලකූ පුද්ගලයෙකි. ඔහු අපට කියූ කතන්දරය පැටලිලි සහිත එකක් වූ අතර එහි වැල්වටාරම් ගොඩක්ද ඇතුළත්ව තිබිණි. කෙසේ වෙතත් පසුවදා "ඩේලි ටෙලිග්‍රාෆ්" පුවත්පතේ මෙම සිද්ධිය ගැන සම්පූර්ණ පැහැදිලි විස්තරයක් සඳහන් විය. ජෝන්ස් තොරතුරු ගෙන ආ දිනයේම දහවල් අපි එම ගම්මානය බලා පිටත්වී ගියෙමු. පුවත්පත් වාර්තාව මෙන්ම අපට අසන්නට ලැබුණු කරුණු ඇසුරින් පාඨකයා වෙත එම සිද්ධිය ගැන පැහැදිලි විස්තරයක් ගෙන ඒමට මම උත්සාහ කරමි.

ස්කිනර්ෆීල්ඩ් යනු ලැංකැෂයර් ප්‍රාන්තයේ කුඩා ගම්මානයකි. මෙය ලිවර්පූල් නගරයට සැතපුම් දහයක් පමණ නිරිත දිගින් පිහිටා ඇත. ලිවර්පූල්හි සුප්‍රකට විශේෂඥ වෛද්‍යවරයෙකු වූ ශ්‍රීමත් හියුබට් ග්‍රන්ඩි ගැන ඔබ අසා ඇතුවා නිසැකය. ස්කිනර්ෆීල්ඩ්හි

වෛද්‍යවරයා වූයේ ශ්‍රීමත් හියුබට් ගේ පුත්‍රයා වූ වෛද්‍ය රෝලන්ඩ් ග්‍රන්ඩිය.

ඒ අතර මීට අවුරුදු කිහිපයකට පෙර නාඳුනන වෛද්‍යවරයෙක් මේ ගමට පැමිණ ශල්‍යාගාරයක් විවෘත කොට පෞද්ගලිකව රෝගීනට ප්‍රතිකාර කිරීම ඇරඹුවේය. ඇන්තනි ඕලැන්ඩෝ නම් වූ ඔහු කාගේ කවුද යන්න ගම්වාසීහු දැන නොසිටියහ. වෙදකමක් ඇරඹීමට ඔහු මේ ගමට පැමිණියේ ඇයිද යන්න ද කිසිවෙකු දැනසිටියේ නැත. ඔහු ගැන නිශ්චිතව පැවසිය හැක්කේ කරුණු දෙකක් පමණි. ඔහු ගෞරව සහිතව වෛද්‍ය උපාධිය ලබා තිබුණේ ග්ලාස්ගෝහි වෛද්‍ය විද්‍යාලයෙන් වීම ඉන් පළමුවැන්නය. ඉංග්‍රීසි ජාතිකයන්ගේ දක්නට නොලැබෙන 'කළු' ජාතික පෙනුමක් ඔහුට තිබීම දෙවැන්නයි.

වෛද්‍ය ඕලැන්ඩෝ උෂ්ණ කලාපික රටකින් පැමිණි අයෙකු බවට සැකයක් නොවීය. ඔහුගේ සම සැහෙන තරම් දුඹුරු පැහැ වූයෙන් ඔහු ඉන්දියානු ජාතිකයෙකු යයි කෙනෙකු වරදවා වටහා ගැනීමට ද ඉඩ තිබිණ. ඔහුගේ දෙනෙත්වල මෙන්ම කෙස්වැටියේ ද තිබුණේ තද කළු පැහැයකි. කෙසේ වෙතත් ඔහුගේ මුහුණේ පෙනුම, ආචාර සමාචාර විධි මෙන්ම ඉංග්‍රීසි උච්චාරණයෙන්ද හැඟුණේ මොහු ස්පාඤ්ඤ සම්භවය ඇත්තෙකු විය හැකි බවයි. පෙනුමේ මෙම වෙනස නිසා ගම්වාසීන් විසින් ඔහු හඳුන්වනු ලැබුවේ "කළු දොස්තර" යනුවෙනි. මුල් කාලවලදී සමහරුන් එය යොදා ගත්තේ උපහාසාත්මක මෙන්ම අපහාසාත්මක චේතනාවද ඇතුවය. කෙසේ වෙතත් කල් ගතවීමේදී වෛද්‍ය ඕලැන්ඩෝ යනු කාරුණික, අවංක මෙන්ම ඉතා දක්ෂ වෛද්‍යවරයෙකු බැව් ගම්වාසීන්ට වැටහිණි. ඔහු ශල්‍යමය කටයුතුවලදී දැක්වූ දක්ෂතාවය ද රෝග විනිශ්චයේදී හා ප්‍රතිකාර විධිවල දැක්වූ බුද්ධිමත් බවද කැපී පෙනිණ. එබැවින් ඔහුගේ කීර්ති නාමය මේ ගමේ පමණක් නොව සමීප ගම්වලටද පැතිර ගියේය.

ඔහුගෙන් ප්‍රතිකාර ලැබූ රෝගීන්ට වෛද්‍ය ඕලැන්ඩෝ වෙතින් දැකිය හැකි වූයේ එක් අඩුපාඩුවක් පමණි. එය නම් ඔහු අවිවාහකයකු වීමය. ඔහු ළඟදී විවාහ වන බවට සලකුණක්වත් නොවීය. වෛද්‍ය ප්‍රතිකාරද ලබා දෙමින් තම පදිංචිය සඳහා ඔහු තෝරාගෙන තිබුණේ ප්‍රමාණයෙන් ඉතා විශාල නිවසකි. රෝගීනට





ගම්වාසීන් විසින් ඔහු හඳුන්වන ලද්දේ "කළු දොස්තර" යන නාමයෙනි.

විශාල වශයෙන් ප්‍රතිකාර කෙරුණු නිසා, මෙම වෛද්‍යවරයා විශාල මුදලක් උපයාගෙන ඇති බවට සැකයක් ද නොවීය. එබැවින් ඔහුට මංගල යෝජනා ගෙන ඒමට ප්‍රදේශයේ මඟුල් කපුවෝ ඇඩි උත්සාහයක් දැරූහ. ප්‍රදේශයේ ධනවත්, වංශවත්, රූමත් තරුණියන් රැසක් පිළිබඳ තොරතුරු වෛද්‍යවරයා වෙත ගෙන ආවද ඔහුගෙන් ඒවාට අනුමැතියක් නොලැබිණි. අවුරුදු කිහිපයක් ගතවූවත් ඔහු විවාහ වෙන සලකුණක් දක්නට නොලැබිණි. මේ ගැන බොහෝ දෙනා විවිධ මත පළ කිරීමට පටන් ගත්හ. වෛද්‍ය ඕලැන්ඩෝ දැනටමත් විවාහ වී දරු මල්ලන් සිටින කෙනෙකු විය යුතු යයි සමහරු කීහ. ඔහු කලින් පදිංචිව සිටි ප්‍රදේශයකදී සිදුවූ විෂමාචාරයක් නිසා එම පළාත අත්හැර මෙහි පැමිණ ඇතැයි තවත් සමහරු කීහ. මඟුල් කපුවන් තම බලාපොරොත්තු අත්හැර විවිධ මත පළකරද්දීම යම් සිදුවීමක් වූයේ, කිසිසේත් අපේක්ෂා නොකළ අයුරෙනි. එය නම් කළු දොස්තර මහතා තම විවාහ ගිවිස ගැනීමක් ගැන ප්‍රසිද්ධියට පත් කිරීමය. ඒ ලැංකැස්ටර් මන්දිරයේ එලිසබෙත් ග්‍රැහැම් තරුණ නෝනා සමගය.

එලිසබෙත් ග්‍රැහැම් යනු එම ගමේ කවුරුත් දන්නා හඳුනන රූමත් වංශවත් තරුණියකි. ඇගේ පියා වූ ජෝන් එඩ්වඩ් ග්‍රැහැම් ස්කිනර්ෆීල්ඩ් ගමේ වංශවත් ප්‍රභූවරයෙකු විය. මේ කාලය වන විට ඇගේ මව්පියන් දෙදෙනාම මියගොස් සිටි බැවින්, ඇය ලැංකැස්ටර් මන්දිරයේ පදිංචිව සිටියේ ඇගේ බාල සොහොයුරා වූ සිඩ්නි ග්‍රැහැම් සමගය. දෙමව්පිය ඇවෑමෙන් මෙම මන්දිරය ද ඉඩකඩම්වලින් කොටසක්ද උරුම වූයේ ඔහුට ය.

එලිසබෙත් සිහින් උස සිරුරක් තිබූ රූමත් මෙන්ම කාරුණික තැනැත්තියක ලෙස ගමේ ප්‍රචලිතව තිබිණි. කිසි විටෙකත් කවුරුන් සමඟ හෝ පෙම් සබඳතා පවත්වා නොතිබූ ඇය, දෙව් මැඳුරේ ආගමික කටයුතු වලටත් අනාථ ළමයින්ගේ ළමා නිවාසයටත් නොමසුරුව පරිත්‍යාග කළාය. ඇය ඒවායේ කටයුතුවලට සහභාගී වූ තැනැත්තියක වූ බැව් ප්‍රකට කරුණකි. එලිසබෙත් මෙනෙවියට දොස්තර ඕලැන්ඩෝ හමු වී තිබුණේ ඉවෝන් ජෝසෆ් ගුරුතුමිය පැවැත්වූ සැඳෑ ප්‍රිය සම්භාෂණයකදීය. ඒ ප්‍රථම හමුවීමෙන්ම එය මිත්‍රත්වයක් බවට හැරී ඇඩි ප්‍රේම සම්බන්ධයක් වීමට එතරම් කලක් ගතවූයේ නැත. ඔහුගේ වයස අවුරුදු තිස්හතක් වුවත් ඇයගේ





වයස අවුරුදු විසි හතරක් වුවත් ඔවුන්ගේ ප්‍රේමයට එය බාධාවක් නොවීය. දෙදෙනා අතර තිබූ අන්‍යෝන්‍ය බැඳීමේ හා කැපවීමේ කිසිදු අඩුවක් නොතිබූ බැව් අසන්නට ලැබිණ. විවාහ ගිවිස ගැනීම සිදුවූයේ පෙබරවාරි මාසයේදීය. විවාහය අගෝස්තු මාසයේදී සිදු කරන බව අසන්නට ලැබිණ.

ජූනි මාසයේ 3 වැනිදා දොස්තර ඕලැන්ඩෝ නමට විදේශයකින් ලිපියක් ලැබිණි. ගමේ තැපැල් මහතාට ගමේ ඕපාදූප හා කටකතා පතුරුවන්නා වීමට කුඩා ගම්මානවල අවස්ථාව සැලසේ. මේ ගමේ තැපැල් මහතා වූ ෆිෂර් මහතාද එවැන්නෙකි. ස්කිනර්ෆීල්ඩ්හි වාසය කරන බොහෝ දෙනෙකුගේ රහස් ෆිෂර් මහතා දන්නා බවට ද ආරංචියක් තිබිණ.

"දොස්තර ඕලැන්ඩෝ නමට කවදාවත් පිටරටකින් ලියුමක් ලැබුණේ නැහැ" තැපැල් මහතා කීය. "මේකෙ තිබුණේ හරිම අමුතු බර ලියුම් කවරයක්. ඒකෙ අලවලා තිබුණේ "ආජන්ටිනා ජනරජය" කියා සඳහන් මුද්දරයක්. තැපැල් මුද්‍රාව පැහැදිලිවම බුවනෝස් අයිරිස් නගරයෙන්. පිටත කවරය නම් ලියල තිබුණේ පිරිමියෙකුගේ අවලක්ෂණ අත් අකුරු වලින්"

තැපැල් මහතා කියා තිබුණේ ගමේ අය සමඟයි. ලියුම් බෙදන්නා එය රැගෙන ගොස් තිබුණේ එදා සැන්දෑවේ බෙදූ ලියුම් සමඟය.

පසුවදා උදයේ දොස්තර ඕලැන්ඩෝ, ග්‍රැහැම් මෙනෙවිය හමුවීමට ඇගේ නිවසට ගොස් ඇත. ඇය සමඟ දීර්ඝ සාකච්ඡාවක යෙදී සිටි ඔහු ආපසු එද්දී පාගමනින් ගිය ලියුම් බෙදන්නාට දොස්තර මහතා දකින්නට ලැබී ඇත. ඔහු ගැඹුරු කල්පනාවකට වැටී, කැලැඹුණු සිත් ඇතිව නිහඬව ගමන් කළ බැව් ලියුම් බෙදන්නාට පෙනී ගොස් තිබිණ.

එලිසබත් ග්‍රැහැම් මෙනෙවිය එදා මුළු දවසේම තම කාමරයටම වී ගත කළ බැව්, ඇගේ සේවිකාව වූ මේරි තම යෙහෙළියකට පවසා තිබිණි. තමන් ඇගේ ස්වාමිදූවගේ කාමරයට ගිය කිහිප වතාවකම, ඇය කඳුළු වගුරුවමින් සිටි අයුරු තමන් දුටු බැව් මේරි කියා ඇත. මේ අයුරින් සතියක් ගත වී ගියේය. දෙදෙනා අතර සිදුව තිබූ විවාහ ගිවිස ගැනීම දැන් අවසානයකට ළඟාවී තිබූ බැව් කාගේත් මුව'ග රැව්දුන් විවෘත රහසක් බවට පත්වී තිබිණ. දොස්තර ඕලැන්ඩෝගේ මේ ලැජ්ජා සහගත ක්‍රියා කලාපය

කාගේත් උදහසට ලක්විය. එලිසබෙත් මෙනෙවියගේ සොහොයුරා වූ සිඩ්නි ග්‍රැහැම් අශ්වයිනට තළන කසයෙන් දොස්තරට පහර දීමට බලාපොරොත්තු වන බැව් ගමේ ඕපාදූපකාරයෝ පැවසූහ.

දොස්තර ඕලැන්ඩෝගේ හැසිරීම ලැජ්ජා සහගත එකක් ලෙස හඳුන්වනු ලැබුවේ ඇයි? එයට හේතුව දැන සිටි කිසිවෙකු නොවීය. කෙසේ වෙතත් ගමේ රෝගියෙකු බැලීමට යාමට සිදුවූ විටෙක, ලැංකැස්ටර් මැඳුර අසලින් නොගොස් තම රාජකාරිය සඳහා, ලොකු රවුමක් ගසා වෙනත් මගකින් යාමට දොස්තර පෙළඹී ඇතැයි ද අසන්නට ලැබිණ. මෙපමණ කලක් ඉරිදා උදෑසන දෙව්මැඳුරේ දේව මෙහෙයට සහභාගි වීමට පුරුදුව සිටි කළු දොස්තර දැන් එයින් වැළකී සිටියේය. එයට හේතුව දේව මෙහෙයට නොවරදවාම පැමිණෙන එලිසබත් මෙනෙවිය මගහැර සිටීම බැව් සිතා ගැන්ම අපහසු නොවීය. මීට අමතරව වෛද්‍යවරයෙකුගේ වෘත්තීය නියැලුමක් අලෙවිය සඳහා ඇතැයි දැන්වීමක් "ලැන්සට්" නම් වෛද්‍ය සඟරාවේ පළවූ බවද අසන්නට ලැබිණ. මෙහි ස්කිනර්ෆීල්ඩ් යන ගමේ නම හෝ වෛද්‍ය ඕලැන්ඩෝගේ නම සඳහන් නොවුණත්, මෙය ඔහු විසින් පළකළ දැන්වීමක් බවට බොහෝ දෙනා අනුමාන කළහ. ජුනි මස 21 වැනිදා සවස්කාලය වන විටද මේ අවාසනාවන්ත අර්බුදය පැවැතියේ මෙවැනි තත්ත්වයකය. ගමේ හුටපටයක්ව තිබූ මෙම සිදුවීම මුළු රටම කැලැඹූ ඛේදවාචකයක් බවට පත්වූයේ ජුනි 21 වැනිදා රාත්‍රියේයි. මෙහි වැදගත්කම තේරුම් ගැනීමට පාඨකයන් වෙත තවත් තොරතුරු ස්වල්පයක් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය බැව් පෙනී යයි.

වෛද්‍යවරයා තම වෙදකම පවත්වාගෙන ගිය විශාල නිවසේ ඇතුළත, නිතිපතා පදිංචිව සිටියේ තවත් දෙදෙනෙකු පමණි. ඒ නිවසේ වැඩ කටයුතු සොයා බැලූ වැදගත් උගත් කාන්තාවක වූ වයස්ගත වයලට් පෝටර් මහත්මිය සහ තරුණ සේවිකාව වූ ඇග්නස් රෙනී පමණකි. ශල්‍යාගාරයේ වැඩට සහාය වූ සේවකයා සහ අශ්වකරත්ත රියැදුරා ලැගුම් ගත්තේ, නිවසෙන් පිටත වූ වෙනත් ඉදිකිරීමකය. නිවසේ සේවිකාවන්ගේ කාමර ආදිය තිබුණේ වෛද්‍යවරයා පදිංචිව සිටි කාමරයට සහ ශල්‍යාගාරය ලෙස භාවිත කළ කාමරය පිහිටි අංගනයට බොහෝ ඈතිනි. ශල්‍යාගාරයට





ප්‍රවිසීම සඳහා නිවසේ පිටතට කෙළින්ම සම්බන්ධ දොරක් ද විය. ඒ රාත්‍රි කාලයට නිවසේ අනෙක් අයට බාධා නොකොට, රෝගීන් ශල්‍යාගාරයට ඇතුළුකර ගැනීමේ පහසුව සඳහාය. වයස්ගත පෝටර් මහත්මිය මෙන්ම සේවිකා රෙනී කල්තබා නින්දට යාමට පුරුදුව සිටියහ. එබැවින් රාත්‍රියේ පැමිණෙන රෝගීන් එම පසුව කී දොරටුවෙන් ඇතුළු කරගෙන ප්‍රතිකාර වලින් පසු එම දොරටුවෙන්ම පිටවී ගිය බව සත්‍යයකි. වෛද්‍යවරයාගේ නිදන කාමරය තිබුණේ ශල්‍යාගාරයට යාබදවමය.

ජුනි 21 වැනි දින - එනම් වැදගත් යයි අප සඳහන් කළ දිනයේ සිදු වූයේ කුමක්ද? තමා නින්දට යාමට පෙර දොස්තර මහතාට යම් ඕනෑ-එපාකම් ඇත්දැයි සොයා බැලීම වයලට් පෝටර් මහත්මියගේ සිරිත විය. රාත්‍රි 9.30 ට ඔහුගේ කාමරයේ දොර අසලට ගිය ඇයට දකින්නට ලැබුණේ සුපුරුදු දසුනකි. එනම් ඔහු තම ලියන මේසයට වාඩිවී යමක් ලියමින් සිටි බවයි. ඔහුට ශුභ රාත්‍රියක් පැතූ පෝටර් මහත්මිය ගියේ මුළුතැන් ගෙයටයි. සේවිකාව වූ ඇග්නස් රෙනී තවමත් එහි රාජකාරිවල යෙදී සිටියාය. පෝටර් මහත්මිය සේවිකාවට නින්දට යන මෙන් නියම කළාය. අනතුරුව වයස්ගත කාන්තාව මුළුතැන් ගෙයි ඉතිරිව තිබූ වැඩකටයුතුවල යෙදුණාය. ඒ රාත්‍රි 10.45 වන තුරුය. අන්තිමේදී නිදාගැනීම සඳහා ඇය තම කාමරයට යන විට බිත්ති ඔරලෝසුවේ රාත්‍රි 11 නාද වෙමින් තිබිණි.

ඇඳේ වැතිරුණද ඇයට ඉක්මනින් නින්ද ගියේ නැත. තවත් පැය කාලක් පමණ ගතවෙද්දී කිසිවෙකු කෑගසන හෝ කෑඳවීමේ ශබ්දයක් ඇයට නිවස තුළින් ඇසිණ. මඳවේලාවක් ඇය නිහඬව සවන් යොමු කරගෙන සිටියාය. එහෙත් අමුතු ශබ්දයක් ඇයට යළිත් වරක් අසන්නට නොලැබිණි. උස් හඬින් ඇසුණු පෙර කී ශබ්දය හදිසි කෑඳවීමක්ද, නැතහොත් කෑගැසීමක් දැයි සිතාගැනීමට ඇයට හැකි නොවිණි. ඩ්‍රෙසිං-ගවොමක් හැඳගත් ඇය වහාම වෛද්‍යවරයාගේ කාමරය දෙසට දිව ගියාය. ඔහුගේ කාමරයේ දොර වසා තිබිණි. ඇය දොරට තට්ටු කළේ නොඉවසිල්ලෙනි.

"ඔය කවුද?" කවුදෝ විමසනු ලැබුවේ කාමරය තුළ සිටයි.

"මහත්මයා මේ මම - පෝටර් මහත්මිය"

"පෝටර් මහත්මිය. මං ඔබට ආයාචනා කරනවා. කරුණාකරල මට නිදහසේ ඉන්න දීල ඔතැනින් යන්න! මේ මොහොතෙම යන්න!"



"මහත්මයා. මේ මම පෝටර් මහත්මිය."





එම කටහඬෙන් කියනු ලැබිණ. ඒ තම ස්වාමියාගේ කට හඬ යයි ඇය සිතුවාය. එහෙත් එහි තිබුණේ අකාරුණික සැරපරුෂ බවකි. තම ස්වාමියා කිසිවිටෙකත් මෙලෙස කථා නොකරන බව පෝටර් මහත්මිය දැන සිටියාය. එබැවින් ඇගේ සිතට වේදනාවක් දැනිණ.

"මහත්මයා. මං හිතුවේ ඔබ මාව කැඳෙව්වා කියල" ඇය කීවාය. එහෙත් ඊට කාමරය තුළින් පිළිතුරක් නොලැබිණි. මඳ වේලාවක් එතැන බලා සිටි පෝටර් මහත්මිය තම නිදන කාමරය වෙත ආපසු යාමට තීරණය කළාය. එවිට වේලාව රාත්‍රි 11.30 බැව් ඇය දුටුවාය.

මීළඟට තවත් කාන්තාවක දුන් සාක්ෂියක් අපට අසන්නට ලැබේ. ඒ ගමේ ආහාර ද්‍රව්‍ය වෙළෙන්දාගේ බිරිඳ වූ ලින්ඩ්සේ මහත්මියයි. වෛද්‍යවරයාගෙන් උපදෙස් ලබා ගැනීමේ අරමුණෙන් ඇය මෙ නිවසට පැමිණ ඇත්තේ රාත්‍රි එකොළහත් දොළහත් අතරේය. (එවිට වේලාව හරියටම කීයද යන්න නිශ්චිතව කීමට ඇයට හැකියාවක් නොතිබිණි)

ගමේ ආහාර ද්‍රව්‍ය වෙළෙන්දා වූ ලින්ඩ්සේ මහතාට උණ සන්නිපාතය වැළඳී තිබිණි. එම රෝගයට ඔහුට ප්‍රතිකාර කළේ දොස්තර ඇන්තනි ඕලැන්ඩෝය. දිගින් දිගටම පාචනයට, හා වමනයට භාජනය වී අධික උණෙන් පෙළීම නිසා, ලින්ඩ්සේ සිට ඇත්තේ දරුණු රෝගී තත්ත්වයකිනි. ඔහු වෙත ඇඩි අවධානයක් යොමු කළ යුතු බවට වෛද්‍යවරයා ලින්ඩ්සේ මහත්මියට දැනුම් දී තිබිණි. රාත්‍රියේ නින්දට යාමට පෙර ඔහුගේ තත්ත්වය ගැන තමාට නොවරදවාම දැනුම් දෙන මෙන්, එදා සවස වෛද්‍යවරයා ඇයගෙන් ඉල්ලා සිටියාලු.

මේ සඳහා රාත්‍රියේ වෛද්‍යවරයාගේ ශල්‍යාගාරය අසලට පැමිණි ඇයට දකින්නට ලැබුණේ, වෛද්‍යවරයාගේ කාමරය තුළ පහනක් දැල්වෙමින් තිබූ බවයි. ඒ නිසා ඇය කිහිපවාරයක්ම එහි දොරට තට්ටු කළාය. එයට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. ඒ අනුව ඇයට සිතුණේ හදිසි රෝගියෙකුට ප්‍රතිකාර කිරීම සඳහා වෛද්‍යවරයා නිවසෙන් බැහැර යන්නට ඇති බවයි. ඒ නිසා ආපසු තම නිවසට යාමට ලින්ඩ්සේ මහත්මිය තීරණය කළාය.

වෛද්‍යවරයාගේ නිවසේ සිට ප්‍රධාන පාරට යාම සඳහා තිබුණේ වංගු සහිත කෙටි මාර්ගයකි. මේ දිගේ ඉදිරියට ගිය ඇයට

ඇතින් කිසිවෙකු ඉදිරියට පැමිණි අයුරු දකින්නට ලැබිණ. මුලින් ඇය සිතුවේ මේ ආපසු පැමිණෙන වෛද්‍යවරයා කියායි. එබැවින් ඇය සිටි තැනම නැවතී බලා සිටියාය. පැමිණියේ කවුද යන්න ඇයට මඳ වේලාවකින් පැහැදිලිව දැකගත හැකි විය. ඒ මාර්ගයේ තිබූ ගෑස් පහනෙන් නිකුත් වූ ආලෝකයෙනි. එසේ පැමිණියේ වෛද්‍යවරයා නොව ගමේ වංශවත් තරුණයා වූ සිඩ්නි ග්‍රැහැම්ය. ඔහුගේ අතේ බරෙන් වැඩි වර්ගයේ දඩයම්-කසයක් ද විය. ඔහුගේ මුහුණේ තිබුණේ කැලඹීමට පත් ස්වභාවයකි.

"දොස්තර මහත්තයා ගෙදර නෑ" ඇය කීවේ තරුණයා අමතමිනි.

"ඔහේ කොහොමද ඒක දන්නේ?" තරුණයා විමසුවේ රළු ආකාරයෙනි.

"මහත්මයා. මං දැන් මේ ශල්‍යාගාරයට ගිහිල්ලයි එන්නේ"

"මට නම් පේනවා ඒකෙ එළියක්. එයාගෙ කාමරේ ඒක නේද?"

"ඔව් මහත්මයා. ඒ වුණාට මට විශ්වාසයි දොස්තර මහත්මයා කාමරේ නෑ. කොහේ හරි ගිහින්"

"ඒ ගියත් එයා ආපහු එන්න ඕන නේ" කියූ ග්‍රැහැම් තරුණයා ශල්‍යාගාරය දෙසට පා නැඟීමට පටන් ගත්තේය. ලින්ඩ්සේ මහත්මිය ආපසු තම නිවස බලා ගියාය.

පාන්දර තුනට පමණ ඇගේ සැමියා වූ ලින්ඩ්සේ මහතාගේ තත්ත්වය වඩාත් උග්‍ර අතට හැරිණි. ඔහු පත්ව සිටි භයානක තත්ත්වය ගැන ඇය භීතියට පත් වූවාය. තවත් පමා නොවී දොස්තර මහතා වහාම එහි කැඳවාගෙන ආ යුතු යයි ඇය තීරණය කළාය. වෛද්‍ය නිවසට ඇතුළුවන පාර දිගේ ඇය ඉක්මනින් ඉදිරියට ගමන් කළාය. එසේ යද්දී උස් මල් පඳුරු අතර කෙනෙකු සක්මන් කරමින් සිටි ආකාරය දැක ඇය මවිතයට පත්වූවාය. එහි සිටියේ පිරිමියෙකු බවද ඇයට පෙනිණි. ඇයට සිතුණේ මේ පුද්ගලයා සිඩ්නි ග්‍රැහැම් විය යුතු බවයි. කෙසේ වෙතත් ඒ ගැන සිතනවාට වඩා තමා විසින් කළ යුතු කටයුත්ත ගැන සිතූ ඇය, වෛද්‍ය නිවසේ ශල්‍යාගාරය දෙසට පිය නැඟුවාය.

ඇයට දකින්නට ලැබුණේ එහි කලින් දක්නට ලැබුණු පහන තවමත් දැල්වෙන බවයි. එබැවින් ඇය වෛද්‍යවරයාගේ කාමරයේ





සිඩ්නි ග්‍රැහැම් අතේ බරෙන් වැඩි වර්ගයේ දඩයම් කසයක් ද විය.

සහ ශල්‍යාගාරයේ දොරවලට තට්ටු කළාය. ඇය දිගින් දිගටම කිහිපවරක් තට්ටු කළත් පිළිතුරක් නොලැබිණි. පහනක් මේ තරම් දීප්තියෙන් දැල්වෙමින් තිබියදී එය නිවා නොදමා, වෛද්‍යවරයා නිවසෙන් බැහැර ගියා යයි සිතීමට අපහසු බැව් ඇය කල්පනා කළාය. ලින්ඩ්සේ මහත්මියට සිතුණේ දොස්තර මහතාට එකත් එකටම හිඳගෙන සිටි අසුනක නින්ද යන්නට ඇත කියායි. කෙසේ හෝ කාමරයේ ඇතුළත දැකගත හැකි නම්.........?

වීදුරු ජනේලයට ඇතුළතින් ජනේල රෙද්දක් තිබූ බැවින් කාමරයේ ඇතුළත ආවරණය වී තිබිණි. එහෙත් මෙම ජනෙල් තිරය එක් තැනකින් නැමී ඇඹරී ගොස් තිබූ බැවින් ඒ හිඩැස හරහා කාමරයේ ඇතුළත දැක ගත හැකි බැව් ඇයට වැටහිණි. ඇය තම ඇස් එතැනට ළංකොට කාමරය තුළට නෙත් යොමු කළාය.

කාමරයේ මැද වූ මේසය මත තිබූ විශාල පහනෙන් දීප්තිමත් ආලෝකයක් විහිදිණි. වෛද්‍යවරයාගේ උපකරණ සහ පොත්පත් මිස ඇයට කිසිවෙකු දැකගන්නට නොලැබිණි. මේසයේ සෙවණැල්ල තිබූ පෙදෙසේ සුදු පැහැති හස්තාවරණයක් ඇයගේ නෙත ගැටිණ. ඇය දිගටම එම අඳුරු සෙවණැලි ප්‍රදේශය දෙසම බලා සිටියාය. ඇගේ දෙනෙත් කෙමෙන් කෙමෙන් අඳුරට හැඩ ගැසිණි. එක්වරම ඇයට දකින්නට ලැබුණු දසුනෙන් ලින්ඩ්සේ මහත්මිය භීතියෙන් තිගැස්සුණාය. ඇයට දකින්නට ලැබුණේ කාමරයේ මැද මේසය අසල බිම ඇද වැටී සිටි පුද්ගලයෙකුගේ දර්ශනයයි. හස්තාවරණයක් ලෙස සුදු පැහැයෙන් ඇය දැක තිබුණේ එම පුද්ගලයාගේ අතකි.

කුමක් හෝ භයානක දෙයක් සිදුවී ඇති බව ලින්ඩ්සේ මහත්මිය වටහා ගත්තාය. වහා ඉදිරි දොර වෙත ගිය ඇය සීනුව නාද කොට වයලට් පෝටර් මහත්මිය සහ සේවිකාව අවදි කළාය.

සේවිකාව අත පොලීසියට පණිවුඩයක් යැවුණු අතර පෝටර් සහ ලින්ඩ්සේ මහත්මීහු වෛද්‍යවරයාගේ කාමරය වෙත ගමන් කළහ.

වෛද්‍ය ඇන්තනි ඕලැන්ඩෝ මහතා ජීවිතක්ෂයට පත්ව කාමරය තුළ බිම ඇද වැටී සිටි ආකාරය ඔවුනට දකින්නට ලැබිණි. ඔහු උඩුබැලි අතට සිටි අතර දෙනෙත් විවෘතව තිබිණි.





ඇසකට ලේ ගලායාම නිසා ඒ ඇස රතුපැහැ වී තිබූ අතර මුහුණ පුරා, බෙල්ලේ හා ඇත්වල, තැළීමේ සලකුණු හා ලේ ගලාගිය තුවාල දක්නට ලැබිණ. ඔහු මරණයට පත්වන්නට පෙර ශරීරයට දරුණු ප්‍රහාරයක් එල්ල වී ඇති බැව් සිතාගැනීම අපහසු නොවිණි. කෙසේ වෙතත් ඔහුගේ මුහුණ හා තවත් තැන් මඳක් ඉදිමී තිබීම නිසා, මරණයට හේතුව අපරාධකාරයකු විසින් කරන ලද හුස්ම හිරකිරීමක් යයි අනුමාන කළ හැකි විය. ඔහු හැඳ සිටියේ රෝගීනට ප්‍රතිකාර කිරීමේදී සාමාන්‍යයෙන් සැරසෙන ඇඳුමය. සැහැල්ලු රෙදි සෙරෙප්පු යුගලක් ඔහු පැළැඳ සිටි අතර ඒවායේ දෙපතුල් පිරිසිදු බැව් පෙනිණ.

මා ඉහතින් සඳහන් කළේ පුවත්පත් මාර්ගයෙන් අප වෙත දැනගන්නට ලැබුණු විස්තරයයි.

ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක ඇතල්නි ජෝන්ස් ලබා දුන් ආරංචිය නිසා එදා වහාම ස්කිනර්ෆීල්ඩ් වෙත යාමට අපි පිටත්වූයෙමු.

දුම්රිය ලිවර්පූල් වෙත ළඟාවෙද්දී තරමක් ප්‍රමාද වී තිබිණ. එහිදී දහවල් ආහාරය ගෙන කුලීරියකින් අපි ස්කිනර්ෆීල්ඩ් බලා පිටත්වූයෙමු.

"මේ ප්‍රදේශය භාර පොලීසියේ පරීක්ෂක මැක්නීල්ට මං විදුලි පුවතක් එව්වා" ඇතල්නි ජෝන්ස් කීය. "අපරාධය සිදුවුණු ස්ථානය ආරක්ෂා කර තැබීම ඔහු කොයිතරම් සාර්ථකව කරලද කියන්න බෑ"

"ඔබේ උපදෙස් අනුව ඔවුන් ඒ කටයුත්ත හොඳින් කර ඇති බවට සැකයක් නෑ" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේය.

පොලිස් නිලධරයන් සෑහෙන පිරිසක් එහි රැස්ව සිටි බැව් එතැනට ළඟාවෙද්දී අපට දැකගත හැකි විය.

"ජෝන්ස් මහත්මයා. ඔබ කියූ අයුරින් අපරාධය සිදුවුණු තැන ආරක්ෂා කරන්න මං සෑම පියවරක්ම ගත්තා" ස්කිනර්ෆීල්ඩ් පොලීසියේ පරීක්ෂක මැක්නීල් කීවේ ඉදිරියට පැමිණ ආචාර කරමිනි. "මළසිරුර ඉවත් කරගෙන යන්නවත් මං ඉඩ දුන්නෙ නෑ"

"ඒක බොහොම හොඳයි." හෝම්ස් කීවේ කාමරයේ බිම තිබූ පා සටහන් පරීක්ෂා කිරීමට සූදානම් වෙමිනි.

ඔහු තම අවධානය මුලින්ම යොමු කළේ මළසිරුර සමීපයේ කාමරයේ බුමුතුරුණු මත තිබූ පා සටහන් වෙතයි. හැඩිදැඩි පුද්ගලයෙකුගේ යයි සිතිය හැකි, ගෙවී ගිය අපිරිසිදු අඩියක් සහිත බූට් සපත්තු වලින් ඇතිවූ සලකුණු රැසක් එහි විය. හෝම්ස් ඒවා තම සටහන් පොතේ ඇඳගත් අතර, ඒවායේ දිග පළලද මැන ගැනීමට අමතක නොකළේය.

"මං හැමදාම කියන්න වගේ පා සටහන්වල වැදගත්කම, අවුරුදු සීයක් ගියත් අපට අමතක කරන්න බෑ" හෝම්ස් කීවේය.

අධිකරණ වෛද්‍ය කටයුතු සඳහා පොලිස් වෛද්‍යවරයා එහි පැමිණ සිටියද, හෝම්ස් තම පරීක්ෂණ කටයුතු නිම කරන තෙක් වෛද්‍යවරයා විසිත්ත කාමරයට වී හිඳගෙන සිටියේය.

වෛද්‍ය ඕලැන්ඩෝගේ සිරුරේ දක්නට ලැබුණේ මා මුලින් සඳහන් කළ ආකාරයේ තැලීම් හා ලේ ගැලීම්ය. මෘත ශරීරය තිබුණු පරීක්ෂාවකට ලක් කළද ආයුධයකින් කරන ලද තුවාල කිසිවක් එහි දක්නට නොලැබිණි.

"මරණයක් සිදුවෙන්න තරම් ලොකු තුවාල කිසිවක් නෑ" හෝම්ස් කීය.

"එතකොට ඔහු මියගියේ කොහොමද? හුස්ම හිරකිරීමකින්ද?" ඇතල්නි ජෝන්ස් විමසීය.

"එහෙම විය යුතුයි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "වොට්සන් මට ඔබේ උදව් ඕනෑ කරනවා."

මගේ මිත්‍රයාට උදව් උවමනා වී තිබුණේ මියගිය කළු දොස්තර මහතාගේ - ගාත්‍රාවල දිග, වට ප්‍රමාණය, බෙල්ලේ හා හිණේ ප්‍රමාණය ආදිය මැන ගැනීම සඳහායි. අන්තිමේදී මළසිරුරේ දෙපයේ තිබූ සෙරෙප්පු ඉවත් කොට දෙපතුල්ද, හෝම්ස් පරීක්ෂාවට ලක් කළේය.

"හෝම්ස් මහත්මයා. ඔබේ පරීක්ෂණ කටයුතු අවසන්ද?" මැක්නීල් විමසීය.

"ඔව්. මෘත ශරීරය පරීක්ෂා කිරීම අවසන්. ඔබේ වෛද්‍යවරයාට පුළුවන් ඔහුගේ කටයුතු අරඹන්න. ඒ අතරේ අපි ටිකක් එළියෙන් ඉන්නම්" හෝම්ස් කීය.

ඔවුන් ඒ කටයුතුවල යෙදෙන අතරේ මගේ මිත්‍රයා තම අවධානය යොමු කළේ නිවසේ පිටත පිහිටි උද්‍යානය හා නිවස වෙත වැටී තිබුණු මාර්ගය වෙතයි.





"වෛද්‍යවරයාගේ මරණය ගැන ආරංචි වුණාම ප්‍රදේශවාසීන් සිය ගණනක් මෙතැනට එන්න ඇති" හෝම්ස් කීවේ පොළොවේ අඩි සටහන් පරීක්ෂා කිරීමට උත්සාහයක් නොදරමිනි. "අපරාධකාරයා එන්න ඇත්තෙත් මේ පාර දිගේ. ඒ මොකද අපි දන්නා තරමින් වෙනත් පාරවල් නොමැති නිසා. බොහොම වෙලාවට පිටවී යන්න ඇත්තෙත් ආව විදියට. ඒ වුණත් මං කැමැතියි නිවස වටේම ඇවිදලා බලන්න. නමුත් ඉස්සර වෙලා මට උවමනායි මේ මල්පඳුරු අවට පරීක්ෂා කර බලන්න. සිඩ්නි ග්‍රැහැම් මේ මල් පඳුරු අසල සක්මන් කරමින් සිටි බව නේ ලින්ඩ්සේ මහත්මිය දැකල තිබුණේ"

හෝම්ස් මල්පඳුරු සහිත එම ප්‍රදේශය පරීක්ෂා කරන තුරු, මම නිවසට පිවිසෙන මග අසල වූ උද්‍යාන බංකුවක හිඳගෙන බලා සිටියෙමි.

"ලින්ඩ්සේ මහත්මිය කියූ කරුණ නිවැරදියි" හෝම්ස් කීය. "ඔහු පැය ගණනක් මෙතැන සක්මන් කරමින් ඉඳල තියෙනවා. ඔහුගේ ඔල්සොප් වර්ගයේ පාවහනේ අඩි සලකුණු මෙතැන ඉතාම පැහැදිලිව වැදිල තියෙනවා. ඔහුගේ පියවරක දිග මං මැන ගත්තා; ඒ වගේම පාවහනේ ප්‍රමාණයත්. ඒ අනුව ඔහු උසින් අඩි පහයි, අඟල් නවයත් එකොළහත් අතර ප්‍රමාණයේ කෙනෙකු විය යුතුයි. ඒ වගේම ඔහු එතරම් තරබාරු අයෙකු වෙන්න බෑ........"

"......... හෝම්ස් මහත්මයා" එතැනට පැමිණි පොලිස් පරීක්ෂක මැක්නීල් කීවේ අපේ කතාබහට බාධා කරමිනි. "පොලිස් වෛද්‍යවරයාගේ මූලික පරීක්ෂණ කටයුතු අවසන්. ඔහු කියනවා මළසිරුර කපා පරීක්ෂා කළ යුතුයි කියලා. ඒ සඳහා එය ලිවර්පූල් නගරයට ගෙන යා යුතුයි"

"පොලිස් මෘත ශරීරාගාරයකටද?"

"නැහැ මහත්මයා. ලිවර්පූල්හි සාන්ත ජෝජ් රෝහලේ මෘත ශරීරාගාරයට."

"එහේදි පශ්චාත් මරණ පරීක්ෂණය කරන්නෙ කවුද? මේ වෛද්‍යවරයාමද?"

"නැහැ මහත්මයා. මෙහි සැක කටයුතු මරණ සිදුවුණාම ඒ මරණ පරීක්ෂණ සඳහා කැඳවන්නේ ශ්‍රීමත් මිල්ටන් බේලි මහාචාර්යතුමා"

"විශිෂ්ටයි. මං ඒ මහාචාර්යතුමාව හොඳට අඳුනනවා. ඔහු අති දක්ෂයෙක්." හෝම්ස් කීය. "ඔබට මතකද මං දන්නෙ නෑ ලෝරන්ස් අර්විං නම් බැංකුකරුගේ මරණය; මේරියන් සින්ක්ලෙයා නම් නිළියගේ මරණය; සියදිවි නසා ගැනීම කියූ මේවා, සාපරාධී මිනීමැරුම් බව හෙළිකර දුන්නේ බෙලි මහාචාර්යතුමා."

"ඔව් මං අහල තියෙනවා" මැක්නීල් කීය. "පශ්චාත් මරණ පරීක්ෂණය අද රාත්‍රියේම පවත්වන්න ඉඩ තියෙනවා. මේවා පැය ගණන් පමා කරනවාට එතුමා කැමති නෑ. හෝම්ස් මහත්මයත් එනවද මරණ පරීක්ෂණය බලන්න?"

"නැහැ. ඒක අවසන් වුණාට පස්සේ මං ඇවිත් මහාචාර්යතුමා හමුවෙන්නම්. එතුමා කොහේද ඉන්නේ?"

"ලිවර්පූල් දුම්රියපොළ අසලින් තිබෙන වික්ටෝරියා හිල් මාවතේ හැතැක්ම දෙකක් පමණ කන්ද උඩට ගියාම තිබෙන නිවසක"

"බොහොම හොඳයි." හෝම්ස් කීය. "මහාචාර්යතුමාට කියන්න මං එතුමා ගෞරවයෙන් සිහිකළ බව"

"හොඳමයි හෝම්ස් මහත්මයා"

මේ අතර මළසිරුර ලිවර්පූල් වෙත ඉවත් කරගෙන යෑමේ කටයුතු සිදුවිය. එයින් පසු අපි යළිත් වරක් වෛද්‍ය ඇන්තනි ඕලැන්ඩෝගේ නිවස වෙත පැමිණියෙමු.

"මෙතැන මංකොල්ලකෑමේ අරමුණක් තිබිල නැහැ කියලයි මට හිතෙන්නෙ" හෝම්ස් කීවේ ගෘහපාලිකාව වූ වයලට් පෝටර් මහත්මිය අමතමිනි. "දොස්තර මහත්මයාට අයත් රත්රන් ඔරලෝසුව මට හමුවුණා ඔහුගේ කබා සාක්කුවේ තිබිලා"

"එහෙම වෙන්න ඇති මහත්මයා."

"ඔහු වටිනා දේවල් කිසිවක් මේ කාමරයේ තබා ගත්තෙ නැද්ද?"

"ඔහු සාමාන්‍යයෙන් ලොකු මුදලක් ළඟ තබාගත්තා" පෝටර් මහත්මිය කීවාය. "ඒක තබා ගත්තේ බරින් වැඩි ලොකු යකඩ පෙට්ටියක. අර අතන තියෙන්නේ ඒක තමයි. ඒක හැමවිටම යතුරු දමා වසා තබලයි තියෙන්නේ. ගෙදරට උවමනා ආහාර ද්‍රව්‍ය මිලට ගන්න මුදල් උවමනා වුණාම, ඔහු ඒකෙන් තමා මුදල් අරගෙන දුන්නේ"

එම පෙට්ටියේ අගුළ විවෘතව තිබූ අතර එහි පියන පහසුවෙන්ම විවෘත විය. පෙට්ටිය තුළ කිසිදු මුදලක් නොවීය.





"හොරා කවුරු වුණත් මුදල් ඔක්කොම අරගෙන ගිහින් වගෙයි." හෝම්ස් කීවේ එහි පියන වසා දමමිනි. "පෝටර් මහත්මිය. ඔබට පුළුවන්ද මේ කාමරය ඇතුළත ටිකක් පරීක්ෂා කර බලන්න. මොනවා හරි දේක අඩුවක් තියෙනවද කියල බලන්න. එහෙමත් නැත්නම් ඔබ කලින් දැක නැති පිටස්තර දෙයක් මෙහි තියෙනවා නම් ඒකත් මට කියන්න"

"දොස්තර මහත්මයා මට නියම කරල තියෙන්නේ දවසක් ඇර දවසක් මේකෙ දූවිල පිහිදාන්න කියලයි" ඇය කීවේ කාමරය තුළට අත දිගු කරමිනි. "ඔහුගේ පෞද්ගලික ඇඳුම් පැළඳුම්වල අඩුවක් තියෙනවද කියල නම් මට කියන්න බෑ. නමුත්........." කී ඇය නළල රැළි කරගෙන කාමරයේ සෑම තැනක් වෙතම දෙනෙත් යොමු කරමින් ඇවිද්දාය. අනතුරුව තමාටම යමක් කියා ගනිමින් හිස සොලවමින් කල්පනා කළාය. පොළොව දෙසට දෙනෙත් යොමු කරගෙන ඇවිද ගිය ඇය බිම තිබී යමක් අහුළා ගත්තාය. අනතුරුව එය මගේ මිත්‍රයා වෙත දිගු කළාය."

"මහත්මයා. මෙන්න මේක මීට කලින් මේ කාමරයේ තිබෙනවා මං දැකල නෑ" ඇය කීවාය. "දොස්තර මහත්තයාගෙ ශල්‍යාගාරයේ මේවා තියෙනවාද කියන එක මං දන්නෙ නෑ කියන්න. ඒක නම් අහන්න ඕන ශල්‍යාගාරයේ වැඩට උදව්වෙන ළමයා ගෙන්"

ඇය හෝම්ස් අතට දුන්නේ ඇස්රෝගීන්ගේ ඇසකට බෙහෙත් ඇමූ විට එම ඇස වසා තැබීමට අලවන ඕවාල හැඩයේ ලින්ට් රෙදි කැබැල්ලකි. එහි ඉහළ හා පහළ ඊට අළවා තිබූ පැලැස්තර කැබලි දෙකක් තවමත් දක්නට ලැබිණ.

"ඔබට කියන්න තිබෙන්නේ එපමණද?" මම ඇසුවෙමි.

"නැහැ මහත්මයා. මේ කාරණය නම් මම මුලින්ම දුටුවා" ඇය කීවාය. "ඔබට පෙනෙනවා නේද මේ පින්තූර රාමුව? පසුගිය මාස තුන හතරක කාලයක් තිස්සේ මේ රාමුව තුළ ආරක්ෂා කර තිබූ ඡායාරූපයක් මං දුටුවා. නමුත් දැන් එය නැහැ"

"මොකක්ද ඒ ඡායාරූපය?"

"ඒ තමයි අපේ දොස්තර මහත්තයා විවාහ වීමට බලාපොරොත්තුවෙන් සිටි මෙනෙවියගේ ඡායාරූපය"

"ඔබ කියන්නේ........."

"ඔව් මහත්මයා. එලිසබෙත් ග්‍රැහැම් මෙනෙවියගේ ඡායාරූපය"

"ගෙදරට මුදල් හොරකමට ආ හොරෙක් මොකටද එවැනි ඡායාරූපයක් හොරකම් කරගෙන යන්නේ?" හෝම්ස් විමසීය.

"ඒක නම් මටත් හිතාගන්න බෑ මහත්මයා"

"එතකොට ඔබට කියන්න තියෙන්නේ ඔය කරුණු පමණද? වෙන මොනවා හරි ඔබට මතක් වෙන්නේ නැද්ද? කල්පනා කර බලන්න"

"දැන් මට තවත් කාරණයක් මතක් වෙනවා" ඇය කීවාය.

"ඒ මොකක්ද?"

"බරින් වැඩි අර යකඩ පෙට්ටියේ අපේ දොස්තර මහත්තයා ලොකු මුදලක් තබා ගැනීමට තවත් හේතුවක් තිබුණා."

"ඒ මොකක්ද?"

"රෝගීන්ට ලබාදෙන ඖෂධ වගේම ඔහු නිතර පාවිච්චි කරන ශල්‍ය උපකරණ, පුළුන්, වෙළුම් පටි ආදිය මිලට ගත්තේ, ඒවා රැගෙන එන වෙළඳුන්ගෙන්." ඇය කීවාය. "ඒවා මිලට ගෙන ඒමට නගරයට යන්න දොස්තර මහත්මයාට වෙලාවක් තිබුණෙ නෑ. ඒ නිසා ඒ ද්‍රව්‍ය මිලට ගන්න ඔහු ලොකු මුදලක් ළඟ තබාගෙන හිටියා."

"එතකොට ඒ දේවල් අලෙවි කරන කෙනෙකු ළඟදී ආවද?"

"ඔව් මහත්මයා. ඖෂධ පෙට්ටි පටවාගෙන එන සමාගමේ අශ්ව කරත්තය ආවේ ඊයෙ උදේ. ඒ රථය සහ අලෙවිකරුවන් නම් මං හොඳට දැක පුරුදු අය. ඊයෙ හවසත් අශ්ව කරත්තයක් ආවා. එහි ගෙන ආවේ ශල්‍ය උපකරණ කියලයි මං හිතන්නේ. ඔවුනුත් ලොකු පෙට්ටි වගයක් නිවස තුළට ගෙන ආවා."

"එහෙනම් මහත්මයාගෙ මුදල් පෙට්ටියේ තිබුණු මුදල් වැඩි ප්‍රමාණයක් මේ වෙළෙන්දන්ට ගෙව්වා වෙන්නත් පුළුවනි?"

"ඔව් මහත්මයා"

"එහෙම නම් දැන් බලන කොට කාමරයෙන් නැති වී තිබෙන්නේ ඔබ කියන ඡායාරූපය පමණයි?"

"එහෙම විය යුතුයි මහත්මයා"

"ඔබට ස්තුතියි පෝටර් මහත්මිය" හෝම්ස් කීය. "අවශ්‍ය වුණොත් යළිත් වරක් අපි ඔබව කැඳවන්නම්"

පෝටර් මහත්මිය එතැනින් පිටවී ගිය පසු කතාව ඇරඹුවේ මෙතෙක් වේලා නිහඬවම සිටි ඇතල්නි ජෝන්ස්ය.





"හෝම්ස් මහත්මයා. මට නම් හිතෙන්නේ දැන් නම් හැමදෙයක්ම පැහැදිලියි. දොස්තර ඕලැන්ඩෝ සමඟ කෝපාවිෂ්ට වෙලා හිටියේ කවුද? ඒ තමයි තරුණ සිඩ්නි ග්‍රැහැම්. ඔහුට ඒකට සාධාරණ හේතුවක් තියෙනවා. ඒ තමයි මේ පළාතේ වංශවතුන් ප්‍රභූවරුන් වන ඔවුනට, නින්දා අපහාස වෙන විදියේ සිදුවීමක් දොස්තර ඕලැන්ඩෝ අතින් වීම. අශ්වයිනට තළන කසයෙන් දොස්තරට තළන බව තරුණයා කියා තිබුණලු නේ. ඔහු මේ ගෙදර සමීපයේ ගැවසුණු බවටත් ඇසින් දුටු සාක්ෂි තියෙනවා."

"සිදුවෙන්න ඇත්තේ මේකයි" ස්කිනර්ෆීල්ඩ් පොලීසියේ පරීක්ෂක මැක්නීල් තම අදහස කීවේ අපේ කතාබහට සම්බන්ධ වෙමිනි.

"සිඩ්නි ග්‍රැහැම් දොස්තර මහත්මයා සමඟ කෝපයෙන් සිටි බවට ඕනෑ තරම් සාක්ෂි තියෙනවා. ඒ මොකද ඔහු තමන්ගේ සොහොයුරියට දැඩි ආදරයකින් ඉන්න කෙනෙක්. දඩයම්-කසයක් අතැතිව ඔහු මේ ගෙදර සමීපයේ ඉඳල තියෙන්නේ රෑ එකොළට විතර. ඊළඟට ඔහු මොනවා හරි ක්‍රමයකින් දොර අරවාගෙන දොස්තර මහත්තයාගේ කාමරයට ඇතුළුවුණා. එතුමා කෝපයට හෝ භීතියට පත්ව හඬක් නැඟුවා. ඒක තමයි පෝටර් මහත්මියට අහන්නට ලැබුණේ. පෝටර් මහත්මිය මෙතැනට ආවේ ඒ ශබ්දය අහන්න ලැබිලා ඒ සැණින් නෙමෙයි. ඇය මඳ වේලාවක් කන් දීගෙන ඉඳලා තමයි, උඩ තට්ටුවේ තිබුණු තමන්ගේ නිදන කාමරයේ ඉඳල පහළට බැහැලා ආවෙ. ඒ වෙලාව වෙන කොට දොස්තර ඕලැන්ඩෝ තීරණයකට ඇවිත්. මොකකටද? ඇවිත් හිටි ඔහුගේ අමුත්තා එක්ක කතාබහ කරලා යම් කිසි විසඳුමකට එන්න. ඒ නිසයි ඔහු පෝටර් මහත්මියව ආපසු ඇයගේ කාමරයට හරවා යැව්වේ.

ඊළඟට මොකක්ද සිද්ධවුණේ? මේ දෙන්නා අතර සාකච්ඡාව උණුසුම් එකක් බවට පත්වුණා. පසුව ඒක දරුණු ගැටුමක් බවට හැරෙන්න ඇති. ඒකෙ ප්‍රතිඵලයක් හැටියටයි දොස්තර ඕලැන්ඩෝගේ ජීවිතය නැතිවුණේ. තරුණ වංශවතා ඊළඟට මොකද කළේ? තමන් ඉතාම ආදරය කරන තමන්ගේ සොහොයුරියගේ ඡායාරූපයත් ඉවත් කරගෙන ඔහු යන්න ගියා. ආපසු යන්න ගිය ඔහු දුටුවා ලින්ඩසේ මහත්මිය වෛද්‍යවරයා සොයාගෙන පැමිණෙන ආකාරය. ඔහු මල්පඳුරු දෙසට වෙලා

ඇයව මගහැරියා. මේ මිනීමැරුම සම්බන්ධයෙන් සිඩ්නි ග්‍රැහැම් අත්අඩංගුවට ගන්න ඕනෑ තරම් සාක්ෂි තියෙනවා කියලයි මට හිතෙන්නෙ"

අන්තිමේදී සිදුවූයේද එයමය. එදා සැන්දෑවේ සිඩ්නි ග්‍රැහැම් පොලිස් අත්අඩංගුවට පත්වූ බැව් අපට අසන්නට ලැබිණ.

අප දෙදෙනා එදා රාත්‍රිය සඳහා නවාතැන් ගත්තේ ලිවර්පූල් නගරයේ "ලයන් ඇන්ඩ් ඩ්‍රැගන්" තානායමේය. අප තානායමට පැමිණ කාමර වෙන්කර ගත්තා පමණි.

"වොට්සන්. ඔබට මහන්සි නිසා ඔබ විවේක ගන්න" මගේ මිත්‍රයා කීය. "දැන් පශ්චාත් මරණ පරීක්ෂණය අවසන් වෙන්නත් කිට්ටු ඇති. සමහර විට දැනටමත් ඒක අවසන් වෙලාද දන්නේ නැහැ. කොහොම නමුත් මට උවමනායි මහාචාර්ය බෙලි හමුවෙලා කරුණු කිහිපයක් දැනගන්න."

"ඔහු හමුවෙන එක නම් හෙට උදේටත් බැරි වෙන එකක් නැ නේද හෝම්ස්?" මම ඇසීමි.

"ඔය මහාචාර්යතුමන්ලාට කාලය ගතවෙන්නෙ බොහොම අවිවේකීව" හෝම්ස් කීය. "හෙට උදේ වෙන කොට ඔහු කොහේ ගිහින් ඉඳීවිද කියන්න බෑ. මේ ගැටලුව විසඳන්න නම් මං නොවරදවාම ඔහු හමුවෙන්න ඕන.

අනික් තැනැත්තා තමයි සිඩ්නි ග්‍රැහැම් තරුණයා. ඔහු වෙනුවෙන් පෙනී ඉන්න නීතිඥයින් මේ වෙනකොටත් කරුණු සාකච්ඡා කරමින් ඉන්නවා ඇති. නමුත් මෙතැන අපරාධකාරයා ඇත්තටම ඔහුද කියන එක නිගමනය කරන්න අපටත් තියෙනවා වගකීමක්"

එසේ කී හෝම්ස් තේ කෝප්පයක් පමණක් බී තානායමෙන් පිටවී ගියේ මටද යම් උපදෙසක් දෙමිනි.

"සමහරවිට මං රෑ වෙන්න ඉඩ තියෙනවා වොට්සන්. ඒ මොකද නීතිඥයින් හමුවෙන්න ගියාම ඔවුන්ගේ කතාබහට කාලය කොයි තරමක් ගතවෙනවද කියන එක ඔවුන්වත් දන්නෙ නැ. ඔබට තියෙන්නේ මං එනතුරු බලා නොසිට රෑට කෑම කාලා නිදාගන්න."

මගේ මිත්‍රයා ආපසු පැමිණියේ රාත්‍රී කීයටද යන්න මම නොදනිමි. මට ඔහු පසුවදා උදේ දකින්නට ලැබුණේ ඔහු සෙවීමට මා ඔහුගේ කාමරයට ගිය විටයි.





"හෝම්ස් ඔබ ආපහු ආවෙ ඊයෙ රෑ කීයටද? මට නම් තදින්ම නින්ද ගියා"

"මං ආපහු එද්දි රෑ දොළහත් පහුවෙලා. මං ආව වෙලාවෙ ඔබේ කාමරයට යන්තමින් තට්ටු කළා. ඔබට තදින්ම නින්ද ගිහින් තියෙන්න ඇති. ඉතින් ඔබව අවදි කරන්න මට හිතුණෙ නෑ."

"මොනවද ඔබට දැනගන්න ලැබුණු අලුත් තොරතුරු?"

"පශ්චාත් මරණ පරීක්ෂණය මං යද්දි අවසන් වෙලයි තිබුණෙ" හෝම්ස් කීය. "මහාචාර්ය බෙලි එතැනින් පිටවී යන්න කලින් මට හැකිවුණා, එතුමා සමඟ කතාබහ කරන්න. ඔහුගෙන් දැනගන්න හැකිවුණේ මොනවද කියලා මං ඔබට පසුව කියන්නම්.

එතැනින් මං ගියේ පොලිස් අත්අඩංගුවට පත්වුණු සිඩ්නි ග්‍රැහැම් හමුවෙන්න. ඔහු සිටියේ දැඩි කම්පනයකට පත්වෙලා. ප්‍රදේශයේ ප්‍රභූ පෙළපතක වංශවතෙකු වුණු ඔහු, පොලිස් භාරයට පත්වීම ඔහුට බලවත් සිත්වේදනාවක් වෙන්න ඇති. නාඳුනන කෙනෙකු වුණු මා සමඟ කතාබහ කරන්න ඔහු කැමැති වුණේ නැහැ. ඒ නිසා මං ඔහුගේ නීතිඥයින් සමඟ කතාබහ කළා.

මට අහන්න ලැබුණු විදියට සිඩ්නි ග්‍රැහැම් කියන්නේ අර සම්ප්‍රදායික ප්‍රභූ පැළැන්තියේ තරුණයෙකු නෙමෙයි. ඔහු කලක් කේම්බ්‍රිජ් සරසවියේ ඉගෙනුම ලැබූ ක්‍රීඩාවට කැපවී සිටි කෙනෙක්. ගමේ අය අතර ජනප්‍රිය චරිතයක් වෙන ඔහු සෑම දෙනෙකුගේම ආදරයට ලක්වුණු අවංක කෙනෙක්ලු. මේ අවේලාවේ දොස්තර ඕලැන්ඩෝ හමුවෙන්න ගියේ ඇයි කියල නීතිඥයින් ඔහුගෙන් විමසලා තියෙනවා.

තමන්ගේ පවුල මුහුණ දී ඇති ප්‍රශ්නය ගැන ඔහු දිගින් දිගටම කල්පනා කරමින්ලු හිටියේ. මේක විසඳා ගැනීමට වෛද්‍යවරයා සමඟ කෙළින් කතාබහ කරලා තීරණයකට ඒම වඩා හොඳයි කියා ඔහුට සිතුණාලු. වෛද්‍යවරයා සමහරවිට මැදියම් රැය දක්වා රෝගීන් පරීක්ෂා කරන බව, ඔවුනට ප්‍රතිකාර කරන බව, තරුණයා හොඳින් දන්නා කරුණක්. ඉතින් නිදහසේ කතාබහ කරගන්න රෑ වෙලා යන එක හොඳයි කියලයි තරුණයා හිතල තියෙන්නේ. නමුත් පාන්දර තුනට එහි ගියේ ඇයි කියල නීතිඥයකු අහල තියෙනවා. රාත්‍රියේ නිදාගන්න ගිහින් කල්පනා කරමින් සිටි තමන් තීරණයකට ආ වෙලාවේ ගියා මිසක්, වෙලාව ගැන ඔහුට මතක් වුණේ නැහැලු."

"කොහොම වුණත් රෑ එකොළහත් දොළහත් අතර වෛද්‍යවරයා හමුවෙන්න ගිය ලින්ඩසේ මහත්මියටත් සිඩ්නි ග්‍රැහැම් හමුවී තිබුණා නේද?" මම ඇසීමි.

"ඔව් ඒක හරි" හෝම්ස් කීය. "ග්‍රැහැම් කියන්නේ තමන් එහි යද්දී ඔහුට යම් කාන්තාවක හමුවුණු බව. වෛද්‍යවරයා නිවසේ නොමැති බව ඇය කී නිසා ඔහු එනතුරු තමන් එතැන කාලය ගත කළ බවත් ඔහු කියනවා. අන්තිමේදී පාන්දර තුන වෙද්දිත් වෛද්‍යවරයා ආපසු නො ආ නිසා, තමන් ගෙදර ඒමට පිටත්වුණු බව තරුණයා කිව්වාලු.

වෛද්‍යවරයාගේ මරණය ගැන තමන් මොනවද දන්නෙ කියා පොලීසිය විමසා තිබෙනවා. ඔහු කියල තියෙන්නේ තමන් ඒ ගැන කිසිවක් නොදන්නා බව. වෛද්‍ය ඕලැන්ඩෝ කාලයක් තමන්ගේ හොඳම මිතුරෙකුව සිටි බව ප්‍රශ්න කිරීම් වලදී තරුණයා පිළි අරගෙන තියෙනවා. නමුත් එම සමීප මිත්‍රත්වය පසුව වෙනස්වුණු බවයි ඔහු කියන්නෙ. ඒකට හේතු ඔහු පැහැදිලි කරල නෑ."

"හෝම්ස්. ඔබට හිතෙන්නෙ වෛද්‍යවරයාගේ මරණයට සිඩ්නි ග්‍රැහැම්ගේ සම්බන්ධයක් නැහැ කියලද?"

"ඒ වගේ නිශ්චිත නිගමනයකට එන්න මට ලැබී තිබෙන සාක්ෂි තවමත් ප්‍රමාණවත් නෑ වොට්සන්. දොස්තර ඕලැන්ඩෝ වෙනුවෙන් පෙනී ඉන්න නීතිඥයා ඔහුගේ සමීපතම මිතුරෙක්. ඔහුගේ නම හැරී හක්ස්ලි. වොට්සන්, ඔබ ලියා ඇති වාර්තා නිසා ඔහු මා ගැනත් දන්නවා. මට හැකිවුණා ඔහුගේ විශ්වාසය දිනාගන්න. හක්ස්ලි කියූ දේට කන්දීගෙන හිටි මට හැකිවුණා මේ විදියට ටිකක් ඉදිරියට යන්න.

රෑ 11.30 වත් වෛද්‍යවරයා ජීවතුන් අතර සිටී බව සහතිකයි. ඒ ගැන අපට සහතිකයක් ලැබෙනවා පෝටර් මහත්මියගෙන්. තමන්ට දොස්තර ඕලැන්ඩෝගෙ කටහඬ අහන්න ලැබුණෙ ඒ වෙලාවෙ කියල දිවුරන්න ඇය සූදානම්. මේ කියන වෙලාවෙත් ඊට ටිකක් කලින් සහ පසුවත්, දොස්තර හිටියෙ තනියෙන් නෙමෙයි කියල අපට හිතන්න පුළුවනි. ඒ කොහොමද කිව්වොත්; එකක් පෝටර් මහත්මියට අසන්නට ලැබුණු අසාමාන්‍ය ශබ්දය. අනික තමයි වෛද්‍ය ඕලැන්ඩෝගේ තිබුණු නොඉවසිලිමත් ස්වභාවය.





සාමාන්‍යයෙන් බොහොම ආචාරශීලීව කතා කරන වෛද්‍යවරයා ඇයට මේ වෙලාවෙ කතා කළේ රළු ආකාරයට. ඔහු කිව්වේ තමන්ට නිදහසේ ඉන්න දීලා වහාම ඔතැනින් ඉවත්වෙලා යන්න කියලා.

කාරණා ඒ විධිය නම් අපට මෙන්න මේ ආකාරයේ නිගමනයකට එන්න පුළුවනි. එනම් ඇයට ඔහුගේ කටහඬ අහන්න ලැබුණු වෙලාවත්, ලින්ඩසේ මහත්මිය පළමුවෙනි සැරේ වෛද්‍යවරයා සොයා ආ වෙලාවත් අතරතුර තමයි ඔහුගේ මරණය සිද්ධවුණේ. ඒ මොකද ඒ වන විටත් ඔහු කාමරය තුළ වැටී සිටිනවා. මෙම කාරණය නිවැරදි නම් අපරාධකාරයා සිඩ්නි ග්‍රැහැම් වෙන්න විදියක් නෑ. ඒ මොකද ලින්ඩසේ මහත්මියට නිවස දෙසට එන තරුණයා එදා මුලින්ම දකින්න ලැබුණෙ ඇය ආපසු ගිය ගමනේදි නිසා.

මේ උපකල්පනය නිවැරදියි කියා අපි මොහොතකට හිතමු. එහෙනම් ලින්ඩසේ මහත්මියට ග්‍රැහැම් තරුණයා හමුවෙන්න කලින් කවුරු හරි කෙනෙක්, වෛද්‍යවරයා සමඟ ඔහුගේ කාමරයේ ඉඳල තියෙනවා. කවුද මේ අමුත්තා? වෛද්‍යවරයාගේ කාමරයේ බුමුතුරුණු මත තිබූ පාවහන් සලකුණු මා පරීක්ෂා කළ බව ඔබ දුටුවා. ඒවා එතරම් පැහැදිලි නෑ. එදා හැන්දෑවේ තද වැස්සක් ඇද හැළුණු නිසා කාටත් ඇවිද යන්න සිදුවුණේ මඩ ගොඩවල් උඩින්. අර පා සටහන් ප්‍රමාණයෙන් සමාන වුණේ මියගිය වෛද්‍යවරයාගේ පා සටහන්වලට මිස, ග්‍රැහැම් තරුණයාගේ පා සටහන් වලට නෙමෙයි. එකොළහමාරට පෙර වෛද්‍යවරයා එළියට ගිහින් මඩ පාගාගෙන ඇතුළට ඇවිත් ඇති බවයි ඒකෙන් නිගමනය කරන්න පුළුවන්.

වෛද්‍යවරයාගේ මේසය උඩ තිබූ රාමුවෙන් ඉවත් කරගෙන ගිය එලිසබෙත් මෙනෙවියගේ ඡායාරූපය ගැන සමහරු කතා කරනවා. ඒක ග්‍රැහැම් තරුණයා ළඟ තිබී හමුවුණේ නැහැලු. ඒකෙ නම් ඇති වැදගත්කමක් මට පෙනෙන්නෙ නැහැ. ඒ මොකද ඔහු ඒක පුලුස්සා දැමුවා වෙන්න පුළුවනි."

"මේ වෙලාවෙදි එලිසබෙත් ග්‍රැහැම් මෙනෙවිය මොනවද කියන්නේ? එක පැත්තකින් ඇගේ පෙම්වතා නැත්නම් හිටපු පෙම්වතා ඝාතනය වෙලා. ඒකෙදි චූදිතයා වෙලා ඉන්නේ ඇගේ එකම සොහොයුරා. ඇය මොකද කියන්නේ?" මම ඇසුවෙමි.

"තවම නම් ඇය කිසිම ප්‍රකාශයක් දීම ප්‍රතික්ෂේප කරනවා." හෝම්ස් කීය. "ඒ වුණත් ඇය දිගටම එහෙම ඉඳී කියල මං හිතන්නේ

නෑ. සිඩ්නි ග්‍රැහැම්ට විරුද්ධව නඩුවක් උසාවියෙදි විභාග වෙන්න ගන්න කොට ඇයව සාක්ෂි දෙන්න කැඳවාවී"

ෂර්ලොක් හෝම්ස් කියූ ඒ අනාවැකිය නිවැරදි විය.

දින දෙකකට පසු නඩුව විභාගයට ගැනීමට නියමිතව තිබිණි. විත්තියේ නීතිඥයා වූ හැරී හක්ස්ලි මහතා ෂර්ලොක් හෝම්ස් හමුවීමට කිහිප වාරයක්ම "ලයන් ඇන්ඩ් ඩ්‍රැගන්" තානායම වෙත පැමිණියේය. නමුත් මගේ මිත්‍රයා බැහැර ගොස් සිටි නිසා ඔහු හමුවීමට නීතිඥයාට හැකි නොවීය. ගත වූ දින දෙකේම හෝම්ස් ආපසු තානායම වෙත එන විට රෑ බෝවී තිබිණි. විඩාපත්ව සිටියද ඔහුගේ දෙනෙත් දීප්තියෙන් බැබළුණු බැව් මම දුටුවෙමි. මෙම අභිරහස විසඳීමට ඔහු දැඩි වෙහෙසක් ගන්නා බැව් මම දැන සිටියෙමි. එහෙත් ඔහුගේ උත්සාහය සාර්ථක ද නැති ද යන්න මා විමසූ විට ඔහුගෙන් ලැබුණේ නිශ්චිත පිළිතුරක් නොවේ.

වෛද්‍ය ඕලැන්ඩෝ ඝාතන නඩුව යනුවෙන් පුවත්පත් මගින් නම් කරන ලද නඩු විභාගය, ලිවර්පූල් අධිකරණයේදී විභාගයට ගැනිණ. මට උසාවියට යාමට සිදුවූයේ තනිවමය. ඊට හේතුව තමන්ට වැඩ කටයුතු රාශියක් ඇති බැව් පැවසූ මගේ මිත්‍රයා උසාවියට නොපැමිණ ඒ සඳහා පිටත්ව යාමයි.

පැමිණිල්ලේ නීතිඥවරයා වූ ෆ්‍රැන්ක් ඩෙවොන් මහතා තම කරුණු ඉදිරිපත් කළේ අසාමාන්‍ය දක්ෂතාවයක් පෙන්වමිනි. මා දැනටමත් සඳහන් කර ඇති කරුණු එකින් එක ගෙන, ඔහු ඒවා විග්‍රහ කළේ සිද්ධිය වූ ආකාරය ගැන පැහැදිලි චිත්‍රයක් මවමිනි.

තම සොයුරියට කළ නින්දා අපහාසය ගැන ඔහුට හොඳ පාඩමක් උගන්වන බවට තරුණ වංශාධිපතියා වහසි බස් දොඩා ඇතැයි ඩෙවොන් මහතා කීය. ඒ බැව් සනාථ කිරීම සඳහා ඔහු සාක්ෂිකරුවන් තුන් හතර දෙනෙකුම කැඳවීය. විත්තිකරු එදා පාන්දර තුනට පමණ වෛද්‍යවරයා හමුවීමට පැමිණ ගෙවත්තේ සිටිනු තමා දුටු බැව් ලින්ඩ්සේ මහත්මිය සාක්ෂි දෙමින් තහවුරු කළාය.

විත්තිය වෙනුවෙන් සාක්ෂි දීමට කැඳවනු ලැබූ පළමු සාක්ෂිකරු වූයේ එලිසබෙත් ග්‍රැහැම් මෙනෙවියයි. සිහින් උස් සිරුරක් ද රූමත් මුහුණක් හා පැහැදිලි කටහඬක් ද තිබූ ඇය සාක්ෂි කූඩුවට නගිද්දී දැඩි කම්පනයකට මෙන්ම කැලඹීමකට පත්ව සිටි බැව් පැහැදිලිව පෙනිණි.





තමා පෙබරවාරි මාසයේදී වෛද්‍ය ඇන්තනි ඕලැන්ඩෝ සමග විවාහ ගිවිසගත් බවත්, විවාහය අගෝස්තු මාසයේදී සිදුකිරීමට දෙපක්ෂයම එකඟ වූ බවත්, ඇය කීවාය. මෙම විවාහ ගිවිසුම හදිසියේ නැවැත්වීමට සිදුවූයේ වෛද්‍යවරයාගේ පවුලේ අය සම්බන්ධ ගැටලු රැසක් නිසා බවත් ඇය කෙටියෙන් සඳහන් කළාය. කෙසේ වෙතත් මේ ගැන තම සොහොයුරා කෝපයට හා කැලඹීමට පත්වීම අසාධාරණ බවත්, තමා එය අනුමත නොකරන බවත් ඇය උසාවියට කීවාය.

ඇගේ නීතිඥයා ඉදිරිපත් කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ග්‍රැහැම් මෙනෙවිය කීවේ, වෛද්‍ය ඕලැන්ඩෝ ගැන තමාගේ සිතේ වෛරයක් නොමැති බවත්, ඔහු කටයුතු කර ඇති ආකාරය අවංක බව තමාට හැඟෙන බවත්ය. වෛද්‍යවරයා මුහුණ දී තිබූ කරදරය ගැන කාරණා හරි හැටි නොදන්නා තමාගේ සොහොයුරා මේ ගැන දැරුවේ වෙනත් මතයක් බව ඇය කීවාය. සැබෑ කාරණා තම සොහොයුරාට පැහැදිලි කරදීමට, ඒවා ඔහුට ඒත්තු ගැන්වීමට තමා කොතරම් උත්සාහ කළද ඒවා ඵල රහිත වූ බවද ඇය කීවාය. තමා ඔහු රඳවා ගැනීමට කොපමණ උත්සාහ කළද ඒවා පිළිනොගත් තම සොහොයුරා සිද්ධිය වූ දින සැන්දෑවේ ගෙදරින් පිටවී ගියේ වෛද්‍යවරයා හමුවී, දෙකෙන් එකක් තීරණය කරගත යුතු බව පවසමින් යයි ඇය වැඩිදුරටත් කීවාය.

තරුණ කාන්තාව මේ දක්වාම දුන් සාක්ෂි, විත්තිකරු වූ ඇගේ සොහොයුරාට අවාසි සහගත ඒවා විය. නමුත් විත්තියේ නීතිඥයා වූ හැරී හක්ස්ලි මහතා මීළඟට ඉදිරිපත් කළ ප්‍රශ්නය නිසා සාක්ෂි විභාගය වෙනත් මඟක් ගත්තේය.

හක්ස්ලි මහතා: වෛද්‍ය ඇන්තනි ඕලැන්ඩෝ ගේ මරණය ගැන ඔබේ සොහොයුරා සිඩ්නි ග්‍රැහැම් නිවැරැදිකරු බව ඔබ දන්නවාද?

ග්‍රැහැම් මෙනෙවිය: ඔව්.

හක්ස්ලි මහතා: ඔබ කොහොමද එහෙම දෙයක් කියන්නේ?

ග්‍රැහැම් මෙනෙවිය: වෛද්‍ය ඕලැන්ඩෝ මියගිහින් නැති නිසා.

නීතිඥයාගේ හරස් ප්‍රශ්න ඇසීම නැවැත්වීමට සිදුවූයේ උසාවියේ නිහඬතාවය බිඳිමින් ඇති වූ ඝෝෂාව නිසයි.



පළමු සාක්ෂිකරු වූයේ එලිසබෙත් ග්‍රැහැම් මෙනෙවියයි.





හක්ස්ලි මහතා: දොස්තර මහතා මියගිහින් නැහැ කියල ඔබ කියන්නේ කොහොමද?

ග්‍රැහැම් මෙනෙවිය: ඔහුගේ මරණය සිදුවුණා කියන දිනයට පසු දිනයේ මට ඔහුගෙන් ලිපියක් ලැබුණා.

හක්ස්ලි: මේ ලියුම ඔබ ළඟ තියෙනවද?

ග්‍රැහැම් මෙනෙවිය: ඔව්. නමුත් ඒක කාටවත් පෙන්වන්න මං කැමති නෑ.

හක්ස්ලි: ඔබ ළඟ තියෙනවද ඒකෙ ලියුම් කවරය?

ග්‍රැහැම් මෙනෙවිය: ඔව්. මේ තියෙන්නෙ.

හක්ස්ලි: තැපැල් මුද්‍රාව කොහේද?

ග්‍රැහැම් මෙනෙවිය: ලිවර්පූල්

හක්ස්ලි: එතකොට දිනය?

ග්‍රැහැම් මෙනෙවිය: ජූනි 22 වැනිදා.

හක්ස්ලි: ඔය කියන්නෙ වෛද්‍යවරයා මියගියාය කියන දිනයට පසුවදා නේද?

ග්‍රැහැම් මෙනෙවිය: ඇත්තෙන්ම ඔව්.

හක්ස්ලි: ලියුමේ අත්අකුරු ඔහුගේ කියල මේ උසාවියෙදි දිවුරා කියා හිටින්න ඔබට පුළුවන්ද?

ග්‍රැහැම් මෙනෙවිය: ඔව්.

හක්ස්ලි: (උසාවියට) ස්වාමීනි. මේ ලියුමේ අත්අකුරු දොස්තර ඕලැන්ඩෝගේ බවට සහතික කිරීමට, සාක්ෂිකරුවන් හය දෙනෙක් ඉදිරිපත් කරන්න වුණත් අපට පුළුවනි.

ෆ්‍රැන්ක් ඩෙවොන් මහතා
(පැමිණිල්ලේ නීතිඥවරයා)

ස්වාමීනි. මං කැමතියි එක් වැදගත් කරුණක් වෙත ඔබතුමාගේ අවධානය යොමු කරන්න. සාක්ෂිකාරිය ඔය තරම් සහතික කරන ලිපිය මුල ඉඳලම ඇය ළඟ තිබිල තියෙනවා. ඉන්ක්වෙස්ට් විභාගයෙදිවත්, පොලිස් උසාවියේ මූලික කටයුතු සිදුවෙද්දිවත් ඇය ඔය කියන ලිපිය ඉදිරිපත් කළේ නෑ. මේ පරීක්ෂණය වෙනත් අතකට හැරවීමට, විත්තිකරුගේ මිතුරෙකු විසින් මේ ලියුම ලියුවාද කියන්නත් බෑ. ඒ නිසා අප කැමතියි ඔය ලියමන අත්අකුරු විශේෂඥයකු ලවා පරීක්ෂා කරවා බලන්න.

විනිශ්චයකරු: ග්‍රැහැම් මෙනෙවිය. පැමිණිල්ලේ නීතිඥ මහතා කියූ දේවල් ඔබට ඇහෙන්න ඇති. ඔබ මොනවද ඒ ගැන කියන්නෙ?"

"ග්‍රැහැම් මෙනෙවිය: දොස්තර ඕලැන්ඩෝට උවමනා වුණා ඔහුගේ රහස ආරක්ෂා කරන්න.

ෆ්‍රැන්ක් ඩෙවොන් මහතා: ඉතින් එහෙනම් දැන් ඔබ මේ රහසිගත කරුණ ඇයි ප්‍රසිද්ධියට පත් කළේ?

ග්‍රැහැම් මෙනෙවිය- මගේ සහෝදරයා බේරා ගන්න.

මේ අවස්ථාවේ උසාවිය තුළ කසුකුසුවක් දිගටම අසන්නට ලැබිණ. එය නිහඬ කළ විනිශ්චයකාරතුමා විත්තියේ නීතිඥ හක්ස්ලි ඇමතුවේය.

විනිශ්චයකරු: හක්ස්ලි මහත්මයා. දැන් මෙතැන හැම දෙයක්ම පටලැවිලයි තියෙන්නේ. කෙනෙකුගේ මළසිරුර පොලීසියට හමුවුණා. ඒ වෛද්‍ය ඕලැන්ඩෝගේ කාමරයේ තිබී. ඔහුගේ මිත්‍රයන් මෙන්ම රෝගීන් කිහිප දෙනෙකු අඳුනාගත්තා, මේ මළසිරුර වෛද්‍ය ඕලැන්ඩෝගේ බවට. නමුත් විත්තියේ සාක්ෂිකාරිය පවසන අන්දමට ඔහු මියගිහින් නැහැ! දැන් මොකක්ද මෙතැන සිද්ධ වෙන්නේ? විත්ති පාර්ශ්වය විසින් කාරණා ඉතාම අසතුටුදායක තත්ත්වයකටයි ඉතිරි කර තියෙන්නේ. එක්කෝ කවුරු හරි සිතාමතාම අධිකරණය නොමග යවන්න උත්සාහ කරනවා......"

හක්ස්ලි මහතා: ස්වාමීනි. මගේ ඊළඟ සාක්ෂිකාරයා සාක්ෂි දෙද්දී ඔය අවුල් හැම එකක්ම ලිහේවි. අසතුටුදායකව තිබෙන හැම දෙයක්ම සතුටුදායක බවට හැරෙනවා. විශේෂඥ අපරාධ පරීක්ෂක ෂර්ලොක් හෝම්ස් මහතා මේ ගැටලුව විසඳා අවසන් කළා.

විනිශ්චකරු: කෝ ඔබේ මීළඟ සාක්ෂිකරු? ඔහුව කැඳවන්න.

හක්ස්ලි: මගේ මීළඟ සාක්ෂිකරු වෛද්‍ය ඇන්තනි ඕලැන්ඩෝ මහතා!

නීතිඥයාගේ මෙම ප්‍රකාශයත් සමගම උසාවිය නිශ්ශබ්ද වූයේ මීයකට පිම්බ විලසිනි. කවුරුත් ගල්ගැසී බලා සිටියේ මීළඟට සිදුවන්නේ කුමක්ද යන්නය. කෙනෙකු ඝාතනය කිරීම ගැන නඩුවක් උසාවියේ විභාග වෙද්දී, එයට සාක්ෂිකරුවකු ලෙස මිය ගියා යයි කියන පුද්ගලයාම පැමිණීම, මොන තරම් විස්මයජනක සිදුවීමක්ද?

ඉදිරියට පැමිණි සාක්ෂිකරු මුලින්ම හිස නමා විනිසුරු අසුනට ආචාර කළේය. ස්කිනර්ෆීල්ඩ්හි මෙම සාක්ෂිකරු දැක පුරුදු අයට පෙනී ගියේ, දැන් මොහු තවත් කෙට්ටු වී මුහුණේ දුක්මුසු





හැඟුමක් පළවූ බවයි. කෙසේ වෙතත් ඔහු විනිසුරුවරයාගෙන් මෙසේ විමසීය.

"ස්වාමීනි. ප්‍රකාශයක් කිරීමට මට අවසර ලබාදිය හැකිද?"

"ඔව්. ඔබට ඊට අවසර ලැබෙනවා. නමුත් ඔබ කියන දෙයක් ඔබට එරෙහිව යොදා ගන්නත් අධිකරණයට බලය තිබෙනවා."

"මගේ අවංක අධිෂ්ඨානය" සාක්ෂිකරු කීය. "කාරණා කිසිවක් සඟවන්නේ නැතිව හැමදෙයක්ම, සම්පූර්ණ සත්‍යයම, ඔබ හැම දෙනා ඉදිරියේ ප්‍රකාශ කිරීමයි.

ජූනි 21 වැනිදා රාත්‍රියේ සිදුවුණේ මොකක්ද? මේ සිද්ධිය නිසා අසරණ අයට සිත්වේදනා විඳින්නට සිදුවෙන බවක් මා දැන හිටියෙ නෑ. අලුතින් සිදුවෙන දේවල් මෙවැනි මගක් ගනීවි කියල මට හිතුණෙත් නෑ. අන්තිමේදී ෂර්ලොක් හෝම්ස් නම් මහත්මයෙක් මාව හොයාගෙන ආවා. මං ඔහුව අඳුනන්නෙත් නෑ. නමුත් උසාවිය ඉදිරියට ඒම හැර මට වෙන විකල්පයක් නැති බව ඔහු මට තේරුම් කරල දුන්නා.

ආජන්ටිනා ජනරජයේ ඉතිහාසය හොඳින් දන්නා කෙනෙකුට ඕලැන්ඩෝ කියන නම ගැන අමුතුවෙන් හඳුන්වාදීමක් උවමනා නෑ. මගේ පියා ස්පාඤ්ඤයෙන් ආජන්ටිනාවට සංක්‍රමණය වුණු පෙළපතක කෙනෙක්. හමුදාවේ ජෙනරාල්වරුන්ගෙන් පැවත ආ මගේ පියා භාෂා ගණනාවක් දැනගෙන හිටියා. රාජ්‍ය තාන්ත්‍රිකයන් අතර ජනප්‍රියව හිටි ඔහු, රජයේ ඉහළම ඇමතිකම් ගණනාවක් දැරූ කෙනෙක්. විදේශ බලවේග රටට ප්‍රහාර එල්ල කරද්දී, ඒවාට එරෙහිව රටේ හමුදාව සංවිධානය කළ, ආරක්ෂක ප්‍රධානියා මෙන්ම සේනාධිනායකයා වුණේ මගේ පියා. ඔහු තමයි ඊළඟට රටේ ජනාධිපති තනතුරට පත්වෙන්න හිටියේ. නමුත් ඇමරිකානු අධිරාජ්‍යවාදීන්ගේ මග පෙන්වීම යටතේ දේශද්‍රෝහී කොටස් එකතුවෙලා රට තුළ කැරැල්ලක් සංවිධානය කළා. හිටපු ජනාධිපති සහ මගේ පියා රට සාමකාමී කරලා රට එක් සේසත් කරලයි තිබුණේ. නමුත් බල තණ්හාවෙන් සිටි ඇමතිවරයෙකු යොදාගෙන ඔවුන් කැරැල්ලක් ඇතිකළා. එදා අත්අඩංගුවට ගැනුණු මගේ පියා සහ මව හිරගෙදරදී ඝාතනය කෙරුණා. අපට අයිතිව තිබුණු දේපළ ගැන බොරු නඩු පවරලා, මේ දූෂිතයන් ඒවා මංකොල්ල කෑවා.

මේකෙන් මා සහ මගේ සොහොයුරා වූ ජෝජ් සම්පූර්ණයෙන්ම අසරණ වුණා. හොඳ අධ්‍යාපනයක් ලබා තිටී අපේ ජීවිත අඳුරු වුණා. ජීවත්වීම සඳහා මට කම්කරු රැකියාවක් වත් සොයා ගැනීමට සිදුවුණා.

ස්වාමීනි. මේ තොරතුරු මගේ පාපෝච්චාරණයට අදාළ නොවෙනවා වගේ පෙනෙනවා නම් මට සමාවෙන්න. නමුත් මට කියන්න තියෙන කථාන්තරය ඔබට පැහැදිලිව තේරුම් ගැනීමට හැකිවෙන්නට, මම මේ දේවල් කිවයුතුමයි.

මං ඔබට කලින් කිව්වා වගේ මට හිටියේ ජෝජ් නම් එකම සොහොයුරෙක් පමණයි. ඔහු මගේ නිවුන් සොහොයුරා. අප දෙදෙනාට තිබුණේ හැම අතින්ම එක සමාන පෙනුමක්. අප දෙදෙනා එක ළඟ සිටින විට අප අතර කිසිම වෙනස් කමක් කාටවත් පෙනුණේ නෑ. නමුත් අප වයසෙන් වැඩෙද්දී මේ සමාන කම් ක්‍රමයෙන් අඩුවුණා. අපේ සිත්වල තිබූ ආකල්ප, ඒවායින් ඇතිවූ හැඟීම් පිටතට ප්‍රකාශවුණු ආකාරය, ඒකට හේතුව වෙන්නත් ඇති.

මගේ සොහොයුරා දැන් මියගිහින් නිසා ඔහුගේ දුර්ගුණ දිගින් දිගටම කීම සුදුසු නැහැ කියලයි මට හිතෙන්නේ. කොහොම නමුත් ගැටවර වයසේ සිටම මගේ හිතේ ඔහු ගැන තිබුණේ භය මිශ්‍ර පිළිකුල් සහගත හැඟීමක්. ඒකට හේතු වුණේ ඔහු යෙදුණු දුශ්චරිත ක්‍රියා. අප දෙදෙනාගේ පෙනුමේ සමාන කම නිසා, බොහොම වෙලාවට මේ දූෂ්‍ය අවිනීත ක්‍රියා ගියේ මගේ කර පිටින්. ඒ බව ජෝජ් හොඳින් දැන හිටියා. ඒ හින්දාම හොඳ මිනිහෙක් වෙන්න ඔහුට කිසිම උවමනාවක් තිබුණේ නෑ. බේබදු මැරවර යහළුවන් සමග එකතුව සිටි ඔහු, කූට ව්‍යාපාරවලින් මුදල් උපයා ගත්තා. ඒවා රේස් පිටියේ නාස්ති කළා. අන්තිමේදී ඔහු යෙදුණු නින්දිත, තිරිසන් කටයුත්තක වගකීම මා පිට පටවලා ඔහු මගහැරියා. මා කිසිම ආකාරයකින් සම්බන්ධ නොවූ ඒ ලැජ්ජා සහගත ක්‍රියාව ගැන චෝදනාව මට එල්ල වෙද්දී මං මොකක් කරන්නද? රටෙන් පැන යාමට මං තීරණය කළා.

යුරෝපය වෙත වෙඩිලුණු ගෙන යෑම සඳහා ස්කොට්ලන්තයේ සිට නැව් ආජන්ටිනාව බලා එනවා. වෙඩිලුණුවලට ගිනි ඇවිලී නැවම පුපුරා විනාශ වීමේ අවදානමක් තියෙනවා. ඒ නිසා





මෙ නැව්වල මගීන් ගෙනයාම තහනම්. ඒ වුණත් මේ නැව්වල කපිතාන්වරු තමන්ට මුදලක් උපයා ගැනීමෙ අරමුණෙන්, මගීන් දෙතුන් දෙනෙකුට ගමන් පහසුව සලසන්න අකැමැති නෑ. සාමාන්‍ය මගී නැවක තරම් පහසුකම් නැතිවුණත්, මේ නැවකින් හුගක් අඩු මුදලකට ප්‍රවාහන පහසුකම ලබාගැනීමේ හැකියාව තිබුණා.

ඉතින් මං ආජන්ටිනාවේ සිට ස්කොට්ලන්තයට ආවා.

කුඩා කාලයේ සිටම මගේ ආශාව වුණේ වෛද්‍යවරයෙකු වීම. නමුත් ස්කොට්ලන්තයට ආවාට පසු ඒකට ප්‍රමාණවත් තරම් මුදලක් මා ළඟ තිබුණේ නෑ. අර්ධකාලීනව රැකියාවක් කරන ගමන් තමයි මං ග්ලාස්ගෝ වෛද්‍ය විද්‍යාලයට බැඳුණේ. එහිදී මට ශිෂ්‍යත්වයකුත් ලැබුණා. අන්තිමේ වෛද්‍ය උපාධිය ලබලා මං ලැංකැෂයරයට ආවේ, මගේ ජීවිතය අප්‍රසිද්ධව ගෙවන්න. මගේ මල්ලී ජෝජ්ට කවදාවත් මා ගැන අහන්න ලැබේවි කියල මං හිතුවෙ නෑ.

අවුරුදු ගණනාවක්ම මගේ ඒ බලාපොරොත්තු ඒ විදියටම ඉටුවුණා. නමුත් බුවනෝස් අයිරිස් නගරයට ගිය ලිවර්පූල් වැසියෙකුට ජෝජ්ව හමුවී තිබුණා. ඒකෙන් ඔහුට මා ගැන දැනගන්න ලැබිලා. තමන් ළඟ තිබූ මුදල් සම්පූර්ණයෙන්ම අවසන් වෙලා, ඔහු සිටියේ හතර අතට ණය වෙලාලු. එතකොට ඔහු සිතුවාලු එංගලන්තයට ඇවිත්, මගේ දේපළ හවුලේ භුක්ති විඳින්න. මං ඔහු ගැන භීතියට හා පිළිකුලට පත්ව සිටි බව ඔහු දැන හිටියා. ඒ නිසා තමන්ව නිශ්ශබ්දව තබන්න, මගෙන් මුදලක් අය කරගන්න ඔහු බලාපොරොත්තු වෙන්න ඇති.

මා සොයාගෙන ඔහු පැමිණෙන බව දන්වා මට එවූ ලියුම මා අතට පත්වුණා. මා ග්‍රැහැම් මෙනෙවිය සමග විවාහ ගිවිසගෙන ඉදිරියේදී විවාහ වීමේ අරමුණෙන් හිටියේ. මෙවැනි අවස්ථාවක ඔහුගේ පැමිණීම මට මහ කරදරයක්. පළාතේ ප්‍රභූවරුන් වන ග්‍රැහැම් පවුලට අවමානයක් නොවෙන විධියට මල්ලී ගැන තොරතුරු සඟවා ගන්නත් මට සිදුවී තිබුණා. අප දෙදෙනා අතර සම්බන්ධය ටික කාලයකට නැවැත්වීමට මා කැමති බව, ග්‍රැහැම් මෙනෙවියට මා ඇනුම් දුන්නා. එසේ කළේ මගේ මල්ලී නරක ලෙස හැසිරී ප්‍රශ්නයක් ඇති කරගත්තොත් ඒක ඇයට ප්‍රශ්නයක් වෙන නිසා.

ඔහුගේ ලියුම මට ලැබිලා බොහොම දවසක් ගතවුණා. එදා රෑ එක්වරම ඔහු හදිසියේම ආව නේද මගේ ගෙදරට.

සේවක සේවිකාවන් නින්දට ගියාටත් පස්සේ, මට නිවසට ළඟාවෙන බොරලු පාර දෙසින් ශබ්දයක් ඇහුණා. ඒ වෙලාවෙ මං මගේ කාමරය ඇතුළෙ හිටියෙ පොතක් කියවමින්. මඳ වේලාවකින් මට ජනේල වීදුරුවෙන් ඔහුගේ මුහුණ දකින්න ලැබුණා. ඔහු මා දිහා දෙනෙත් යොමුකරගෙනයි හිටියේ. ඔහුත් මා වගේම සම්පූර්ණයෙන්ම රැවුළ බා හිටියේ. ඔහුගේ මුහුණේ පෙනුම මගේ පෙනුමට කොයිතරම් සමානද කිව්වොත්, වීදුරුවේ මේ පේන්නේ මගේම ප්‍රතිබිම්බයද කියලා මට එක් මොහොතකට හිතුණා. ඔහුගේ එක් ඇසකට උඩින් රඳවාගෙන සිටි පැලැස්තරයක් ඇරෙන්න අප දෙදෙනාගේම මුහුණුවල තිබුණේ එක සමාන පෙනුමක්.

ඔහු මා සමඟ සිනාසුණා. එහි තිබුණේ උපහාසාත්මක බවක්. ඕලන්ඩෝ නම් අපේ ගෞරවනීය පෙළපත් නාමයේ ඇලි ගෑ, මට උපන් බිම අත් හැර දමා හොරෙන්ම පලා ඒමට කටයුතු සම්පාදනය කළ තක්කඩියා මොහු නොවේද කියන හැඟීම, එක්වරම මගේ සිතට නැගුණා. නමුත් මං දොර විවෘත කර ඔහුව ඇතුළට ගත්තා. එතකොට වෙලාව රෑ දහය පමණ වෙන්න ඇති.

ඔහු ගිනි උදුනට සමීප වුණාමයි ජෝජ්ගේ පෙනුම මට හරිහැටි දකින්න ලැබුණේ. ඔහු ඉතාම දුක්ඛිත කාල පරිච්ඡේදයකට මුහුණ දී ඇති බව මට වැටහුණා. ඔහු ලිවර්පූල් සිට ස්කිනර්ෆීල්ඩ් දක්වා සම්පූර්ණ දුරම ඇවිත් තිබුණේ පයින්. ඒ නිසා දැඩි ලෙස විඩාපත්ව සිටියා. ඔහුට තිබුණේ රෝගී පෙනුමක්. ඔහුගේ මුහුණේ පෙනුමෙන් මා තැතිගත්තා. ඊට හේතුවුණේ මගේ වෛද්‍ය දැනුමෙන් හා පළපුරුද්දෙන් මට අවබෝධ වුණු කාරණය. ඒ තමයි මොහු යම්කිසි බරපතළ රෝගයකට ගොදුරු වී සිටින බව. ඊට අමතරව ඔහුගේ මුහුණේ, බෙල්ලේ හා අත්වල තිබූ තැළීම් හා තුවාල. නැවෙන් එද්දී නාවිකයන් සමඟ ඔහු අඬදබර ඇතිකරගත් නිසා ඔවුන් පහර දීමෙන් ඇතිවුණු තුවාල තමයි එලෙස දක්නට ලැබුණේ. ඇසක් වැසෙන්න ඔහු පැලැස්තරයක් දමාගෙන හිටියෙත් එම අරගලයකදී වැදුණු පහරක් නිසා. ඔහු හැඳගෙන සිටියේ නාවිකයන් අඳින වර්ගයේ ඝන රළු පිට කබායක්. ඊට ඇතුළතින් ඔහු ෆ්ලැනල් කමිසයක් ඇඳ හිටියා. ඔහුගේ පාවහන් හොඳටම දිරාගොස් පුපුරා





"......... ජනේල වීදුරුවෙන් ඔහුගේ මුහුණ දකින්න ලැබුණා........."

තිබුණේ, පාඇඟිලි එළියට පනින ආකාරයට. ඒ ඔක්කොටම හරියන්න ඔහු සිටියේ බීමත්ව.

තමන් දුප්පතෙකු වීම ගැන ඔහු වෛරය ඇති කරගෙන තිබුණේ මා සමගයි. ඔහු එදා ද්වේශයෙන් කෝපාවිෂ්ඨ වෙලා හැසිරුණේ වියරුවෙන් වගේ. තමන් ආජන්ටිනාවට වෙලා බඩගින්නේ පණ අදිමින් සිටියදී, මං එංගලන්තයට වෙලා සුර සැප විඳිමින් සිටි බවයි ඔහු කිව්වේ. ඔහු එවේලේ මට කළ නින්දා, අපහාස, තර්ජන, බියගැන්වීම හා ශාප කිරීම ගැන මේ වෙලාවේ මං ඔබට කියන්න යන්නේ නෑ. දිගින් දිගටම දුක් කරදරවලට මුහුණ දීමට සිදුවීම නිසා, ඔහුගේ මොළයේ යම් වියරු තත්ත්වයක් ඇතිවුණා වෙන්නත් පුළුවනි. මගෙන් මුදල් සහ මත්පැන් ඉල්ලා මට තර්ජනය කරමින් ඔහු කාමරයේ ඉහළ පහළ ඇවිද්දේ වියරු වැටුණු කැලෑ සතෙකු වගේ. මමත් බොහොම කේන්ති යන කෙනෙක්. නමුත් මේ වෙලාවේ මගේ කේන්තිය පාලනය කරගන්න හැකිවීම ගැන මම දෙවියන්ට ස්තූති කරනවා. ඔහුට එරෙහිව මම එක අතක් එසෙව්වේ නැහැ.

ඔහුගේ තර්ජන ගර්ජන කිසිවකින් මා නොකැලඹුණු එක ඔහුට රිස්සුවේ නෑ. ඔහු තමන්ගේ අතේ මිට මොළොවා මගේ මුහුණට ළංකොට මට ඉතා පහත් අන්දමින් ශාප කළා. එක්වරම ඔහුගේ මුහුණ විරූපී වී ගියා. ඔහු දකුණු අත තම පපුවේ වම්පසට තද කරගෙන මා ඉදිරියේ ඇද වැටුණේ කටෙන් භයානක ශබ්දයක් පිට කරමින්.

මං ඔහුව ඔසවලා සෝපාවේ හාන්සි කළා. ඔහුට වැලඳුණේ හෘදයාබාධයක් බව මට වැටහුණා. මං ඊට ප්‍රථමාධාර දුන්නත් වැඩක් වුණේ නෑ. ඔහු ජීවිතක්ෂයට පත්වුණේ ඔහුගේම කෲර කම නිසායි.

කිසිදෙයක් හිතාගන්න බැරුව මං සෑහෙන වෙලාවක් ගල්ගැසී හිටියේ සිහිනයක් දකින කෙනෙකු වගේ. මගේ දෙනෙත් යොමු වී තිබුණේ මගේ සොහොයුරාගේ මළසිරුර වෙත. මං එක්වරම තිගැස්සී අවදි වුණා. ඒ පෝටර් මහත්මිය දොරට ගැසූ හඬෙන්. මගේ සොහොයුරා මරු වික්ලලෙන් නැඟූ විලාපය ඇසී ඇය කැලඹී තිබුණා. මං වහාම ඇයව නින්දට යැව්වා. මඳ වේලාවකට පස්සේ මගේ ශල්‍යාගාරයේ දොරට රෝගියෙකු තට්ටු කළ හඬ





"......... මුදලුත් අරගෙන පිටුපසින් තිබූ මගකින් තරන්න පාරකට පිවිසුණා......"

අහන්න ලැබුණා. මං එය ගණන් නොගත් නිසා ඔහු හෝ ඇය යන්න ගියා.

මා සිටියේ මා මීළඟට කුමක් කළ යුතු දැයි කල්පනා කරමින්. මෙයට යෙදිය හැකි සාර්ථක උපක්‍රමයක් ගැන හෙමින් හෙමින් මගේ සිතට නැඟුණා. මා ගත යුතු ක්‍රියාමාර්ගය ගැන මගේ සිතට අවබෝධ වුණා.

මගේ සොහොයුරා අනපේක්ෂිත ලෙස ස්කිනර්ෆීල්ඩ් වෙත පැමිණ, ජීවිතක්ෂයට පත්වීමෙන් මං වැටුණේ ලොකු අමාරුවක. අනාගතය සඳහා මං කරගෙන තිබූ සැලසුම් බිඳ වැටුණා. ඔහු කර තිබූ සියලු නින්දිත වැඩ එළිවී මහ හුටපටයක් වීම වළක්වන්න බෑ: මා ගොඩනගාගෙන තිබූ කීර්ති නාමය බිඳ වැටී මං වැටෙන්නේ ලොකු අමාරුවක. මං මෙතැනදී අසාමාන්‍ය ලෙස සංවේදී වුණාද කියා මට කියන්න බැහැ. නමුත් ස්කිනර්ෆීල්ඩ් ගමෙන් පැන ගියොත්, මේ අපකීර්තියෙන් මිදෙන්න පුළුවන් කියා මට හිතුණා. ඒ සඳහා අනගි අවස්ථාවක් මා වෙත ළඟාවී ඇති බවත් මට තේරුම් ගියා.

පෙනුමෙන් මට සමාන ජෝජ්ගෙ මළසිරුර සෝපාව මත තිබුණා. ඔහුගේ මුහුණේ තිබූ රළු බවක් හා රෝගී පෙනුමක් ඇරෙන්න, අප දෙදෙනා අතර විශාල වෙනසක් කෙනෙකුට දැකගන්න අමාරුයි. ඔහු මගේ ගෙදරට ආව බව කිසිවෙකු දැක තිබුණේ නෑ. ඒ නිසා ඔහුට මොකක් වුණාද කියා විමසන්න කෙනෙකුත් නෑ. අප දෙදෙනාම සම්පූර්ණයෙන්ම රැවුළ බා සිටි අය. දෙදෙනාගේම කෙස්වැටි දික්වී තිබුණේ බොහෝ දුරට එකම ප්‍රමාණයට. ඉතිරිව තිබුණේ මගේ ඇඳුම් ඔහුට අන්දවා ඔහුගේ ඇඳුම් මා ඇඳගැනීම පමණයි. එතකොට වෛද්‍ය ඇන්තනි ඕලැන්ඩෝ කාමරය තුළ මියගිහින් සිටින ආකාරය ඔවුනට දකින්න ලැබේවි.

කාමරයේ මා මුදල් ළඟ තබාගන්නා පෙට්ටියේ ලොකු මුදලක් තිබුණා. මේ මුදලත් අරගෙන වෙනත් රටකට ගිහිං, යළිත් වරක් වෙදකමක් පටන් ගැනීමට මට බැරිවෙන එකක් නැහැ කියා මට හිතුණා. සොහොයුරාගේ ඇඳුමෙන් මට ලිවර්පූල් දක්වා ඇවිද යාමට බාධාවක් වෙන්නේ නෑ. එතැනින් විදේශයකට යන කුමක් හෝ නැවකට නැගී මේ රටෙන් හැකි ඉක්මනින් පැන යාමයි මා කළ යුත්තේ.





හැම දෙයක්ම විස්තර කරන්න මං උත්සාහ කරන්නේ නෑ. මට අත්‍යවශ්‍ය වෙන සියලුම දේ සහ මුදල් මං ගමන් මල්ලක අසුරා ගත්තා. වත්තේ පිටුපසින් තිබූ මගකින් ගම හරහා වැටුණු කරත්ත පාරකට මං පිවිසුණා. මීළඟට වතුපිටි හා කුඹුරු මැදින් තිබූ මාර්ගවලින් ලිවර්පූල් වෙත ළඟාවීමට මට ගතවුණේ පැය කිහිපයයි. මගේ මුදල්වලට අමතරව මේසය මත තිබූ එක්තරා ඡායාරූපයකුත් මගේ මල්ලට දමා ගත්තා. මට අමතක වුණේ ජෝජ්ගේ ඇස වටා දමා තිබූ පැලැස්තරය පමණයි.

ස්වාමිනි. මං ඔබට මේ කාරණය දිවුරා කියන්නම්. කවුරුත් හෝ මාව මරා දමලා කියා මහජනතාව කැලඹීමට පත්වේවි කියන සිතිවිල්ල, එක් මොහොතකටවත් මගේ සිතට නැඟුණේ නෑ. ඒ මරණය ගැන සැක හිතිලා තවත් කෙනෙකු භයානක ලෙස මිනීමැරීමේ චෝදනාවට ලක්වේවි කියලා කිසිම විදියකින් මට හිතුණේ නෑ. ඇත්තෙන්ම මගේ හිතට නැඟුණු ප්‍රධානම කාරණයක් වුණේ මෙයයි. මා මෙහි රැඳී සිටීමෙන් අනික් අයගේ ජීවිතවලට තිබූ පීඩනය ඉවත් කිරීම.

මේ රටෙන් පිටවී යන්න හිතුවාම එක්වරම මගේ හිතට නැඟුණේ මගේ මව්රට වූ ආජන්ටිනාව. නමුත් දස දහස් ගණනක් ජීවිත පරිත්‍යාග කරලා බේරාගත් රට දැන් පාලනය කරන්නේ කවුද? ඒ අධිරාජ්‍යවාදීන්ගේ මුදල්වලට කෑදරකමට අපේ ජාතියම පාවා දුන් ද්‍රෝහීන්. ඕලැන්ඩෝ කියන නමටත් ඔවුන් බයයි. ඒ නිසා මා යා යුත්තේ ස්පාඤ්ඤයට බව මං දෙවනුව තීරණය කළා. ස්පාඤ්ඤය හරහා කැසබ්ලංකා වෙත යාත්‍රා කරන නැවක් මට මඟ හැරී තිබුණේ පැය ගණනකින්. ස්පාඤ්ඤයේ කොරුනා වරාය බලා යාත්‍රා කරන නැවක් දින තුනකින් ඒමට නියමිතව තිබුණු නිසා මං හෝටලයක ලැගුම් ගත්තා.

නමුත් ඊළඟට මට මතක් වුණා එක් පුද්ගලයෙකු ගැන. ඇය මා ගැන සිතා වැලපෙන බව ස්ථිරයි. මං මේ විදියට කටයුතු කළේ ඇයි කියන එක ඇය තේරුම් ගනීවි. නමුත් ඇයගේ සිතට එක පැයක කාලයක් වත් දුකක් දෙන්න මට සිතුණේ නෑ. ඉතින් මං වහාම ඇය වෙතට ලියුමක් ලිව්වා. ඒ ලියුම ගැන තමයි ඇය උසාවියෙදි සඳහන් කළේ.

කොහොම වුණත් ෂර්ලොක් හෝම්ස් නම් මහත්මයෙක් මා හමුවීමට හෝටලයට ආවා. තමන් සත්‍යය හෙළි කරගෙන ඇති

බවත්, නඩුව විභාගවෙද්දී තමන් උසාවියට එම කාරණා ඉදිරිපත් කරන බවත් ඔහු කිව්වා. ඒ නිසා කළ යුතු හොඳම දේ රටෙන් පැනයාම නොව, මේ සිද්ධියට නිර්භයව මුහුණදීම බව ඔහු මට තේරුම් කරල දුන්නා. ඒ නිසයි මං ආපසු එන්න තීරණය කළේ"

ඒ සමගම වෛද්‍ය ඕලැන්ඩෝ ඝාතනය ගැන ඇතිවූ මහා ආන්දෝලනය අවසන් විය. එදා සවස දුම්රියෙන් අපි ලන්ඩනය බලා ඒමට පිටත්වූයෙමු.

* * *

"හෝම්ස් මහත්මයා" පොලිස් පරීක්ෂක ඇතල්නි ජෝන්ස් කීවේ සුරුට්ටුවක් දල්වා ගනිමිනි. "ඇත්තම කිව්වොත් මට නම් මේකෙ අගක් මුලක් වැටහුණේම නැහැ. මියගොස් සිටි පුද්ගලයා දොස්තර ඕලැන්ඩෝ නොවන බව ඔබ කොහොමද තේරුම් ගත්තේ?"

"මං කළ නිරීක්ෂණ කිහිපයකදීම ඒ බව මට පෙනී ගියා. මෙම නිරීක්ෂණ කරන්න විශේෂඥ අපරාධ පරීක්ෂකයකු අවශ්‍ය නැහැ. මේවා සාමාන්‍ය පොලිස් නිලධරයකු විසින් කළ යුතු මූලික නිරීක්ෂණ"

"ඒ මොනවද?"

"එයින් කිහිපයක් විතරක් මං කියන්නම්" හෝම්ස් කීය. "මියගිය තැනැත්තා හැඳගෙන සිටි කලිසම ඔහුට ඉතාම 'හිර' බව මට පෙනී ගියා. ඔහුගේ හිණේ සත්‍ය ප්‍රමාණය අඟල් 37-38 පමණ. නමුත් ඔහු හැඳ සිටියේ අඟල් 34 ක පමණ හිණක් තිබෙන කලිසමක්. මේක වෙන්න පුළුවන්ද? මගේ සිතේ සැකයක් ඇති කළ පළමුවැනි කරුණ එයයි.

මට දකින්න ලැබුණු තවත් දෙයක් තමයි, මියගිය තැනැත්තා වම් අත හුරු අයෙකු බව. ඒ කරුණ මං නිගමනය කළේ කොහොමද? ඔහුගේ දකුණු අතේට වඩා වම් අතේ මාංශ පේශි වැඩියෙන් වර්ධනය වී තිබුණා. නමුත් වෛද්‍ය ඕලැන්ඩෝ සමග ඉඳහිට හෝ ටෙනිස් ක්‍රීඩාවේ යෙදුණු ඇලෙක්ස් කැම්බල් නීතිඥ මහත්මයා මට කිව්වේ වෛද්‍යවරයා දකුණු අතින් ටෙනිස් ක්‍රීඩා කළ බව. සමහර ටෙනිස් ක්‍රීඩකයන්ගේ අත් දෙකේම මාංශ පේශි සමාන තරමට වර්ධනය වී ඇති බව සත්‍යයක්. නමුත් දකුණු අතේ වැඩියෙන් වර්ධනය වීම පෙන්වන්නේ දකුණත් ක්‍රීඩකයකු බවයි.





මුලින් කවුරුත් හිතුවේ මරණයට හේතුව හුස්ම හිර කිරීම නිසා සිදු වූ එකක් වෙන්න ඇති කියලයි. ඒකට හේතුව ආයුධයකින් සිදු කළ තුවාල වැනි යමක් මළසිරුරේ දක්නට නොලැබුණු නිසා. ඔහු මියගිහින් තිබුණේ හුස්ම හිරවීමෙන් නොවන බව මගේ මිත්‍ර දොස්තර වොට්සන්ටත් බැලූ බැල්මටම වැටහෙන්න ඇති.

ඒ කාරණය ගැන සහතික වෙන්නයි, පශ්චාත් මරණ පරීක්ෂණය කළ මහාචාර්ය බේලි හමුවෙන්න මට උවමනා වුණේ. මං හිතූ ආකාරයටම මරණය හුස්ම හිරවීමෙන් සිදුවූ එකක් නොව හෘදයාබාධයකින් සිදුවූ එකක් බව මහාචාර්යතුමා සහතික කළා.

ඊට අමතරව මියගිය තැනැත්තා දීර්ඝ කාලයක් අධික ලෙස මත්පැන් පානය කිරීම නිසා ඔහුගේ අක්මාවටත් බරපතළ ලෙස හානි සිදුවී තිබූ බව මහාචාර්යතුමා පැවසුවා. නමුත් ඔහුගේ මිතුරන් කියන හැටියට වෛද්‍ය ඕලැන්ඩෝ කියන්නේ උත්සව අවස්ථාවකදී පමණක් බීර හෝ වයින් ස්වල්පයක් තොල ගාන කෙනෙක්. එතකොට මෙවැනි වෙනසක් සිදුවුණේ කොහොමද?

මෘත ශරීරාගාරයේ සේවකයා මියගිය පුද්ගලයාගේ ඇඳුම් වෙන්කොට තබා තිබුණා. මම ඒවාත් පරීක්ෂා කළා. දිග කලිසම ලිවර්පූල්හි මැසූ එකක් වුණත් අනෙක් ඇඳුම් කිහිපයකම තිබුණේ ආජන්ටිනාවේ මැසූ බවට ලේබල්.

මෙහෙම දේවල් සිදුවුණේ කොහොමද? මේ හැම කාරණයක්ම පෙන්නුම් කළේ මියගිය පුද්ගලයා වෛද්‍ය ඕලැන්ඩෝ විය නොහැකි බව. එහෙනම් ඔහු කවුද? වෛද්‍යවරයාට ආජන්ටිනා මුද්දරය සහිත ලියුමක් ලැබූ බව ස්කිනර්ෆීල්ඩ් තැපැල් ස්ථානාධිපති තුමා කියා තිබුණා. ඒ නිසා මං වරායට ගිහිං සොයා බැලුවා. බුවනෝස් අයිරිස් සිට ආව නෞකාවක් ලිවර්පූල් වෙත ළඟාවී තිබුණේ ජූනි 20 වැනිදා. ඒ කියන්නේ මේ සිදුවීම වුණු දිනයට කලින් දිනයේ. මේ නැවේ අලුත්වැඩියා කටයුතු කිහිපයක් සිදුවෙමින් තිබූ නිසා එය මේ වනවිටත් පිටත් වී ගිහින් තිබුණේ නැහැ. නැවේ පැමිණි මගීන්ගේ ලේඛනය මං පරීක්ෂා කළා. එහි තිබුණා බුවනෝස් අයිරිස් වලින් නැවට නැගුණු ජෝජ් ඕලැන්ඩෝගේ නම. මත්පැන් අධිකව පානය කරලා නාවිකයන් සමඟ සණ්ඩු සරුවල් කරගත් මේ පුද්ගලයා ගැන ඔවුනට හොඳට මතක තිබුණා. මෙම පුද්ගලයාට හදවතේ ආබාධයක් තිබී එයට තමාගෙන් ප්‍රතිකාර ගත් බවත් නැවේ වෛද්‍යවරයා මා සමඟ කිව්වා.

ඉතින් මේ මියගොස් සිටින්නේ වෛද්‍යවරයාගේ සොහොයුරා ජෝජ් ඕලැන්ඩෝ මිස වෛද්‍යවරයා නොවෙන බව මම පහසුවෙන් තේරුම් ගත්තා."

"ඔහු සැඟවී සිටි තැන ඔබ සොයා ගත්තේ කොහොමද?" මම ඇසීමි.

"ලිවර්පූල් නගරයේ නවාතැන් පහසුකම් සපයන හෝටල් විසි ගණනක් තියෙනවා." හෝම්ස් කීය. "එයින් වැදගත් මහත්වරු නවාතැන් ගන්නා විදියේ ඒවා තියෙන්නේ හතරයි. මං ඒ සැම එකකම සොයා බැලුවා. කළු පැහැති කොණ්ඩයක් සහ දුඹුරු සමක් ඇති පිලිප් මුවර් නම් තැනැත්තෙකු කාමරයටම වී සිටින බවත්, ඔහු එහි නවාතැන් ගෙන තිබුණේ ජුනි 22 වැනිදා බවත් මට සොයා ගැනීමට හැකිවුණා. සැම කෑම වේලක්ම ඔහු ගත්තේ කාමරයට ගෙන්වා ගෙනලු. ඔහුට වේටර්වරයෙකු අතේ මං ලියුම් කැල්ලක් යැව්වා. ඒ දැන් සැම දෙයක්ම හෙළිවී ඇති බවත් එලිසබෙත් හා සිඩ්නි ග්‍රැහැම් ගේ යහපත තකා ඔහු උසාවියට පැමිණ ප්‍රකාශයක් කළ යුතු බව සඳහන් කරමින්. වෛද්‍යවරයා ඊට එකඟ වුණා" හෝම්ස් කථාව අවසන් කළේය.

ඊට තුන් මාසයකට පමණ පසු "මෝනිං පෝස්ට්" පුවත්පතේ පළවී තිබූ පුවතක් වෙත හෝම්ස් මගේ අවධානය යොමු කළේය.

"ලැංකැෂයර් ප්‍රාන්තයේ ස්කිනර්ෆීල්ඩ්හි ලැංකැස්ටර් මන්දිරයේ විසූ සාමදාන විනිශ්චයකාර ජෝන් එඩ්වඩ් ග්‍රැහැම් සහ සේරා ග්‍රැහැම් යුවළගේ එකම දියණිය එලිසබෙත් ඇලෙක්සැන්ඩ්‍රා ග්‍රැහැම් මෙනෙවිය සහ ආජන්ටිනා ජනරජයේ හිටපු සේනාධිනායකයා වූ දොන් රොනාල්ඩෝ ඕලැන්ඩෝ මහතාගේ පුත් වෛද්‍ය ඇන්තනි ඉග්නේෂියස් ඕලැන්ඩෝ අතර විවාහය අති උතුම් හොරේෂියස් හාට්ලි දේවගැතිතුමන් විසින් සැප්තැම්බර් 30 වැනිදා ලිවර්පූල්හි කිංස්ක්‍රොස් දෙව්මැඳුරේදී ආගමික චාරිත්‍රානුකූලව සිදුකරන ලදී"



# චොරික්ෂයරයේ අන්දැකීමක්

"වොට්සන්. ඔබට මතකද අපි දෙන්නා මුලින්ම හමුවුණු දවස?" එක් දිනක් මගේ මිත්‍රයා විමසුවේය.

"ඇයි මතක නැත්තෙ. මට හොඳට මතකයි. ඇයි මේ වෙලාවෙ ඒ කාරණය ඔබේ ඔළුවට ආවෙ?" මම ඇසීමි.

"එදා සඟරාවක පළවෙලා තිබුණු ලිපියක් කියවලා, ඒක ලියූ පුද්ගලයා පළකර තිබූ අදහස් ඔබ විවේචනය කළා නේද?"

"ඔව් මට හොඳට මතකයි ඒක" මම හඬ නගා සිනාසුණෙමි. "ඒක ලියූ තැනැත්තා ඔබ බව මං දැනගෙන හිටියෙ නැහැනේ. අනික් කාරණය........"

"ඔව්........?"

"එදා ඔබ කිව්ව මේ ලෝකෙට ඉන්න එකම විශේෂඥ අපරාධ පරීක්ෂකයා ඔබ බව. එහෙම නේද?"

"ඔව්"

"ඒ කතාවට මට යටි හිතෙන් හිනාත් ගියා. ඒ මොකද එහෙම වෘත්තියක් ගැන මං ජීවිතේටම අහල නොතිබුණු නිසා. මොකක් නිසාද ඔබට ඔය පරණ කතන්දර ඇදල ගන්න හිතුණෙ?" මා විමසුවේ පරණ දේවල් යළිත් මෙනෙහි කිරීම මගේ මිත්‍රයා වෙතින් මා එතරම් දැක නොතිබූ නිසාය. මගේ ප්‍රශ්නයට පිළිතුරු ලෙස ඔහු අපේ විසිත්ත කාමරයේ පොළොව දෙසට අත දිගු කොට පෙන්වීය. එහි තිබුණේ පිටු ලිහී විසිරී තිබූ පුවත්පත් රාශියකි.

"වොට්සන්. ඔබ දන්නවා අපේ පුවත්පත් වල මට වැදගත් වන තොරතුරු ගැඹුරටම කියවීම මගේ සිරිතක් බව. එහෙම බලද්දී දැන් මට නිතර දකින්නට ලැබෙන එක්තරා දෙයක් තියෙනවා. ඒ තමයි මා විසින් අරඹන ලද, මා විසින්ම නිර්මාණය කරන ලද ක්‍රමානුකූලව රහස් පරීක්ෂණය කිරීමේ කාර්යය........"

"........ඔව් ඉතින්?"

"ඒ කාර්යය තවත් බොහෝ දෙනෙකු විසින් අරඹා ඇති බව."

"ඒ කියන්නෙ ඔබ අනුකරණය කරන පිරිස වැඩිවෙලා?"

"ඇත්තෙන්ම ඔව්. බලන්න ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක බ්ඩ්ල්ට අභිරහසක් විසඳන්න මැක්ස් කැරඩොස් නම් රහස් පරීක්ෂකයා උදව් කරලා තියෙනවා. ඇල්බටෝ ස්ට්‍රාඩා මංකොල්ලය විසඳන්න මාටින් ගිල්බට්ගේ උදව් ලැබිල තියෙනවා. ඒ කාලෙ හිටි රහස් පරීක්ෂක ඔගස්ටේ ඩූපින් වගේ රහස් පරීක්ෂක ආසෙන් ලුපින් නම් අලුත් කෙනෙක් ඇවිත්. දැන් රහස් පරීක්ෂණයේ යෙදෙන රාජ කුමාරවරුත් ඉන්නවා........"

"ඒ කවුද?"

"සැලෙස්කි නම් කුමාරයෙකු ගැන පුවත්පත්වල පළ වී තිබුණා. එතකොට ආගමික කටයුතු කරන පියතුමන්ලා, පාර අයිනේ වාඩිවෙලා තූල්වල ගැට දමමින් කාලය ගත කරන අය පමණක් නෙමෙයි; කාන්තාවනුත් රහස් පරීක්ෂණය පටන් අරගෙන. මේ හැමදේකටම ප්‍රධාන වගකිවයුත්තා ඔබයි වොට්සන්"

"මොනවා? ඒ කොහොමද?"

"මගේ රහස් පරීක්ෂණ ගැන ඔබ සඟරා වලට ලියූ ලිපි නිසා තවත් අයටත් උවමනා වෙලා රහස් පරීක්ෂකයන් වෙන්න"

"ඉතින් ඒ ගැන ඔබේ හිතේ කැමැත්තක් නැද්ද හෝම්ස්?"

"මගේ රහස් පරීක්ෂණ විධි නිවැරැදිව අනුගමනය කරමින් ඔවුන් ඒ වෘත්තියට පිවිසෙනවාට මගේ තරහක් නෑ........ කොහොම වුණත් මට ලැබෙන අනුග්‍රාහකයන් මේ හැමදෙනෙකු අතරේ බෙදී යනවා කියන්නේ, මට ලැබෙන ආදායමත් අඩුවෙනවා. ඒ කියන්නේ මට විශ්‍රාම ගැනීමට කාලය ළංවෙනවා කියන එකයි. වෙනත් වචන වලින් කියතොත් සසෙක්ස් ප්‍රාන්තයට ගිහින් මීමැස්සන් ඇති කිරීමේ මගේ විනෝදාංශය ගැන යලිත් වරක් මට හිතන්න පුළුවනි"

"මේ අහන්න හෝම්ස්" මා කීවේ අතිශය කලබලයට පත්වය. "විශේෂඥ රහස් පරීක්ෂකයකු හැටියට ඔබට තියෙන කීර්ති නාමය මොන තරම් සුවිශාල එකක්ද? ඒකෙ ප්‍රමාණය ඔබවත් හරියට දන්නෙ නෑ. දුගී දුප්පතාගේ සිට රජ පවුල්වලටත් ඔබේ පිහිට ලැබිල තියෙනවා. ඒ නිසා නුදුරු අනාගතයේදී නම් ඔබට මේ වෘත්තියෙන් සමුගන්න හැකිවේවි කියල මං හිතන්නෙ නෑ"

තම අසුනෙන් නැගී සිටි හෝම්ස් මේසය වෙත ගොස් එහි තබා තිබූ ලියුමක් ගෙන මා අතට දුන්නේය.





"මෙන්න මේක කියවල බලන්න වොට්සන්. මේකෙ තිබෙන දේ ගැන ඔබට මොනවද හිතෙන්නෙ කියල කියන්න"

මුලින් කවරය පරීක්ෂා කොට මීළඟට ඇතුළත තිබූ ලිපිය අතට ගතිමි. අනතුරුව හෝම්ස් සිදුකරන ආකාරයට එම කඩදාසිය වෙත මුලින් අවධානය යොමු කළෙමි.

"මේක ලියල තියෙන්නේ, බරෙන් වැඩි ඒ නිසා මිල අධික කඩදාසියක. ඒ නිසා මේක එවූ අය ධනවත් ඒ වගේම හොඳ ගුණාත්මක තත්ත්වයක දේ අගය කරන අය බව කිව හැකියි. මේ අත් අකුරු කාන්තාවකගේ බව පහසුවෙන් කිව හැකියි. ඇය බුද්ධිමත් තැනැත්තියක බව මට විශ්වාසයි"

"වොට්සන්. ඔබ එහි ලියා තිබෙන දේ තවම කියෙව්වෙත් නෑ. ඉතින් කොහොමද ඔබ කියන්නේ ඇය බුද්ධිමත් තැනැත්තියක කියා?"

"ඒක නම් මට පහසුවෙන්ම කියන්න පුළුවනි"

"ඒ කොහොමද?"

"ඇයි........ තමන්ගේ ගැටලුව විසඳා ගැනීමට ඇය තෝරා ගෙන ඉන්නේ ෂර්ලොක් හෝම්ස් නම් ප්‍රමුඛ අපරාධ පරීක්ෂකයා. ඔහු අනුකරණය කරන අය දුසිම් බාගයක් මේ ලන්ඩන් නගරයේ ඉඳිද්දී ඇය එහෙම කෙනෙකු තෝරා නොගත්තෙ ඇයි? ඇය බුද්ධිමත් නිසා. හොඳයි නැද්ද?"

"හරි හරි! ඔබ නිවැරැදියි. එතැනදි නම් මම පරාදයි." හෝම්ස් කීවේ හඬ නගා සිනාසෙමිනි. "දැන් ඉතින් ලියුම කියවා බලන්න. එහි අඩංගු කාරණා ගැන ඔබේ අදහස කියන්න"

මම ලිපිය වෙත මගේ අවධානය යොමු කළෙමි.

හෙරිංටන් ඇබේ,
වොරික්ෂයරය.

හිතවත් ෂර්ලොක් හෝම්ස් මහතාණනි,

අභිරහස් විසඳීමට ඔබ යොදාගන්නා ක්‍රම ගැනත් ඒවා සාර්ථක ලෙස නිම කරන ආකාරය ගැනත් මම කියවා ඇත්තෙමි. ඔබගේ උදව් දැන් අපටද අවශ්‍ය වී තිබේ. දැනට මාස දෙකක කාලයක සිට මෙම නිවසේ නොයෙකුත් දුක් ගැහැට හා හිරිහැර වලට අපි මුහුණ දෙන්නෙමු. මේවා පිළිබඳව මොනම ආකාරයක පැහැදිලි

කිරීමකටවත්, විසඳීමකටවත් මේ ප්‍රදේශයේ පොලීසිය සමත් වී නැත. සුළු සුළු හිරිහැර හා සිදුවීම් ලෙස ඇරඹුණු දේ දැන් ක්‍රමයෙන් වඩාත් උග්‍ර හිංසන බවට පත් වී ඇත. මෙතැන තවමත් අපරාධයක් සිදුවී නොමැති නිසා, තමන්ට කිසිවක් කළ නොහැකි බව පොලීසිය කියයි.

මටත් මගේ සැමියාටත් විඳින්නට සිදුවී ඇති වේදනාවේ සැබෑ තත්ත්වය ඔබට ලිපියකින් විස්තර කළ නොහැක. එබැවින් මෙහි පැමිණ අපට පිහිට වන්නේ යයි අපි විශ්වාස කරමු. ඔබට පැමිණීමට පහසුවන දුම්රිය වේලාවන් පිළිබඳ සටහනක් මේ සමග ඇති කඩදාසියේ ඇත. ඔබ පැමිණෙන්නේ කුමන දුම්රියේද යන්න සඳහන් කර විදුලි පුවතක් එවනු මැනවි. එවිට ඔබ කැඳවාගෙන ඒම සඳහා දුම්රියපොළට අශ්වරථයක් එවිය හැක.

මේ ලිපිය ලිවීම පමණකින්ම මගේ සිතට ලොකු සැහැල්ලුවක් දැනේ. ඔබට ස්තුති කරමින්,

මේ හිතවත්,
ඈන් රොබින්සන් මහත්මිය.

"හොඳයි වොට්සන්. ඔබට මොනවද මේ ගැන හිතෙන්නෙ?"

ලිපිය මේසය මත තබා මම මගේ මිත්‍රයා ඇමතීමි.

"මං කලින් පළකළ අදහස් මේ ලියුමෙන් තව දුරටත් ඔප්පු වෙනවා. ඇය බුද්ධිමත් තැනැත්තියක බවත් ඇගේ සිතේ තිබෙන අධිෂ්ඨානශීලී බව මෙන්ම සන්සුන් බව, මේ ලියුමෙන් පැහැදිලි වෙනවා. එහෙම නේද? මෙතැන පොලීසිය ගැන සඳහන් වෙනවානෙ. මේකට යම්කිසි බැරෑරුම් සිදුවීමක් අදාළ බව ඒකෙන් අපට තේරුම් ගන්න පුළුවනි. නමුත් ඇය කටයුතු කරන්නේ සාමාන්‍ය බුද්ධියක් ඇති වෙනත් කාන්තාවක් කටයුතු කරන ආකාරයෙන් නෙමෙයි. කරුණු කාරණා රාශියක් එක පාරටම එළියට දාන්න ඇය කලබල වෙන්නෙ නෑ. ඇය උගත් කෙනෙකු ලෙස ආචාරශීලී අයුරෙන් අප අමතන බව ඇත්තයි. නමුත් ඇගේ සිතේ ඇතිවී තිබෙන කැලඹීමත් ඇයට අමතක කරන්න බෑ. ඇගේ සැමියා මේ ගැන දරන්නෙ මොන වගේ මතයක්ද කියන එක අපට පැහැදිලි නෑ. නමුත් ඇය නම් ඉතා සුළු දේටත් කලබල වෙන කෙනෙකු කියා මං හිතන්නේ නෑ"





"ඔව් වොට්සන්. ඔබේ අදහස් වලට මාත් එකඟ වෙනවා."

"හෝම්ස්. මේක විසඳීමට ඉදිරිපත්වෙන්න ඔබ තීරණය කළාද?"

"ඔව්. අපට යාමට සුදුසු දුම්රිය ගැන කාල සටහනක් එවන්න තරම් ඇය කාරුණික වුණා නේ. අපි 12.23 දුම්රියෙන් ඔවුන්ගේ ගමට එන බව මං විදුලි පුවතකින් දන්වා යැව්වා. දවස් දෙක තුනක් ඔබේ රෝගීන් ගැන බලාගැනීම කාට හරි පවරන්න, ඔබට බැරිවෙන එකක් නැහැ නේද?"

"හෝම්ස්. ඔබ මගේ පැමිණීමත් අපේක්ෂා කරනවා නම් මං මොකක් හරි පිළිවෙළක් වහාම යොදන්නම්?"

"ඔබගේ පැමිණීම අත්‍යවශ්‍යයි වොට්සන්. මෙදා පාර වසන්ත ඍතුවෙත් වැස්සෙ අඩුවක් නෑ වගෙයි. වොරික්ෂයර් ප්‍රාන්තයේ නම් කාලගුණික වෙනසක් පැහැදිලිවම තිබිය යුතුයි. අනෙක මා සමඟ තරග කරන අනෙක් අපරාධ පරීක්ෂකයන් ගැනත් මං හිතන්න ඕන නේ. එතකොට මගේ පරීක්ෂණ සවිස්තර ලෙස විද්‍යානුකූලව වාර්තා කරන මගේ උදව් කාරයා, මා ළඟින්ම සිටිය යුතු කාලයක් මේක."

මෙසේ කියද්දී මගේ මිත්‍රයාගේ මුහුණ සිනාවකින් ආලෝකමත් විය. මගේ ශල්‍යාගාරයේ "වැඩ-බැලීම" මගේ හිතවත් වෛද්‍ය ඇන්ස්ට්‍රුදර්ට භාරදිය යුතුය. විදුලි පුවතකින් ඒ බව දැනුම්දීමට මම එවෙලේම තීරණය කළෙමි.

මගේ යුද්ධ හමුදා ජීවිතය අවසන් වෙද්දීම ෂර්ලොක් හෝම්ස් සමඟ මිත්‍රත්වයක් ඇරඹීමට හැකිවීම මගේ වාසනාවක් විය. දුර බැහැරක දින කිහිපයක් ගතකිරීමට යාමේදී, ඒ සඳහා කෙටි කාලයකින් සූදානම් වීමට මට හැකියාව තිබිණි. එදා වෛද්‍ය ඇන්ස්ට්‍රුදර්ට ශල්‍යාගාරයේ වැඩ කටයුතු ඉක්මනින් භාරදී නියමිත වේලාවට බේකර් වීදියට පැමිණීමට මට හැකිවිණි. අපි වහාම යූස්ටන් දුම්රියපොළ වෙත ගමන් ගත්තෙමු. එතැන අසාමාන්‍ය ලෙස සෙනගෙන් පිරී තිබුණු බව අපට දක්නට ලැබුණේ එවිටයි. කෙසේ වෙතත් අපටම වෙන්වූ පළමුවැනි පංතියේ දුම්රිය මැදිරියකට ටිකට්පත් ලබාගැනීමට හැකිවීම වාසනාවක් විය.

"මං ඔබට කිව්වා නේද වොට්සන් මේ හෙරිංටන් ඇබේ කියන නම මට අහල පුරුදු එකක් කියල" හෝම්ස් කීවේ දල්වා ගත් පයිප්පය මුවෙන් ඉවතට ගනිමිනි. "ඔබ නිවසෙන් පිටවී ගිය

වෙලාවෙ මං මගේ ස්ක්‍රැප් පොත පරීක්ෂා කර බැලුවා. කිසිම අපරාධයකට සම්බන්ධ නැතිවුණත් පුවත්පත්වල පළවෙන සමහර ප්‍රවෘත්ති, මං කපා එක්රැස්කර ගන්නවානෙ. මේ ප්‍රවෘත්තියට අදාළ පුද්ගලයාගෙ තිබූ අද්භූත ස්වභාවය නිසාමයි මං ඒක කපාගත්තේ. ගිය අවුරුද්දේ ජූලි මාසයේ "ටයිම්ස්" පුවත්පතේ තමයි ඒ පුවත පළවුණේ.

වොරික්ෂයර් ප්‍රාන්තයේ හියුගෝ ඇඩම්ස් නම් ඉංග්‍රීසි ජාතික සංචාරකයෙකු ප්‍රංශයේදී හදිසි අනතුරකට මුහුණ දීලා තිබුණා. ඔහු බෝඩෝ හි ඉතාම පුරාණ දෙව්මැඳුරක් නරඹමින් ඉඳලා තියෙන්නේ. ගල්වලින් ඉදිකර තිබූ මේ දෙව්මැඳුර තරමක් අබලන් එකක්ලු. එහි ප්‍රධාන කුලුනෙන් ගැළැවී ගිය විශාල ගලක් ඇඩම්ස්ගේ හිස මතට වැටී තිබුණා. අසල සිටි අය ගල ඉවත් කොට ඔහු බේරාගන්නා විටත් ඔහු මියගිහින් සිටියාලු."

"ඔහු කුමන අන්දමේ පුද්ගලයෙක්ද කියා ඒ පුවතේ පළ වී තිබෙන්න නැතුව ඇති?"

"ආගම්, ඇදහිලි සහ මිථ්‍යා විශ්වාස ගැන තොරතුරු තිබෙන "සමයාන්තර විශ්ව කෝෂය" මා පෙරළා බැලුවා. එහි තිබුණෙත් කරුණු ස්වල්පයයි. ඔහු සමාජයේ සම්මත නීති කඩා බිඳ දමමින් අපරාධ කළ අයෙකු නෙමෙයි. නමුත්........"

"........ඇයි ඔබ නමුත් කිව්වෙ?"

"........සම්මත නීති රීති නොබින්දත් ඔහු යෙදිලා තියෙන්නෙ, සමාජය හෙළා දකින, අපරාධ යයි සැලකිය හැකි කටයුතුවල. ඒ කියන්නේ අප්‍රිකාවේ, ඉන්දියාවේ සහ දකුණු ඇමරිකාවේ අහන්න ලැබෙන යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම් කොඩිවින වගේ කටයුතු වල. මේ කටයුතු ගැන පර්යේෂණ පවත්වන්න ඔහු විශාල වශයෙන් මුදල් වියදම් කරලා තියෙනවා. ඒ සඳහා මුදල් හදල් වල අගහිඟයක් ඔහුට තිබිලා නැහැ. ඔහු මහා ධනවතෙකු බව ප්‍රසිද්ධ කරුණක්ලු. නමුත් ඔහු ඒ ධනය උපයාගත්තේ කොහොමද කියලා කවුරුවත් දන්නේ නැහැලු. තමන්ගේ නිවසේ මහා නිධාන ඇති බවට ඔහු විහිළුවට වගේ අනෙක් අය සමඟ කියල තිබෙනවා. නමුත් ඒව දැක ගන්න කිසිම විටෙක කාටවත් අවසර දීලත් නෑ: ඉඩක් ලබාදීලත් නෑ. ඔහු පොතක් ලියා තිබෙනවා "ගුප්ත විද්‍යාව සහ මන්ත්‍ර ගුරුකම් ශාස්ත්‍රය" කියලා. මේ පොතේ අඩංගුව තිබුණේ





එම ශාස්ත්‍රය ප්‍රායෝගිකව යොදා ගන්නා හැටිලු. ඒක කියවූ බොහෝ දෙනෙක් ඇඩම්ස්ගේ එම උත්සාහය දැඩිව හෙළා දැකල තියෙනවා. ඒ මොකද එහි අඩංගු පර්යේෂණ අත්හදා බැලුවොත් ඒ මගින් සමාජයේ සාරධර්ම පිරිහී මුළු මහත් සමාජයම විනාශ මුඛයට යා හැකි බව කියමින්. ඒ ගැන පුවත්පත්වල පළවූ විවේචන වලින් ඇඩම්ස් අතිශය කෝපයට පත්වුණාලු.

මේ පොත ගැන තදින්ම විවේචනය කළ එක් අයෙකු තමයි අධිමානසික විද්‍යාව ගැන පර්යේෂකයකු වුණු ආචාර්ය ස්ටුවට් තොම්සන්. ඇඩම්ස් විවේචනය කර සතියක් ගතවෙන්න කලින් ආචාර්ය තොම්සන් ක්ලැප්හැම් දුම්රියපොළ අසලදී දුම්රියේ හැපී මරණයට පත්වුණේ ඉතාම අද්භූත ආකාරයට. ඒක සිදුවුණේ කොහොමද කියන එක ගැන නිශ්චිත තීරණයකට එන්න, ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියටවත්, දුම්රිය අධිකාරීන්ටවත් හැකිවුණේ නැහැ.

ඇඩම්ස්ගේ පොතේ කරුණු තදින් හෙළා දුටු අය රාශියක් ඉන්නවා. එයින් තවත් දෙදෙනෙකු ගේ නම් අර විශ්ව කෝෂයේ සඳහන්ව තිබුණා. එක් අයෙකු වුණේ පරම විඥානාර්ථ පර්යේෂක සංගමයේ ක්ලෝඩියා ඩි සීකා මැතිණිය. ඇය එක් සැන්දෑවක මාගේට් ප්‍රදේශයේ මුහුද අද්දර පාරක ඇවිදින්න ගිහින් තියෙනවා. හදිසියේම එක්තරා දරුණු බල්ලෙකු ඇය ලුහුබැඳ ඇවිත් තිබෙන්නේ බුරමින්. උගෙන් බේරීමට දිවගිය ඇය මුහුදට වැටී දියේ ගිලී මියගියාලු. මේ බල්ලාගේ අයිතිකාරයා ගැන කවුරුවත් දැනගෙන හිටියේ නැහැ. බල්ලාට ඊට පසු කුමක් සිදුවුණාද කියලත් කවුරුවත් දන්නේ නැහැ.

ඇඩම්ස්ගේ පොත ගැන බොහෝ දුරට දොස් කියූ තවත් කෙනෙකු වුණේ ජෝසෆ් සිල්වියෝ නම් ඉතාලි ජාතික පියතුමෙක්. එතුමා ප්‍රංශයේ දෙව්මැඳුරක උස් කුලුනක් මත නැග සිටියදී පය ලිස්සා පොළොවට ඇද වැටී බරපතළ තුවාල සිදුවුණාලු. කොහොම වුණත් ඔහුට නම් ජීවිතය ගළවාගන්න හැකිවුණාලු. හිසට තුවාල සිදු නොවූ නිසා. කුලුන මතින් පය ලිස්සා යාමට හේතුව කුමක්ද කියලා පියතුමා පවසා නැහැ. හියුගෝ ඇඩම්ස් අපරාධකාරයෙක්ද නැද්ද? ඔහු නීති විරෝධී යමක් කළ බවක් අපට පැහැදිලිව පෙනෙන්නේ නෑ. නමුත් ඔහු යමක් කළාද? ඒ

සැකය ඕනෑම කෙනෙකුගේ සිතේ ඇතිවීම ස්වාභාවිකයි. එහෙම නේද?"

"හරි පුදුමයි නේ! ඔහුට විරුද්ධව යමක් කරන්න පොලීසියට හා අධිකරණයට බැරිවුණාද?"

"ඔහුට විරුද්ධව ප්‍රබල සාක්ෂි කිසිවක් නෑ" හෝම්ස් කීය. "කොඩිවින, හූනියම් ආදී නම්වලින් හැඳින්වෙන ඝාතන ක්‍රම තියෙන්නේ ඉන්දියාව වගේ මං කලින් සඳහන් කළ රටවල. ඇඩම්ස්ට විරුද්ධව නඩුවක් ඒ වගේ රටක පවරන්න සමහරවිට පුළුවන් ඇති. නමුත් එංගලන්තය වගේ රටක උසාවියක් ඔය වගේ සාක්ෂි පිළිගන්නෙ නෑ."

"එතකොට මේ රටේ මිනිස්සුන්ට සිදුවෙලා තියෙන්නෙ ඔහුට උවමනා හැටියට කටයුතු කරලා මහ විනාශයක් කරන තුරු........"

"........ ඇත් ඒ ප්‍රශ්නෙ පැන නගින්නෙ නැහැනෙ වොට්සන්; ඔහු මිය ගිහින් නිසා." හෝම්ස් කීය.

"කොහොම වුණත් ඔහු යම් යම් දක්ෂතා තිබූ පුද්ගලයෙකු බව අප පිළිගත යුතුයි. තමන් කිසිම කරදරයකට නොවැටී සතුරන්ගෙන් පළිගැනීමට ක්‍රම සහ විධි ඔහු දැනසිටියා වෙන්න පුළුවනි. ඔහු තමන්ගේ ප්‍රියතම ක්ෂේත්‍රයේ දෙවැනි පොතත් සූදානම් කරමින් සිටි බවට කටකතා තිබුණාලු. කොහොම වුණත් රොබින්සන් මහතා සහ මහත්මිය මුහුණදෙන බරපතළ ප්‍රශ්නය සාර්ථක ලෙස ඉක්මනින් විසඳා දීමයි මගේ අරමුණ. මං මේ කියූ කරුණු හිතේ තබාගෙන අපි ඒ ප්‍රශ්නයට මුහුණ දෙමු."

අප වොරික්ෂයරය බලා දුම්රියෙන් ගමන් කරමින් සිටියදී තවත් බොහෝ දේ කතාවිණි. ඒ සියලු දේ විස්තර කරමින් ඔබ තවදුරටත් වෙහෙසට පත්කිරීමට මගේ කැමැත්තක් නැත. නමුත් අවසන් වශයෙන් මගේ සිතට නැගුණු හැඟීම් කිහිපයක් ඔබට කෙටියෙන් පැවසිය යුතුය.

හියුගෝ ඇඩම්ස් ජීවත්ව සිටියදී ඉතා අප්‍රසන්න පුද්ගලයෙකුව සිටි බැව් පෙනී යයි. ඔහු ගැන සැබැවින්ම කෙරුණු විවේචනවලට මෙන්ම, ඔහු තම සතුරන් යයි සිතාගත් පිරිස කෙරෙහිද වෛර බැඳගෙන ඇති බැව්, හෝම්ස් කියූ දෙයින් මම තේරුම් ගතිමි. ඔවුන් සමඟ ඇඩිව කෝපාවිෂ්ට වූ ඔහු සතුරන්ගෙන් පළිගැනීමට ප්‍රමාද නොවන්නට ඇත. ආචාර්ය ස්ටුවට් තොම්සන් සහ ක්ලෝඩියා





ද සීකා මැතිණිය මරණයට පත්කිරීම ගැනත් සිල්වියෝ පියතුමා මරා දැමීමට තැත්කිරීම ගැනත් හියුගෝ ඇඩම්ස් වගකිව යුතු බව මගේ විශ්වාසයයි. ඇඩම්ස්ගේ ක්ෂණික මරණය ඔහු කළ අපරාධ වලට දෙවියන් දුන් දඬුවමක් යයි සමහරු පවසා තිබිණ. ප්‍රංශ පොලීසියේ නිගමනය වී තිබුණේ දෙව්මැඳුරු ගොඩනැගිල්ල අලුත්වැඩියා කරමින් සිටි වෙලාවේ එය සමීපයටම යාමෙන් සිදු වූ මෙය හදිසි අනතුරක් බවය.

අපේ දුම්රියේ වේගය ක්‍රමයෙන් අඩුවෙන බැව් අපට දැනිණ. දුම්රිය ස්ථානය වෙත ඉක්මනින් ළඟාවෙන බැව් ශබ්ද විකාශන යන්ත්‍රයෙන් ප්‍රකාශ කෙරිණි. දුම්රියෙන් බැස්සේ අප දෙදෙනා ද ඇතුළුව මගීන් කිහිප දෙනෙකු පමණි.

අශ්වකරත්ත රියැදුරෙකුගේ ඇඳුමෙන් සැරසුණු පුද්ගලයකු අප ඉදිරියට පැමිණ හිස නමා අපට ආචාර කළේය.

"මේ හෝම්ස් මහත්මයා සහ දොස්තර වොට්සන්ද? ඔබ දෙදෙනා බලාපොරොත්තුවෙනුයි මා සිටියේ. කරුණාකර මේ පැත්තෙන් එන්න මහත්වරුනි. මං ඔබේ ගමන් මලු රැගෙන එන්නම්"

දුම්රියපොළෙන් පිටතට පැමිණි අපට ඉතා හොඳ තත්ත්වයේ අශ්වකරත්තයක් දක්නට ලැබිණි. අපේ ගමන් මලු එහි පටවාගත් පසු අපි පිටත්වීමු. අපේ ගමන් මග සුන්දර ගම්මානයක් මැදින් වැටී තිබිණ. රොබින්සන් මහත්මිය පවසා තිබූ සිත් කලඹන ආකාරයේ සිදුවීම් ඇතිවූයේ මෙවැනි අලංකාර ගම්මානයකදැයි සිතා ගැනීමට පවා නොහැකි විය. මේ අතර හියුගෝ ඇඩම්ස්ගේ කෲරෙ පළිගැනීම් ගැන හෝම්ස් පැවසූ තොරතුරු සිහිවෙද්දී මගේ ගත වෙවුලා ගියේය.

නිසංසල ගම්මානය පසු කරද්දීම අපේ ගමන් මග වෙනස් විය. දැවැන්ත යකඩ ගේට්ටු දෙකකින් ආරක්ෂාව ලබා දුන් පෞද්ගලික මාර්ගයකට රථය හරවන ලදී. ඒ ගමන් මග වැටී තිබුණේ තරමක කඳු පෙදෙසක් දෙසටය. පාර දෙපස වවා තිබූ තුරු ලතාවන් මෙන්ම මල් පඳුරු ද, උද්‍යාන පාලකයකුගේ හොඳ සැලකිල්ල නිසා සශ්‍රීකව වැවී තිබිණි. සැන්දෑ කාලයේ තඹ පැහැති ආලෝකයෙන් එම පෙදෙස දීප්තිමත් වෙද්දී අපි හෙරිංටන් ඇබේ මන්දිරය වෙත ළඟාවීමු. වේගයෙන් ගලා ආ අඳුරෙන් හාත්පස වැසී යද්දී අප ගමන් කළ රථය ගල්වලින් ඉදිකළ සුවිසල් මන්දිරයක් ඉදිරියේ නවත්වන ලදී. ගෙහිමියන් වූ ඩේවිඩ් [illegible]ොබින්සන් හා ඈන් රොබින්සන් යුවළ

ඉදිරියට පැමිණ අප සාදරයෙන් පිළිගත්හ. අනතුරුව අපට වෙන් කළ කාමර වෙත අප කැඳවාගෙන යන ලදී.

පැය භාගයක් ගතවීමට පෙර අපි පහළ තට්ටුවේ විසිත්ත කාමරයට යළි පැමිණියෙමු. ඒ තේපැන් සංග්‍රහය සඳහායි.

"ඔව් මහත්මයා. ඔබ කීවා නිවැරැදියි." රොබින්සන් මහතා කීවේ හෝම්ස්ගේ ප්‍රශ්නයට පිළිතුරු ලෙසිනි. "මෙතැන කලකට පෙර ඉතාම පෞරාණික දෙව්මැඳුරක් පිහිටා තිබුණාලු. එය 1539 දී පමණ මුළුමනින්ම වගේ විනාශ වුණාලු. මෙතැනින් එකතු කර ගැනීමට හැකි වූ දෙව පිළිම ආගමික වස්තූන් ස්වල්පය, ගමේ පිහිටි අනෙක් දෙව්මැඳුර වෙත ගෙනගොස් තිබෙනවා. අවසානයේ ඉතිරිව තිබූ දේවගැති නිවාසය සහ ඉස්තාලයත් මේ වෙනකොට සම්පූර්ණයෙන්ම විනාශයට පත් වෙලා. මේ ගෙදර ඉදිකිරීම අරඹලා තියෙන්නෙ, දෙව්මැඳුර විනාශ වුණාට පස්සේ. නිවස ඉදිකිරීම සඳහා පෞරාණික දෙව් මැදුරේ ගල් යොදාගන්න ඇති කියල මං විශ්වාස කරනවා. ඒ නිසයි මේකට හෙරිංටන් ඇබේ කියන නම ලැබෙන්න ඇත්තෙ. ඒ අනුව අපට රටේ ඉතිහාසයේ වැදගත් පුරාණ ගොඩනැඟිල්ලක සුන්බුන් අයිති කරගන්න පුළුවන් වෙලා තියෙනවා."

"ඊට අමතරව තවත් ආකාරයක සුවිශේෂ අත්දැකීම් වලටත් ඔබට මුහුණ දීමට සිදුවී ඇති බවයි මට පෙනෙන්නෙ........" හෝම්ස් කීවේ ගෙහිමියා නියම කාරණයට යොමු කරවා ගැනීමේ අපේක්ෂාවෙනි.

"ඒකත් සම්පූර්ණ ඇත්තක් මහත්වරුනි" යයි ගෙහිමියා කියද්දී ඔහුගේ මුහුණ අඳුරු වූ බව මම නිරීක්ෂණය කළෙමි. තේ කෝප්පය මේසය උඩින් තැබීමට සූදානම් වූ රොබින්සන් මහත්මියගේ අත ද යම් තරමක තිගැස්සීමකට ලක් වූ බව මම නිරීක්ෂණය කළෙමි.

"මේ ගෙදර දැනට සිදුවෙන යම් යම් සිදුවීම්වලට හේතුව, හියුගෝ ඇඩම්ස් නැත්නම් ඔහුට සම්බන්ධ කාරණා කියලයි අපට හිතෙන්නේ." රොබින්සන් මහත්මිය කීවාය. "ඒක සිදු වෙන්නෙ හරියටම කොහොමද කියන එක ගැන අපි දෙන්නාගෙ එකඟතාවයක් නෑ. මං ඇමරිකාවෙ බොස්ටන්හි හැදුණු වැඩුණු කෙනෙක්. ඒ නිසා වෙන්න ඇති ඔය හොල්මන්, අවතාර, මන්ත්‍ර ගුරුකම් ගැන මගේ එච්චර විශ්වාසයක් නෑ. නමුත් මගේ ස්වාමිපුරුෂයා........"





"........ ඔව් මහත්වරුනි" රොබින්සන් මහතා කියා. "ඇය ඒ කීමට සූදානම් වුණේ මං ඒ දේවල් උවමනාවටත් වඩා හිතට අරගෙන ඇති බව. ඇත්ත. ඇගේ හිත මට වඩා හයියයි. මගේ පියා උපතින් ඉංග්‍රීසි ජාතිකයෙකු වුණත් කුඩා කාලයේ ඉඳන් හැදිල වැඩිල තියෙන්නේ අයර්ලන්තයේ. මගේ මවත් අයිරිෂ් කාන්තාවක්. ඉංග්‍රීසි ජාතිකයන්ට වඩා අපි හොල්මන් අවතාර විශ්වාස කරනවා. ඒකට හේතුව අපට කුඩා කාලයේ ඉඳලම ඒවා සහ ඒවායේ කටයුතු දකින්න ලැබිල තියෙනවා. ගැටවර අවදියේ අවුරුදු හයක් මං නාවිකයෙකු ලෙස සත් සමුදුර තරණය කරල තියෙනවා. අනෙක් අයට වඩා නාවිකයොත් මේවා විශ්වාස කරන බව ප්‍රසිද්ධ කරුණක්."

"කොහොම වුණත්........" හෝම්ස් කීවේ වෙනදාට නොදක්වන නොඉවසිලිමත් බවක් පෙන්වමිනි. "අපි කැමතියි ඒව මොනවද කියල විස්තර සහිතව දැන ගන්න"

"එහෙම නම් මං පටන් ගන්නද?" බිරිඳ ඇසුවාය.

"ඒක හොඳයි. ඒක හොඳයි" සැමියා කීය. "ඔයාට පුළුවන් වේවි. ඇන් ඒක මට වඩා හොඳට කියන්න."

ඇය කථාව කීම අරඹද්දී පුටුවෙ පිටුපසට හේත්තු වී දෑත්වල ඇඟිලි තුඩු එකට තබාගත් හෝම්ස් දෙනෙත් අඩවන් කර ගත්තේය.

"හෝම්ස් මහත්මයාට මං කලිනුත් දැන්නුවා වගේ අපි මෙහේ පදිංචියට ඇවිත් ඒ තරම් දීර්ඝ කාලයක් ගතවුණේ නෑ. මගේ මුතුන් මිත්තන්ගේ ගම වොරික්ෂයර් ප්‍රාන්තයේමයි. හෙරිංටන් ඇබේ මන්දිරය විකිණීමට තිබෙන බව අපට දැනගන්න ලැබුණේ හදිසියේ. එක්වර අපේ හිත්වල ලොකු සතුටක් ඇතිවුණා. නමුත් මේ ගමේ මිනිස්සු මේකෙ කලින් අයිතිකාරයා ගැන දැඩි අප්‍රසාදයකින් හිටි බව අපට දැනගන්න ලැබුණේ හුගක් පහුවෙලා. අප දැනගෙන හිටි එකම කාරණය ඔහු, එනම් හියුගෝ ඇඩම්ස් නිවාඩුවක් ගත කරන්න ප්‍රංශයට ගිය වෙලාවෙ හදිසියේ මියගියා කියන එක පමණයි. මේවා භාරවෙන දරු මල්ලෙකු හෝ සමීප ඥාතියෙකු නොසිටි නිසා ගෙය විකිණීමට දැමුවාලු. ඔහුට අයිතිව තිබුණු බඩු බාහිරාදියත් දේපළ වෙළෙඳ සමාගම මගින් මේ ගෙදරදීම විකුණා දැමුණා. අපි ඒක බලන්නත් ආවා. මේ ගමේ සෙනඟ විශාල

ප්‍රමාණයකුත් ඒ සඳහා ආවා. ඒ සෙනගෙන් වැඩි දෙනෙක් ආවෙ නිවසේ ඇතුළත දැක බලාගන්න වෙන්න ඇති කියල මට හිතුණා. ඒ මොකද අයිතිකාරයා ජීවත්ව ඉඳිද්දී බාහිර කිසිවෙකුට වත්ත ඇතුළට එන්නවත් අවසර තිබිල නෑ. ඊට අමතරව නිවසේ ඉතා වටිනා නිධාන සඟවා ඇති බවටත් කතාවක් තිබුණාලු. කොහොම වුණත් විකිණූ බඩු අතර නම් වටිනා නිධානයක් යයි කිව හැකි කිසිවක් තිබුණේ නෑ.

ඇඩම්ස් මහතාට අයිතිව තිබූ දේවල් මිලට ගත් අය ඒවා ඉවත් කරගෙන ගියා. එතකොට අප බලාපොරොත්තු වුණේ මෙහි ඉක්මනින් පදිංචියට එන්නයි. නමුත් ඒක ඒ විධියටම කරන්න බැරි බව අපට පෙනී ගියා. නිවසේ ඉදිරිපස සතුටුදායක තත්ත්වයෙන් තිබුණු බව ඇත්තයි. නමුත් ඇතුළත - කාමර, විශේෂයෙන්ම ඇඩම්ස් මහතා පදිංචිව සිටි කාමර වල යම් යම් අලුත්වැඩියා අවශ්‍ය බව පෙනුණා. ඔහු සුනඛයන් නිඳන කාමර තුළ තබා ගත්තා කියලයි අපට හිතුණේ. ඒ මොකද බිත්තිවලට අල්ලා තිබෙන පනේල ලෑලි මෙන්ම බිම ඇතිරූ ලෑලි තදින්ම සීරී පතුරු කැඩී ගොස් තිබුණා. මෙවැනි පළුදුවීම් කොයිතරම් බරපතළ ලෙස සිදුවෙලා තිබුණා ද කිව්වොත්, ඒ ලෑලි මුළුමනින්ම ඉවත් කර අලුත් ලෑලි සවිකළ යුතු බව අපට පෙනී ගියා.

සමහර ලී බඩු ගෙදරින් ඉවත් කරගැනීමත් අපට ප්‍රශ්නයක් වුණා. ගෙදර බඩු වෙන්දේසියේදී ඒවාට මුදල් ගෙවූ සමහර පුද්ගලයින් ඒවා ඉවත් කරගෙන නොයන බව අපට දන්වා තිබුණා. ඇඩම්ස්ගේ පර්යේෂණ සඳහා යොදාගත් මේසයක්, ලියන මේසයක්, ලාච්චු අල්මාරියක් සහ ඔහු නිදාගත් ඇඳ මේ අතර වුණා. මැහෝගනි සහ ඕක් ලීයෙන් සාදා තිබූ මේ භාණ්ඩවල පෙනුමේ වරදක් තිබුණේ නෑ. කොහොම වුණත් ඒවා නිවසේ තබාගන්න මගේ සැමියා කැමති වුණේත් නෑ. පුවත්පත්වල දැන්වීම් පළ කළත් ලී බඩු බලන්න ආවෙත් දෙතුන් දෙනයි. ඒවා ගැන ඔවුන්ගේත් උනන්දුවක් තිබුණේ නෑ. අපට ලොකුම හිරිහැරයක් වී තිබුණේ ඇඩම්ස්ගේ ඇඳ. අන්තිමේදී ලී බඩු බලන්න ආව කෙනෙකුට අප මුදලක් ගෙවා තමයි ඒක යවා ගත්තේ. අනික්වා ඉතිරි වුණා."

"එතකොට ගෙදර ඉදිකිරීම් කළ කම්කරුවන් ගැන" රොබින්සන් මහතා කීවේ තම බිරිඳටයි. "ඒව අමතක කරන්න එපා"

"නෑ. නෑ. ඒව අමතක නෑ" ඇය කීවාය. "ගෙදර ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අපි කම්කරුවන්, පෙදරේරුවන් වඩුවන් රාශියක්





යොදා ගත්තා. ඔවුන් නිසා අපට මුහුණ දෙන්න සිදුවුණු ප්‍රශ්න වලටත් කෙළවරක් තිබුණෙ නෑ. ඒ කටයුතු භාරදීල තිබුණු පුද්ගලයා කිව්වේ, මේවා බොහොම සරල, සාමාන්‍ය ඉදිකිරීම් කටයුතු කියලයි. සමහර සේවකයන් වැඩට ඒමේදී හුගක් ප්‍රමාද වුණා. සමහරු එන්නෙ නැතුව යන්නම ගියා. ඉදිකිරීම්වලට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය හරි හැටි සැපයුණේ නෑ. ඒ නිසා නිතරම වැඩ ඇනහිටියා. හැමදාමත් කාට හරි මොකක් හරි අනතුරක් සිදුවුණා. එහෙම සිදුවීමක් නොවුණු දවසක් නැති තරම්. මෙම ඉදිකිරීම කටයුතු කවදාවත් ඉවර වෙන එකක් නැහැ කියලයි අන්තිමේදී අපට හිතුණේ. බැරිම තැන අප කලින් පොරොන්දු වුණාටත් වඩා වැඩි මුදලක් ගෙවලයි වැඩ කටයුතු අවසන් කර ගත්තේ"

"මට තියෙනවා ප්‍රශ්නයක්" හෝම්ස් කීය. "මේ සේවකයන් මේ පළාතේ අයද, නැත්නම් පිට පළාත්වල අයද?"

"මේ අවටින් වැඩට පැමිණි අතළොස්සක් හිටියා" ඇය කීවාය. "නමුත් වැඩිදෙනා ඈත පළාත්වලින් ගෙන්වා ගත් අය. මේ ගැන මගේ සැමියා ඉදිකිරීම් භාරගත් තැනැත්තාගෙන් විමසුවා. ඔහු කීවේ තමන්ට කොවෙන්ට්‍රි තරම් ඈත පළාත් වලිනුත් සේවකයන් සොයා ගැනීමට සිදුවුණු බව. මේක කලින් අයිතිව සිටි ඇඩම්ස් ගැන මේ පළාතේ දැඩි අප්‍රසාදයක් තිබුණාලු"

"ඔහුගේ මරණයෙන් පසුවත් ඒ අප්‍රසාදය තිබුණා නම් ඒ ගැන හිතාගන්න පුළුවනි" හෝම්ස් කීය. "මෙතැන ඉදිකිරීම් කටයුතු සිදුවෙද්දී ඔබ දෙදෙනා ඒවා ගැන සොයා බැලුවාද?"

"මෙතැනටම වෙලා ඒවා බලා සිටීම අපහසු නිසා අපි එහෙම කළේ නෑ. නමුත් කොයි තරම් වැඩ ප්‍රමාණයක් දිනපතා සිදුවෙනවාද කියන එක ගැන එය භාරව සිටි පුද්ගලයා අපට වාර්තා සැපයුවා. ඒ අපේ ඉල්ලීම අනුව. නමුත් කටයුත්තේ ඉදිරි ගමන ගැන පරීක්ෂා කරන්න මගේ සැමියා නිතර මෙහි පැමිණියා."

"ඇඩම්ස් ගෙදර සුනඛයන් ඇති කළ බවක් ඔබට අහන්න ලැබුණාද?"

"නැහැ" රොබින්සන් මහත්මිය කීවාය. "ඔහු ගැන අපට අහන්න ලැබුණු කාරණාවල හැටියට ඔහු සුරතල් සතුන් ඇති කළා කියල හිතන්න අමාරුයි"

"ඔබ කියූ පළුදුවීම් තිබුණේ ගෙදර එක් තැනක පමණක්ද? නැත්නම් සාමාන්‍යයෙන් හැම තැනකම වගේ දකින්න ලැබුණාද?"

"ඒකෙත් අපි අමුත්තක් දුටුවා මහත්මයා" ඇය කීවාය. "බල්ලන් විසින් යම් පළුදු කිරීමක් සිදු කළා නම්, ඒක එක්තරා විශේෂ තැනක පමණක් සිදු කළා කියල හිතන්න අමාරුයි නේද? නමුත් මේ පළුදුවීම් හැම එකක්ම එක් කාමරයකට සීමා වුණා. ඒ තමයි ඇඩම්ස් තමන්ගේ කාර්යාල කාමරය ලෙස යොදා ගත්තා කියන කාමරය. ඒක ඉතා හොඳ කාමරයක්. ගෙදර උද්‍යානය එක් පැත්තකින් පෙනෙන මෙය තිබෙන්නේ පළමුවැනි තට්ටුවේ."

"නිවසට සිදුවී තිබුණේ මොන වගේ හානියක්ද?"

"කාමරයේ බිත්තිවලට සවිකර තිබූ ලෑලිවල තමයි පළුදුවීම් දක්නට ලැබුණේ" රොබින්සන් මහතා කීය. "ඒවා හරියට සතෙකු තියුණු නිය පොතුවලින් පහුරු ගෑමෙන් සිදුවුණු ඒවා කියල හිතන්න පුළුවන්. මතුපිට ඇතිවූ සීරීම් නිකම් සීරීම් නෙමෙයි. ලෑල්ල ඇතුළට හෑරී තිබුණා."

"ඒ සලකුණු මොනවා හරි ඉතිරි වුණු ඒවා තියෙනවද අපට බලන්න?" හෝම්ස් ඇසීය.

රොබින්සන් මහත්මියගේ මුහුණ සුදුමැලි විය. ඇය එක්වරම හුස්මක් ඉහළට ඇද ගත්තාය. තරමක් සුදුමැලිව තිබූ ඇගේ සැමියාගේ මුහුණ වඩාත් සුදුමැලි විය.

"අපි මේ ගෙදර පදිංචි වුණු දිනවලම ඔබ ඔය ප්‍රශ්නය ඇහුවා නම්" ඇය කීවාය. "මට දෙන්න වෙන උත්තරය "නැහැ" කියලයි. නමුත් දැන් ඒ සලකුණු ආපසු ඇවිත්!"

"ආපහු ඇවිත්? මොකක්ද ඒ කතාවෙ තේරුම?" හෝම්ස් විමසුවේ විමතියෙනි.

"හෝම්ස් මහත්මයා. මට මොහොතක් දෙන්න" රොබින්සන් මහත්මිය කීවාය. "තව මොහොතකින් මං ඒ කාරණයට එන්නම්. අපි මේ ගෙදර පදිංචියට ආවෙ මාර්තු මාසෙ මුල. මුල් දවස්වල අපට කිසිම ප්‍රශ්නක් තිබුණෙ නෑ. අපේ අවධානය යොමු කරන්න දහසකුත් එකක් දේවල් තිබුණා. මොකක් හරි අසාමාන්‍ය දෙයක් දකින්න ලැබුණා නම්, අපි ඒ ගැන හිතුවේ මෙහෙමයි; අපි මේ ඇවිත් ඉන්නේ බොහොම පරණ ගෙදරකට. ඒක අපට නුපුරුදු තැනක්. ඒකට ඉක්මනින්ම හැඩ ගැහෙන්න අපට හැකි වේවි.





නමුත් ටිකෙන් ටික මේ අසාමාන්‍ය සිදුවීම් අපට හිරිහැරයක් වුණා."

"කොහොමද එය මුලින්ම ඇරඹුණේ?" හෝම්ස් විමසීය.

"අප නිදාගන්න කාමරය කෙළින්ම උඩම තට්ටුවේ කාමරයේ තේරුම් ගන්න අමාරු ශබ්ද වගයක් ඇහුණා. මුලින් ඒවා අහන්න ලැබුණේ ඉතාමත් අඩු හඬකින්. ඊළඟට........" කී ඇය එක්වරම තිගැස්සී කථාව නැවැත්වූවාය. ඇගේ දෙනෙත් යොමු වූයේ ඇගේ ස්වාමියා වෙතයි.

"ඇන් ඔයා කතාව නවත්වන්න" ඔහු කීය. "කතාවෙ ඉතිරි හරිය මං කියන්නම්. මුලදී අපි හිතුවේම ශබ්දය එන්නෙ අපේ සේවිකාව ඒ කාමරය හෝ යාබද කාමරයක් පිරිසිදු කරමින් සිටිය නිසා විය යුතුයි කියල. නමුත් එවැනි ශබ්ද ඇහෙද්දී ඇය උඩ තට්ටුවේ වත් නොහිටි බව පසුව අපට තේරුණා.

මීළඟට අපට දැනුණු අමුතුම දේ තමා, කාමරය හරහා වේගයෙන් හමා ගිය සීතල හුළං පාර. මේ වගේ පරණ ගෙයක ඇතුළට සීතල සුළං හැමීම එතරම් අස්වාභාවික දෙයක් නෙමෙයි කියල ඔබ කියාවි. මේ ගෙදර වුණත් අනෙක් තැන්වල එහෙම සීතල සුළං හැමීමක් සිදුවුණේ නෑ. ඒක තිබුණේත් දැනට තිබෙන්නේත් මං කියන මේ කාමරයේ පමණයි. අපි හැම තැනක්ම ඉතාම හොඳින් සෝදිසි කරල බැලුවා. දොරවල් අයින්, බිත්ති සහ ජනේල. නමුත් මෙහෙම හුළං පාරක් හමා එන්න පුළුවන් තැනක් අපට දකින්න ලැබුණෙ නෑ. ඇඩම්ස් මහත්තයා කාර්යාල කාමරය ලෙස පාවිච්චි කළ කාමරය තුළ වාසය අපට එන්න එන්නම අපහසු වුණා. වසන්ත සෘතුව ලබද්දී මේ තත්ත්වය හරි යාවි කියලයි මං හිතාගෙන හිටියෙ. නමුත් සිදුවුණේ එය අඩුවීම නෙමෙයි; තව තවත් වැඩි වීමයි.

මේ කාලය තුළ ශබ්ද ඇසීමත් නොනවත්වාම තිබුණා. මං කියන්නේ දවස පුරාම එක දිගටම නෙමෙයි. නමුත් ඒවා වරින්වර ඇසුණේ අපේ සිත් කැලඹීමට පත් කරමින්. මේ ශබ්දවලට හේතුව අසාමාන්‍ය ආකාරයට සුළං හැමීම නිසා, ගෙයි කොතැනක හෝ සිදුවෙන අසාමාන්‍ය සෙලවීමක් විය යුතුයි; ඒකට හිත කරදර කරගන්න අවශ්‍ය නැහැ කියල අපි අපටම කියාගත්තා. නමුත් එක දවසක් හැන්දෑවෙ ඔය ශබ්ද වෙන කවරදාටත් වඩා පැහැදිලිවම

ඇසුණා. ශබ්දයේ වෙනසකුත් තිබුණු බවයි අපි තේරුම් ගත්තෙ. මේ ශබ්ද මුලදී මේ තරම් පැහැදිලිව ඇහුණෙ නෑ. එහෙම ඇහුණා නම් මේ කෙනෙකුගේ අඩි ශබ්ද කියල අපි වරදවා තේරුම් ගන්නෙ නෑ. ඒ ශබ්ද මොකක් හරි බර දෙයක් බිම දිගේ ඇදගෙන යනවා වෙන්න ඇති කියලත් කෙනෙකුට තේරුම් කරන්න පුළුවනි. එහෙමත් නැත්නම් ප්‍රමාණයෙන් ඉතා විශාල සුනඛයෙකු, ඉතා අපහසුවෙන් පොළොවේ ඇවිදගෙන යාමක් කියලත් විස්තර කළ හැකියි. ගිහින් පරීක්ෂා කර බැලුවත් මට කිසි දෙයක් දකින්න ලැබුණේ නෑ. ඒ වුණත් ඒ කාමරයේ එක මොහොතක්වත් තනියෙන් රැඳී ඉන්න මගේ හිතේ ධෛර්යයක් තිබුණෙ නෑ.

මීළඟ සිදුවීමට මුහුණ දුන්නෙ අපේ ගෙදර සේවය කළ තරුණ සේවිකාවක්. අපි දෙන්න හිටියෙ මේ විසිත්ත කාමරයේ. ඇය අප වෙත දුවගෙන ආවේ ඇස්වල කඳුළු පුරවාගෙන. ඇය මෙහෙම කිව්වා.

"මහත්මයා. මං කාර්යාල කාමරයට ගියේ අඟුරු භාජනයට ගල් අඟුරු පුරවා තබන්න. මට ලොකු ශබ්දයක් ඇහුණා. ඒක හරියට ලොකු බල්ලෙකු තරහෙන් කරන ගෙරවීමක් වගේ. දඩාවතේ යන බල්ලෙකු වත් අපේ ගෙට ඇතුළුවෙලාද කියල, මං ඉතාම හොඳින් සෝදිසි කරල බැලුවා. නමුත් එහෙම සැක සහිත කිසිම දෙයක් මට දකින්න ලැබුණෙ නෑ. ඊළඟට මම ආයෙමත් මගේ වැඩකටයුතු වල යෙදුණා. එතකොට මට දැනුණා මොකෙක් හරි ලොකු සතෙක් මගේ ඇගේ දැවටී ගෙන මාව පහුකරගෙන ගියා. මං ක්ෂණිකව ආපහු හැරිලා බැලුවත් කිසිවක් දුටුවේ නෑ. ඊළඟට ඇගේ දැවටීගෙන ගිය සතා යළිත් වරක් අනෙක් පැත්තට ගමන් කළා වගේ මට දැනුණා"

අපි දෙන්න වහාම ඒ කාමරයට ගිහින් බැලුවා. අපට නම් කිසිවක් දකින්න ලැබුණේ නැහැ. සේවිකාව තදින් කැලඹීමට පත්වෙලයි හිටියේ. ඒ නිසා ඇයව මුළුතැන්ගෙට කැඳවාගෙන ගිහින් ඇයට බීමට තේ කෝප්පයක් පිළියෙල කර දෙන්න මගේ බිරිඳ පියවර ගත්තා. ඔවුන් දෙදෙනා කාමරයෙන් පිටවී ගියාට පස්සෙයි මට බිත්තියේ සලකුණු දකින්න ලැබුණේ"

"ඒ මොන සලකුණුද?"

"අර සතෙකුගේ පහුරු ගෑම් ලකුණු කියා මගේ බිරිඳ කීවේ. අන්න ඒවා. අපි ඔබට කලින් කීවා කාමරයේ පොළොව මට්ටමේ





සිට තරමක් ඉහළට බිත්ති වලට සවිකර තිබූ පනේල ලෑලි ගැන. කලින් තිබූ පළුදු වූ ලෑලි වෙනුවට අලුත් ලෑලි සවිකළ බව මං ඔබට කිව්වා. අපේ සේවකයන් ඒ කටයුත්ත ඉතාම හොඳින් කළ නිසා මං බොහොම සතුටට පත්වෙලයි හිටියේ. කලින් තිබූ වෙස්ට්නට් දැවය වෙනුවට බුරුම තේක්ක නම් දැවයයි අප අලුතෙන් යෙදුවේ. ඒක මිල අධික වුණත් ශක්තිමත් අලංකාර දැවයක්. ඉතින් සතෙකු පහුරු ගෑ සලකුණු මේ ලෑල්ලෙත් දුටුවාම, මගේ සිතේ ඇතිවුණු පුදුමය මෙන්ම කෝපය ඔබට හිතාගන්න පුළුවන් නේද? මුලින් මට හිතුණේ මොකක් හරි තල්ලු වෙලා ඇවිත් මේ ලෑල්ලේ තදින් වැදීම නිසා මේ සලකුණු ඇතිවෙන්න ඇති කියලයි. නමුත් එහෙම තල්ලුවෙන්න බර දෙයක් කිට්ටුවක තිබුණෙ නෑ. නමුත් ඒවාට. හුඟක් ළංවෙලා පරීක්ෂා කර බැලුවාම මට පෙනුණා, මේවා තරමක් ඇතුළට හෑරී ඇතිවුණු සලකුණු බව. අනෙක මේවාත් කලින් තිබූ ඒවාට හැම අතකින්ම සමානයි. ඒවා පරීක්ෂා කර බලා මං එතැනින් නැගිට්ටා විතරයි. මට ලැබුණු ඊළඟ අත්දැකීමෙන් මගේ ඇඟ කිළිපොළා ගියා. මට ඇහුණා ලොකු බල්ලෙකු උගේ ඇඟ ගසා දමනවා වැනි ශබ්දයක්. ඒක හරියට තෙමුණු බල්ලෙකු උගේ ඇඟේ ඇති වතුර ගසා දමනවා වගේ එකක්. කිසි දෙයක් මට දකින්න ලැබුණේ නෑ. නමුත් ඒ සතා මගේ ඇඟේ හැප්පී ගෙන ගියා වගේ දැනුණා."

"ඔබට දකින්න ලැබුණේ මොනවාද?"

"මං කිසිවක් දුටුවේ නෑ. තවදුරටත් පරීක්ෂා කර බලන්න මං එතැන රැඳුණෙත් නැහැ. මං වහාම කාමරයෙන් එළියට ඇවිත් ඒ දොර වසා යතුරු දැම්මා. ඊළඟට මං සේවකයන්ට උපදෙස් දුන්නා මෙහෙම. තවත් සෑහෙන කාලයකට අපි ඒ කාමරය පාවිච්චි කිරීමට බලාපොරොත්තු නොවන නිසා එය පිරිසිදු කිරීම අනවශ්‍ය බව"

මොහොතක් කල්පනා කරමින් සිටි හෝම්ස් තම මීළඟ ප්‍රශ්නය ඉදිරිපත් කළේය.

"මේ සේවක සේවිකාවන් ඔබ ළඟ ඉන්නේ හුඟක් කල් ඉඳලද? එහෙමත් නැත්නම් ඔවුන් ඇඩම්ස් ළඟ සේවය කරලා පසුව ඔබට එකතුවුණු අයද?"

"ඇඩම්ස්ගේ සේවකයන් කිසි කෙනෙකු අප ළඟ නැහැ හෝම්ස් මහත්මයා" රොබින්සන් මහත්මිය කීවාය. "ඇඩම්ස්ගේ හදිසි

මරණයෙන් පසු ඔවුන් ලෝක අමාරුවක වැටිලයි හිටියේ. ඒකට හේතු කීපයක් තිබුණා. හියුගෝ ඇඩම්ස්ගේ කුප්‍රකට බව නිසා මෙම සේවකයන්ගෙන් කිසි කෙනෙකුට, කොහේවත් රැකියාවක් හොයා ගැනීම අපහසු වන බව, ඔවුනට වැටහෙන්න ඇති. අනික් අතට මෙම සේවකයන් ගැන ගමේ අයගේ තිබුණේ දැඩි පිළිකුලක් මෙන්ම ද්වේශයක්. සේවකයන් තිදෙනෙක් කෙළින්ම මගේ සැමියා වෙත පැමිණ මෙහි රැකියා ලබාගත හැකිදැයි විමසුවා. තවත් දෙදෙනෙකු වක්‍රව විමසා තිබුණා. නමුත් ඒ හැමදෙනෙකුම ප්‍රතික්ෂේප කරන්න දෙවරක් හිතන්න උවමනා වුණේ නෑ. දැනට අප ළඟ ඉන්නේ දීර්ඝ කාලයක සිට අප ළඟ සේවය කරන විශ්වාසවන්ත හිතෛෂී සේවක මඬුල්ලක්."

"දැන් සඳහන් කළ එකට අමතරව ඔබ.කිසියම් වෙනත් අප්‍රසන්න සිදුවීමකට මුහුණ දුන්නද? ඔබ සතු යමක් නැතිවුණාද? එහෙමත් නැත්නම් ඔබට අයිති යමක මුද්‍රා කඩා අනවසරයෙන් පාවිච්චියට ගැනීමක් සිදු වී තිබුණාද?"

"නෑ හෝම්ස් මහත්මයා. හැම සිදුවීමක්ම අර කාමරයට සීමාවුණා"

"මං හිතන්නේ අප මේ අපූර්ව කාමරය පරීක්ෂා කර බැලිය යුතුයි" හෝම්ස් කීවේ තම අසුනෙන් නැඟී සිටිමිනි. "අපට පෙන්වන්න යා යුතු දිශාව"

අපි රොබින්සන් යුවළ පසු පස ගොස් තරප්පු පෙළේ ඉහළට නැඟුණෙමු. වසන්ත ඍතුවේ දවස ගෙවී ගොස් අඳුරු වැටෙමින් තිබිණි. නිවස පුරා පහන් දල්වමින් තිබූ අයුරු අපි දුටුවෙමු.

උඩුමහලේ එක් දොරක් ඉදිරිපස නැවතුණු ගෙහිමියා සාක්කුවෙන් යතුරක් ගෙන දොර විවෘත කිරීමට සූදානම් විය. එම දොර ඉදිරියේ තිබුණේ අසාමාන්‍ය අඳුරු බවක් යයි මට සිතිණි. එය සැබැවින්ම තිබූ දෙයක්ද, නැතිනම් මගේ සිතේ මැවුණු සිතිවිල්ලක්ද යන්න මට කිව නොහැක. ඒ සමීපයේ සිවිලිමේ එල්ලා තිබූ පහනේ ස්වභාවය ද සාලයේ තිබූ අනෙක් පහන් වලට සමාන බැව් පෙනිණ. කෙසේ වෙතත් ඒ ගැන කිසිවක් නොකියා මම නිශ්ශබ්ද වූයෙමි. රොබින්සන් මහතා මේ මොහොතේ දොර විවෘත කළේය.

සීතල සුළං ධාරාවක් එක්වරම කාමරය තුළින් හමාවිත් මගේ දෙපාවල වළලුකර ප්‍රදේශයේ ඇවටිණි. මීළඟට එය ක්‍රමයෙන්





ඉහළට නැඟුණේ වඩාත් ප්‍රබල වෙමිනි. කාමරය තුළ සිටි යම් අදිසි හස්තයකින් මා එළියට තල්ලු කරන්නේද යන හැඟීම ඇතිවී මම නැතිගත්තෙමි. මෙම අසාමාන්‍ය සුළං පහර නිසා සිතේ කැලඹීමක් ඇතිවූයේ මට පමණක් නොවන බව මම වහා තේරුම් ගතිමි. මගේ මිත්‍ර හෝම්ස්ගේ මෙන්ම රොබින්සන් යුවළගේ මුහුණුවලද එම සලකුණු දක්නට ලැබිණ.

එය ප්‍රමාණයෙන් සෑහෙන තරම් විශාල කාමරයක් විය. දහවල් කාලයේ දීප්තිමත් හිරුඑළිය එය තුළට වැටෙද්දී එය ප්‍රසන්න තැනක් විය යුතු බව මට සිතාගැනීමට හැකිවිය. විශාල ජනේල වලින් දිස්වූයේ තණකොළ වවා තිබූ මිදුල සහ මෑතකදී රෝපණය කළ, එහෙත් මල් පිපිදුණු මල් ගස් රාශියකි. බිත්තිවලට සවිකර තිබූ ඔපදැමූ ලෑලි කාමරය තුළට උණුසුම් මෙන්ම සිත් අදනා ප්‍රියංකර බවක් ගෙන ආවේය. කෙසේ වෙතත් මීට මඳ වේලාවකට පෙර මට අසන්නට ලැබුණු පුදුමාකාර කතන්දරය නිසාත්, ඇල්වූ පහන්වලින් නිකුත් වූ දුර්වල ආලෝකය නිසාත්, කාමරය තුළ මා දුටුවේ දුෂ්ඨ බියකරු පෙනුමක් බැව් කිව යුතුය. අප මේ අනවසරයෙන් පිවිසී බාධා කරන්නේ, ගුප්ත පුද්ගලයෙකුගේ කුරිරු රහස් සංසරණය වන කුටියකට දැයි, මගේ සිතේ හැඟීමක් ඇති විය. අප වහා එළියට යා යුතු යයි මගේ මිත්‍රයා අදහසක් පළකළා නම්, එක් ක්ෂණයකින් ඔහුට පෙර මා එතැනින් එළියට යන්නට ඉඩ තිබිණි. කෙසේ වෙතත් හෝම්ස් කළේ සෙමෙන් සෙමෙන් කාමරය මැදටම පිය නැඟීමයි. ඒ අතර ඔහු හිස සෑම අතටම හරවමින් විමසිල්ලෙන් බැලීය. කාරණා රැසක් ඔහු නිරීක්ෂණය කරන්නට ඇත. මීළඟට ඔහු රොබින්සන් මහතා ඇමතුවේය.

"ඔබ කලින් සඳහන් කළ සලකුණු තියෙන්නෙ කොතැනද?"

"මෙන්න මේ පැත්තේ හෝම්ස් මහත්මයා" කී ඔහු අප කැඳවාගෙන ගියේ කාමරය උණුසුම් කිරීම සඳහා ඇති ගිනි උදුන දෙසටය. එතැන සිට තරමක් ඈතට බිත්තියේ සවිකොට තිබුණේ වටිනා දැවයක ඔප දැමූ ලෑල්ලකි. ගස්වැල්වල කොළ අතු සහ මල් දැක්වෙන දර්ශනයක් එහි සියුම්ව කැටයම් කර තිබූ බැව් මම දුටුවෙමි. රොබින්සන් මහතා ඒ ඉදිරියෙන් දණ ගසා ගත්තේය. කෙසේ වෙතත් එම කැටයම අභිභවා කැපී පෙනුණේ ලෑල්ල තුළට හැරුණු යම් සලකුණුය. ඒවා ප්‍රමාණයෙන් විශාල සුනඛයෙකුගේ

නියපොතුවලින් සෑදුණු ඒවා විය යුතු යයි මට සිතිණ. කෙසේ වෙතත් මේ සලකුණු ඇතිකළ තිරිසන් සත්ත්වයා දැකීමට නම් මගේ කිසිදු කැමැත්තක් නොවීය. දණගසා ගෙන සිටි රොබින්සන් මහතා නැගිටීමට සූදානම්ව, ලෑල්ලෙන් එහා බිත්තියට ද දෙනෙත් යොමු කළේය. මීළඟට ඔහුට කෙඳිරි ගෑවිණි.

"අලුතෙන් තවත් සලකුණු වගයක් ඇවිත්"

"ඔබට හොඳටම විශ්වාසද?" මම ඇසීමි.

"හොඳටම විශ්වාසයි! මං අන්තිම වරට මෙතැන බලද්දී ඔය සලකුණු තිබුණෙ ලෑල්ලෙ දිගට විතරයි" ඔහු කීය. "දැන් ඔබට පෙනෙනවා ඇති ඒවා ලෑල්ලෙන් පිටත, බිත්තිය මතුපිටත් තිබෙන බව. මේක සිදුවුණේ කොහොමද කියල මට තේරුම් ගන්න අමාරුයි. ඒ මොකද පහුගිය සතියෙම කාමරය හොඳටම අගුළු දාල තිබුණෙ. මේකට කිසිම කෙනෙකු ඇතුළු නොවුණු බව මට හොඳටම විශ්වාසයි. මේක කරන එකා මොකාද?"

මෙතෙක් වේලා නිහඬව බලා සිටි හෝම්ස් ගමන් කළේ කාමරයේ එක් කෙළවරක තිබූ මේසයක් වෙතටය. එය රතු පැහැති මැහෝගනි ලීයෙන් නිමවා තිබූ එකකි. එහි තිබුණේ තරමක් පැරණි පෙනුමකි.

"රොබින්සන් මහත්මයා" හෝම්ස් කීය. "ඇඩම්ස් මහතාට අයත්ව තිබූ ලීබඩු සමහරක් මිලදී ගත් අය පවා ඒවා ඉවත් කරගෙන ගියේ නැහැ කියල ඔබ කිව්වා. මේ මේසය එවැනි එකක්ද?"

"ඇත්තෙන්ම ඔව්. නමුත් ඔබ කොහොමද ඒ බව තේරුම් ගත්තේ?"

"මේ කාමරයේ තිබෙන අනෙක් ලී බඩු හැම එකක්ම වගේ අලංකාර සියුම් නිර්මාණ" හෝම්ස් කීය. "නමුත් ඒ මේසයේ විතරක් තිබෙනවා අනික් ඒවාට නොගැළපෙන රළු ස්වභාවයක්. මේ කාමරයේ තිබෙන අනෙක් ලියන මේසය මත කඩදාසි පෑන් පැන්සල් පොත් ආදිය තිබෙනවා. නමුත් අර මේසය මත ඒ කිසිවක් නැහැ."

"ඔබ කියූ දේ නිවැරැදියි හෝම්ස් මහත්මයා" රොබින්සන් මහතා කීය. "මං මුලින් සිතුවේ ඒක මගේ ලියන මේසය ලෙස භාවිතයට ගන්නයි. එහි දෙපස තිබෙන ලාච්චුත්, ගැඹුරු පුළුල් ඒවා. නමුත් එතැනට වාඩිවී යමක් ලියන්න පටන් ගත්තාම මට ලොකු අපහසුවක් දැනුණා. සිතේ තිබුණේ කැලඹිලි ගතියක්.





සිතිවිලි කිසිවක් නිසි පිළිවෙළකට ගොනුකර ගැනීමට හැකිවුණේ නෑ. ඒ නිසා එම මේසය භාවිත කිරීම මං අත්හැර දැම්මා."

"මේ මේසයට වඩා ඒක අයිතිව තිබූ පුද්ගලයා ගැන අපට යමක් කීමට හැකි විය යුතුයි" හෝම්ස් කීය. "එය විකිණීම සඳහා තැබීමට පෙර එම අලෙවිකරුවන්, එහි ලාච්චු හොඳින් පිරිසිදු කර තබන්න ඇති. නමුත් ඔබට එහි තිබී කිසිම දෙයක් හමුවුණේ නැද්ද?"

"ඔබ කියන දේ හරි පුදුමයි හෝම්ස් මහත්මයා. ඔබ කිව්වා වගේ ලාච්චුවල තිබූ බඩු බාහිරාදිය සියල්ලම අලෙවිකරුවන් ඉවත් කොට තිබුණා. වටිනා යමක් තිබුණා නම් ඒවා හමුවෙන්න ඇත්තේ ඔවුනට. මට නම් ඒ දිනවල කිසිවක් දකින්න ලැබුණේ නැහැ. නමුත් දින කිහිපයකට පසු පුවත්පතේ ප්‍රහේලිකාවක් පුරවමින් සිටියදී, මට මකන කෑල්ලක් උවමනා වුණා. එය අස්ථාන ගතවෙලා නිසා මං හැමතැනකම බැලුවා. ඇඩම්ස්ගේ මේස ලාච්චුවකවත් මං එය අමතක වීමකින් දමලාද කියා මට සිතුණා. ඉතින් එම ලාච්චු විවෘත කරන්න උත්සාහ කරද්දී එයින් එකක් හිර වී තිබුණා. ඒ මට කලින් විවෘත කිරීමට හැකිව තිබූ ලාච්චුවක්. නමුත් ලාච්චුව ඇතුළට තල්ලු කරමින් යළි එළියට අදිමින් මම අමතර ශක්තියක් යොදමින් උත්සාහ කළා. අන්තිමේදී තරමක් අපහසු වුවත් ලාච්චුව විවෘත කර ගැනීමට මට හැකිවුණා. එය එසේ හිරවී තිබීමට හේතුව එහි දාරයට කඩදාසි කැබැල්ලක් හිරවී තිබීම බවයි මට පෙනුණේ"

"ඒ කඩදාසි කැබැල්ල තවමත් ඔබ ළඟ තියෙනවද?" හෝම්ස් විමසුවේ නොඉවසිල්ලෙනි.

"ඒ වෙලාවෙ මට ඒකෙ වැදගත් කමක් පෙනුණෙ නෑ" ගෙහිමියා කීයා. "මං ඒක මගේ ලියකියවිලි අතරට දමන්න ඇති" කී ඔහු තමා පාවිච්චියට ගත් මේස ලාච්චුවේ ලියකියවිලි අවුස්සා පරීක්ෂා කළේය. ඔහු අප සිටි තැනට පැමිණෙන තෙක් අපි නිහඬව බලා සිටියෙමු. අන්තිමේදී ඔහු පැමිණියේ කහ පැහැ ගැන්වුණු කඩදාසි කැබැල්ලක් ද අතැතිවය. මගේ මිත්‍රයා එය පරීක්ෂා කර බැලීය. එහි යමක් ලියා තිබුණේ නොපැහැදිලි අකුරෙනි. අපේ පහසුව සඳහා හෝම්ස් එය ශබ්ද නඟා කියෙව්වේය.

"........ මෙය මගේ නිධාන අතරේ තැන්පත් කර තිබුණේ මගේ යහපත සඳහා නොවේද? පළිගැනීම මෙන්ම ප්‍රතිප්‍රහාර

එල්ල කිරීම දැන් ඇත්තේ මා භාරයේය. සුදුසු කාලය පැමිණි විට ඔවුන් පා ලිස්සා ඇද වැටෙනු ඇත. ඔවුන්ගේ විනාශය ළඟ ළඟම එයි. ඔවුන්ගේ හිස් මතට කඩා හැළෙන අභාග්‍යය වහ වහා පැමිණෙත්වා!"

"නිධාන!" කී හෝම්ස් අතිශයින්ම කල්පනාකාරී වන අයුරු මම දුටුවෙමි. "පළිගැනීම සහ ප්‍රතිප්‍රහාර එල්ල කිරීම" ඔහු මෘදු හඬින් තමාටම කියා ගත්තේය. එක්වරම ඔහුගේ දෙනෙත් යොමුවූයේ බිත්තියේ හැරී තිබූ නියපොතු පාරවල් දෙසටය. මඳ වේලාවක් හෝම්ස් කල්පනා කළේ නළල රැළි කරගෙනය. අනතුරුව ඔහු රොබින්සන් මහතා ඇමතීය.

"මේක ටිකක් අමාරු කටයුත්තක් වෙන්න පුළුවනි. කරුණාකර මට පොරවක් සහ අලවංගුවක් ලබාදෙන්න"

"ඔව්. ඒක අපහසුවක් නෑ. හෝම්ස් මහත්මයා ඔබ මොකක් කරන්නද සූදානම් වෙන්නෙ?"

"මේ ලෑල්ල සවිකර තිබෙන්නේ නිවසේ පිටත බිත්තියකට නේද?"

"ඔව්. ඔව්" රොබින්සන් මහත්මිය කලබලයෙන් කීවාය. "ඇයි මහත්මයා. මොනවද ඔබට හිතුණෙ?"

"මට හිතුණු දේ සියල්ල පැහැදිලි කරදීමට තවමත් කාලය එළඹුණේ නැහැ. ඒ වුණත් මේ ගැටලුවට විසඳුම තියෙන්නේ මේ බිත්තිය පිටුපස විය යුතුයි කියල මං විශ්වාස කරනවා. ඒ ගැන සොයා බැලීම අපි ඉක්මන් කළ තරමට හොඳයි. එතකොට ඔබ දෙදෙනාගේ සිත් අවුල් කළ අභිරහස විසඳා අවසන් කරන්න අපට හැකිවේවි."

හෝම්ස් ඉල්លූ උපකරණ ගෙන ඒම සඳහා රොබින්සන් මහතා පිටවී ගියේය. මිනිත්තු දෙකක් ගතවීමට පෙර ඔහු ආපසු පැමිණියේ ඒවා අතින් ගෙනය. අන්තිමේදී මෙම උපකරණ අවශ්‍ය නොවූ බැව් පෙනිණ.

හෝම්ස් ගිනිඋදුන සමීපයේ සිට කැටයම් තිබූ ලෑල්ල දෙස අත යවමින් සෝදිසි කළේය. මම ලන්තෑරුම අතින් ගෙන ඔහුගේ එම පරීක්ෂාවට ආලෝකය ලබාදුන්නෙමි. මිනිත්තු කිහිපයකින් හෝම්ස්ගේ මුවෙන් නිකුත් වූයේ ජයග්‍රාහී හඬකි.

"මං හිතන්නේ මට අහුවුණා අප සෙවූ අභිරහස විසඳන යතුර."





ඒ සමඟම අපට අසන්නට ලැබුණේ "ක්ලික්" හඬින් යම් අගුලක් විවෘත කරන්නාක් වැනි තියුණු ශබ්දයකි. කෙසේ වෙතත් එය කාමරය පුරා ශබ්දය රැව්පිළිරැව් දුන් තියුණු එකක් විය. අපි පුදුමයෙන් ලෑල්ල දෙසම ඇසිපිය නොහෙළා බලා සිටියෙමු. දක්නට ලැබුණු දර්ශනයෙන් අතිශය භීතියට පත්ව ගල්ගැසී සිටියේ කවුරුන්දැයි මම නොදනිමි.

බිත්තිය ආවරණය කොට තිබූ ලෑල්ල සෙමින් සෙමින් ඉදිරියට චලනය වූයේ කිසිවෙකු පිටුපස සිට එය ඉදිරියට තල්ලු කරන ආකාරයෙනි. මේ සිතිවිල්ල කාගේත් සිත්වල පහළ වන්නට ඇත. කිසිවක් නොකියා කවුරුවත් ගල්ගැසී ඒ දෙස බලා සිටියේ ඒ නිසා විය යුතුය.

මීළඟට ලන්තෑරුම මගේ අතින් ගත් හෝම්ස් එය රොබින්සන් මහතා අතට දී ඔහු ඉදිරියට කැඳෙව්වේය.

"වොට්සන්. මට උදව් කරන්න. අපි මේ ලෑල්ල ඉවතට ගමු"

ලෑල්ලේ ඉහළ දාරයෙන් අල්ලා ගත් අපි එය අප දෙසට ඇද්දෙමු. මුලදී එය නොසෙල්වී තිබුණේ කිසිවෙකු එය ඇතුළතින් තදින් අල්ලාගෙන සිටින ආකාරයෙනි. ඉන්පසු කවුරුන් හෝ සුසුමක් හෙළන්නාක් වැනි ශබ්දයක් සමඟ ලෑල්ල ගැලවී ආවේය. ලෑල්ලට පිටිපසින් අපට දක්නට ලැබුණේ ඍජුකෝණාස්‍රාකාර අන්ධකාර කුහරයකි. එක්වරම ඒ තුළින් හමා ආවේ ශීතල සුළං පහරකි. ඒ සමඟම අපි අඩියක් පිටුපසට ගත්තෙමු. මොහොතකට පසු අප තවත් ලන්තෑරුමක් රැගෙන එම කුහරය වෙත වඩාත් ළංවූයේ එහි ඇතුළත දැක ගැනීමේ අරමුණෙනි.

ඒ තුළ අප දැකීමට බලාපොරොත්තු වූයේ කුමක් දැයි මට කිව නොහැක. එම කුටීරය තුළ සිටුවා තිබුණේ. අල්තාරයක් ලෙස පෙනුණු කුඩා මේසයකි. මෙහි මනුෂ්‍යයෙකුට රැඳී සිටීමට තරම් ස්වල්ප ඉඩකඩක් තිබිණි. අඳුරු පැහැති ලීයකින් තනා තිබූ කුරුසියක් හිස පහළට සිටින සේ මේසයට උඩින් එල්ලා තිබිණි. එය අතට ගත් රොබින්සන් මහතා එය පොළොවට දමා ගැසුවේ මහත් පිළිකුලෙනි. පූජකවරුන් ආගමික උත්සව වලදී අඳින ඇඳුම් ලෙස දිස්වූ ඇඳුම් කිහිපයක් පුටුවක් මත දමා තිබිණ. හම් බැම්මෙන් බැඳ තිබූ පොතක් සහ කළු පැහැති දියරයක් පුරවා

තිබූ කුඩා වීදුරු කිහිපයක්ද මේසය මත විය. මේසයේ ලාච්චුවක පෑන්, තීන්ත මෙන්ම ලේඛනය සඳහා යොදාගන්නා වියළු සම කිහිපයක්ද අපි දුටුවෙමු. නූලකින් එකට ගැටගසා තිබූ සටහන් පොත් කිහිපයක් තවත් ලාච්චුවක තිබී හමුවිය. නූල කපා දමා එම පොත් කිහිපය පෙරළා බැලූ හෝම්ස්ගේ මුහුණට මඳ සිනාවක් නැඟිණ.

"මේක මං හිතුවා වගේමයි" හෝම්ස් කීය. "මෙවැනි දෙයක් තිබිය යුතුමයි කියල මං නිශ්චය කළා. "ඔහු කීවේ එතැනින් වම් පසට අත දිගු කරමිනි. අපි ඒ දෙසට දෙනෙත් යොමු කළෙමු.

කුටියේ කෙළවරක කුඩා දොරටුවක් ද එතැනින් පහළට යා හැකි ගල්වලින් සෑදූ රළු පියගැට පෙළක් ද එහි විය. මෙම පියගැට පෙළ අවසන් වූයේ නිවස පිටත බිත්තියට සහ ඇතුළත ඉදිකළ බිත්තියකට මැදින් සාදා තිබූ රහසිගත උමං මාර්ගයකිනි.

"මේ උමං මාර්ගය අවසන් වනවා ඇත්තේ වත්ත පහළ ආවරණය වූ තැනක පිහිටි රහසිගත දොරටුවකින්"

අපේ ළඟ තිබූ ලන්තෑරුම්වල ආලෝකය ගිල දැමෙන ඇඩි අන්ධකාරයක් ඉදිරියෙන් විය. ඊට අමතරව ඒ දෙසින් හමා ආවේ දුර්ගන්ධයක් මුසු වූ ඉතා ශීතල සුළඟකි.

"අපේ ගවේෂණ කටයුතු අද රාත්‍රියට මෙතැනින් අත් හිටුවන එක වඩා හොඳයි කියා මට හිතෙනවා" හෝම්ස් කීය. "ඒ මොකද මේ වෙලාවේ අන්ධකාරයේ ඉදිරියට යාම අපේ ආරක්ෂාවට හොඳ නෑ. මේකට අරක් ගත් පුද්ගලයා මනුෂ්‍යයෙකු මිස යක්ෂයෙකු කියා මං හිතන්නේ නෑ. ඒ මනුෂ්‍යයා ගිනි අවියකින් සන්නද්ධ වී සිටීමට ඉඩ තිබෙනවා. ඒ හින්දා ගවේෂණ කටයුතු හෙට උදේ වෙනතුරු අත්හිටවලා ඇතුළත දොරටුව අපි අවහිර කරමු"

* * *

පැයකට පමණ පසු අපි රාත්‍රී ආහාරය සඳහා භෝජනාගාරයේ අසුන් ගත්තෙමු. සේවකයන් එහා මෙහා ගමන් කළ බැවින් අපගේ සොයාගැනීම් ගැන කිසිදු කතාබහක් නොකිරීමට අපි පරෙස්සම් වූයෙමු. රාත්‍රී ආහාරයෙන් පසු නිවසේ පුස්තකාල කාමරය වෙත පැමිණිය යුතු යයි අප දෙදෙනාට ඇරයුමක් විය. කෝපි සහ බ්‍රැන්ඩිවලින් සංග්‍රහ කෙරෙන අතරේ හෝම්ස් තම පයිප්පය දල්වා ගත්තේය. ඔහු කරුණු පැහැදිලි කරන ආකාරයට සවන්දීමට රොබින්සන් මහතා සහ මහත්මිය සිටියේ නොඉවසිල්ලෙනි.





"මෙම අභිරහස් සිදුවීමට මියගිය හියුගෝ ඇඩම්ස්ගේ කුමන ආකාරයක හෝ සම්බන්ධයක් තිබෙන බවට සැකයක් අප කාගේත් සිත්වල තිබුණා" හෝම්ස් කථාව ඇරඹුවේය. "නමුත් එය මෙතැනදී මුල් විහිදී තිබෙන්නේ කුමන ආකාරයකටද කියන එකයි ලොකුම ගැටලුව වුණේ. ඇඩම්ස් විශාල ධනයක් එක් රැස්කරගත් අයෙකු බවට සැකයක් නැහැ. ඔහුට සතුරන් විශාල සංඛ්‍යාවක් සිටි බවටත් ආරංචියි. අනික් අයගෙන් වෙන්වෙලා තනියම ජීවත්වුණු ඔහු තමන්ගේ ආරක්ෂාවට අමතර පියවර ගන්න ඇති කියලා මං කල්පනා කළා. ඔහුගේ නිවස ඉදිකළ යුගයේ මන්දිර ඉදිකිරීමේදී යොදාගත් එක් සුවිශේෂ උපක්‍රමයක් ගැන මා දැන සිටියා. ඒ තමයි හදිසි සතුරු ආක්‍රමණයකදී නිවැසියන්ට ආරක්ෂා සහිතව සැඟවී සිටීමට හැකි කුඩා කුටියක් භූගතව ඉදිකර තිබීම. මේක එකල රජවරුන්, වංශාධිපතීන් ධනවතුන් සහ අනෙකුත් ප්‍රභුවරුන් අනිවාර්යයෙන්ම අනුගමනය කළ පිළිවෙතක්.

මෙම පුරාණ නිවසේ එම රහස් කුටීරය ගැන දැනගත් පසු ඇඩම්ස් එය තවත් වැඩි දියුණු කළ බවට සැකයක් නෑ. ඒ බවට සාක්ෂි අප දුටුවා. මෙම රහස් කුටිය ගැන අඩුම වශයෙන් එක් සේවකයෙකුවත් දැන සිටින්න ඇති. ඒ මොකද තමන්ගේ ස්වාමියා එය තුළ හිරවී කරදරයකට පත්වුණොත්, ඔහු ගලවා ගැනීම සඳහා. සේවකයන් මොන තරම් කැපවීමෙන් හා පක්ෂපාත ලෙස ස්වාමියාගේ රහස් ආරක්ෂා කළත්, ඔවුන් අතින් ඒවා හෙළිවෙන අවස්ථා තියෙනවා. ඒ මුදලට නැත්නම් ගෞරවයක් ලබාගන්න; නැත්නම් පළිගැනීමේ චේතනාවෙන්. ඒ අනුව මෙම රහසිගත කුටිය ගැන දන්න කිහිප දෙනෙකුවත් මේ ගමේ සිටිනවා ඇති කියලයි මං හිතන්නේ. ඉතින් අපට ඉන්නවා විස්මය ජනක ස්වභාවයක් ඇති, අරුම පුදුම ජීවිතයක් ගත කරන විශාල ධනවතෙක්. ඔහු හදිසියේම මියයන්නේ ඔහුගේ ධනස්කන්ධයට උරුමකම් කියන කිසිවෙකු නොමැතිව.

මොහු ගැන ගමේ අයගේ තිබුණේ සෑහෙන අප්‍රසාදයක් බව ඔබ කිව්වා. මුලින් ඔබගේ නිවස ප්‍රතිසංස්කරණය සඳහා පැමිණි අයගෙන් කවුරු හරි මෙහි රහස් කුටිය ගැන දැන හිටියා. නැත්නම් අහම්බෙන් එය ඔවුනට හමුවූවා වෙන්නත් පුළුවනි. ඒ කුමක් වුණත් ඔවුන් අපේක්ෂා කරන්න ඇති මෙහි සඟවා තිබෙනවා කියන

නිධානය සොයාගන්න. ප්‍රතිසංස්කරණ කටයුතු පමාවීම ඔවුන් සැලසුම් සහගතව කළ දෙයක්. නිධානය හමුවන තුරු පිළිසකර කටයුතු පමා කිරීම ඔවුන්ගේ අරමුණ වෙන්න ඇති.

ඔබට වරින්වර අහන්න ලැබුණු පියවර හඬ ගැන කියනවා නම්; ඒ භූත ආත්ම දෙකකින් නැඟුණු ඒවා නෙමෙයි; නිධාන සෙවීමට රහස් කුටියට ආ ගිය මනුෂ්‍යයින් දෙදෙනෙකුගේ පියවර හඬ. අතිශය සීතල සුළං ප්‍රවාහ නිවස තුළට හැමුවේත් ඔවුන් ඒ රහස් දොරටු විවෘත කොට උමඟ තුළට පැමිණි නිසා.

හියුගෝ ඇඩම්ස්ගේ ලියවිලි අතර ඔහු සතු නිධානයක් ගැන සඳහනක් අපට හමුවුණා. ඔහු සැබැවින්ම ධනවතෙකු වුණු නිසා රන් රිදී මුතු මැණික් වැනි ද්‍රව්‍යමය වස්තු සම්භාරයක් තිබුණා වෙන්නත් පුළුවනි. නිධන් සෙවූ අය සමහරවිට මේ වෙනකොට ඒ වස්තුව සොරකම් කරගෙන ගිහිං වෙන්නත් පුළුවනි. නමුත් රොබින්සන් මහත්මයා බලාපොරොත්තු කඩකර ගන්න එපා. මේ නිවසේ අපට දකින්නට ලැබුණු රහස් කුටීරයට අමතරව තවත් රහසිගත කුටි ඇති බව මට හොඳට විශ්වාසයි. දැන් ඉතින් අමනුෂ්‍ය බියක් නොමැති නිසා ඒව ඔබට නිදහසේ සෝදිසි කර බලන්න පුළුවනි. කොහොම වුණත් ඔබ දෙදෙනාට අප්‍රමාණ කරදරයක් වුණු පියවර හඬ සහ අනෙක් ශබ්ද වලින් බේරීමට නම් ඔබට කරන්න තියෙන්නේ උමගට පිවිසෙන පිටත හා ඇතුළත දොරටු වසා දැමීමයි."

"ඒ වුණත් හෝම්ස් මහත්මයා මගේ ඇගේ බල්ලෙකු වැනි සත්ත්වයෙකු දැවටී ගිය ආකාරය ඔබ තේරුම් කරන්නේ කොහොමද?" රොබින්සන් මහතා විමසුවේය. "මට විතරක් නෙමෙයි. අපේ සේවිකාව ඇලිස්ටත් එය දැනී තිබුණා"

"ඔබේ බිරිඳ සඳහන් කළ ආකාරයට ඇලිස් සිටියේ සිතේ කැලඹීමෙන්. සතෙකු ඇගේ වැදීගෙන ගියා කියන්නේ ඇය සිතේ මවා ගත් දෙයක් කියලයි මට හිතෙන්නේ. ඔබ කාමරය තුළට යද්දී ඔබේ සිතේ වැඩ කළෙත් ඇය පැවසූ වදන්. මේ වෙලාවේ හමා ආ සීතල සුළං පාරකට නොයෙක් අද්භූත හැඩ ගන්න පුළුවනි"

"හෝම්ස් මහත්මයා" රොබින්සන් මහත්මිය විමසා සිටියාය. "අර බිත්තියට සවිකළ ලෑලිවලින් පසුව බිත්තියේත් සතෙකුගේ නියපොතු පාරවල් වැනි සලකුණු ඇතිවුණේ කොහොමද? අනික





මොකක්ද අර කඩදාසි කැබැල්ලක අනතුරු ඇඟවීමක් වැනි යමක් ලියා තැබීමෙන් ඔහු අදහස් කළේ?"

"ඒ දේවල් පැහැදිලි කිරීම ඒ තරම් අපහසු නෑ" හෝම්ස් කීය. "ඔබට ලෑල්ලේ හා බිත්තියේ දකින්න ලැබුණු සලකුණු, මුවහත් නියනකින් ඉතා පහසුවෙන් කළ හැකියි. ගෙදර අලුත් වැඩියාව සඳහා පැමිණි වඩු කාර්මිකයෙකුට මේ වගේ දෙයක් මිනිත්තු කිහිපයකදී කළ හැකියි.

කඩදාසි කැබැල්ල ගැන නම් ඔබ සිතූ දේ නිවැරැදියි. ඇඩම්ස් එය කල් තබා ලියා තැබුවෙ ඔහුගේ නිධාන සොයමින් කඩා බිඳ දැමීම කරන හොරුන්ට අනතුරු ඇඟවීමක් වශයෙන්. ඔබට මතක නේද වොට්සන් මේ වගේ දෙයක් අපට ඊජිප්තු ශාපය කතාවේදිත් අහන්න ලැබුණා. ඊජිප්තුවේ පුරාණ රජවරුන්ගේ සොහොන් ගැබවලත් මේ ආකාරයේ අනතුරු ඇඟවීම්, ශාපකිරීම් තිබෙනවා. ඒ නිධන් හොරුන්ගෙන් සොහොන් ගැබ් බේරා ගැනීමට"

"ඔබට බොහොමත්ම ස්තුතියි. හෝම්ස් මහත්මයා සහ දොස්තර වොට්සන්" රොබින්සන් මහත්මිය කීවේ අත්පොළසන් දෙමිනි. රොබින්සන් මහතා ඒ වහාම අපට හෘදයාංගම අයුරෙන් අතට අත දුන්නේය.

මෙම අසාමාන්‍ය පරීක්ෂණය ගැන මට තවත් කීමට ඇත්තේ කරුණු ඉතා ස්වල්පයක් පමණි. පසුවදාට හිරු පායා ආ පසු රහසිගත කුටිය හොඳ පරීක්ෂාවකට ලක් කෙරිණ. අප කලින් අනුමාන කළ අයුරින් කුටියට සම්බන්ධ ගල් පඩිපෙළ නිවසේ පිටත බිත්තිවලට ඇතුළතින් පහතට ගොස් උමගට සම්බන්ධ විය. පොළොව මට්ටමට අඩි කිහිපයක් පහළින් පිහිටා තිබූ උමඟ යොමුවී තිබුණේ වත්තේ පිටුපසටය. අන්තිමේදී එය අඩි විස්සක් පමණ දුරින් පොළොව මතුපිටට ආවේ ඔවුන් ආවුධ ගබඩාව නමින් හැඳින්වූ ගඩොලින් සෑදූ කුඩා මණ්ඩපයක් තුළටය. එහි දොරවල් අගුළු දමා වසා තිබිණි. එහෙත් කවුරුන් හෝ එහි නිතර ආ ගිය බවට දැක්වෙන සලකුණු ඇති බැව් හෝම්ස් අපට පෙන්වා දුන්නේය. එය වටා වවා තිබූ ගස් හා මල්පඳුරු වලින් මෙම මණ්ඩපයේ පිවිසුම ආවරණය වී තිබිණි. උමගට ඇතුළු වන එතැන දොරටුව මෙන්ම උමඟ නිවසේ කාමරයට සම්බන්ධ කෙරෙන දොරටුව සිමෙන්ති හා ගඩොල් යොදා සම්පූර්ණයෙන්ම

වසා දැමීමට රොබින්සන් මහතා තීරණය කළේය. මගේ මිත්‍රයා ද එය අනුමත කළේය. මීට අමතරව රහස් කුටියේ තිබූ හමුවූ සියලු භාණ්ඩ ගින්නෙන් පුළුස්සා විනාශ කරන බැව් ගෙහිමියා පැවසීය.

පසුවදා උදයේ අපි ලන්ඩනය බලා ඒමට වොරික්ෂයරයෙන් පිටත් වී ආවෙමු. ඒ රොබින්සන් මහතා සහ මහත්මිය අප වෙත පිරිනැමූ තෑගිබෝග හා ස්තුති ප්‍රශංසා මධ්‍යයේය.

දැන් දීර්ඝ කාලයක් ගතවී ඇත. එහෙත් තමනට යළිත් මුහුණ පෑමට සිදුවූ කිසිදු හිරිහැරයක් ගැන රොබින්සන් යුවළගෙන් මෙතෙක් අපට අසන්නට ලැබී නොමැත.



## මුහුදු වෙරළේ බේදවාචකය

ෂර්ලොක් හෝම්ස් මහතා යෙදුණු පරීක්ෂණ අතරින් භයානකම පරීක්ෂණය ලෙස සැලකෙන්නේ බැස්කවිල් රුදුරු බල්ලා පිළිබඳ පරීක්ෂණය බැව් මගේ පාඨකයනට අමුතුවෙන් කිම අනවශ්‍යය. එම පරීක්ෂණය සඳහා බොහෝ වෙහෙසකර කාල පරිච්ඡේදයකට මුහුණදී විවේකයක් ගැනීමේ අරමුණෙන් අප බේකර් වීදියට පැමිණි බැව් සැබෑය. එහෙත් ඒ පැමිණි ඉක්මනින්ම හෝම්ස්ට තවත් වැදගත් පරීක්ෂණ දෙකක් භාරවිණි.

ඉන් පළමුවැන්න නොන්පැරෙයිල් ක්‍රීඩා සමාජයේ කාඩ් ක්‍රීඩා කිරීමේදී කර්නල් අප්වුඩ් ඇතිකරගෙන තිබූ හුටපටයයි. එම සිදුවීම නිරාකරණය කර දීමට හෝම්ස්ට සිදුවිය.

දෙවැන්න නම් මොන්ට්පෙන්සියර් නම් ප්‍රභු කාන්තාව පිළිබඳ සිදුවීමයි. ඇයට එල්ල වී තිබුණේ මිනීමැරීමේ චෝදනාවකි. ඇගේ සැමියාගේ පළමු විවාහයේ දියණිය වූ කැරේරේ මෙනෙවිය අතුරුදන්ව සිටියාය. මොන්ට්පෙන්සියර් මහත්මියගේ නිර්දෝෂී බව තේරුම් ගත් හෝම්ස්, ඇය නිදහස් කර ගැනීමේ අරමුණෙන් ඇය වෙනුවෙන් අධිකරණයට කරුණු ඉදිරිපත් කළේය. මරා ඇමුණා යයි කී කැරේරේ මෙනෙවිය තවත් මාස හයකට පසු ඇමෙරිකාවේ නිව්යෝක් නගරයේ ජීවතුන් අතර සිට හමුවිණි. ඒ වනවිට ඇය විවාහ වී සිටියාය.

විසඳීමට ඉතාමත් අපහසු වූ මෙම ගැටලු විසඳීමට හැකිවීමෙන් මගේ මිත්‍රයා ඉමහත් සතුටකට පත්ව සිටියේය. එහෙත් ඔහු සිටියේ යහපත් සෞඛ්‍ය තත්ත්වයක නම් නොවේ. අධික රුධිර පීඩනයෙන් පෙළෙන රෝගීන්ගේ රෝග ලක්ෂණ රැසක්ම හෝම්ස් වෙතින් ද දක්නට ලැබිණ. විශේෂඥ කායික වෛද්‍ය ක්විත්සි මොන්රෝ වෙත යළිත් වරක් හෝම්ස් කැඳවාගෙන යාමට මම අපේක්ෂා කළෙමි. එය සාර්ථක වූයේ දිගින් දිගටම මවිසින් ඔහු වෙත කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුවය. වෛද්‍ය මොන්රෝගෙන් අසන්නට ලැබුණේද ඔහු මීට පෙර අවස්ථා වලදී දුන් උපදෙස්මය.

ක්වීන් මේරි රෝහලේ සේවය කළ විශේෂඥ වෛද්‍ය ක්වින්සි මොන්රෝ අවුරුදු තිහක පමණ දීර්ඝ පළපුරුද්දක් තිබූ වෛද්‍යවරයෙකි. හෝම්ස්ගේ රැකියාවේ ස්වභාවය, ආහාරය, දුම්බීම හා විවේකය ගැන මා පැවසූ සෑම දේකටම, වෛද්‍යවරයා ඉවසිල්ලෙන් සවන් දීගෙන සිටියේය. අනතුරුව හෝම්ස් පරීක්ෂා කර බැලීමට වෛද්‍ය මොන්රෝ සෑහෙන වේලාවක් ගත කළේය. කාරුණික ස්වරයෙන් ඔහු හෝම්ස් ඇමතුවේ ඉන්පසුවය.

"මගේ හිතවත් ෂර්ලොක් හෝම්ස් මහත්මයා" වෛද්‍යවරයා කීය. "මගේ ශිෂ්‍ය දොස්තර වොට්සන් කියන දේ සම්පූර්ණ ඇත්ත. ඔබේ රුධිර පීඩනය තිබෙන්නේ හුඟක් ඉහළ මට්ටමක. රෑ දවල් නොබලා මේ විදියට වැඩ කටයුතු කිරීම ඔබේ හෘදයට සහ රුධිරවාහිනී පද්ධතියට කොහොමටවත් යෝග්‍ය නැහැ. ඒක ඔබේ මුළු ශරීරයටම අහිත කර ලෙස බලපාන්න පුළුවනි. හැම ඉන්ද්‍රියයකටම කලින් මොළයට. එහි සියුම් රුධිර කේශ නාලිකාවක් පිපිරී ගියොත් අංග භාග රෝගයට ගොදුරු වෙන්න පිළිවන්.

ඒ නිසා මං ඔබට ආයාචනය කර සිටින්නේ ගන්න දිග නිවාඩුවක්. මාස තුනක නිවාඩුවක් ගන්න හැකි නම් ඒ තරමට හොඳයි. ලන්ඩන් නගරයෙන් පිටවෙලා දීර්ඝ මුහුදු ගමනක යෙදෙන්න. යන්න ස්විට්සර්ලන්තයට. එහෙමත් නැත්නම් එංගලන්තයේම ඈත පිටිසර පළාතකට........ කෝන්වෝල් පැත්තේ මුහුදුබඩ ගම්මානයකට. එතකොට ඔබට පුළුවනි ගැටලු විසඳීම ගැන අමතක කරලා මානසික සුවයක්, විවේකයක් ලබන්න"

වෛද්‍යවරයා එසේ කීවද හෝම්ස් ස්විට්සර්ලන්තය වැනි රටකට කැඳවාගෙන යාමට නම් කිසිම අයුරකින් කැමැත්තක් නොදෙන බව මම දැන සිටියෙමි. අන්තිමේදී නෝෆෝක් ප්‍රාන්තයේ යාමත් පෙදෙසට උතුරින් පිහිටි මුහුදුබඩ ගම්මානවල සංචාරයක යෙදීමට මම ඔහු කැමති කරවා ගත්තෙමි.

සයුරේ සැඩ රළ පහරින් බිඳීගිය පෞරාණික දෙව්මැඳුරු ගැන තොරතුරු එකතු කිරීම අපේ ඉලක්කය විය යුතු බැව් මම හෝම්ස්ට කීවෙමි. වරින් වර මහ වැසි ඇද හැළුණත් ජූනි මාසය වූ නිසා අව් රශ්මියේද තිබුණේ චණ්ඩ ස්වභාවයකි. වැලි සහිත ගල් වලින් සැදුණු කුඩා කඳුගැට වෙරළ දිගටම පිහිටා තිබිණි. එහෙත් ඒවායින් වෙරළට ආරක්ෂාවක් නොලැබිණි.





පළමු දිනයේ නොරිච් නගරයේ සංචාරය කරමින්, අපි එහි පැරණි නගරය පිළිබඳ මතකය අවදි කර ගත්තෙමු. දෙවැනි දිනයේ අපි යාමත් දක්වා ගමන් ,කළෙමු. ඉන්පසු අශ්ව කරත්තයෙන් ගමන් කිරීම නවත්වා, කිංස්ලින් දක්වා වෙරළ තීරය දිගේ පයින් ගමන් කිරීමට තීරණය කළෙමු. මේ අතර ගොඩබිමට වන්නට පිහිටි පැරණි ගම්මාන සහ දේවස්ථාන නැරඹීමටද අපි අපේක්ෂා කළෙමු.

තුන්වැනි දිනයේ උදෑසනින්ම ගමන් අරඹා අප ඇවිද ගියේ, ඉතා අඩු ජනගහනයක් තිබූ පෙදෙසකය. මහ සමුදුර විසින් ගොඩබිම ඛාදනය කිරීම නිසා, මිනිසා මෙන්ම වාසස්ථාන ද මිහිපිටෙන් මැකී යාමට පටන් ගෙන තිබිණ. සැතපුම් කිහිපයක් එපිටින් පිහිටි ප්‍රදීපාගාරයක් වෙත ද, ඊට මෙපිටින් පිහිටි දෙව්මැඳුරක උස් කුලුනක් වෙත ද අපේ දෙනෙත් යොමු විය. ඊටත් මෙපිටින් කුඩා කඳුගැටයක මුදුන සමීපයේ තිබූ නිවසක් හා තවත් ඈතින් දෙව් මැඳුරක නටබුන් ද දැකිය හැකි විය.

"මට නම් හරිම පිපාසයි වොට්සන්." හෝම්ස් කීය. "මේ වෙලාවෙ තේ කෝප්පයක් නැත්නම් වතුර ටිකක් හරි බොන්න තියෙනවා නම් කොච්චර හොඳද"

සිතියම අතට ගත් ඔහු එය පරීක්ෂා කර බැලීය. "අර ඈතින් පෙනෙන ප්‍රදීපාගාරයට මේ පැත්තෙන් ගම්මානයක් තිබෙන බවක් සිතියමේ සඳහන් වෙලා නැහැ. ඒක තියෙන්නෙත් හැතැක්ම තුනක් විතර ඈත. ඊට ටිකක් එහායින් දෙව්මැඳුරක කුලුනක් පෙනෙන තැන තියෙනවා විලිංඩන් කියල පුංචි ගමක්."

හෝම්ස් අතේ තිබූ සිතියම ගෙන මම ද ඊට නෙත් යොමු කළෙමි. "රට ඇතුළට හැතැක්ම බාගයක් පමණ ගියාම ගෙවල් කීපයක් සහිත ගම්මානයක් තියෙනවා. ඒ හරියට ගියොත් නම් මොනවා හරි බොන දෙයක් ලබාගන්න බැරිවෙන එකක් නැහැ"

"ඊට වඩා හොඳ නැද්ද අපි කෙළින්ම ඉදිරියට ගමන් කළොත්?" මගේ මිත්‍රයා ඇසීය. "අර ගම්මානයේ නම් අවන්හලක් නොවරදවාම ඇති. ඒ ගැන සැකයක් නෑ. අපට ළඟින්ම වගේ දිස්වෙන කඳුගැටය උඩ ගෙදර නම්, මනුස්ස වාසයක් තිබෙන තැනක් වෙන්න බෑ" ඔහු කීවේ ඉදිරියෙන් පිහිටි කඳු බෑවුම් මුදුනේ තිබූ නිවස පෙන්වමිනි.

ඔහු පැවසූ කරුණ සත්‍යයක් බව අපට ඉක්මනින් දැකගත හැකි විය. කතාබහ කරමින් එතැනට අපි ළංවීමු. එය තවදුරටත් නිවසක් නොව නිවසක සැකිල්ලක් බව දක්නට ලැබිණ. නිවසේ අඩකට වඩා කැඩී බිඳී විශාල කොටස් කන්දෙන් පහළට වැටී ගොස්ය. ඊට අමතරව බිත්තිවල ගඩොල් පදාස පිටින් කඩා වැටීම නිසා බිත්තිවල විශාල විවර සෑදී තිබෙන අයුරු දක්නා ලදී. වහල සහ ජනේල කැඩී ගොස් තිබුණද එහි දොර නම් වසා තිබිණි. ඒ ලෑලි පටි තබා එයට ඇණ ගැසීමෙනි. එහෙත් බිත්ති බිඳී ගිය තැනකින් නිවස තුළට යාම අපහසු නොවන බැව් අපි තේරුම් ගත්තෙමු.

"අන්න අරක ඊට වඩා හොඳයි" මා කීවේ නිවසට නුදුරින් වූ පහළ බිම් කඩක අටවා තිබූ සීනු හැඩයේ කූඩාරමක් දුටු විටයි. "මෙතැන කඳවුරු බැඳගත් අය ඉන්නවා නම් අපට පුළුවනි මේ පළාත ගැන විස්තර ටිකක් දැනගන්න"

"ඒ වුණාට පෙනෙන තෙක් මානයක කිසි කෙනෙක් නෑ"

කූඩාරම මතට දීප්තිමත් හිරු එළිය වැටී තිබිණි. එහෙත් අපට සිතාගැනීමට සිදු වූයේ මෙය කිසිවෙකු විසින් අත්හැර දමන ලද කූඩාරමක් යන්නය. ඊට හේතුව වූයේ එහි තිබූ අපිරිසිදු පෙනුමයි. අබලන් වූ නිවසට යන මඟ පසුකොට අපි කූඩාරම වෙතට ළංවීමු. එහෙත් මිනිස් පුළුටක් වත් ඒ තුළින් මතු නොවීය. කූඩාරමේ දොරටුව වසා දැමීම සඳහා තිබූ කැන්වස් ආවරණය වේගයෙන් හැමූ සුළඟේ ඒ මේ අතට විසිවෙමින් තිබිණි. එතැනට ළං වූ අපි තවත් බොහෝ දේවල් දුටුවෙමු. කඳවුරු බැඳ සිටි අය ඉවුම් පිහුම් සඳහා භාවිත කරන ලද සාස්පාන් ආදී උපකරණ කිහිපයක් සමඟ තවත් බඩු බාහිරාදිය රැසක්, කූඩාරම් බිමේ තැන්තැන්වල විසිකොට තිබිණි. ඊට අමතරව ඔවුන් දැල්වූ ගිනිගොඩක සුන්බුන්ද සුළඟේ දැවටී දසත විසිරී ගියේය.

"මේ කඳවුරුකාරයො නම් හරිම නොසැලකිලිමත් අය වගේ" හෝම්ස් කීය. "පෙනෙන්න නම් මේකෙ කිසි කෙනෙක් නැහැ වගෙයි. ඒ වුණත් ඇත්තම තත්ත්වය ඒකද කියලා දැනගෙන හිටියොත් හොඳයි."

එසේ කී ඔහු පියවර කිහිපයක් ඉදිරියට තබා කූඩාරමේ දොරටුව වෙත ළං විය. අනතුරුව එහි විවරයෙන් ඒ තුළට හිස දමා මිනිත්තුවකින් පමණ ආපසු හැරී මා ඇමතීය.





"වොට්සන්. ඔබත් ඇවිත් බලන්න"

කූඩාරම ඇතුළත අවුල් ජාලයක් වී තිබූ බැව් මම දුටුවෙමි. කැන්වසය බිමට සවිකොට තිබූ තැන් දෙකකම එය ගැලවී ගොස් සුළං පහර වේගයෙන් ඇතුළට හමා ආයේය. ඇඳරෙදි, පොරෝනා සහ ඇඳුම් කිහිපයක් කූඩාරම පුරා විසුරුවා දමා ඇති අයුරු අපි දුටුවෙමු. ඊට අමතරව බොහොමයක් දේවල් සම්පූර්ණයෙන්ම ජලයෙන් පෙඟී තිබිණි. එයින් කෙනෙකුගේ සිතට නැගෙන්නේ වර්ෂාව කූඩාරම ඇතුළට කඩාවැදී ඇති බවයි. නමුත් කූඩාරමේ තිබුණේ වැස්සට අසුනොවූ වියළි පෙනුමකි. කෙසේ වෙතත් එහි ඈත කෙළවරේ කැන්වසය ඉරී ගොස් තිබිණි. ඒ හිඩැස හරහා හිරු එළිය කූඩාරම තුළට ගලා එමින් තිබූ අයුරක් දිස්විය.

"හොඳයි වොට්සන්. ඔබ නිරීක්ෂණය කළේ මොනවද? ඒ මගින් ඔබට ගත හැකි වූ නිගමන මොනවාද?" මගේ මිත්‍රයා ඇසීය.

"මට කියන්න තියෙන්නෙ මෙච්චරයි" මම කීවෙමි. "කඳවුරු බැන්ද පුද්ගලයා මොළේ ඇති කෙනෙකු නම්, ඔහු කළ යුතු වැඩ රාශියක් තියෙනවා. එයින් පළමුවැනි එක තමයි තෙමුණු ඇඳුම් සහ අනික් රෙදි වියළෙන්නට අව්වට දැමීම. කූඩාරමේ කැන්වසය ඉරී ගිය තැන ඉක්මනින් මසා ගැනීම. කූඩාරමෙන් ගැලවී ගිය කූඤ්ඤ යළිත් පොළොවට සවි කිරීම. ඒ තමයි අත්‍යවශ්‍ය දේවල්"

"ඒක සම්පූර්ණ ඇත්ත. මමත් ඔබ සමඟ සියයට සීයක් එකඟ වෙනවා. නමුත් මෙහි කඳවුරු බැඳ සිටි අය ඒ දේවල් කරලා නෑ. ඒ නිසා ඔබ ගන්නා නිගමනය මොකක්ද?"

"මට හිතෙනවා ඊයේ රාත්‍රී ඔවුන් මෙහේ නැවතී ඉඳල නැහැ කියලා."

"ඔබ එහෙම කියන්නේ පෙරේදායින් පසු මේ පැත්තට වැස්සක් ඇද හැළුණේ නැති නිසා. එහෙම නේද?"

"ඔව්" මම කීවෙමි. "අර රෙදි ඔය විදියට තෙමෙන්න ඇත්තෙ පැය දහ අටකට වත් කලින්. ඇඳරෙදි පොරෝනා මේ විදියට තෙමිල තිබුණා නම්, කිසි කෙනෙක් ඒවල නිදියන්න නෑ."

"ඒක ඇත්ත" හෝම්ස් කීවේ මගේ අදහසට එකඟ වෙමිනි. "අනිත් එක ඔවුන් මෙතැනින් පිටවී ගියේ වැහි නැවතුණාට පස්සෙ නම් තෙමුණු ඒවා මේ විදියට දාලා, එළියට යන එකකුත් නෑ. ඒකෙන් අපට තේරුම් ගත හැක්කේ මොකක්ද? කඳවුරුකාරයො මෙතැනින් පිටවෙලා ගිහින් තියෙන්නෙ ඊයෙ රාත්‍රියට කලින්.

අනික ඔවුන් ගිහින් තියෙන්නෙ පුදුමාකාර කලබලයකින්. කූඩාරමෙ දොරටුව වහන ආවරණය නිසි ලෙස සකස් කරලා මේක වහල ඇලත් නෑ. මේක හරිම අසාමාන්‍යයයි. එහෙම නේද වොට්සන්? හැම දෙයක්ම තිබුණු හැටියටම තිබියදී, කූඩාරම අත්ඇර දමලා යන්න මොකක්ද ඔවුන්ට තිබුණු හදිස්සිය?" කී හෝම්ස් කල්පනා කිරීමට පටන් ගත්තේය.

"ඒක නම් මටත් හිතාගන්න බෑ. කවුද දන්නෙ. දුම්රියක් අල්ලා ගැනීමේ හදිසියක් තිබුණද කියන්න බැහැනෙ"

කූඩාරම වටේ ඇවිද ගිය මගේ මිත්‍රයා එක්වරම නැවතී මා ඇමතීය.

"ඔහෝ! වොට්සන්. ඔබ දුටුවද මේ බාල්දිය?"

"ඔව්. මොකක්ද ඒකෙ තියෙන ප්‍රශ්නේ?"

"ඒකෙ වතුර බින්දුවක්වත් නැහැනෙ"

"ඔබට හිතෙන්නෙ බාල්දියෙ වතුර තිබිය යුතුමයි කියලද?"

"ඒක ඉතාම සරල කාරණයක්, මගේ හිතවත් වොට්සන්. වැස්ස වෙලාවෙත් බාල්දිය තිබුණෙ ඔය විදියටම නම්, දැන් බලනකොට ඒක වියළී තිබෙන්න විදියක් නෑ. එහෙම නේද?"

"එතකොට ඔබ කියන්නෙ කාලගුණය යහපත් අතට හැරුණට පස්සෙත් ඔවුන් මෙහි සිටියා කියලද? එහෙම නම් වැස්ස නැවතුණාට පස්සෙ ඔවුන් කලබලේට රාත්‍රී කාලයේ මෙහෙන් පිටවෙලා යන්න ඇති"

"මැදියම් රැයේ පිටත් වී ගියා? දුම්රියක් අල්ලන්න? ඒක නම් හිතන්න අමාරුයි"

"තවත් කවුරු හරි මෙතැනට එන්න ඇති. බාල්දිය ඔතැනින් තියන්න ඇත්තෙ ඔහු වෙන්නත් පුළුවනි"

"බාග වෙලාවට එහෙම වෙන්නැති" යයි පිළිතුරු දුන්නද හෝම්ස් සිටියේ එම කරුණ වෙත අවධානය යොමු කරමින් නොවේ.

ඔහු කළේ නිවී ගිය ගිනිගොඩේ තිබූ සුන්බුන් අවුස්සා බැලීමය.

"ඔහෝ! මේ මොනවද?"

"ඔය වැඩ අත්හැරල දමන්න හෝම්ස්" මම කීවෙමි. "මං ඔබව මේ තරම් දුරක් කැඳවාගෙන ආවෙ විවේකයක් ගන්න. ඒ මිසක්





රහස් පරීක්ෂණ කටයුතුවල යෙදෙන්න නෙමෙයි. කඳවුරු බැඳපු කවුදෝ දෙන්නෙක් කෑම ඉව්ව සාස්පාන් හෝදල නැතුව ගිහින්. ඒවායින් අපට වැඩක් නෑ........"

"......... වොට්සන්" මගේ මිත්‍රයා මා කී දෙයට බාධා කළත් ඔහුගේ දෙනෙත් දීප්තියෙන් බැබළුණු අයුරු මම දුටුවෙමි. "......... කොහොම වුණත් මෙතැන තියෙනවා සිත් ඇදගන්නා දේවල් රාශියක්. මේ බලන්න"

ඔහු මා වෙතට දිගු කළ දේ මම අතට ගෙන පරීක්ෂාවෙන් බැලුවෙමි.

"මේ කාගෙ හරි චෙක් පොතක සුන්බුන් නේ"

"ඔව් සුන්බුන් තමයි. ඒක පුලුස්සා දමන්න උත්සාහ කළත් ඔක්කොම දැවී ගිහින් නෑ. කවුන්ටර් ෆොයිල තිබෙන කොටස ඉතිරි වෙලා. ඒ මගින් චෙක්පත්වල අංක ඉතිරිවෙලා නිසා, චෙක්පොතේ අයිතිකාරයා හඳුනාගන්න අපට හැකිවේවි."

"කෙනෙකුට උවමනා නම් තමන්ගේ චෙක් පොත් පුලුස්සා දමන්න පුළුවනි නේ. ඒකෙ තහනමක් නෑ නේද?" මම කීවෙමි.

"ඔබ කියන දේ ඇත්තයි." හෝම්ස් කීය. "ඒ වුණත් එහෙම දෙයක් ඕනම කෙනෙක් කරන්නෙ ගෙදරදී නේ. නිවාඩුවක් ගත කරන්න ඇවිත් කඳවුරු ගිනිමැලයක තමන්ගේ චෙක්පොත් පුලුස්සා දමන කෙනෙකු, මට මේ හමුවුණේ පළමුවැනි වතාවට. මෙතැන තියෙනවා චෙක්පොත් තුනක සුන්බුන්." හෝම්ස් කීවේ අළු ගොඩ කුරුගා ඒවා මතුකර ගනිමිනි. නිකුත් කළ චෙක්පත් වල තිබුණේ කුමන අංකද යන්න ඒවායින් තේරුම් ගැනීම අපහසු නොවීය.

"වොට්සන් මෙතැන මොකක් හරි අසාමාන්‍ය දෙයක් සිදුවී ඇති බව මට විශ්වාසයි." හෝම්ස් කීවේ කූඩාරමට ඇතුළු වීමට තැත් කරමිනි. "කාරණා මේ විදිය නම් මෙතැන තවත් සෝදිසි කර බැලීම වටිනවා."

කූඩාරම තුළ වූ ද පරෙස්සමෙන් එහා මෙහා කරමින් ඔහුට සුපුරුදු ලෙස ඒවා පරීක්ෂා කරන අයුරු මම බලා සිටියෙමි. අන්තිමේදී ඔහුගේ මුවෙන් නැගුණේ සිවුරුහන් හඬකි.

"මේ බලන්න" ඔහු කීය.

මම ඒ දෙස බැලීමි. ඔහු ඉහළට ඔසවා මට පෙන්වූයේ ඇඳ ඇතිරිල්ලකි. එහි තිබූ පැල්ලම ලේ පැල්ලමක් බවට කිසිදු සැකයක්

නොවීය. එහෙත් ඒ පැල්ලම ඇතිවූයේ ඇතිරිල්ල මතට ලේ ගලායාමකින් නොවේ යයි මට සිතිණි. එම සලකුණ ඇතිවන්නට හේතුව ලේ තැවරුණු යම්කිසි දිගටි මුවහත් ආයුධයක් පිස දැමීම සඳහා, ඇතිරිල්ල පාවිච්චි කිරීම නිසා විය යුතුය. එහි පැල්ලම තිබූ හරියේම තැනින් තැන රෙද්ද කැපීගොස් තිබිණි. එයින් මා සිතාගත්තේ එම ආයුධය ඉතාම මුවහත් එකක් වියයුතු බවයි.

"දැන් මොකක්ද ඔබේ තීරණය?" මගේ මිත්‍රයා විමසුවේ සිනාමුසු මුහුණෙනි. "මගේ වෛද්‍ය උපදේශකයා තවදුරටත් කියනවද කඳවුරු බැන්ද පුද්ගලයන්ගේ වැඩ කටයුතුවලට අප ඇඟිලි ගැසීම අනවශ්‍යයි කියලා?"

"මගේ හිතවත් හෝම්ස්. ඔබ මේ ආවෙ ලොකු විවේකයක් ගැනීමට බව අපට කොහොමටවත් අමතක කරන්න බෑ. ඔබ මේකට පටලැවෙන්නේ නැතුව ඉන්න. මං ගිහින් මේ ගැන පොලීසියට දැනුම් දෙන්නම්"

"වොට්සන්. බොහොම දුර ඈත ලන්ඩනයේ ඉඳල ඔබ මාව කැඳවාගෙන ආවෙ කොතැනකටද? අභිරහසක් මධ්‍යයට. මේක දෙවියන් විසින් මට භාර කළ ගැටලුවක්. මගේ මොළයටත් හදවතටත් හොඳ මොකක්ද කියන කාරණය, මගේ වෛද්‍යවරයාට වඩා දන්නෙ දෙවියන්. දෙවියන් අප යොමු කරන මාර්ගයට පිටුපෑම කොහොමටවත් හොඳ නෑ වොට්සන්"

එසේ කී ඔහු අතට ගත් යමක් ඉහළට ඔසවා මට පෙන්විය. ඒ දිග මුවහත් වානේ තලයක් තිබූ පිහියකි.

"එහෙම නම් ආයුධය මේක වෙන්න ඇති?"

"ඔබේ ඒ නිගමනය නිවැරදියි." හෝම්ස් කීය. "දැන් අපට හොයන්න වෙලා තියෙන්නෙ එක දෙයයි. ඒ තමයි මළසිරුර"

"ඒක එහෙම විය යුතුමයි කියල නිශ්චිතව කියන්න බැහැනෙ." මම ඒ අදහසට විරුද්ධ වූයෙමි. "මිනිසෙකුට පිහියෙන් ඇන්නා වුණත් හැම විටම ඔහු මියයන්නෙ නැහැනෙ"

"ශල්‍ය වෛද්‍යවරයෙකු හැටියට ඔබ කියන කාරණය ඉතාම නිවැරදියි. "හෝම්ස් කීය. "කොහොම වුණත් අපි හොයල බලමු මළ සිරුරක් තියෙනවද කියලා. ඒ මොකද ලේ විශාල ප්‍රමාණයක් ගලා ගිය බවට සලකුණු තියෙනවා. මෙහෙ එන්න ඔබට පෙන්වන්න"

කූඩාරම පිටිපසට ඔහු මා කැඳවාගෙන ගියේය. එහි වැලි පොළොව මත අඳුරු පැහැති විශාල ලේ පැල්ලමක් විය.





"වොට්සන්. මේ තරම් පැල්ලමක් ඇතිවෙන්න නම් ලේ කොයිතරමක් ගලා ගියාද කියල ඔබට හිතාගන්න පුළුවන් නේද? පිහිපාරක් කාපු එහෙම කෙනෙක්, දුම්රියක් අල්ලාගන්න කෙටි දුර ධාවකයෙකු වගේ වේගයෙන් දිව්වා කියල. මම නම් හිතන්නෙ නෑ. අපි තවත් ටිකක් සෝදිසි කරල බලමු"

කූඩාරම ඇතුළට රිංගූ ඔහු ඉවතට ආවේ, තවත් ඇඳුම් කිහිපයක් ද රැගෙනය. ඒ ෆ්ලැනල් රෙද්දෙන් මැසූ අළු පැහැති කලිසමක්, ඉතාමත් අපිරිසිදු කමිසයක් සහ නෝෆෝක් කබා නමින් හැඳින්වෙන රැළි සහිත ලිහිල් කමිසයක් ඒ අතර විය. ඔහු මේවා ඉතා උනන්දුවෙන් සෝදිසි කිරීමට පටන් ගත්තේය.

"මොන නිගමනවලටද ඔබට එන්න හැකිවුණේ?" මම අන්තිමේදී විමසුවෙමි.

"පැහැදිලිවම පෙනෙන සලකුණු කිහිපයක් මේවල දකින්න පුළුවනි. කමිසයේ තිබෙනවා 'C.H' කියල ලකුණු කරලා. කබාය ඇතුළු පැත්තේ තියෙනවා ඒක මැසූ ටේලර්ගේ ලේබලයක්. කබායේ අයිතිකරුවා "ජෙෆ් කින්සි මහතා, පාක් රෙසිඩන්සස්" ලෙස ඒකෙ සඳහන් වෙනවා. මේක මහල තියෙන්නෙ හුගක් තරබාරු මිටි අයෙකුට. ෆ්ලැනල් කලිසම නම් මහල තියෙන්නේ කෙට්ටු අයෙකුට. ඒත් කිසිම සලකුණක් නෑ. ඒකේ අයිතිකාරයා C.H ම වෙන්නත් පුළුවනි. නැත්නම් වෙනත් තුන්වැන්නෙකු විය හැකියි. ඉතින් දැනට සැකයේ වාසිය C.H ට දෙමු.

එතකොට අපට ලැබෙනවා පුද්ගලයන් දෙදෙනෙකු ගැන හෝඩුවාවල්. එක් අයෙක් මහතයි. අනිකා කෙට්ටුයි. මහත පුද්ගලයා එනම් කින්සි අධික වශයෙන් දුම්පානය කරන කෙනෙක්. ඔහුගේ සාක්කුවල තිබෙනවා පයිප්ප දුම්කොළ. කෙට්ටු තැනැත්තා C.H යන්ත්‍ර සූත්‍ර සමග සම්බන්ධයක් තියෙන අයෙකු විය හැකියි. ඒ මොකද ඔහුගේ කලිසමේ තෙල් සහ ග්‍රීස් පැල්ලම් තිබෙනවා. ඔහු තමන්ගේ දෑත් නිතරම කලිසම් සාක්කුවල දමාගෙන ඉන්නා කෙනෙක්. ඒ වගේම ඔහුගේ වම් කකුලේ මොකක් හරි ආබාධයක් තියෙනවා. තවත් හෝඩුවාවන් කිහිපයක්ම මේ ඇඳුම්වල දකින්න පුළුවනි. නමුත් මේ වෙලාවේ ඒවා ඒ තරම් වැදගත් නෑ. තවත් කාරණයක් මං ඔබට කිවයුතුයි. ඒ තමයි කබා හෝ කලිසම් සාක්කුවල කඩදාසි කිසිවක් නෑ. දැනට එපමණයි. ඔබ කැමතිද වොට්සන් පා සටහන් වෙත අවධානය යොමු කරන්න?"

"හරි හරි මං කැමතියි" මම කීවෙමි. "ඔබගේ මග පෙන්වීම නිසා මට දැන් පුළුවනි පාවහන් අඩියේ කට්ට රටාව අනුව සමහර පාවහන් හඳුනාගන්න. මුල්ම එක 9 ප්‍රමාණයේ ජෝන් වයිට් වර්ගයේ පාවහන්........ මේ තියෙන්නේ"

"ඔබ කොහොමද ඒක හඳුනාගත්තේ?"

"ඇයි හෝම්ස් මේ සපත්තුවේ ඉදිරි කොටසේ ලොකු W අකුරක් තියෙන්නේ. ඒ වගේම විළුඹේ රවුමක් මැද J අකුරකුත් තියෙන්නේ"

"විශිෂ්ටයි. වෙන මොනවද සලකුණු?"

"ඊළඟට 8 ප්‍රමාණයේ ඉදිරිය හතරැස් හම්බර් මෝස්තරයේ පාවහනක ලාංඡන. මේකෙ තියෙන්නේ දියමන්ති හැඩයේ කට්ට රටාවක්. විළුඹේ තියෙනවා රවුමක් මැද තාරකාවක්"

"මොකක්ද ඒ වර්ගය ඔබ කියන හැටියට?"

"කිසිම සැකයක් නෑ; හම්බර් පාවහන්. නිතර දකින්න ලැබෙන මෝස්තරයක්."

"වෙන මොනවද?"

"ඒ දෙකට අමතරව පැහැදිලිව පෙනෙන්නේ පාවහන් සලකුණු දෙවර්ගයක් පමණයි. එයින් එක් වර්ගයක් "ලෝටස්". නෙළුම් මලක සලකුණ විශාලෙට තිබෙන මේ පාවහන් නිෂ්පාදනය කරන්නේ අපනයනය සඳහා බව ඔබ මට කියා තිබෙනවා. අනික් වර්ගය ඔල්සොප් විය යුතුයි. ඒ ගැන මට එච්චර විශ්වාස නැහැ"

"කොහොම වුණත් ඔබ පාවහන් සලකුණු හඳුනාගත් ආකාරය විශිෂ්ටයි වොට්සන්." හෝම්ස් කීය. "ඒ දෙක ලෝටස් සහ ඔල්සොප් බව නිවැරදියි. ඔබ ඉතා විමසිල්ලෙන් බැලුවොත් ඔබට වැටහේවි, ඔබ පසුව කී දෙවර්ගයේ පාවහන් සලකුණු වලට උඩින් තමා ඔබ කලින් කී සලකුණු දෙවර්ගය වැදිල තියෙන්නේ. ඒකෙන් ඔබට ගතහැකි නිගමනය මොකක්ද?"

"ජෝන් වයිට් සහ හම්බර් පාවහන් පැළඳි අය මෙතැනට ඇවිත් තිබෙන්නේ පසුව." මම කීවෙමි. "ඒ නිසයි ඒවා වඩාත් පැහැදිලි"

"ඇත්තෙන්ම ඔබ ඉතාම දක්ෂයි වොට්සන්. එම පාවහන් පැළැඳ සිටි පුද්ගලයන් ගැන ඔබට යමක් කිව හැකිද?"

"පාවහන් පැළඳ සිටි පුද්ගලයන් ගැන........?" පාවහන් සටහන බලා එම පුද්ගලයන් ගැන තොරතුරු කීමට තරම් මට හැකියාවක් නොවීය.





"ඒක නම් මට අමාරුයි හෝම්ස්"

"ඇයි වොට්සන්.......? හම්බර් පාවහන් සලකුණ ඔබේ. ජෝන් වයිට් පාවහන් සලකුණ මගේ!"

"දෙයියෝ සාක්කි! ඇත්ත නේන්නං" මට ලැජ්ජාවෙන් කියවිණි.

"මට ඒ කාරණය අමතක වුණා නේ"

"එතකොට එක් කාරණයක් පැහැදිලියි." හෝම්ස් කීය. "අපි මෙහේ එනතුරු මෙතැන ගැවසිලා තියෙන්නෙ දෙදෙනයි. ඒ වැස්සෙන් පසු ඔවුන් මෙහි සිටි බවට සලකුණු. වැස්සට කලින් කවුරු හරි ආවා නම් ඒ සලකුණු වැස්සට සේදී යන්න ඇති"

"එතකොට කූඩාරම තුළ තිබුණු තෙත රෙදි, ඇඳුම්?"

"වොට්සන් ඒකට හේතුව බාල්දියේ තිබූ වතුර; වැස්ස නෙමෙයි. කවුරු හරි බාල්දියේ තිබුණු වතුර රෙදි මතට හළලා, බාල්දිය හිස් කරලා, එය ආපසු කෙළින් අතට හිටවලා තැබුවා. ඒක කරල තියෙන්නේ වැස්සට පසු. නැත්නම් ඒක හිස්ව තිබෙන්න විදියක් නෑ. ඔන්න එතකොට අපි තර්කානුකූලව නිගමනයකට එළඹෙනවා. වර්ෂාවට පසු දෙදෙනෙක් මෙතැන ගැවසුණා. ඊළඟට බොහොම කලබලයෙන් මෙතැනින් පිටවෙලා ගියා"

සටහන් පොත හා පැන්සල සාක්කුවෙන් ගත් මගේ මිත්‍රයා එහි යමක් ලිවීමට සූදානම් විය.

"කුඩා පාවහන් තිබෙන පුද්ගලයා අපි "A" කියල හඳුන්වමු. ලොකු පාවහන් සලකුණු තිබූ තැනැත්තා "B" කියල හඳුන්වමු."

මුලින්ම අපට B ගේ පා සලකුණු දකින්න පුළුවනි. ගම තුළ සිට මුහුදු වෙරළ දක්වා ඇති පාරෙන් හැරී ඔහු කූඩාරම වෙත එනවා. ඊළඟට යළිත් වරක් ඔහුගේ, එනම් B ගේ පා සටහන් දකින්න ලැබෙනවා. ඔහු කැඩුණු බිඳුණු නිවස වෙත ගිහින් ආපහු එනවා. තමන්ගේ පා සලකුණු මතම විරුද්ධ දිශාවටත් එම සලකුණු තිබීමෙන් අපට හඳුනාගන්න පුළුවනි, ඔහු මුලින් ගිය දිශාව මොකක්ද කියලා.

ඊටත් පස්සේ අවසාන වශයෙන් අපට දකින්න ලැබෙනවා B ගේ පැහැදිලි පා සලකුණු - ඔහු ඉහළට හා පහළට ගිය සලකුණු. මේ වෙලාවේ ඔහු ගිහින් තියෙන්නේ වෙරළේ සිට ගම මැද පැත්තට වැටී ඇති පාරට." ඔහු මඳ වෙලාවක් පා සටහන් දෙස පරීක්ෂාවෙන් බැලුවේ කල්පනා කරමිනි. "A ගේ පා සටහන්

ගැන හිතුවොත්; ඔහුගේ පා සටහන් තිබෙන්නේ කූඩාරම වටේට පමණයි. මේවා විසිරී තිබෙන ආකාරයෙන් අපට කියන්න පුළුවනි, ඔවුන් දෙදෙනා එකම වෙලාවක මෙතන ගැවසුණු බව. ඊළඟට අපට පැහැදිලිවම දකින්න ලැබෙනවා B මෙතැනින් පිටවෙලා යන්න ගිය සලකුණු. නමුත් A මෙතැනින් පිටවී ගිය බවට කිසිම පා සලකුණක් නෑ. ඔන්න එතකොට මතුවෙනවා ගැටලුවක්. A ට මොකද වුණේ? ඔහු ඉන්නේ කොහේද?"

"........ කූඩාරම ඇතුළෙ හෝ මේ අවට නම් නැහැ" මම කීවෙමි.

"ඔව්. ඒක හරි." හෝම්ස් කීය. "අපට දැන් කරන්න තියෙන්නේ බිඳුණු නිවස වෙත වැටුණු B ගේ පා සලකුණු දිගේ ගිහින් බලන්න"

අපි බිඳුණු නිවස වෙත ඇවිද ගියෙමු. "හොඳ පරීක්ෂාවෙන් ඔය සලකුණු දිහා බලන්න වොට්සන්. ඒවායින් යම් යම් කාරණා අපට තේරුම් ගන්න පුළුවනි. ඔබ පා තැබිය යුත්තේ මෙම සලකුණු වලට හානියක් නොවෙන විදියට"

හෝම්ස්ගේ ඉල්ලීමට මම කීකරු වීමි. එහෙත් ඔහු කියූ අයුරින් පා සටහන් වලින් "යම් යම් කාරණා" තේරුම් ගැනීමට මට නම් නොහැකි විය. B ගේ පා සටහන් වැටී තිබුණේ බිඳී ගිය ගඩොල් බිත්තියේ විවරයක් වෙතය. ඉදිරියෙන් ගිය හෝම්ස් එය තුළින් හිස දමා බැලුවේය. අනතුරුව ඔහුගේ මුවෙන් නිකුත් වූයේ විස්මයට පත් හඬකි.

නිවසේ මුහුද දෙසට තිබූ බිත්ති දෙකක්ම පහළට ඇද වැටී තිබිණි. අප ඇතුළු වූ කොටසේ අබලන් මේසයක් විය. මේසයේ කකුල් තුනක් සිමෙන්ති පොළොව මත තිබුණද එක් කකුලක් කඩා හැළුණු බිත්තිය අසල අහසේ රැඳී තිබිණ. මේසය මත තිබූ දේවල් කිහිපයක් වෙත අපේ අවධානය යොමු කළෙමු. ඒ සැරයටියක්, වැහි කබායක් සහ කැප් තොප්පියකි. අනෙක් ඒවාට තරමක් දුරින් පිහිටි සැරයටිය යට ලිපියක් රැඳී තිබිණි. එය දිස්වූයේ ලිපිය සුළඟේ යාම වැළැක්වීමට, සැරයටිය ඒ මත තබන ලද ආකාරයෙනි. හෝම්ස් එම ලිපිය අතට ගත්තේය. ලිපිය ඇමූ කවරය අලවා තිබූ අතර, එය තැපැල් කිරීමට සූදානමෙන් ඇලවූ තැපැල් මුද්දරයක් ද එහි විය. එහි ලිපිනයේ මෙසේ සඳහන් විය.





බොනි ආම්ටේජ් මහතා,
පාක් රෙසිඩන්සස් - සී 187
කෙන්සිංටන් උතුර, ලන්ඩනය.

ලිපිය අතට ගත් හෝම්ස් මොහොතක් කල්පනා කළේය. අනතුරුව තම සාක්කුවෙන් කුඩා දුනු පිහියක් ගත් ඔහු කවරයේ අයින දිගේ කපා එය විවෘත කොට ඇතුළත තිබූ ලිපිය අතට ගත්තේය.

"අපි මේක කියවා බැලීමේ වරදක් නෑ" කී ඔහු ලිපිය දිග හැරියේය.

එහි මෙසේ සඳහන්ව තිබිණි.

"හිතවත් බොනි,

ඔබ අමාරු අඩියකට පත්කර දමා මෙවැනි පියවරක් ගැනීමට සිදුවීම ගැන මම බෙහෙවින් කනගාටු වෙමි. මට තවදුරටත් මෙලොව ජීවත් වීමට නොහැකි වන්නේ ඇයිද යන්න ඔබට ඉක්මනින්ම තේරුම් ගැනීමට හැකිවනු ඇත. මම ඔබෙන් සමාව අයැද සිටිමි.

මේ හිතවත්
ක්‍රිස්."

"සිය දිවිනසා ගැනීමක් වගෙයි" මට කියැවිණි. "නමුත් කොහොමද........?"

නිවසේ බිත්තිය බිඳී ගොස් සෑදුණු විශාල විවරය දෙසට පරෙස්සමෙන් පා තැබූ හෝම්ස්,පහළින් වූ ප්‍රපාතය වෙත නෙත් යොමු කළේය.

"මොනවා හරි පෙනෙන්න තියෙනවද?" මම ඇසීමි.

"ඔව්. නඩුභාණ්ඩ සම්පූර්ණයි. එක් මළසිරුරක් තියෙනවා"

ඔහු අසලට ළං වූ මම පහළ ප්‍රපාතය දෙසට එබී බැලුවෙමි. කඳු බෑවුම අවසන් වූ තැන වැවී තිබූ මුහුදු ශාක සහ කුඩා වැටකෙයියා ගස් කිහිපයක් අසල මිනිසෙකුගේ මළසිරුරක් විය. අප සිටි තැනින් පහළට ඇද වැටුණු නිසා දෝ, මළසිරුර දෙකට නැමී තිබුණේ අස්වාභාවික ඉරියව්වකිනි.

"කන්ද පහළට බැහැලා මං ඔහුව පරීක්ෂා කරල බලන්න ඕන." මම කීවෙමි.

එය ඉතා දුෂ්කර අප්‍රසන්න කටයුත්තක් විය. නමුත් මම අපහසුවෙන් එතැනට ළඟා වුණිමි. මිනිත්තුවක් පමණ ගතවෙද්දී

මළසිරුර පරීක්ෂා කර බැලීමට මට හැකි විය. මරණයට හේතුව පිළිබඳ සැකයක් නොවීය. එක් කනක සිට අනෙක් කන දක්වාම ඔහුගේ ගෙල කපා තිබිණි.

"ඔහුගේ බෙල්ල කපලා" මම පහළ සිට මගේ මිත්‍රයා අමතා කෑගැසුවෙමි. මිනිත්තුවක් ගතවෙද්දී ඔහු මා සමීපයට පැමිණියේය.

මියගිය තැනැත්තා අවුරුදු තිහක් පමණ වයස් වූ තැනැත්තෙකු විය. ශරීර ප්‍රමාණයෙන් කුඩා වූ ඔහුගේ කොණ්ඩය කහ පැහැති වූ අතර මුහුණේ තිබුණේ ළා බාල පෙනුමකි. එහෙත් දැන් නම් එයින් දිස්වූයේ භීතියට පත් හැඟීමය. ඔහු මියගොස් පැය ගණනාවක් ගතවන්නට ඇත. ඒ ගැන මට කිසිදු සැකයක් නොවීය. හෝම්ස් ප්‍රශ්නයට නගා කටින් පිටකළේ මගේ සිතේද ඇතිවූ හැඟීමය.

"කෙනෙක් ඔය විදියට දිවි නසාගන්නවාද වොට්සන්?"

"මේක සිය දිවි නසා ගැනීමක් නෙමෙයි" මා කීවේ යළිත් වරක් තුවාලයට දෙනෙත් යොමු කිරීමෙන් පසුවය. "මේ මිනිහව මරා දමලා"

"ඒක හරියට හරි" හෝම්ස් කීය. "මිනිස්සු මුලින් තමන්ගෙ බෙල්ලත් කපාගෙන, ඊළඟට අඩි පනහක පමණ ප්‍රපාතයකට පනින්නෙ නැහැනෙ. මොනවද ඔබට තව කියන්න තියෙන්නෙ?"

"මේක තමන් විසින්ම කරගත් තුවාලයක් නෙමෙයි. මේ අසරණ මනුස්සයාව තදින් ග්‍රහණය කරගෙන තමයි ඝාතකයා මේ දේ කරන්න ඇත්තෙ. ඒ වුණත් අර ලියුමෙ තේරුම මොකක්ද? ඔහු කියල තිබුණ නේද තමන් දිවි නසාගන්නා බව"

"ඔහු වෙනුවෙන් එහෙම ප්‍රකාශ කරන්න ඇත්තෙ මිනීමරුවා." හෝම්ස් කීය. "ඒක නෙමෙයි වොට්සන්. ඔබ දුටුවද මේක?"

මළසිරුර සමීපයේ පඳුරක් මත විවෘත කරන ලද ඇළි පිහියක් ද විය. එහි ලේ තැවරී තිබිණි.

"ඒක වෙන්න ඇති ආයුධය" මම කීවෙමි.

"ඔබ කලිනුත් ඔය කතාවම කිව්ව නේද මිත්‍රයා?" හෝම්ස් ඇසීය. "මුවහත් ආයුධ දෙකක්ම උවමනා වුණාද මේ අසරණයගෙ දිවි තොර කරන්න?"

"මට නම් මේ කිසිදෙයක් තේරුම් ගන්න අමාරුයි" මම කීවෙමි.





මළ සිරුර දෙසට පහත් වුණු හෝම්ස් එය පරීක්ෂා කිරීමට පටන් ගත්තේය. මියගිය පුද්ගලයාගේ ඇඳුමේ සාක්කුවල තිබී කඩදාසි සහ ලිපි කිහිපයක්ම සොයා ගැනීමට මගේ මිත්‍රයාට හැකිවිය. ක්‍රිස්ටෝෆර් හැරල්ඩ් යනුවෙන් නම ලියා, හැම්ස්ටෙඩ් ලිපිනයකට යොමු කළ ලිපි දෙකක් ද ඒ අතර විය. ලියුම් සහ අනෙක් කඩදාසි පෞද්ගලික ඒවා බැව් තේරුම් ගැනීමට හැකි විය.

"මූලික කරුණු වල හැටියට අපට තේරුම් ගන්න සිදුවෙන්නේ මෙ මළසිරුර අයත් පුද්ගලයා ක්‍රිස්ටෝෆර් හැරල්ඩ් බව. අපට හමුවුණු ලියුමේ ක්‍රිස් හා කුඩාරමේ තිබුණු කමිසයේ "C.H" යන්නෙන් හැඟවෙන්නේ මේ පුද්ගලයා බව අපට වටහාගන්න පුළුවනි."

"මට මේක තේරුම් ගන්න අමාරුයි" මම කීවෙමි. "මේ පුද්ගලයා මිය ගියේ ඝාතනයකින්. නමුත් ඔහු ලියුමක් තබා මියගියා, මරණයට හේතුව සිය දිවි නසා ගැනීමක් බව සඳහන් කරමින්. ඒක තේරුම් කරන්නේ කොහොමද?"

"බොහොම සරලයි. හැරල්ඩ් මරා දැමූ ඝාතකයා මේක සිය දිවි නසා ගැනීමක් බව පෙන්වන විදියේ ලියුමක් ලියා තැබුවා."

"ඒ උත්සාහය අසාර්ථක එකක්?"

"අසාර්ථක තේන්නං. මළසිරුරක් හමුවෙන්න කලින් ඉඳලම ඝාතන තැනක් ගැන අපි සැක කළා. අපට ලැබී තිබෙන කරුණු අපි යළිත් වරක් විමසා බලමු.

මුලින්ම අපට තියෙනවා එක් පුද්ගලයෙකුගේ අඩි සටහන් සමූහයක්. ඒ බිඳුණු ගෙය තිබෙන කඳු ගැටය මුදුනට ගිය හා එහි සිට ආපසු ආව අඩි සටහන්.

ඒ අඩි සටහන් මියගිය පුද්ගලයාගේ නෙමෙයි.

දෙවනුව අපට දකින්න ලැබෙන්නේ නෑ මියගිය තැනැත්තා මේ කඳු ගැටය මුදුනට ඇවිද ආ අඩි සලකුණු. ඒ වුණත් ඔහු මෙතැනට ඇවිත් ඇති බව පැහැදිලියි. එක්කෝ ඇවිදගෙන නැත්නම් ඔසවාගෙන. කවුරු හරි ඔහුව ඔසවාගෙන මෙතැනට ගෙනැත් තියෙන්නේ, වැස්ස නැවතුණාට පස්සේ. ඒ මොකද මෘත ශරීරය වියළියි. නමුත් සිරුර තිබුණු තැන ඊට යටින් පොළොව තෙතයි.

තුන්වනුව අපට කුඩාරම හා ඒ අවට, නොයෙක් දේවල් නොයෙක් සාක්ෂි දකින්න ලැබුණා. ඒවා හරියට "මිනීමැරුමක්!" කියා හඬ නඟා කෑගහන සාක්ෂි වගෙයි.

සිව්වනුව අපට හමුවී තිබෙනවා ලේ තැවරුණු ආයුධ එකක් නෙමෙයි දෙකක්. මේක දිවිනසාගැනීමක් කියල හිතන්න මේ සාක්ෂි ප්‍රමාණවත් නෑ කියල, ඕනම අපරාධකාරයෙකුට හිතේවි. නමුත් හැම දෙයක්ම එහෙමම තිබියදී ඔහු යන්න ගියා. ඒ ඇයි?"

"මට හිතෙන්නෙ මෙහෙමයි හෝම්ස්." මම කීවෙමි. "මේක දිවි නසාගැනීමක් ලෙස ඇඟවීමට ඔහු කටයුතු සූදානම් කරමින් ඉන්න ඇති. නමුත් බලාපොරොත්තු නොවූ ලෙස කවුරු හරි එක්වරම එතැනට පැමිණියා. කුඩාරමේ ඉතිරිව තිබූ හෝඩුවාවන් ඉවත් කරන්නවත්, තමන්ගේ පා සලකුණු මකා දමන්නවත් අපරාධකාරයට ඉඩක් ලැබුණේ නෑ."

"ඔව් ඒක වෙන්න පුළුවනි. නමුත් ඒකට නිවැරදි පිළිතුර ඔබ කියූ එක කියා මං විශ්වාස කරන්නේ නෑ. අපි දන්නවා ඔහු පුදුමයට පත් කරමින් කවුරුවත් කඩා වැදුණෙ නෑ. වෙනිං කාගෙවත් පා සටහන් ඇත්තේ නෑ. සමහරවිට ඔහු හේතුවක් නැතුව කලබල වෙලා, ඔළුව අවුල් වෙලා හැමදෙයක්ම පටළවාගත්ත වෙන්න ඉඩ තිබුණා. නමුත් එහෙම දෙයක් සිදුවුණෙත් නෑ. කුඩාරමේ ඉඳල ගම ඇතුළට යන පාර දිගේ තිබෙන්නේ, බොහොම හෙමින් ඇවිද යන මිනිහෙකුගේ පා සටහන්.

"එතකොට ඔබ කොහොමද මේක තේරුම් කරන්නේ?"

"මේකෙන් කොටසක් අපට තේරුම් ගන්න පුළුවනි. මට හිතෙනවා ඒ ටික පැහැදිලියි කියල. ඝාතනය සිදු කරල තියෙන්නෙ කුඩාරම අසලදී මයි. ඊට පස්සෙ මිනීමරුවා මළසිරුර අරගෙන කන්ද නැගල ආව බිඳුණු ගෙය ළඟට. සිරුර පහළට විසි කරල තමයි ඔහු සිය දිවිනසාගැනීම රඟ දක්වන්නෙ.

B ගෙ අඩි සලකුණු ඔබට මතකද වොට්සන්? මේ පැත්තට එද්දි ඔහුගේ පියවර කෙටියි; අනික මඩ සහිත පොළෙවේ තදින්ම ගැඹුරට සටහන් වී තිබුණා. ආපසු යද්දී ඒකෙ අනික් පැත්ත. මොනවද මේකෙන් කියන්නෙ? ඔහු මේ පැත්තට එද්දි ලොකු බරක් ඔසවාගෙන ආවා. ඒ තමයි මළසිරුර. තමන්ගෙ අඩි සටහන් ඔහු මකා දැම්මෙ නැත්තෙ ඇයි කියන එකයි, මට තේරුම් ගන්න අමාරු. අනික මරණීය තුවාලය තමන් විසින්ම සිදුකරගත් එකක් නොවන බව, ඔය තරම් පැහැදිලිව පෙනෙද්දි"

"ඒක තේරුම් ගන්න තරම් වෛද්‍ය විද්‍යාත්මක දැනුමක් ඔහුට තියෙන්න නැහැ." මම කීවෙමි.





"ඒ වුණත් මෙවැනි වෙලාවක මරණය සිදු කිරීමට යොදාගත් ආයුධ දෙකක් මෙහි තිබීම?" හෝම්ස් විමසුවේ නළල රැළි කරමිනි. "ඔහුට ඒ තරමවත් දැනුමක් තිබුණේ නැද්ද? ඒ කාරණය නිසා මේ අභිරහස තවත් අවුල් සහගත වෙනවා. මේ නාටකය රඟදැක්වීමේදී සමහර පැති ඔහු ඉතා දක්ෂ ලෙස ක්‍රියාත්මක කරනවා. සමහරක් දේවල් සම්බන්ධයෙන් ඔහු කටයුතු කරල තියෙන්නේ අදක්ෂව. ඒ වගේම අනුවණ විදියට. ඇයි එහෙම වුණේ?"

"මට නම් තේරුම් ගන්න බෑ හෝම්ස්. ඔබට ඒක තේරෙනවද?"

"ඒ අවුල තේරුම් කළ හැකි එක් ආකාරයක් මට නම් වැටහෙනවා" හෝම්ස් කීවේ තම වම් අතේ ඇඟිලිවලින් නළලට තට්ටු කරමිනි. "ඒක තවත් ඉදිරියට ගෙන යාමට, මට තවමත් ප්‍රමාණවත් තරම් දත්ත ලැබිලා නෑ. කොහොම වුණත් මේ වෙලාවෙ අපේ වගකීම මේ ගැන වහාම පොලීසියට දැනුම් දීම නේද?"

අපගේ එම කටයුත්තට මේ වෙලාවේ බාධා පැමිණිණි. ඒ කඳුගැටය මුදුනෙන් අපට අසන්නට ලැබුණු කටහඬකිනි.

"හලෝ! ඔතන මොකක් හරි ප්‍රශ්නයක්ද?"

උඩ බැලූ අපට දකින්නට ලැබුණේ අවුරුදු දහහතක දහඅටක වයසේ කොලු ගැටව් දෙදෙනෙකු අප දෙස බලා සිටි ආකාරයයි.

"මෙතන හරි බරපතළ ප්‍රශ්නයක්" හෝම්ස් කීය. "මේ පුද්ගලයා කවුද කියලා ඔය ළමයි අඳුනනවද?"

ඔවුහු වහා පහළට බැස අප සිටි තැනට ළඟා වූහ.

"මේ අර පැත්තේ කුඩාරමක් ගහගෙන හිටී දෙන්නගෙන් එක් කෙනෙක්" එක් ළමයෙක් කීය.

"ඔබ දකිද්දී එතැන දෙන්නෙක් හිටියා. එහෙමද?" හෝම්ස් විමසීය.

"ඇත්තටම නම් දෙන්නා නෙමෙයි තුන්දෙනයි. කුඩාරමේ හිටියෙ දෙන්නයි. අනික් යාළුවා හිටියෙ රෙඩ් ලයන් තානායමේ"

"ඒක තියෙන්නෙ කොහේද?"

"ගම ඇතුළට යන පාර දිගේ හැතැක්මක් විතර ගියාම තමයි ඒ තානායම හම්බ වෙන්නේ. ඒ යාළුවාට තියෙනවා කුඩා අශ්ව කරත්තයක්. මං හිතන්නේ කුලියට ගත් එකක්. ඒකෙන් තමයි එයා මෙහේ ඇවිත් ගියේ"

"මේ යාළුවන්ව ඔබ අන්තිම වරට දුටුවේ කවදාද?"

"අශ්වකරත්තයෙන් ඇවිත් යන එක්කෙනා නම් දවස් දෙක තුනකින් දැක්කෙ නෑ. නමුත් අනික් දෙන්නා නම් අපි දැක්කා...... මං හිතන්නෙ......... මට මතක හැටියට දවස් දෙකකට කලින් වෙන්න ඕන" එකෙක් කීය.

"මට නම් හිතෙන්නෙ අපි ඒ දෙන්නව දැක්කෙ දවස් තුනකට කලින් කියලයි" මෙතෙක් වේලා නිහඬව සිටි අනෙක් ළමයා කීය. "ඒ අය සණ්ඩු සරුවල් වෙවී හිටියෙ. අයියෝ! ඔබ හිතන්නේ එයින් එක් කෙනෙක් මෙයා මරාදාල කියලද?"

"කළේ කවුද කියන්න බෑ. නමුත් කවුරු හරි ඒක කරල තියෙනවා" හෝම්ස් කීය. අනතුරුව ඔහු මා ඇමතුවේය.

"වොට්සන්. ඔබට තියෙනවා වැඩ කොටසක්. පොලීසිය එනතුරු මට මෙතැන ඉන්න වෙනවා. ඔබ ගිහින් දුරකතන පහසුකම් තිබෙන පළමු වැනි තැනෙන්ම නොරිච් පොලීසියට ඇමතුමක් දෙන්න. ඔවුනට කියන්න මං මෙහේ ඉන්න බවත්, පොලිස් පරීක්ෂකවරයෙක් සහ භටයන් කිහිප දෙනෙකු ඉක්මනට මෙහේට එවන්න කියලත්. මං ඔබට භාරදෙන අනික් කටයුත්ත තමයි; ඔබ යා යුතුයි මේ කියන රෙඩ් ලයන් තානායමට. බලන්න අර අශ්වකරත්තයෙන් යන එන මෙයාලගේ අනික් මිත්‍රයා ඉන්නවද කියල. කූඩාරමේ නැවතිලා හිටි දෙන්නා ගැන ඔහු දන්න තොරතුරු මොනවද කියල විමසන්න. ආපහු එද්දී සැන්ඩ්විච්ස් පාර්සලයක් සහ බොන්න මොනවා හරි අරගෙන එන්න. ඒක නම් අමතක කරන්න එපා වොට්සන්"

අප ආපසු බිඳුණු ගෙය තිබූ තැනට යද්දී තරුණයෝ තවත් කිහිප දෙනෙක් එතැනට එකතු වී සිටියහ. ඔවුන් නොරිච් සමීපයේ පාසලක සිසුන් බවත්, ජීව විද්‍යා ගුරුවරයාගේ උපදෙස් අනුව මුහුද ආශ්‍රිත ශාක හා සතුන් අධ්‍යයනය කිරීමට, කඳවුරක් බැඳගෙන මෙහි රැඳී සිටින බවත් අපට දැනගන්නට ලැබිණි.

මා පිටත් වී යාමට සූදානම් වෙද්දී කූඩාරමෙන් බලැන්කේට්ටු හා ඇතිරිලි කිහිපයක් අතට ගත් හෝම්ස්, අප නිරීක්ෂණය කළ අඩි සටහන් ආරක්ෂා කිරීම සඳහා ඒවා වසා දැමූ ආකාරය මම දුටුවෙමි.

අන්තිමේදී මට දුරකතන පහසුකම් ලබා ගැනීමට රෙඩ් ලයන් තානායමට ම යාමට සිදුවිය. නොරිච් පොලිස් ස්ථානය ඉක්මනින්ම





සම්බන්ධ කර ගැනීමට තරම් මම වාසනාවන්ත වීමි. පොලීසිය වෙත අත්‍යවශ්‍ය තොරතුරු දන්වද්දී, තානායම් හිමියා මවිතයෙන් මුව විවර කරගෙන බලා සිටියේය. අපරාධය සිදුවූ ස්ථානය වෙත පොලිස් පරීක්ෂකවරයෙකු යැවීමට ඔවුහු එකඟ වූහ. එහෙත් වැඩ කටයුතු ඉතා ඉක්මනින් මෙන්ම කාර්යක්ෂමව සිදුවන අයුරක් මට වැටහුණේ, මා හෝම්ස්ගේ නම සඳහන් කළ පසුවය. මීළඟට මම තානායම් හිමිකරු වෙත මගේ අවධානය යොමු කළෙමි.

ඔහු කලක් යුද්ධ හමුදාවේ සාජන්ට්වරයෙකු ලෙස සේවය කොට විශ්‍රාම ලැබූවෙකි. දකුණු අප්‍රිකාවේ බලොම් ෆොන්ටේන් සහ මැෆ්කිං යුද පෙරමුණුවල, ක්‍රියාන්විත රාජකාරියේ යෙදී ඇති ඔහු, මා ඇමතුවේ ගෞරවයෙනි. ඒ මා හමුදා වෛද්‍යවරයෙකු ලෙස සේවය කොට ඇති බව දැනගත් පසුවය. ඔහුට උවමනා වී තිබුණේ තොරතුරු හාර හාරා මගෙන් විමසීමටයි. එහෙත් පරීක්ෂණයට බාධා විය හැකි නිසා මා ඔහුට දුන්නේ තොරතුරු ස්වල්පයකි. අන්තිමේදී කථා කිරීමේ රාජකාරිය ඔහුට භාරකොට ඔහුගෙන් හැකිතරම් තොරතුරු ලබා ගතිමි.

"වොට්සන් දොස්තර මහත්තයා" ටයිලර් නම් වූ තානායම්කරු කීවේ දිග කතාවක් ඇරඹීමට සූදානමෙනි. "කූඩාරමක් අටවාගෙන ඔය නැවතුණු දෙන්නා තමයි ක්‍රිස්ටෝෆර් හැරල්ඩ් සහ ජෙෆ් කින්සි. මීට ඉස්සරත් එයාලා මේ පළාතට ඇවිත් කඳවුරු බැඳගෙන නිවාඩු ගත කරලා තියෙනවා. මේ සැරේ ඔවුන් මෙහේ දින දහයක් පමණ ගත කළා. ලන්ඩනයේ සිට එයාලා නමට එවන ලියුම් එන්නේ මේ තානායමට. වරින් වර මෙහේට ඇවිත් ඒවා එකතු කර ගන්නවා.

කලින් සති අන්තයේ එයාලගේ යාළුවෙක් මෙහේ ආවා. එයාගෙ නම බොනී ආමිටේජ්. එයා මේ තානායමේ නැවතුණා. ඔහු ලන්ඩනයේ සිට දුම්රියෙන් ඇවිත් තිබුණේ. ඊළඟට තමන්ගේ ගමන් පහසුවට කියලා අශ්වකරත්ත කුලියට දෙන ක්‍රොස්ෆීල්ඩ් සමාගමෙන් පොඩි අශ්වකරත්තයක් අරගෙන ඒක තමන්ම දක්කාගෙනයි ආවෙ. ඔහු නැවතී හිටියෙ දින කිහිපයක් විතරයි. අනෙක් දෙන්නා මෙහෙ ඉද්දදී ආමිටේජ් පහුගිය අඟහරුවාදා ආපහු ලන්ඩන් බලා ගියා. ඔහු මේ පළාතට එන්න කලින් නම් ක්‍රිස් හැරල්ඩ් සහ ජෙෆ් කින්සි නිතරම මේ තානායමට ඇවිත් ගියා. ගිය සති අන්තයේ ඔවුන් තුන්දෙනා සැහෙන්න කාලය ගත

කළා එකට. ආම්ටේජ් එයාගෙ අශ්වකරත්තයෙන්, අර දෙන්නාව හුගක් එහෙ මෙහේ ගෙන ගියා.

දින තුනකට කලින්, ඒ කියන්නේ ගිය අඟහරුවාදා දවල් දෙකට තුනට, ආම්ටේජ් නමට විදුලිපුවතක් ආවා. ඒක කඩා බැලූ ඔහු කිව්වා තමන්ට වහාම ලන්ඩනයට යැමට සිදුවී ඇති බව. ආම්ටේජ්ට විදුලි පුවත ලැබෙන වෙලාවෙ අනෙක් දෙන්නත් මෙහේ හිටියනෙ. ඉතින් ඔවුන් මිත්‍රයාට ශුභ පතන්න, සමුගැනීමේ සච්දිය පුරන්න තවත් පැය කීපයක් මෙහේ රැඳී ඉන්න තීරණය කළා. මං අන්තිමට දැක්කෙ ඔවුන් තුන්දෙනාම එකිනෙකාගෙ කරට අත් දමාගෙන තානායමෙන් පිටවී ගිය හැටි. අධික වශයෙන් මත්පැන් පානය කිරීම නිසා තුන්දෙනාම හොඳටම වෙරිවෙලා හිටියා වගෙයි මට පෙනුණේ. එහාට මෙහාට විසිවෙවී තමයි ඇවිදගෙන ගියේ. ඔවුන් ගමන් කළේ මුහුදු වෙරළ පැත්තට ගස් අතරින් වැටී තිබුණු අඩි පාරක් දිගේ.

ඊට පැය දෙකකට විතර පස්සේ මං තානායමේ නොහිටි වෙලාවක ආපහු ආව ආම්ටේජ්, ගෙවීම් අවසන් කරලා ඔහුගේ බඩුමුට්ටු හා අශ්ව කරත්තය අරගෙන පිටවී ගොස් තිබුණා. නමුත් අනික් දෙන්නා මට දකින්නවත් ලැබුණෙ නෑ. වෙනදාට දවසට දෙතුන් සැරයක් මෙහේ ඇවිත් යන හැරල්ඩ් හා කින්සි දෙන්නා අඟහරුවාදාට පස්සේ මේ පැත්තට වත් ආවෙ නෑ. වෙනදාට ඔවුන් නිතර නිතර ආවෙ අඩුපාඩු වෙන මත්පැන් ප්‍රමාණය සම්පූර්ණ කරගන්න. නමුත් දැන් ඔවුන්ගේ මිත්‍රයාත් මෙහේ නොමැති නිසා ඔවුන්ගේ අවධානය වෙනත් පැත්තකට යොමු කරල වෙන්න ඇති කියලයි මට හිතුණේ. විලිංඩන්වල තියෙනවා "ද ඩ්‍රැගන්" කියලා තානායමක්. ඔවුන් කඳවුරු බැඳගෙන ඉන්නා පැත්තට "ද ඩ්‍රැගන්" එක අපට වඩා ළඟයි."

"ටයිලර් මහත්මයා" මා කීවේ තානායම් හිමියා අමතමිනි. "ඔබට පුළුවන්ද "ද ඩ්‍රැගන්" තානායම අයිතිකරුට දුරකතනයෙන් කතා කරල බලන්න? අහන්න මේ දෙන්නා පහුගිය කාලය එහේ ගත කළාද කියල"

මගේ ඉල්ලීම අනුව "රෙඩ් ලයන්" තානායම හිමිකරු "ද ඩ්‍රැගන්" තානායම ඇමතුවේය. ඔහුගේ ඒ කතාබහට මිනිත්තු කිහිපයක් ගතවිය.





"වොට්සන් මහත්මයා" ටයිලර් කීය. "මං හිතුවා හරි. බදාදා දවස පුරාම වැස්ස තිබුණ නේ. හැරල්ඩ් කින්සි දෙන්නා මුළු බදාදා දවසම වගේ ගත කරල තියෙන්නෙ එහේ. ඔවුන් බිලියඩ් ක්‍රීඩා කරමින්, පියානෝ වාදනය කරමින් මත්පැන් බොමින් තමයි එදා කාලය ගත කරල තියෙන්නේ. ඔවුන් බ්‍රහස්පතින්දා දවල් එහේ ගියාලු. එක් වටයක් බීම අර ගත්තට පස්සේ දවල් දෙකට පමණ එහෙන් පිටවෙලා ආවලු. ඒ කියන්නේ බ්‍රහස්පතින්දා දවාලෙ. ඊට පස්සෙ නම් "ද ඩ්‍රැගන්" එකේ අයට මේ දෙන්නා දකින්න ලැබිල නෑ."

"දැන් අද සිකුරාදා හවස් වරුව නේ." මම කීවෙමි. "පැය 24 කට වැඩි කාලයක් කවුරුවත් මේ දෙන්නා දැකපු බවට සාක්ෂි නෑ. මත්පැන් විකිණීමට අවසර තිබෙන තානායම් මේ කිට්ටුව වෙන කොහේද තියෙන්නේ?"

"මත්පැන් ලබාගන්න පුළුවන් වෙනත් තැනක් මේ කිට්ටුවක නෑ දොස්තර මහත්තයා. එක තානායමක් තියෙනවා මෝල්ඩන් වල. ඒ හැතැක්ම හතක් අටක් දුරින්. අනික තියෙන්නේ වීට්ස්හැම් පැත්තේ. ඒකට හැතැක්ම දහයකට වඩා දුරයි."

"මේ ආම්ටේජ් කියන එක්කෙනා මොන විදියේ කෙනෙක්ද?" මම විමසුවෙමි.

"වයස අවුරුදු තිහක් විතර ඇති මගෙ හිතේ" ටයිලර් කීය. "එච්චර උස නෑ; අඩි පහයි අඟල් දෙකක් තුනක් ඇති. ඒ වුණාට ශරීරය බොහොම හැඩි දැඩි ශක්තිමත් එකක්. මං අහගෙන කතා වෙනවා තරුණ කාලෙ ඔහු යෙදුණු බොක්සිං, රග්බි, පාපන්දු ආදී ක්‍රීඩා ගැන. කළුපාට කොණ්ඩය අක්බමරු වුණු කෙටි එකක්. පොඩි උඩු රැවුලක් තියෙනවා. හරි කතා කාරයා"

"ඒක නෙමෙයි ටයිලර් මහත්මයා. කුඩාරමේ තිබිල අපට ඉතා අසාමාන්‍ය පෙනුමක් තිබෙන පිහියක් හමුවුණා. ඒකෙ මිට සුදුපාට අස්ථි මිටක්. ඉතාම මුවහත් තුනී තලයක් එයට තියෙන්නෙ. ඒක අඟල් අටක් විතර දිගයි. ඒක ඔබ දන්නා පිහියක්ද?"

"ඇයි දෙයියනේ!" තානායම් හිමියා කීවේ දෙනෙත් ලොකු කරගෙනය. "මගේ ළඟ තිබුණා හැම් සහ හරක්මස් පෙති කැපීමට යොදා ගත් පිහියක්. ඔබ කිවූ විස්තරය ඒකට නූලටම ගැළපෙනවා. අර කට්ටිය මෙහේ ඇවිත් ගියේ අඟහරුවාදා දවල්. ඒ වෙලාවෙ ඉදල පිහිය නැතිවෙලා. හෙච්චට හමුවුනේ නැහැ. ඔබ කියන්නේ........"

"අපරාධයට යොදාගත් ආයුධය ඒක වෙන්නත් පුළුවනි" මම කීවෙමි. දැන් ඒක තියෙන්නෙ කුඩාරමේ. මේ අයගෙන් කවුරු හරි ඒක අරගෙන යන්න ඇති. ඒක තිබුණේ එයාලට පහසුවෙන් ගන්න පුළුවන් තැනකද?"

"සාලයේ මේස ලාච්චුවක තමයි ඒක තබා තිබුණේ. එයාලා නිතරම වගේ හිඳගෙන හිටියෙත් ඒකෙම තමා. ඔබ ඒ ගැන විමසූ නිසා දැන් මට මතක් වෙනවා. ආම්ටේජ් මහත්මයා සමග පිටත්වෙලා යන්න කලින්, ජෙෆ් කින්සි මහත්මයා ඒ සාලයට ගියා. ඔහු ඒක අරගන්න ඇති"

මට එක්රැස්කර ගත හැකි වූ තොරතුරු වල සාරාංශය එයයි. සැන්ඩ්විච්ස් පාර්සලයක් සහ පලතුරු යුෂ බෝතල් කිහිපයක් රැගෙන මම හෝම්ස් රැඳී සිටි ස්ථානය වෙත පිටත් වූයෙමි.

මට දැන ගැනීමට හැකිවූ කරුණු සෑම එකක්ම පාහේ එකින් එක ගැළපෙන බැව් මට පෙනී ගියේය. අපරාධය සිදු කිරීමට දින දෙකකට පෙර මස් කපන පිහිය අතුරුදන්වීමෙන් පෙනෙන්නේ කුමක්ද? මේ මිනීමැරුම කල්තබා සැලසුම් කරගෙන තිබූ ආකාරය එයින් තහවුරු වෙයි. ක්‍රිස් හැරල්ඩ් මිය ගොසිනි. ඔහුගේ මිනීමරුවා බොහෝ දුරට කින්සි විය යුතුය. එසේ නොමැති නම් ඔහු කිසිදු හෝඩුවාවක් ඉතිරි නොකර අතුරුදන්ව සිටින්නේ ඇයි? පිහිය සොරකම් කිරීමට වැඩිම අවස්ථාවක් තිබුණේ කින්සිට බවට ද සාක්ෂි ඇත.

පාසල් සිසුන් කිහිප දෙනෙකු සහ ගුරුවරයෙකු යයි සිතිය හැකි කෙනෙකු හෝම්ස් වටකරගෙන සිටි අයුරු මට දකින්නට ලැබිණ. මා දුටු වහාම සතුටට පත් හඬක් නැගූ හෝම්ස් පලතුරු බීම බෝතලයෙන් උගුරු කිහිපයක්ම බීවේය. ඒ පැය ගණනක් නිරාහාරව සිටි අයෙකු විලසිනි. මට දැනගැනීමට ලැබුණු තොරතුරු මම ඔහුට පැවසුවෙමි.

"මටත් ආරංචි ටිකක් ලැබුණා" හෝම්ස් කීය. "මේ මහත්මයා තමයි මේ ශිෂ්‍යයන්ගේ විද්‍යා ගුරුතුමා - නැතැනියෙල් මහත්මයා. ඔහුත් දන්නවා අපේ මිත්‍රයන් දෙදෙනා ගැන කාරණා ස්වල්පයක්"

මේ ගුරුතුමා පැවසූ අන්දමට ඔහුට මුල්වරට හැරල්ඩ් සහ කින්සි හමුවී ඇත්තේ "රෙඩ් ලයන්" තානායමේ දීය. ඔවුන් දෙදෙනා ලන්ඩනයේ පිහිටි සමාගමක බාහිර තැරැව්කරුවන් දෙදෙනෙකු බැව් නැතැනියෙල් මහතා පැවසීය. මෙම සමාගම කොටස්





වෙළෙඳපොළේ කොටස් අලෙවි කරන තැරැව්කාර සමාගමකි. කොටස් මිල ඉහළ පහළ යන ආකාරය ගැන හොඳ වැටහීමක් ඔවුනට තිබූ නිසා, විශාල මුදල් ප්‍රමාණ ඉක්මනින් උපයා ගැනීමට ඔවුන්ට හැකිවූයේ යයි, තමා තේරුම් ගත් බැව් ගුරුතුමා වැඩිදුරටත් පැවසුවේය. තමාට "රෙඩ් ලයන්" තානායමේදී එක්වරක් බොනී ආම්ටේජ් මහතා හමු වූ බවත්, ඔහු අර මිත්‍රයන් රැකියාව කළ සමාගමේ ජ්‍යෙෂ්ඨ කොටස්කරුවෙකු බවත් ගුරුතුමාට දැනගන්නට ලැබී ඇත.

"මේ මරණය ගැන නම් මං මොකුත්ම කියන්න දන්නේ නෑ" නැතැනියෙල් මහතා කීය. "මට මේ යාළුවන් දෙන්නා අන්තිමට හමුවුණේ බ්‍රහස්පතින්දා දවල් දෙකට තුනට පමණ. ඔවුන් ඒ වෙලාවේ මුහුදේ නාන්න යන්න සූදානම් වෙලා හිටියේ. ආම්ටේජ් ආපහු ලන්ඩනයට ගිය බව ඔවුන් කිව්වා. තමන් මේ ප්‍රදේශයේ තවත් සතියක් පමණ ගත කරන්න බලාපොරොත්තු වෙන බවත් ඔවුන් වැඩිදුරටත් කිව්වා"

"ඔවුන් දෙදෙනා හිටියේ සතුටෙන්ද? නැත්නම් කනගාටුවෙන් වගේද?" හෝම්ස් විමසුවේය. "විශේෂයෙන්ම ඒ දෙදෙනා එකිනෙකා වෙත දැක්වූ මිත්‍රත්වය කොහොමද?"

"ඔවුන් සිටියේ බොහොම සතුටෙන්. ඒ දෙන්නා එකිනෙකා වෙත දැක්වූ සුහද මිත්‍රශීලී බවෙත් අඩුවක් මට නම් පෙනුණේ නෑ" නැතැනියෙල් මහතා කීය.

ජෙෆ් කින්සිගේ ස්වභාවය ගැන තමන්ට හිතුණු දේ ගුරුතුමා හෝම්ස් සමග කියා තිබිණි. කින්සි හැමවිටම සිනාමුසු මුහුණෙන් සිටියත්, පහසුවෙන් කෝපයට පත්වන්නෙකු බව නොපෙනුණත් ඔහුගේ අභ්‍යන්තර ස්වභාවය ගැන තමාගේ පැහැදීමක් නොමැති බැව් ගුරුතුමා පවසා ඇත. ඔහු කියා ඇත්තේ කින්සි යනු හදිසි තීරණයක් මත බරපතළ අපරාධයක් කිරීමට වුවත් පසුබට වන්නෙකු නොවන බවයි. ක්‍රිස් හැරල්ඩ් ගැන ගුරුතුමාට කීමට තිබී ඇත්තේ ඉතා ස්වල්පයක් පමණි. හැරල්ඩ් අහිංසකයෙකු බවත් ඔහු කින්සිගේ ප්‍රයෝගකාරී ඇතට හසු වූ අහිංසකයෙකු බව තමාට හැඟුණේ යයි ගුරුතුමා පවසා ඇත.

එහෙත් ඔහු පැවසූ සෑම දෙයක්ම එලෙසින්ම විශ්වාසයට ගැනීමට මම කැමැති නොවීමි. මට සිතුණේ නැතැනියෙල් ගුරුතුමා සදාචාරාත්මක බව පමණ වඩා හිතට ආරූඪ කරගත්,

තමන් සර්වප්‍රකාරයෙන්ම සුදනෙකු යයි සිතන, අනික් සියලුම දෙනා ඒ තත්ත්වයට පත්විය යුතු යයි සිතන්නෙකු බවයි.

"මෙහේට එන්න වොට්සන්" හෝම්ස් කීය. "මං කැමතියි මෙන්න මේව දිහා ඔබ තවත් වරක් බලනවා නම්"

"මං ගියාට පස්සෙ අලුතෙන් යමක් ඔබට හමුවුණාද?"

"ඔව් සහ නැහැ" ඔහු පිළිතුරු දුන්නේය. "ඔබට මතක නේද B ගේ පා සලකුණු ගැන අප යම් නිරීක්ෂණයක් කරලා එක්තරා නිගමනයකට ආවා?"

"මට ඒක යළිත් වරක් මතක් කරල දෙන්න"

"B ගේ පා සලකුණු වලින් අපට හැකිවුණා යම් නිගමනයකට එන්න. ඒ තමයි ඔහු කඳු ගැටය උඩ බිඳුණු ගෙදර දෙසට ගමන් කරද්දී යම් බරක් ඔසවා ගෙන ගිහින් තියෙනවා; නමුත් ආපසු එද්දී ආවේ බරක් නොමැතිව. කඳු ගැටය පහළ මළ සිරුරක් හමුවුණාම ඒක අපේ අර මුල් නිරීක්ෂණයට සහ නිගමනයට කදිමට ගැළපුණා. එහෙම නේද?"

"ඔව්. ඔබ කියන දේ මට පැහැදිලියි. දැන් මොකක්ද ප්‍රශ්නේ?"

"B ගේම තවත් පා සටහන් සමූහයක් ගැන, මං සමීප නිරීක්ෂණයක් කළා. ඔහු එක්තරා තැනකට ගිහිං ආපහු ඇවිත් තියෙනවා. ඒකෙදි කලින් වගේම බරක් ඔසවා ගෙන ගිහිං ආපහු එද්දි බරක් නොමැතිව ඇවිත් තියෙනවා. ඔබට තේරෙනවද වොට්සන් මං කියන දේ?"

"ඔව්. මට පැහැදිලියි. ඉතින්?"

"මම මේ කියන අඩි සටහන් වැටී තිබෙන්නේ බිඳුණු නිවස තිබෙන කඳුගැටය දිහාවටවත්, මුහුදු වෙරළ දිහාවටවත් නෙමෙයි"

"එහෙනම්?"

"ඔහු මුලින් ගමන් කළ පාරට අංශක 160 ක නැත්නම් අංශක 180 ක කෝණයක් සාදමින් වෙනත් දිශාවකට"

"ඒ කොහේටද?"

"මුහුදු වෙරළේ සිට ගම ඇතුළට යාමට හැකි පාර වෙතට. ඒ පාරෙන් යන්න පුළුවන් තානායමටත්."

"ඒකෙන් ඔබට ගත හැකි නිගමනය මොකක්ද හෝම්ස්?"

"පා සලකුණු අනුව නම් මට කියන්න වෙන්නේ, ඔහු කූඩාරමේ සිට බරක් ඔසවා ගෙන, ඒ පාර ළඟට ගිහින් තියෙනවා. ඊළඟට






**හෝම්ස් - වොට්සන් ගවේෂණය කළ අඩවියේ දළ සිතියමක්**

(පරිමාණයට නොවේ)

ඒ බර නොමැතිව ආපහු කූඩාරමට ගිහින් තියෙනවා. එතැනින් එහාට මොකුත්ම කියන්න බෑ. ඒ මොකද පාරේ මතුපිට හුගක් තදයි. ඒකෙ පා සලකුණු කිසිවක් සටහන් වෙන්නෙ නෑ."

"එතකොට?"

"එතකොට මට කියන්න අමාරුයි ...... එම පාරට ළඟාවුණාට පස්සෙ ගියේ කොහේද, ගියේ කොහොමද කියන කාරණය"

"ඉතින් මොකක්ද ඔබ කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"මේ පාර දිගේ ඇවිදගෙන ගිහින් බලන්න ඕන, ඔහුගේ පා සලකුණු කොහේ හරි වැදිල තියෙනවද කියල. හො හෝ! මේ එන්නෙ පොලිස් නිලධරයන් වෙන්න ඇති"

රෙඩ් ලයන් තානායමේ සිට මුහුදු තීරය වෙත වැටුණු පාර දිගේ අශ්වකරත්තයක් ඉදිරියට ආවේය. එහි නිලඇඳුමින් සැරසුණු පොලිස් භටයන් දෙදෙනෙකු සහ සාමාන්‍ය ඇඳුමෙන් සැරසුණු එක් තැනැත්තෙකු සිටිනු දුටුවෙමි. කූඩාරම පසුකොට යාර විසිපහක් පමණ ඉදිරියට ගොස් ඔවුහු රිය නැවැත්වූහ.

සාමාන්‍ය ඇඳුමෙන් සැරසී සිටි තැනැත්තා රියෙන් බැස හෝම්ස්ට ආචාර කළේය. මිනිත්තු දෙක තුනක් කතාබහේ යෙදී සිටි ඔවුහු අනතුරුව මා සිටි දෙසට පැමිණියහ.

"මේ පොලිස් පරීක්ෂක බෙන්සන්; මේ මගේ හිතවත් මිත්‍රයා දොස්තර වොට්සන්" ඔහු අප හඳුන්වා දුන්නේය. මෙතෙක් අපට දැනගැනීමට ලැබුණු තොරතුරු සහ අප සොයාගත් දේ ගැන හෝම්ස් සම්පූර්ණ විස්තරයක් පොලිස් නිලධරයාට ලබා දුන්නේය. එයට මිනිත්තු දහයක් පමණ ගත විය.

එම තොරතුරු විස්තර කොට අවසන් වෙනවාත් සමගම දෙවැනි අශ්ව කරත්තයක් අප සිටි දෙසට ළංවුණු ආකාරය දකින්නට ලැබිණි. එය තනි අශ්වයකු විසින් ඇදගෙන එනු ලැබූ රෝද දෙකේ කුඩා අස්රියකි.

"හලෝ! මේ කවුද?" පොලිස් පරීක්ෂකවරයා විමසුවේ පුදුමයට පත්වය.

එම රිය, පොලිස් අශ්වකරත්තය අසලින්ම නවත්වන ලදී. එයින් බැස්සේ පුළුල් උරහිස් හා හැඩිදැඩි සිරුරක් තිබූ අවුරුදු හතළිහක පමණ පුද්ගලයෙකි.

"මහා කලබලයක් සිදුවෙලාලු, නේද?" ඔහු විමසුවේ අප සිටි දෙසට පැමිණෙමිනි. "මගේ නම ආම්ටේජ්. මේ පැත්තේ ලොකු ප්‍රශ්නයක් ඇතිවෙලා කියල තානායමේ අය කිව්වා"





"බොනි ආම්ටේජ් කියන්නේ ඔබද?" හෝම්ස් අමුත්තාගෙන් විමසුවේය.

"ඔව්. ක්‍රිස් හැරල්ඩ් මියගිහින් කියන්නේ ඇත්තද" යයි විමසූ අමුත්තා වෙතින් දිස්වූයේ ඔහු ඉමහත් කැලැඹීමකට පත්ව සිටි අයුරකි.

"ඔහු ඔබේ මිත්‍රයෙක්ද?"

"ඔව්. හැරල්ඩ් සහ ඔහු සමග මෙහේ නැවතී සිටි ජෙෆ් කින්සි දෙදෙනාම මගේ ව්‍යාපාරයේ හවුල්කාරයෝ. මං ලන්ඩනයේ ඉඳන් ආවෙ ඔවුන් හමුවෙන්න. එතකොට තානායමේදී තමයි මට මේ ගැන........"

"එයාල මොනවද කිව්වෙ?"

"හැරල්ඩ් මියගිහින්; කින්සි අතුරුදන් වෙලා කිව්වා. ඒ කතාව ඇත්තද? මොකක්ද දැන් සිදුවෙලා තියෙන්නෙ?"

"ආම්ටේජ් මහත්මයා" හෝම්ස් කීය. "හැරල්ඩ් මහත්මයා ඔබට ලියූ මෙන්න මේ ලියුම අපට හම්බවුණා. ඒක විවෘත කර බලන්න අපට සිදුවුණා"

ලිපිය විවෘත කළ ආම්ටේජ් එය කියවද්දී ඔහුගේ නළල රැළි වැටිණි. "මේක මට තේරුම් ගන්න අමාරුයි" ඔහු කීය. "තානායමේ අයිතිකාරයා මට කිව්වෙ කවුරු හරි හැරල්ඩ්ව මරා දමල කියල. නමුත් මේකෙ හැටියට නම් පෙනෙන්නෙ ඔහු සිය දිවිනසාගෙන. නමුත් ඒ මොකක් නිසාද........?"

"හැරල්ඩ් මහත්මයාට සිය දිවිනසාගන්න තරම් හේතුවක් තිබුණා කියල ඔබට හිතෙන්නෙ නැද්ද?"

"මේ සිදුවීම තේරුම් කරන්න අමාරු විකාරයක් නේ. දිවි නසාගත්තෙ කින්සි නම්, ඒක මට තේරුම් ගන්න පුළුවනි. මේක මහ යක්ස වැඩක් නේ. මගේ කටින් මේ කියවෙන දේවල් ප්‍රසිද්ධ වෙන්න අරින්න එපා....... මං අදහස් කළේ, අත්‍යවශ්‍යම වෙලාවක ඇරෙන්න"

"ආම්ටේජ් මහත්මයා" හෝම්ස් කීය. "මට නම් හිතෙන්නේ ඔබ දන්නා කරුණු හැම එකක්ම, ඔබ අවංකව හෙළි කළොත් හොඳයි"

"හෙළිකරන්න නම් තියෙන්නෙ හිත කලකිරවන යක්ෂ කතාවක්" ආම්ටේජ් කතාව ඇරඹීය. "මට මේකෙ අගක් මුලක් තවමත්

පැහැදිලි නෑ. අපි කොටස් වෙළෙඳපොළේ තැරැව්කරුවෝ. ක්‍රිස් හැරල්ඩ් සහ ජෙෆ් කින්සි දෙන්නා මගේ හවුල්කාරයෝ. එයාල දින දහයකට කලින් නිවාඩුවක් ගත කරන්න මෙහේ ආවා. එහෙම කළේ නගරයේ තිබෙන කාර්යාලයේ කටයුතු සියල්ලම බලා ගැනීම මට පවරලා.

ගිය සිකුරාදා මා කාර්යාලයේ සිටියදී, අපි ගනුදෙනු කරන බැංකුවේ කළමනාකරු මා අමතලා, බැංකුවට ඇවිත් ඔහුව හමුවෙන්න කිව්වා. ඔහු මට ඉදිරිපත් කළා චෙක් පතක්. ඒක අති විශාල මුදලකට ලියා තිබුණේ, අපේ සමාගමේ ගිණුමෙන් ගෙවන්න කියලා. අනෙක් කාරණය ඒක කාගේවත් නමට ලියූ චෙක් පතක් නෙමෙයි. ඒකෙ තිබුණේ "රැගෙන එන්නාට ගෙවන්න" කියලයි. බැංකු කළමනාකරු ඒක මට පෙන්වලා ඇහුවා මෙතැන මොකක්වත් වැරැදීමක් නැද්ද කියලා. ඒකට යොදා තිබුණේ මගේ අත්සන සහ කින්සිගේ අත්සන.

මං ඔහුට වහාම කිව්වා, "මේක හොර වංචනික චෙක් පතක්. මං කවදාවත් මෙහෙම දේකට අත්සන් කළේ නැහැ" කියලා. එතැන තිබූ මගේ අත්සන මං හොඳින් පරීක්ෂා කරල බැලුවා. ඔබට කියන්න මහත්වරුනි; මගේ සැබෑ අත්සන හා සැසඳුවාම හොර අත්සනේ වෙනසක් නැති තරමයි. ඊළඟට අපි සමාගමේ ගිණුමෙන් මෑත කාලයේ කළ ගෙවීම් පරීක්ෂා කර බැලුවා. මේ හැම එකක්ම "රැගෙන එන්නාට ගෙවන්න" යනුවෙන් යෙදූ මා සහ කින්සි අත්සන් කළ චෙක්පත්. ඒ හැම එකක්ම ඉතාම විශාල මුදල් ප්‍රමාණවලට. ඒ හැම එකකම මගේ අත්සන හොර අත්සනක්.

ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැනේ. මං පත්වුණේ අප්‍රමාණ භයකට. ඒ මුදල් ප්‍රමාණ සලකා බැලුවාම මේ ආකාරයට චෙක් ලියා තිබීමෙන් අපේ සමාගම බංකොළොත් වෙනවා. එපමණක් නෙමෙයි; අප පත්වන්නේ මහා අපකීර්තියකට, ලැජ්ජාවකට. බැංකුවේ දුරකතනයෙන්ම පොලීසිය අමතලා ඒ පිළිබඳව කටයුතු කිරීම මං ඔවුනට භාරදුන්නා. ඊට පස්සේ ආපසු කාර්යාලයට ගිහිං කවුන්ටර් ෆොයිල් කොටස් ඉතිරිව තිබූ චෙක් පොත් තෝරා ගත්තා. ඊළඟට මං ආවේ මෙහේට. ඒ කින්සි හමුවෙන්න. මං අනුමාන කළේ ඔහුගේ අත්සනත් මගේ අත්සන වගේ හොරට යොදලා වෙන්න ඇති කියලයි.





ඉතින් සති අන්තය අපි ගත කළේ ඒ ගැන සාකච්ඡා කරමින්. අමතක වූ කාරණා සහ සිදුවීම් යළි මතක් කරමින්, අපි දීර්ඝ ලෙස සාකච්ඡා කළා. කින්සි කිව්වේ ඔහු ඔය චෙක් පත් කවදාවත් අත්සන් නොකළ බවයි. නමුත් මෙහෙම දෙයක් සිදුවුණේ කොහොමද කියන්නත් ඔහු දැනගෙන හිටියේ නෑ. ඒ වුණත් අපි හොඳින්ම දන්නවා, චෙක්පොත් තැන්පත් කර තිබෙන්නේ ආරක්ෂිත සේප්පුවක. ඒකට යතුරු තිබෙන්නේ අපි තුන්දෙනා ළඟ විතරයි.

අන්තිමේදී මොකද වුණේ? මේ ප්‍රශ්නය ගැන හැරල්ඩ් සහ කින්සි ඔවුනොවුන් සමඟ සණ්ඩුවෙන්න පටන්ගත්තා. හොර චෙක්පත් ලියුවා යයි එකිනෙකාට චෝදනා කරමින්, ඔවුන් කලහකාරී විදියට හැසිරෙන්න පටන් ගත්තා. මං කිව්වේ ඒ කතාව බොහොම වැරැදියි; ඔවුන් දෙදෙනා ගැනම මට විශ්වාසයි කියලා. මගේ උත්සාහය නිසා අන්තිමේදී දෙදෙනා සමගි කරන්න මට හැකිවුණා.

කොහොම හරි මං අඟහරුවාදා වෙනතුරු මෙහේ රැඳී හිටියා. ඒ දිගින් දිගටම දුරකතනය මගින් ලන්ඩනය හා සම්බන්ධ වෙමින්. ඊළඟට අඟහරුවාදා මට කාර්යාලයෙන් විදුලිපුවතක් ආවා. ඒ ඉතාම හදිසි රාජකාරි වැඩකට මා ලන්ඩනයට පැමිණිය යුතු බව දන්වමින්.

මීළඟට අපි එන්නෙ මේ සිද්ධියේ ඉතාම කනගාටුදායක කොටසට. අත්‍යවශ්‍ය කඩදාසි වගයක් ගැනීම සඳහා මට යන්න වුණා කින්සිගෙ කාර්යාල කාමරයේ තිබූ ඔහුගේ මේසයට. ඒකෙ ලාච්චුවක තිබී මට හමුවුණේ මොකක්ද? තීන්ත පොවන කඩදාසි පොතක්. ඒකෙ තිබුණේ මගේ අත්සන වංචනික ලෙස යොදන්න උත්සාහ කළ පුහුණු වීම් රාශියක්. ඒ අත්සන ගැන කිසිම සැකයක් නෑ. හැම දෙයක් ගැනම අවසන් නිශ්චිත තීරණය ලැබුණේ ඒකෙන්. මං යළිත් වරක් වහාම මෙහේ ආවා.

මං ගත් තීරණය ගැන ඔබට කියන එකේ වැරැද්දක් නෑ. මට දිගින් දිගටම පාඩු විඳිමින් අපේ සමාගම බංකොළොත් කරගන්න බෑ. මං කෙළින්ම කින්සිට කිව්වා වෙනිං රස්සාවක් හොයාගන්න කියලා. අපි දෙන්නා කාලයක් බොහොම සමීප මිත්‍රයන් වී හිටි බව ඇත්තයි. නමුත් මෙහෙම වෙන්වීම හොඳයි. පහුවෙලා ඔහුව විත්ති කූඩුවට නංවලා හිරේ අරිනවාට වඩා.

මං රෙඩ් ලයන් තානායමට ගියේ මීට මිනිත්තු කිහිපයකට කලින්. හැරල්ඩ් මියගිහින් කින්සි අතුරුදහන් වී ඇති බවත් මට කිව්වේ තානායම් හිමිකරු. මට අදහාගන්න බැරිවුණා. වංචා කිරීම එකක්. නමුත් මිනීමැරීම? මං වහාම මෙහේට ආවේ මං දන්නා හැම දෙයක්ම ඔබට කියන්නයි. නමුත් මේක සිය දිවි නසාගැනීමක් නම්....... ඇයි ඒක ඒ විදියට වුණේ........" ඔහුගේ කටහඬ සෙමෙන් අඩුවී නොඇසී ගියේය.

"ආම්ටේජ් මහත්මයා. ඒක දිවි නසාගැනීමක් නෙමෙයි" හෝම්ස් කීය. "ඒක හිතාමතා කළ මිනීමැරුමක්. දිවි නසාගැනීමක් කියල ලෝකෙට පෙන්වන්න මිනීමරුවා දුර්වල උත්සාහයක යෙදිල තියෙනවා. චෙක්පොත්වල අර කවුන්ටර් ෆොයිල තියෙන අග්ගිසි පුලුස්සා දමන්න මිනීමරුවා උත්සාහ කරල තිබුණා. නමුත් ඒකත් අසාර්ථක වෙලා" දැන් උද්ගත වී ඇති තත්ත්වය ඔහු වචන කිහිපයකින් ආම්ටේජ්ට පැවසීය.

"මෙහෙම දෙයක් මං කොහොමටවත් විශ්වාස නොකරන්න ඉඩ තිබුණා" ආම්ටේජ් කීවේ තව තවත් කලකිරීමට පත් වෙමිනි.

"හොඳයි. දැන් මොකක්ද ඔබේ අවසන් නිගමනය?" හෝම්ස් විමසුවේය.

"අවසන් නිගමනයකට එන්න මගේ නම් කැමැත්තක් නෑ. නමුත් ඒක බොහොම පැහැදිලියි කියලයි මට හිතෙන්නෙ"

"ඔබ අදහස් කරන්නේ කින්සි හැරල්ඩ්ව මරා දමල පැන ගිහින් කියල නේ. නමුත් ඇයි ඔහු හැරල්ඩ්ව මරන්නේ?"

"මට හිතෙන්නෙ මෙහෙමයි." ආම්ටේජ් කීය. "චෙක්පත්වලට හොර අත්සන් යෙදුවේ කින්සි බව හැරල්ඩ්ට දැනගන්න ලැබුණා. ඔහුගේ කටවහන්න තමයි කින්සි අර දේ කරන්න ඇත්තෙ. නමුත් තමන් අතින් සිද්ධවුණු අපරාධයේ බරපතළකම කින්සිට වැටහුණු ගමන් ඔහුගේ ඔළුව නරක් වුණා. ඒකයි පැන ගියේ"

"ඔබට හිතෙන්නේ ක්‍රිස් හැරල්ඩ් අහිංසකයි කියලද?"

"දෙයියනේ ඔව්. ක්‍රිස් හැරල්ඩ් මේ වංචාවට සම්බන්ධ නෑ. හොර අත්සන් ගැහීම කළේ කින්සි. මට ඒ බව කියන්නත් කනගාටුයි"

"හොඳයි ආම්ටේජ් මහත්මයා" හෝම්ස් කීය. "කරුණාකරල මේ පොලිස් පරීක්ෂක බෙන්සන් මහත්මයා සමඟ යන්න ඔබට පුළුවන්ද? ඔබ හැරල්ඩ්ගේ සිරුර හඳුනාගත යුතුයි"





පොලිස් පරීක්ෂකවරයා පසෙකට කැඳ වූ හෝම්ස්, කෙටි කාලයක් ඇතුළත යම් යම් කාරණා දැනුම් දෙන අයුරු මම දුටුවෙමි. අනතුරුව දෙදෙනා එතැනින් පිටවී ගියහ. ඒ බිඳුණු නිවස තිබූ දෙසටයි. ඔවුන් නොපෙනී යනතුරු බලා සිටි හෝම්ස් මා කැඳෙව්වේය.

"දැන් අපට වැඩක් තියෙනවා වොට්සන්" ඔහු මා කැඳවාගෙන ගියේ වෙරළේ සිට ගම දෙසට වැටී තිබූ පාරේ ඉහළටයි.

"මෙන්න මේ පැත්තෙ තමයි තවත් පා සටහන් වගයක් තිබුණේ.......... හරි මේ තියෙන්නෙ."

මෙම පා සටහන් ඉතාම තදින් සලකුණු වී නොතිබුණත්, ඒවා අප කලින් දුටු B ගේ ඒවා බවට සැකයක් නොවීය. මේවා දක්නට ලැබුණේ මුහුදු වෙරළට සමාන්තරව පඳුරු අතරින් වැටී තිබූ පටු පාරකය. මෙහි පස වැලි මිශ්‍රිත එකක් වූ බැවින් පා සටහන් පොළොවට එතරම් තදින් කාවැදී නොතිබිණි. එහෙත් හෝම්ස් ගේ උකුසු නෙතට ඒවා හඳුනාගැනීම අපහසු වූයේ නැත. කෙසේ වෙතත් ඒවා වැටී තිබුණේ කුඩාරමේ සිට ඉවතට බැව් හඳුනා ගැනීම දුෂ්කර නොවීය. මිනිත්තු පහක් ඉදිරියට ගමන් කළ පසු මෙම පටුමග වඩාත් පුළුල් පාරකට සම්බන්ධ වී තිබූ අයුරු දක්නට ලැබිණ.

"ඔහෝ!" මගේ මිත්‍රයා කීවේ එහි පොළොවට ළං වී පරීක්ෂා කරමිනි. "මේකෙ අශ්ව කරත්තයක් ඇවිත් තියෙනවා. තරමක් පුළුල් රෝද සහිත රෝද දෙකේ කරත්තයක්. එක් රෝදයක යකඩ පට්ටමේ තැනක ලොකු කැබැල්ලක් කැඩී ගිහින්...... කරත්තය දෙපැත්තටම ගමන් කරල තියෙනවා."

මෙම පාර දිගේ අපි ඉදිරියට ගමන් කළෙමු. කරත්ත රෝද සලකුණු එක දිගටම නොතිබුණත්, තිබූ තැන්වලදී ඒවා පැහැදිලිව සටහන් වී ඇති බැව් හෝම්ස් කීය. සැතපුමක් පමණ ඉදිරියට ගිය පසු, පාර වංගුවකින් මුහුදු වෙරළ දෙසට හැරුණේය. තවත් මිනිත්තු පහක් පමණ ගමන් කළ පසු අප පැමිණියේ මුහුදු වෙරළ අසලටය. අප කලින් නැරඹීමට පැමිණි නටබුන් වූ දෙව්මැඳුර පිහිටා තිබුණේ මෙතැනට ඉතා ළඟින් බැව් අපට දැකගන්නට ලැබිණි.

කරත්ත රෝදවල සලකුණු මේ අඩවියේ නොවීය. එම සලකුණු වේගයෙන් හැමූ සුළඟ සමග ආ ලිහිල් වැල්ලෙන් වැසී යන්නට

ඇත. එසේත් නැතිනම් වඩදිය වෙලාවේ නැඟුණු දිගු රැල්ලකින් සේදී යන්නට ඇත. එහෙත් හෝම්ස් පසුබට නොවී ඉදිරියට පා නැඟුවේය. දෙව් මැඳුරේ නටබුන් පිහිටි අඩවියට ළංවෙද්දී තැනින් තැන වැටකෙයියා පඳුරු වැවී තිබූ අතර, වැලි සහ හිරිගල් මිශ්‍ර සවිමත් පොළොවක් ද විය. එතැන නැවතුණු හෝම්ස් එම පඳුරු දෙස බලා සිටියේ කල්පනා කරමිනි.

"ඔබ මොනවද මේ හරියෙ දකින්න බලාපොරොත්තු වෙන්නෙ?" මම ඇසීමි.

"කවුද දන්නෙ?" ඔහු කීය. "උනන්දුවෙන් හොයල බැලුවොත් මොකක් හරි නොලැබෙන එකක් නෑ. උදාහරණයක් වශයෙන්....... මෙන්න මේ පැත්ත දිහා බලන්න වොට්සන්....... මෑතකදී කවුරු හරි ගැවසුණු නිසා, මේ හරියේ සලකුණු ඇති වී තිබෙනවා. නමුත් ඒවා මකාදමලා" හෝම්ස් කීවේ ඒ තැන්වලට තම සැරයටිය දිගු කරමිනි.

"ඔබ කියන්නේ මේ වැලි පොළොව පරීක්ෂා කරන එක වැදගත් කියලද?" මම ඇසීමි.

"ඇත්තෙන්ම ඔව්. අපට පුළුවනි උත්සාහයක් දරල බලන්න......" මෙසේ කී ඔහු තම සැරයටිය වැලි පොළොව තුළට යැව්වේ ඊට බලයක් යොදමිනි. "වොට්සන් ඔබේ සැරයටියෙනුත් උත්සාහයක් දරල බලන්න"

මෙසේ කී ඔහු නොනවත්වාම සැරයටිය පොළොව තුළට ඇණ බැලීම ක්‍රියාත්මක කළේය. මම ද ඔහු අනුගමනය කළෙමි. ඔහුගේ මෙම උත්සාහයේ අරමුණ කුමක්දැයි මට නම් තේරුම් ගැනීමට නොහැකි විය. සමහර තැන් වලදී සැරයටිය පහසුවෙන් පොළොව තුළට ගිළුණු අතර සමහර තැන්වලදී එය වහා නැවතුණේ ගලකින් අවහිර වූ ලෙසිනි.

"එහෙම අවහිර වෙන්නෙ දෙව් මැඳුරේ කැඩී ගිය ගල් හා බදාම කැබලි අහුවුණාම" හෝම්ස් කීය. "ඒව ගණන් ගන්න එපා. බලන්න සැරයටිය ඇතුළට බහින එක මෘදු යමකින් අවහිර වෙනවද කියල"

මිනිත්තු කිහිපයක්ම අපි ඩහදිය වගුරුවමින් එම කටයුත්තේ නිරත වූයෙමු. හෝම්ස් මෙම කටයුත්තෙන් අපේක්ෂා කළේ කුමක්දැයි වටහා ගැනීමට මට නොහැකි විය. එහෙත් කළ යුත්තේ නිහඬව ඔහුට කීකරු වීම බැව් මම දැන සිටියෙමි.





"මෙන්න මෙතැන නම් පොළොව යට මොකක් හරි අහුවෙනවා වොට්සන්" ඔහු කීවේ අපමණ සතුටකිනි. "මෙතැනට ඇවිත් වැලි ඉවත්කරන්න; ඇවිත් මට උදව් වෙන්න"

අපේ සැරයටිවලින් සහ දෑත්වල මහන්සියෙන් බුරුලට තිබූ වැලි සෑහෙන ප්‍රමාණයක් ඉවත් කිරීමට අපට හැකි විය. පොළොව මට්ටමේ සිට අඩියක් පමණ යටින්, ශක්තිමත් එහෙත් නැමෙනසුලු යමක් මගේ අතට හසුවිය. අප දෙදෙනාගේම උත්සාහය එතැනට යොමු කළ පසු යමක් මතුවිය. ඒ කකුලක පැළැඳි බූට් සපත්තුවකි. මිනිත්තුවකින් තවත් බූට් සපත්තුවක් දක්නට ලැබිණ. මිනිත්තු කිහිපයකින් අප ඉදිරියේ මතු වූයේ මිනිසෙකුගේ සම්පූර්ණ මෘත ශරීරයකි.

එතරම් උස් නොවූ, එහෙත් ශක්තිමත් හැඩිදැඩි සිරුරක් තිබූ ඔහු තරුණයෙකු බැව් අපි දුටුවෙමු. කළු පැහැති උඩු රැවුලක් ද තිබූ මෙම පුද්ගලයා මරණයට පත් වී එතරම් කාලයක් ගත වී නොමැති බැව් පහසුවෙන් තේරුම් ගැනීමට හැකි විය. මරණයට හේතුව පැහැදිලිව පෙනිණ. තදින් ගැට දමා තිබූ කඹ කැබැල්ලක් ඔහුගේ ගෙල වටා තිබූ අතර, මුහුණේ සම ඉදිමී නහර මතු වී ඇති අයුරු දිස් විය.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" මට කෑගැසිණ. "කවුද මේ මිනිහා? ඔබ හෙව්වේ මොහුද?"

"ඔහු ඔබට හඳුන්වා දෙන්න මට අවස්ථාවක් දෙන්න වොට්සන්" හෝම්ස් කීය. "මේ තමයි මිනීමරුවා ලෙස සැක කරන, පැනගිය සමාගම් කොටස්කරු ජේෆ් කින්සි!"

"කින්සි!" මට කෑගැසිණ. "එහෙම නම් කවුද.......... ?"

හෝම්ස්ගේ මුවෙන් නිකුත් වූ විස්මය පළ කරන හඬකින් මා කීමට සූදානම් වූ දෙයට බාධා ඇති විය. ඔහු මළසිරුර අනික් පැත්ත පෙරළුවේ එයට යට වී තිබූ යමක් අතට ගනිමිනි. එය හැන්දෑවේ හිරු එළියේ කිරණෙන් බැබළිණි. ඒ සිගරට් අසුරා තැබීමට යොදා ගන්නා රත්රනින් තැනූ අසුරනයකි. එහි එක් කෙළවරකට සවිකළ දියමන්තියක්ද තිබෙනු මම දුටුවෙමි.

එහි අගුළ තද කළ හෝම්ස් එය විවෘත කළේය. එහි ඇතුළත තිබුණේ අනර්ඝතම වර්ගයක සිගරට් දෙකක් සහ පුවත්පතකින් ඉරා ගත් කුඩා කඩදාසි කැබැල්ලකි. එය කියවා බැලූ හෝම්ස් එය මා අතට දුන්නේය. එය "ද ටයිම්ස්" පුවත් පතේ "ආර්ථික පුවත්"

නම් අතිරේකයෙන් ඉරා ගත් කැබැල්ලක් බැව් පැහැදිලි විය. ඊට හේතුව "ද ටයිම්ස්" පුවත්පතේ මෙම අතිරේකය සෑමවිටම මුද්‍රණය කෙරෙන්නේ ලා රෝස පැහැති මුද්‍රණ කඩදාසියක වීම නිසාය. කුඩා කඩදාසි කැබැල්ලේ සඳහන්ව තිබුණේ, ඇංග්ලෝ ඇමරිකන් කොන්සොලිඩේටඩ් සමාගමේ කොටස් මිල පුදුමාකාර ලෙස කඩා වැටී ඇති බවය.

"වොට්සන්. මේක ඊයේ පුවත්පත" හෝම්ස් කීය.

"ඒ කාරණය වැදගත් වෙන්නෙ ඇයි?"

"ආර්ථික පුවත් අතිරේකය තියෙන්නේ "ද ටයිම්ස්" පුවත් පතේ ලන්ඩන් සහ ප්‍රධාන නගරවලට යවන මුද්‍රණවල විතරයි" හෝම්ස් කීය. "මේ මිනීවළ හාරන්න ඇත්තේ ඊයෙ රෑ. එහෙමත් නැත්නම් ඔහු මියයන්න ඇත්තේ ඊට කිට්ටු වෙලාවක. එහෙම නැතුව කොහොමද ඊයෙ පුවත්පතේ කෑල්ලක් ඔහුගේ මිනීවළට වැටුණේ?"

"ඒක සමහරවිට තැපෑලෙන් ආවා වෙන්නත් පුළුවනි"

"ඔහුට පුවත්පත් තැපැල් මගින් ලැබුණාද කියන කාරණය අපට පසුව හොයාගන්න පුළුවනි. ප්‍රශ්නය තියෙන්නේ මේ සිගරට් අසුරනය කින්සිගේද වෙනත් කෙනෙකුගේද කියන එකයි. මේක ඔහුගේ නම් අපට ඇති ප්‍රයෝජනයක් නෑ. නමුත් මේකෙ අයිතිකාරයා වෙනත් කෙනෙක් නම් ඔන්න අපේ වාසනාව පෑදෙනවා"

"නමුත් ඒක මිනීවළේ ඇතුළට ගියේ කොහොමද?"

"වොට්සන්. ඔබ මල්පැළ හිටවන්න වත් පොළොවේ වළ වල් හාරලා තියෙනවද? එහෙම කරනවා නම් හුඟක් ප්‍රවේසම් විය යුතුයි. ඒ මොකද ඔබ සතු යම් යම් දේවල් බොහොමයක් පහසුවෙන් එම වළට වැටෙන්න ඉඩ තියෙනවා. මේක බොහෝවිට සිදුවෙන්නෙ කමිසයක උඩ සාක්කුවෙන්; සිගරට් අසුරන, කාසි, උල්පත් පෑන්, සාක්කු ඔරලෝසු, හදිසියට කමිස සාක්කුවට දමාගන්නා කෆ්ලිංක්, ටයිපින්, නෝනලාගේ කරාබු, පෙන්ඩන්ට් ආදී නොයෙකුත් දේට මේ ඉරණම අත්වෙනවා. වෘත්තීය ලෙස වළවල් හාරන උයන්පල්ලන් හෝ මිනීවළවල් හාරන අයගේ කමිසවල උඩ සාක්කු මහන්නේ නෑ. එවැනි සාක්කුවකින් වටිනා දෙයක් වළට වැටෙන්නේ ඔබ නොදැනුවත්වම; තමන්ට යමක්





අහිමි වී ඇති බව ඔබ තේරුම් ගන්නා විටත් ප්‍රමාද වැඩියි. අපරාධකාරයා ඔහුගේ සිගරට් අසුරනය මේ වළට දමා ගියා නම් ඒක අපේ වාසනාවක්; හරියටම කියනවා නම් බෝනස් එකක්. මට හිතෙනවා මේක අපරාධකාරයාගේ කියලා"

"ඔබ කොහොමද එහෙම කියන්නෙ?"

"ඔබට මතකද කුඩාරමේ තිබ් අප පරීක්ෂා කළ කින්සිගේ කබාය? ඒකෙ සාක්කුවල තිබුණේ සිගරට් නෙමෙයි. පයිප්ප දුම්කොළ"

"නමුත් හෝම්ස් ඔබ කොහොමද නිශ්චිත වශයෙන් කියන්නේ මේ කින්සි කියලා?"

"ඒ කාරණය නිශ්චිතව කියන්න මට තවමත් බැරි බව ඇත්තයි." කී මගේ මිත්‍රයා මියගිය පුද්ගලයා හැඳ සිටි ඇඳුම්වල සාක්කු පරීක්ෂා කර බැලීය. එහෙත් ඒවා හිස්ව තිබිණි. "සාක්කුවල කිසිම දෙයක් නෑ. නමුත් මං ඔබ සමඟ ඔිත ඔට්ටුවක් අල්ලන්නම්. මේ නම් ජෙෆ් කින්සි. මෙයා තමයි මං සොයමින් සිටි පුද්ගලයා."

"ඒ කියන්නේ ඔබ මුල ඉඳලම මෙහෙම දෙයක් සැක කළාද?"

"ඇත්තෙන්ම ඔව්. හැරල්ඩ් සිය දිවිනසාගත් බවට සකස් කළ නාටකයක් අපි මුල ඉඳලම දුටුවනේ. අපරාධකාරයාට තමයි එහෙම දෙයක් අපට ඒත්තු ගන්වන්න උවමනා වුණේ. එතැනදි අපි සත්‍යය වටහා ගත්තා. එතකොට මතුපිටින් පෙනෙන දේවල්වලින් සැකය යොමුවුණේ කින්සිට. නමුත් ඒක කොහොමටවත් වෙන්න බෑ. ඒ මොකද මිනීමරුවා කින්සි නම් ඔහු සමඟ එකට කාලය ගත කළ සමීපතම මිත්‍රයා සිය දිවිනසාගත් බවක්, ලෝකයාට පෙන්වන්න කින්සි කැමැති වෙන්නෙ නෑ. අනික් කාරණය තමයි; අප පරීක්ෂා කරද්දි දකින්න ලැබෙන හෝඩුවාවන් තමා දිශාවට යොමු වෙන විදියට, ඔහු කටයුතු සම්පාදනය කරන්නෙ නැහැනේ. ඒ නිසා මිනීමරුවා කින්සි වෙන්න බෑ. එතකොට කෝ කින්සි? ඇයි ඔහු අතුරුදන් වුණේ? ඒක තේරුම් කරන්න පුළුවන් එක් සරල විදියක් තිබෙනවා. ඒ තමයි සිදුවුණු දේවල් දැකලා භයට පත්වුණු කින්සි පැන ගියා. අපරාධකාරයා නොවුණත් මරණ භයට පත්වුණාම මිනිස්සු එහෙම දේවල් කරනවා; පලා ගිහින් හැංගෙනවා.

අනික් අතට සිදුවෙන්න ඉඩ තිබෙනවා කියල, සත්‍යය විය යුතුයි කියල හිතන්න පුළුවන් වෙනස් විදියේ මතයකුත්, කෙනෙකුට ඉදිරිපත් කරන්න පුළුවනි. ඒ තමයි කින්සිත් ඝාතනයට ලක්වුණා කියල සිතීම. පා සටහන් හොඳින් අධ්‍යයනය කිරීමෙන් ඒ

උපකල්පනය තහවුරු වෙනවා. මිනීමරුවා කුඩාරමේ සිට බිඳුණු නිවස දක්වා ලොකු බරක් ඔසවාගෙන ගොස් තිබුණා. එහෙම ගිහින් ඇති බවට අප නිගමනය කළේ අප කළ නිරීක්ෂණ මත. ඒක නිවැරැදි බව ඔප්පු වුණා. ඔහු ඔසවාගෙන ගිහින් තිබුණේ හැරල්ඩ්ව.

ඒ වගේම හොඳ නිරීක්ෂණ අපට ලැබුණා, දෙවැනි පා සලකුණු සමූහයක් සමග. ඒකෙදි ඔහු බරක් ඔසවා ගෙන ගිහින් තිබුණේ අශ්වකරත්තය වෙත. මිනීමරුවා තමන්ගේ කරත්තය වෙත මිනියක් ඔසවාගෙන ගිහින්. ඒ මළසිරුර හැරල්ඩ්ගේ නෙමෙයි. එහෙනම් කාගෙද? පැහැදිලිවම කින්සිගේ විය යුතුයි."

කරුණු මේ අන්දමින් විශ්ලේෂණය කිරීමට මම උනන්දුවෙන් සවන් දුන්නෙමි. මීළඟට මම හෝම්ස්ගේ කථාවට බාධා කළෙමි.

"නමුත් මගේ මිත්‍රයා. මේ බලන්න ඔහුගේ පාවහන්! බලන්න ඔහු පැළඳගෙන ඉන්න පාවහන්වල අඩිය"

මළසිරුරේ පාවහන්වල අඩිය, අප කුඩාරම අවට දුටු B ගේ පාවහන් සලකුණුවලට සෑම අතින්ම සමාන විය.

"මං ඔහුගේ පාවහන්වල අඩිය බැලුවා වොට්සන්" හෝම්ස් කීය. "අපට දකින්න ලැබුණා පා සලකුණු කාණ්ඩ තුනක්, එහෙම නේද? එකක් මුහුදු වෙරළේ සිට කුඩාරම දක්වා. දෙවැන්න කුඩාරමේ සිට බිඳුණු නිවස දක්වා සහ ආපසු කුඩාරම වෙතට. තුන්වැන්න කුඩාරමේ සිට දැන් අප ඇවිද ආ පාරට."

මම හිස සොළවා එයට මගේ එකඟත්වය පළ කළෙමි.

"දැන් බලන්න මළසිරුරේ වම් කකුලේ තිබෙන පාවහනේ ඇණ දෙකක් ගැලවී හැළිලා. දැන් ඔබ ආපසු කුඩාරමට සහ වෙරළට ගිහින් පරීක්ෂා කර බලන්න. මොකක්ද ඔබට දකින්න ලැබෙන්නේ? අප අංක 1 යයි නම් කළ මුහුදු වෙරළේ සිට කුඩාරමට ආ පා සටහනේ, ඇණය හැළුණු පාවහනක සලකුණු තිබෙනවා. නමුත් අංක 2 සහ අංක 3 පා සලකුණු කාණ්ඩ එහෙම නෙමෙයි. ඒ සලකුණුවල තියෙන්නේ ඇණ දෙකක් අඩු නැති පාවහන්. දැන් ඔබට තේරෙනවද?"

"ඔබ ඔහොම දෙයක් මට කලින් කිව්වෙ නැහැනේ" මම කීවෙමි.

"ඇයි වොට්සන් ඔබත් ඒවා බොහොම පරෙස්සමෙන් බැලුව නේ" හෝම්ස් කීය. "ඒකෙන් අප තේරුම් ගත යුත්තේ මොකක්ද? ඔබට පුළුවන්ද ඒක කියන්න?"





"ඔව්. ......... මහත්තුරු දෙදෙනෙක් ඉන්නවා. නමුත් කින්සි කියන්නේ එයින් එක්කෙනයි."

"හරියට හරි. දෙකම එකම කට්ට රටාව ඇති ලෝටස් වර්ගයේ පාවහන්. නමුත් සියයට සීයක්ම සමාන නෑ. ඒකෙන් මොකක් හරි කාරණයක් ඔබ තේරුම් ගත්තද?"

"ඔව්. මේක හරිම අහඹු සිදුවීමක්. නමුත් මේකෙන් අපට අලුත් මිනීමරුවෙකු ගැන හොයන්න වෙනවා"

"ඔව්. එහෙම නම් අපට කරන්න තියෙන්නේ ඒ වැඩේ වහාම පටන් ගන්න එකයි"

මළසිරුර ආරක්ෂා කිරීම මට භාර කොට, හෝම්ස් කුඩාරම තිබූ තැන වෙත පිටත් වී ගියේය. ඒ, මේ ගැන පොලිස් නිලධරයාට දැනුම් දී, උදව්වට පොලිස් භටයෙකු කැඳවා ගැනීමටයි. හෝම්ස් පිටත් වී ගිය ඉක්මනින්ම, කෙනෙකු කඳුගැටය බැස මා සිටි තැනට එන අයුරු දකින්නට ලැබිණි. ඒ කඳවුරු බැඳ සිටි ළමුන් භාර ඔවුන්ගේ විද්‍යා ගුරුතුමා - නැතැනියෙල් ය. දෙවැනි මළසිරුරක් හමුවීම රහසක් ලෙස තබා ගැනීමට හැකි තරම් උත්සාහ දැරිය යුතු බැව් හෝම්ස් මට කියා තිබිණි. එහෙත් බාහිර පුද්ගලයෙකු මෙලෙස පැමිණීමෙන් මා මුහුණ දුන්නේ බලවත් අපහසුතාවයකටය. ඔහු එතැනට ළඟාවීම වැළැක්වීමේ අරමුණෙන්, මම ඔහු පැමිණි ඉදිරියට ගියෙමි.

"ඔබ දෙදෙනා මොනවද මෙතැන කරමින් හිටියේ?" ඔහු විමසීය. "ඔබ මොකක් හරි කටයුත්තක යෙදී හිටි බව මට අර කඳු ගැටය උඩට පෙනුණා. අලුතෙන් මොනවා හරි හම්බවුණාද?"

"මට කනගාටුයි. මේව හෙළිකරන්න මට......"

නැතැනියෙල් සිනාසුණේය. "මොකද ඒවා රාජ්‍ය රහස්ද? ඒවා හාරා අවුස්සන්න මට උවමනාවක් නෑ. මං මෙතැනට ආව නිසා මං කැමතියි දෙව් මැඳුරේ නෂ්ටාවශේෂ ටිකක් බලන්න. ඔබේ විරුද්ධත්වයක් නැද්ද?"

"මෙහෙමයි" මම කීවෙමි. "ඔබේ අකමැත්තක් නැත්නම්......."

මේ මොහොතේ ගොඩබිම දෙසින් මුහුද දෙසට වේගවත් සුළං ධාරාවක් හමා යන්නට පටන් ගත්තේය. නැතැනියෙල් ගේ තොප්පිය සුළඟට අසු වී ගසාගෙන ගියේ මුහුදු වෙරළ දෙසටයි. ඔහු එය ලුහුබැඳ ගියේය. අන්තිමේදී තොප්පිය නැවතුණේ අප

සැරූ නොගැඹුරු වළට අඩි කිහිපයක් නුදුරෙනි. මම ඔහු සිටි තැනට දිව ගියෙමි.

"දෙයි හාමුදුරුවනේ! මේ කවුද?" ඔහුට කෑගැසිණ. "මේ කින්සි නේද?"

මම හති දමමින් ඔහු සිටි තැනට ළඟාවූයෙමි. "නැතැනියෙල් මහත්මයා. ඔබ මේක දුටුව නිසා දැන් කරන්න දෙයක් නෑ. මේ ගැන කාටවත් එක වචනයක් හෝ නොකියන ලෙස මං ඔබෙන් ඉල්ලා හිටිනවා"

"ඒ වුණත් කින්සි? මං හිතුවේ මිනීමරුවා කින්සි කියලයි"

"ඔහු ඒ දේ කළා නම්, ඒකට ඉක්මනින් දඬුවම් ලැබිල තියෙනවා"

"ඔබ දෙදෙනා කොහොමද කින්සිව සොයා ගත්තේ?"

ඔහුගේ එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට තබා, ඊට අවධානයක් යොමු කිරීමටවත් මට නොහැකි විය. ඊට හේතුව වැලි මත සලකුණු වී තිබූ නැතැනියෙල් ගුරුතුමාගේ පාවහන්වල අඩිය දැකීමෙනි. එහි B ගේ පාවහනේ නෙළුම් මලේ සලකුණ පැහැදිලිවම දක්නට ලැබිණි. එපමණක් නොව එහි එක් ඇණයක හෝ අඩුවක් ද නොවීය.

"බිම සලකුණු වෙලා තිබුණු පා සටහන් ඔස්සේ අපි මෙතැනට ආවා" ඔහුගේ ප්‍රශ්නයට මම පිළිතුරු දුන්නෙමි.

මගේ හැසිරීමේ අමුත්තක් නැතැනියෙල්ට වැටහෙන්නට ඇත. ඔහු මා දෙස බලා සිටියේ මවිතයට පත් මුහුණෙනි. මගේ සිතේ ඇති වී තිබූ කැලඹීම ඔහුට නොපෙන්වීමට මම දැඩි උත්සාහයක් දැරීමි. මගෙන් තොරතුරු හෙළි කර ගැනීමට ඔහු අපමණ උත්සාහයක් දැරීය. ඒ ඍජු හා වක්‍ර ප්‍රශ්න මා වෙත එල්ල කිරීම මඟිනි. වැදගත් තොරතුරු කිසිවක් ඔහුට හෙළි නොකරමින්, මම කිසිවක් හරිහැටි නොදන්නා තාලෙට පිළිතුරු දුන්නෙමි. මා ඔහු ගැන සැක කරන බව ඔහුට සඟවාගෙන සිටීම මගේ අරමුණ විය. එහෙත් කෙමෙන් කෙමෙන් එය දුෂ්කර කටයුත්තක් වන බැව් පෙනී ගියේය. කෙසේ වෙතත් හදිසියේම පොලිස් නිලධරයන් රැගත් අශ්ව කරත්තය එතැනට පැමිණියෙන් මම සැනසුම් සුසුමක් හෙළුවෙමි.

"අප වෙනුවෙන් මෙතැනට ආරක්ෂාව සැලසීම ගැන ඔබට ස්තුතියි දොස්තර මහත්මයා. නැතැනියෙල් මහත්මයත් ඇවිත් ඉන්නෙ. ඔබ මළසිරුර හඳුනාගත්තද?"





"මේ කින්සි නේ" නැතැනියෙල් කීය. "මං හිතාගෙන හිටියේ......."

"මේ වගේ සිදුවීමකදී හරි කාරණාව හමුවෙන්න කලින් අපි වැරදි හෝඩුවාවන් ගණනාවක් පස්සේ ගිහින් වැරැදි තීරණ කීපයක්ම ගන්නවා" පොලිස් පරීක්ෂක බෙන්සන් කීය. "දැන් මේ වැඩ කටයුතු අපට කරගන්න ඉඩ හැරලා ඔබ මෙතැනින් ඉවත් වී යනවා නම් මම ඔබට ස්තුතිවන්ත වෙනවා. වොට්සන් දොස්තර මහත්මයා. හෝම්ස් මහත්මයා කිව්වා ඔබට ඉක්මනින් රෙඩ් ලයන් තානායමට එන්න කියලා"

මගේ සොයා ගැනීම ගැන පොලිස් පරීක්ෂකවරයාට දැනුම් දිය යුතුද නැද්ද යන තීරණය ගැනීමට නොහැකිව, මම දෙගිඩියාවකින් පසු වූයෙමි. කෙසේ වෙතත් මෙම අපූරු සොයා ගැනීම හෝම්ස් වෙනුවෙන් තවදුරටත් රැකගැනීමට අන්තිමේදී මම තීරණය කළෙමි.

"ඔබ එනවද ආපසු කුඩාරමට යන්න?" මම ගුරුතුමාගෙන් විමසුවෙමි

"නැහැ" ඔහු කීවේ හිස සොලවමිනි. "මං යනවා මුහුදු වෙරළ දිගේ ඈතට"

ඔහුට මෙසේ යාමට ඉඩ හැරීම ගැන, හෝම්ස් මට දෝෂාරෝපණය කිරීමට ඉඩ ඇති බැව් මට සිහි විය. ඔහුට යාමට ඉඩ හැර මම වේගවත් ගමනින් තානායම වෙත ගියෙමි.

එහිදී මට දකින්නට ලැබුණේ තානායමේ විසිත්ත කාමරය තුළ හෝම්ස් සහ බොනී ආම්ටේජ් කතාබහක යෙදී සිටි ආකාරයයි. මට හෝම්ස් සමග පෞද්ගලිකව වචන කිහිපයක් කථා කිරීමට අවශ්‍ය බව පවසා, ඔහුගෙන් ඊට අවසර ඉල්ලා සිටියෙමි. ඔහු වහාම මා සමග ඉවතට පැමිණියේය.

නැතැනියෙල් ගැන මා කළ නිරීක්ෂණය මම මගේ මිත්‍රයාට පැවසුවෙමි. ඔහු කොයි මොහොතේ හෝ මේ ප්‍රදේශයෙන් පැන යාමට ඉඩ ඇති බව ද මම හෝම්ස්ට දැනුම් දුන්නෙමි. එහෙත් මා කළ සොයාගැනීම ඔහුට අලුත් දෙයක් නොවූ බව තේරුම් ගෙන මම විමතියට පත්වූයෙමි.

"ඔව් වොට්සන්. ඔහුත් එක්ක අර බිඳුණු නිවස ළඟ ඉඳගෙන කතාබහ කරද්දී මං නැතැනියෙල්ගේ පාවහන් වල අඩිය දුටුවා.

කොහොම වුණත් ඔහු මේ පළාතෙන් පැන යාවි කියා මං හිතන්නේ නෑ" හෝම්ස් සිනාවක් පෑවේය.

"අනික් මළසිරුරත් හමුවී ඇති බව ඔහු දැන් දන්නවා. දැන් ඉතින් මොනවා කරාවිද කියන්න බෑ" මම කීවෙමි.

"අපි ඒ අවදානම භාරගමු මිත්‍රයා" කී හෝම්ස් වහාම ආපසු ගියේ විසිත්ත කාමරය වෙතය. මා මුහුණ දුන්නේ ලොකු බලාපොරොත්තු කඩවීමකටයි. අධික ලෙස විඩාවට පත්වීම නිසාදෝ මගේ මිත්‍රයාගේ ක්‍රියාශීලිත්වය වෙනදාට වඩා දුර්වල තත්ත්වයකට පත්ව ඇතැයි මට සිතිණ. කළ යුතු දෙයක් සිතා ගැනීමට නොහැකිව මම ඔහු පසුපස විසිත්ත කාමරයට ගියෙමි. ආම්ටේජ් තවමත් එහි අසුන්ගෙන සිටියේය.

"මං මේ ආම්ටේජ් මහත්තයාගෙන් විමසමින් හිටියේ ජෙෆ් කින්සි ගැන තොරතුරු" හෝම්ස් කීය. "අපි බලාපොරොත්තු වෙන්නේ ඔහු ගැන හරි ඔත්තුවක් දෙන කෙනෙකුට මුදලින් ත්‍යාගයක් පිරි නමන්නයි"

කාරණා සියල්ල මට එක්වරම වැටහිණ. කින්සිගේ මළසිරුර හමුවීම ගැන ඉඟියක්වත්, ආම්ටේජ්ට නොපැවසිය යුතු බැව් මම තේරුම් ගතිමි.

"ඉතින් ආම්ටේජ් මහත්මයා" හෝම්ස් කීය. "ඔබ කියන්නේ කින්සි හා හැරල්ඩ් ගිය සති අන්තයේ බොහොම දරුණු විදියට සණ්ඩු සරුවල් වුණු බවයි. කොහොම වුණත් ඔබ පිටත්වෙලා යන්න කලින් ඔවුන් සාමදාන කරන්න ඔබට හැකිවුණා. එහෙම නේද?"

"ඔව්"

"ඔබ මෙහෙන් පිටවෙලා ගියාට පස්සේ, ඒ දෙදෙනාගෙන් එක් කෙනෙකු සමගවත් දුරකතන කතාබහක් කරන්න ඔබට ඉඩක් ලැබුණේ නැද්ද?"

"නැහැ"

"මේක අහන්න ආම්ටේජ් මහත්මයා. කින්සි කර තිබෙන වංචාව ගැන ඔබ තොරතුරු සොයා ගත්ත නේ. මේ දෙන්නගෙන් කාට හරි ඒ බව ආරංචි වෙන්න ඇති කියලා ඔබට හිතෙන්නෙ නැද්ද?"

"ඒක කොහොමටවත් වෙන්න විදියක් නෑ. ඒ මොකද මේ දේවල් මට සොයා ගැනීමට හැකිවුණේ අද උදේ නේ"

"නමුත් හැරල්ඩ් මේ කාරණා කලින් ඉඳලම දැනගෙන හිටියා වෙන්නත් පුළුවනි. එහෙම නේද?"





"වෙන්න පුළුවනි. නමුත් ඒ කොහොමද කියල මට හිතාගන්න බෑ"

"එතකොට මේ සිද්ධවුණු දේ ඔබ තේරුම් කරන්නෙ කොහොමද?"

"ඒක තේරුම් කරන්න මට පුළුවන් කමක් නෑ. මගේ කැමැත්තකුත් නෑ. හමුවෙලා තියෙන තොරතුරුවලින් හැම දෙයක්ම පැහැදිලි වෙනවා නෙ"

මේ මොහොතේ හෝම්ස්ගේ කටහඬේ මෙන්ම කථා ලීලාවේද වෙනසක් ඇති වූ බැව් මම තේරුම් ගතිමි.

"ආම්ටේජ් මහත්මයා. ඔබේ සමාගමේ නම ඇංග්ලෝ ඇමරිකන් කොන්සොලිඩේටඩ්ද?"

ආම්ටේජ් එක්වරම තිගැස්සුණේය. ඔහුගේ මුහුණ ක්ෂණිකව සුදුමැලි වූ බැව් මම නිරීක්ෂණය කළෙමි. හෝම්ස් ඇසූ ප්‍රශ්නයට දිය යුතු පිළිතුරක් සිතාගැනීමට නොහැකිව, ඔහු අන්ද මන්ද වූ බැව් මම වටහා ගතිමි.

"........ මට........ මට හිතාගන්න බෑ, ඒ කාරණාව මේ ප්‍රශ්නයට........ සම්බන්ධ වෙන්නෙ කොහොමද කියලා" ඔහු අමාරුවෙන් කියා ගත්තේය.

"මං ඒක ඇහුවේ නිකමට" හෝම්ස් කීවේ සැහැල්ලුවෙන් සිනාසෙමිනි. "ඒ මොකද බදාදා ටයිම්ස් පුවත්පතේ ආර්ථික පුවත් අතිරේකයෙන්, ඔබ වැදගත් තොරතුරක් කපාගෙන ඇති බව මං දුටුවා"

"මොන යක්ෂ කතාවක්ද ඒ?"

"ඔබ එහෙම කළාද නැද්ද?"

"කොහොමටවත් නෑ" ආම්ටේජ් කීවේ කෝපයෙන් ගුගුරමිනි.

"මං එහෙම කීමට හේතුව මේකයි ආම්ටේජ් මහත්මයා" හෝම්ස් කීවේ සන්සුන් ස්වරයෙනි.

මීළඟට ඔහු තම කබා සාක්කුවෙන්, අපට කින්සිගේ මිනිවළෙන් හමුවූ සිගරට් අසුරනය අතට ගත්තේය. "මේ සිගරට් අසුරනය ඔබේ නේද? මං කියූ අර පුවත්පත් කැබැල්ල අපට හමුවුණේ මේක ඇතුළෙ තිබ්බ"

මෙසේ කී හෝම්ස් රත්රන් සිගරට් අසුරනය මේසය උඩ තබා ආම්ටේජ් වෙතට තල්ලු කළේය.

ආම්ටේජ් දෙනෙත් විශාල කරගෙන ඒ දෙස බලා සිටියේ විෂ සහිත පොළඟෙකු මේසය මත සිටියා නම් ඒ දෙස බලන ආකාරයෙනි.

"ඔව්. ඒක මගේ තමයි" ඔහු ගොත ගසමින් කීවේ ඇඩි උත්සාහයක් දරමිනි. "අඟහරුවාදා මෙහේ ඉඳල යද්දී මට මේක කොහේ හරි අමතක වෙලා ගිහින්"

"එහෙම වෙන්න හැටියක් නෑ ආම්ටේජ් මහත්මයා. මේ තානායම් හිමිකරු දුටුවලු, ඔබ අශ්ව කරත්තයට නගින්න කලින්, මේක විවෘත කරලා මේකෙන් සිගරට්ටුවක් අරගෙන දල්වා ගන්නවා. ඊළඟට ඔබ මේක ආපහු ඔබේ සාක්කුවට දමාගත්තු හැටි දුටු බව, ඔහුට හොඳටම විශ්වාසයි"

"ඒක එයාට වුණු වැරැද්දීමක්. මේක මට අමතක වෙලා යන්න ඇත්තේ කුඩාරමේ. නැත්නම් මේක එතැනින් හමුවෙන්න විදියක් නැහැනේ"

"ආම්ටේජ් මහත්මයා. ඕක හමුවුණේ කුඩාරමේ තිබිල නෙමෙයි. ඔබ දන්නව නේද එකල්ස් කිට්ටුව මුහුද අද්දර තිබෙන නටබුන් වුණු දෙව් මැඳුර? සිගරට් අසුරනය හම්බවුණේ ඒ කිට්ටුව වැල්ලේ තිබිලා. එතකොට වත් ඔබේ මතකය අලුත් වෙනවද?"

මෙවර නම් ආම්ටේජ් අප්‍රමාණ තිගැස්සීමකටත්, මොළය අවුල් වූ තත්ත්වයකටත් පත් වූ බැව් පැහැදිලිව පෙනිණි. වෙවුළන්නට පටන්ගත් ඔහුගේ අතෙන් ගිලිහුණු සිගරට් අසුරනය, හඬක් නංවමින් පොළොව මතට ඇද වැටිණි.

"මොකක්?" ඔහු කීය. "ආ......... ආ අඟහරුවාදා මං ඒ පැත්තෙ ඇවිදින්න ගියා නේ. ඒ වෙලාවෙ මගේ සාක්කුවෙන් වැටෙන්න ඇති"

"අඟහරුවාදා වැටෙන්න ඇති කියලද ඔබ කිව්වේ?" හෝම්ස් ඇසීය. "ඒ වුණත් කොහොමද මහත්මයා බදාදා පත්තරේ කැල්ලක් ඒක ඇතුළෙ තිබුණෙ?"

"කාට හරි මේ සිගරට් අසුරනය හම්බ වෙන්න ඇති. ඒ මිනිහා පත්තර කැල්ලකුත් කපලා ඒකට දමලා මේක බිම දමන්න ඇති"

"මහත්මයා මේක කුඩා දියමන්තියකුත් සවිකළ රත්රනින් තැනූ ඉතාම වටිනා එකක්." හෝම්ස් කීය. "මේක වැල්ලෙ තිබිලා කාට හරි හමුවුණා නම්, ඒකට පත්තර කැල්ලකුත් කපා දමල වළ දමාවි කියල මම නම් හිතන්නෙ නෑ. එක්කෝ ඔහු ඒක සාක්කුවේ දමාගෙන යාවි; නැත්නම් පොලීසියට භාරදේවි. කොහොම වුණත්.......





මේක තිබුණේ වැලි පොළොව මතු පිට නෙමෙයි මහත්මයා.

මේක තිබුණෙ වැල්ලෙ වළ දමලා"

"මට කියන්න තියෙන්නෙ මෙච්චරයි. පහුගිය අඟහරුවාදා ඉඳල මේක මා ළඟ තිබුණෙ නෑ"

හෝම්ස් මාතෘකාව වෙනස් කළේය.

"ඔබ කියන්නේ අඟහරුවාදා ඔබ ආපහු ලන්ඩනය බලා ගියා කියල නේ?"

"ඔව්."

"නමුත් ඔබ ක්‍රොස්ෆීල්ඩ් සමාගමෙන් කුලියට ගන්නා අශ්ව කරත්තය බදාදාත් කුලියට ගත්තු බව මං කිව්වොත්?"

"එදා ඒක වෙන කවුරු හරි කුලියට ගන්න ඇති"

"නමුත් ඒ කරත්තය මං කියූ අර නටබුන් වූ දෙව් මැඳුර අසල, ඔය සිගරට් අසුරනය හමුවුණු තැන නවත්වා තිබෙනවා දුටු අය ඉන්නවා කිව්වොත්?"

"මේ අහන්න" ආම්ටේජ් කීවේ හිඳ සිටි අසුනෙන් නැගිටිමිනි. "මෙතැන කාරණා වැරදි විදියට වටහා ගැනීමක් සිදුවී ඇති බවයි මට පෙනෙන්න. ඔය කතා කළා ඇති. මට කියන්න තියෙන්නේ අඟහරුවාදායින් පස්සෙ මේ පළාතක මං ආවෙ නැහැ කියලයි. මං මෙහෙන් යද්දි හැරල්ඩ් සහ කින්සි දෙන්නා හොඳ සනීපයෙන් ජීවතුන් අතර සිටියා!"

"හැබෑට? එතකොට කින්සි මහත්මයා දැන් ජීවතුන් අතර නැහැ කියලා ඔබට හිතෙනවද? ඇයි එහෙම හිතුණෙ?"

තමාගේ කට වැරදුණු බව ආම්ටේජ්ට වහා වැටහිණි. මෙතැනින් ඉක්මනින් පැන ගැනීමට ඔහු තීරණය කරන්නට ඇත. එක් ක්ෂණයකින් වසා තිබූ දොර දෙසට ගමන් කළ ඔහු දොර විවෘත කළේය. ඔහු ඉදිරි පියවර තැබුවේ දෑත් විදහා ගෙන සිටි නෝෆෝක් පොලීසියේ පරීක්ෂක බෙන්සන්ගේ දෑතටයි.

"බොනී ආම්ටේජ් මහත්මයා" බෙන්සන් කීය. "ක්‍රිස්ටෝෆර් හැරල්ඩ් සහ ජෙෆ් කින්සි දෙදෙනා ඝාතනය කිරීම ගැන මං ඔබ අත්අඩංගුවට ගන්නවා......."

ආම්ටේජ් අත්අඩංගුවට ගැනුණ ද හෝම්ස්ගේ රාජකාරි එතැනින් අවසන් නොවීය. ආම්ටේජ් තමාගේ ව්‍යාපාර සහකරුවන් දෙදෙනා ඝාතනය කළ ද එය උසාවියේදී ඔප්පු කිරීම දුෂ්කර කටයුත්තක්

වන බැව් පෙනිණ. ඔහු පදිංචිව සිටි පාක් රෙසිඩන්සස් නිවාසවල ඔහුගේ නිවසේ තිබී වැදගත් සාක්ෂියක් සොයා ගැනීමට හෝම්ස්ට හැකි විය. එනම් ආම්ටේජ්ගේ සිගරට් අලුරනයේ තිබී හමු වූ පුවත්පත් කැබැල්ල ඉරාගත් මුල් පුවත්පතය.

වංචනික චෙක්පත්වලට මුදල් ගෙවූ බැංකුවේ ඉහළ නිලධරයන් හමුවීමට ද හෝම්ස්ට හැකිවිය. ඒවායේ තිබූ අත්සන් තවදුරටත් පරීක්ෂා කිරීම සඳහා විශේෂඥයින් වෙත ඉදිරිපත් කරන ලදී. ඔවුන්ගේ මතය වූයේ මේ චෙක්පත්වල වංචනික ලෙස යොදා තිබුණේ ජේෆ් කින්සිගේ අත්සන බවය. එය යෙදීමට ආම්ටේජ් පුහුණු වූ කඩදාසි කිහිපයක් ඔහුගේ කාර්යාලයේ ඔහුගේ මේසය යට තිබී හෝම්ස්ට හමුවිණි. ඒවා සුළං පහරකින් මේසය යටට ගසාගෙන ගිය නිසා එය විනාශ කර දැමීම ආම්ටේජ්ට අතපසු වී ඇත.

මීට අමතරව කින්සි පැළඳ සිටි වර්ගයේම, එම අඩියම සහිත 'ලෝටස්' පාවහන් යුගළක් ආම්ටේජ්ගේ පාක් රෙසිඩන්සස් නිවසේ තිබී හෝම්ස්ට හමුවිය. මේවා කින්සිගේ පාවහන් වලට වඩා ප්‍රමාණයෙන් අඟල් 1 1/2 ක් කුඩා ඒවා විය. ඒවායේ අඩි ඒ වන විටත් නෝෆෝක් මුහුදු වෙරළේ වැලි වලින් වැසී තිබූ අතර ඇණ සියල්ල කිසිදු අඩුවක් නොමැතිව සම්පූර්ණයෙන්ම තිබිණි.

"වොට්සන් ඔබ දන්නවාද මේ පුද්ගලයා සැබැවින්ම කවුද කියලා?" මගේ මිත්‍රයා දිනක් විමසුවේ බේකර් වීදියේ අපේ නිවහනේදීය.

"මං දන්නෙ නෑ. ඔහු ප්‍රසිද්ධ අපරාධකාරයෙක්ද?" මම ඇසීමි.

"ඔහුගේ සැබෑ නම හෙන්රි ස්ටෝන්ටන්. ඔහු ගැන අපට මුලින්ම අහන්න ලැබෙන්නෙ 1876 දී. ඩැලී තොම්සන් නම් ව්‍යාජ නමකින් ඔහු 1876 දී පෙක්හැම් ප්‍රදේශයේ නිවසක් කුලියට අරගෙන පදිංචියට ගිහින් තිබුණා. ගෙවල්වල පවත්වන සංගීත සන්ධ්‍යාවන් සංවිධානය කරන්නෙකු හැටියට ඔහු ප්‍රසිද්ධියට පත්වුණාලු. ඒ කටයුතු වලදී ඔහු වයලීන වාදනයත් කරල තිබුණා.

කොහොම වුණත් මේ "තොම්සන්" මහත්මයා රාත්‍රී කාලයට වයලීන පෙට්ටියත් අතින් අරගෙන නිවසෙන් බැහැර ගියාලු. ඒක පිරෙන්න තිබිල තියෙන්නේ ගෙවල් බිඳීමට අවශ්‍ය වෙන හොර යතුරු, නියන් ආදී උපකරණ.






The Banner Cross murderer, who disappeared in 1876, had taken up residence in Peckham as "Mr Thompson", organizer of domestic musical evenings where he played hymns on his violin.

At night Mr Thompson went abroad with his violin case full of housebreaking tools, and carried out audacious burglaries.

Two policemen spotted his flashlight in the darkened rooms of a Blackheath house at 2.00 am this October. They were joined by a sergeant, and kept watch, Thompson emerged. PC Edward Robinson challenged him, and was shocked when the thief fired two pistol shots at him. Nevertheless, the constable grappled with him, receiving injuries in his arm and head from three further shots.

**He has been sought by Sheffield police since November 1876, when he murdered Arthur Dyson.**

ෂර්ලොක් හෝම්ස්ගේ "ස්ක්‍රැප්" පොතෙන් උපුටා ගන්නා ලදී.

බ්ලැක්හීත්හි වසා තිබූ නිවසක් තුළ ලන්තෑරුම් එළියක් සැරිසැරූ හැටි රෑ දෙකට මුර සංචාරයක ගිය පොලිස් භටයන් කිහිප දෙනෙකුට දකින්න ලැබිල තියෙනවා. අපරාධකාරයා නිවසින් පිටවෙන තුරු පොලීසිය හැංගිලා බලාගෙන හිටියලු. ඔහු පිටවෙද්දී අල්ලාගන්න යෙදුණු සටනෙදි ඔහු පොලිස් භටයන්ට වෙඩි තැබුවලු. ඒකෙන් කොස්තාපල් එඩ්වඩ් රොබින්සන් ජීවිතක්ෂයට පත්වුණා. තවත් පොලිස් භටයන් දෙදෙනෙකුට බරපතළ තුවාල සිදුකොට ස්ටෝන්ටන් පලා ගියා.

මේ ඝාතනය ගැන ඇසින් දුටු සාක්ෂි තිබුණත් ස්ටෝන්ටන් අල්ලා ගැනීමට පොලීසියට හැකිවුණේ නෑ.

ඊළඟට හෙන්රි ස්ටෝන්ටන් ගැන අහන්න ලැබෙන්නෙ 1887 දී. මේඩින් පටුමගේ ඇඩෙල්ෆි රංග ශාලාවේ සිදුවුණු ඝාතනය ඔබටත් මතක ඇති වොට්සන් - අර කඩවසම් නළුවෙකු වුණු විලියම් ටෙරිස් ඝාතනය වුණේ? ඔහු සැන්දෑවේ දර්ශනය සඳහා රඟහලට ඇතුළුවීමට සූදානම් වෙද්දී, අපරාධකාරයා පාර හරහා දුව ගිහින් නළුවාට පිහියකින් ඇණ තිබුණේ. ඔහු රෝහලකට ඇතුළත් කිරීමටත් පෙර මිය ගියා. ස්ටෝන්ටන් කාලයක් වයලීන වාදකයකු ලෙස රංග ශාලාවන්හි වාදක මණ්ඩලවල සේවය කර තිබුණා. විලියම් ටෙරිස් සහ ස්ටෝන්ටන් අතර ඒ කාලයේ මිත්‍රත්වයක් තිබුණාලු. අපරාධකාරයා ටෙරිස්ගෙන් විශාල මුදලක් ණයට අරගෙන තිබිල තියෙනවා. ඒක ආපසු නොගෙවීම නිසා මෑත කාලයේ දෙදෙනා අතර සණ්ඩුවක් ඇතිවුණාලු. ඒකෙ ප්‍රතිඵලයක් හැටියට තමයි ස්ටෝන්ටන් නළුවාට පිහියෙන් ඇන්නේ. එහෙම කරලා ඔහු වහාම එතනින් පලාගියා. මෙම අපරාධකාරයා කබායේ ලේ සහිතව පටිනිහි තැබෑරුමකට ගිහින් තිබුණා. ස්ටෝන්ටන්ගේ ඡායාරූප තැබෑරුමේ සේවකයන්ට පෙන්නුවාම අපරාධකරු මොහු බව ඔවුන් හඳුනාගෙන තිබුණා.

ඊට පස්සේ මේ දක්වාම ඔහු අතුරුදන් වෙලයි හිටියේ. හෙන්රි ස්ටෝන්ටන් කියන නම බොනී ආම්ටේජ් කියල වෙනස් කරගෙන ඔහු සමාගමකුත් පවත්වාගෙන ගිහින්. ස්කොට්ලන්ඩ්යාඩ්හි අපරාධකරුවන්ගේ ඡායාරූප එකතුවේ ස්ටෝන්ටන්ගේ ඡායාරූප මං දැකල තිබුණා. ඒත් ඔහු දුටු මුල් අවස්ථාවේවත් මට බැරිවුණා ඔහුව හඳුනාගන්න"






A TERRIBLE SCENE occurred at the entry to London's Adelphi Theatre in Maiden Lane, used by actor-manager William Terris as his personal stage door. As the handsome hero of melodrama walked briskly up for the evening performance on December 16, a gaunt figure raced across the road from under the awning of Rule's Restaurant; a knife flashed; and Mr Terris lay bleeding on the step.

Fellow-actors helped him to a sofa in the green-room, but he had not long to live. As the tragic news was telegraphed from theatre to theatre, all the stages of the West End observed a brief silence in his memory.

ෂර්ලොක් හෝම්ස්ගේ "ස්ක්‍රැප්" පොතෙන් උපුටා ගන්නා ලදී.

"මෙකෙදි මට තේරුම් ගන්න බැරි එක් තැනක් තියෙනවා හෝම්ස්" මම කීවෙමි. "අර බාගෙට පුලුස්සා දැමූ චෙක්පොත් වගයක් කින්සිලගෙ කුඩාරමේ තිබිල හමුවුණේ කොහොමද?"

"ඒ ගැන විස්තර ඔබට කියන්න මට බැරිවුණා" හෝම්ස් කීය. "කින්සිගේ අයිසිතිවාසිකම් වෙනුවෙන් උසාවියේ පෙනී සිටි නීතිඥයා කින්සිගේ පෞද්ගලික මිත්‍රයෙක්. නිවාඩුව ගත කරන්න පිටත්වෙලා යන්න කලින්, කින්සි ඔහුගේ නීතිඥයාට ප්‍රකාශයක් කරල තියෙනවා. ව්‍යාපාරයේ මුදල් සම්බන්ධ කටයුතුවල සැක සහිත බවක් දකින්න ලැබිලා. කින්සි ඒ ගැන ආම්ටේජ් ගෙන් ප්‍රශ්න කරලා තියෙනවා. ඔහුගෙන් ඒකට සතුටුදායක පිළිතුරක් ලැබිල නෑ. ක්‍රිස් හැරල්ඩ් සමගත් මේ ගැන වැඩිදුර සාකච්ඡා කර බලන අරමුණෙන්, ඔහු අදාළ ලියකියවිලි වගයක් සහ චෙක්පොත් කිහිපයක් අරගෙන යන බව කිව්වලු. චෙක්පොත්වල කවුන්ටර් ෆොයිලයේ අංකය පමණක් ඉතිරි වෙන විදියට, අනික් හරිය පුලුස්සා දමන්න ඇත්තෙ ආම්ටේජ්. ඒ කින්සි ගැන සැකය වඩාත් තීව්‍ර කරන්න; ඒ වගේම තමන්ගේ කතන්දරය වඩාත් ශක්තිමත් කරන්න. තවත් ඔබට නොපැහැදිලි තැන් තියෙනවද වොට්සන්?"

"නැහැ. කොහොම වුණත් ස්ටෝන්ටන් ලෙස මිනී දෙකක් මරල හිටි අපරාධකාරයාට, තවත් ඝාතන දෙකක් කරන්න හැකිවුණේ පොලීසියට ඔහුව අල්ලාගන්න බැරිවුණු නිසා. මෙදා සැරේ නම් ඔහුට එල්ලුම් ගහෙන් බේරෙන්න හැකිවේවි කියල මං හිතන්නෙ නෑ"

දීර්ඝ නඩු විභාගයකින් පසු හෙන්රි ස්ටෝන්ටන් හෙවත් බොනී ආම්ටේජ් පෝරකයට නියම විය.



## මුතුමාලය

"දැන් ඉතින් ඒ කතාවත් ඔබේ පාඨකයන් වෙත ඉදිරිපත් කිරීමේ වැරැද්දක් නෑ" මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා කීවේ එක් දිනක උදයේ පුවත්පත් කියවමින් සිටියදීය.

"ඒ මොන කතාවද හෝම්ස්?" මම ඇසීමි.

"අර රෙබෙකා ගිබ්සන් මෙනෙවියගේ මුතුමාලයේ කතාව...... මං හිතන්නේ මං ඒ කතන්දරය ඔබට කියල තියෙනවා."

"මගේ මතකය නිවැරදි නම්" මම කීවෙමි. "මුතු මාලයක කතාවක් ඔබ මට කවදාවත් කියල නෑ. ඔය කියන්නේ රෙබෙකා ගිබ්සන් කියන නිළිය ගැනද?"

"අන්න හරි. ඇය මියගිහින්"

"මියගිහින්? ඒ කොහොමද?"

"ඉතාලියේ කෝට්නා ඩී අම්පෙසෝ හි හිම ක්‍රීඩා කරමින් සිටියදී ඇය මුහුණ දුන් අනතුරකින්. ඇය බොහොම කාලයකට පෙර මගේ අනුග්‍රාහිකාවක්. ඒ ඔබ මට හමුවෙන්න කලින්, මං මොන්ටේගු විදියේ නවාතැන් ගෙන සිටි මුල් කාලෙ. මුතුමාලයේ පරීක්ෂණය මගේ මුල්ම පරීක්ෂණ හතර පහෙන් එකක්......" හෝම්ස් කීවේ තම අතේ තිබූ පුවත්පත බිමට දමා මේසය උඩ තිබූ ඔහුගේ පයිප්පය අතට ගනිමිනි. බ්රයර් පයිප්පයේ කෝවට ඔහු පිරවූයේ බ්රැඩ්ලිගේ දුම්කොළ බැව් එහි සුගන්ධයෙන් මම වටහා ගතිමි.

"ඒ කාලෙ මට එච්චර ප්‍රසිද්ධියක් තිබුණෙ නෑ" හෝම්ස් කීය. "පරීක්ෂණයක් ලැබෙන තුරු මං මග බලාගෙන හිටි කාලෙ. රෙබෙකා ගිබ්සන් මෙනෙවිය තමයි ඒ කාලෙ වේදිකා නාට්‍යවල අංක එකට හිටි නිළිය. ඇගේ මුතු මාලය ගැන කතාව රටේ මහත් ආන්දෝලනයක් ඇති කළ සිදුවීමක්"

"හෝම්ස්" මා කීවේ ඔහුගේ කථාවට සවන් යොමු කිරීමෙ සූදානමෙනි. "ඔය සිදුවීම ගැන ඔබ කවදාවත් කිසිම දෙයක් මට කියල නෑ. ඒ හින්දා ඔබ මුල ඉඳලම ඒක පටන්ගත්තොත් ඉතාම හොඳයි"

තම පයිප්පය දල්වා ගැනීමට මොහොතක් පමා වූ හෝම්ස් කථාව ඇරඹුවේ මුවෙන් දුම් වළලු කිහිපයක් පිටකළ පසුවය.

"ඒ රීජන්ට් රංග ශාලාව විවෘත කළ අලුත" ඔහු කීය. "රඟපෑමට ඇයට තිබුණු දක්ෂකමත්, දුටුවන් වශීකරන ඇගේ පෙනුමත් නිසා ඒ කාලයේ ප්‍රසිද්ධ නිළියන් අතර ගිබ්සන් මෙනෙවිය හිටියේ අංක එකට කිව්වොත් නිවැරදියි. ඇය ඉහළට නැඟුණේ ශේක්ස්පියර්ගේ නාට්‍ය, නව නිෂ්පාදන ලෙස ඉදිරිපත් වුණු යුගයේ. "මර්චන්ට් ඔෆ් වෙනිස්" හි ඇය පෝෂියා ලෙස කළ රඟපෑමත්, මැක්බත් නාටකයේ මැක්බත් ආර්යාව ලෙස කළ රඟපෑමත්, රෝමියෝ ජුලියට් හි ජුලියට් ගේ චරිතයත් විචාරකයන්ගේ ප්‍රශංසාවට ලක්වුණු හැටි මට මතකයි.

රඟපෑම ගැන මේ අන්දමින් ප්‍රසිද්ධියට පත්වුණු රෙබෙකා ගිබ්සන් වෙනත් අංශයකිනුත් ප්‍රසිද්ධියක් ලැබුවා. ඒ තමයි ඉතාම අලංකාර වගේම ඉතාම වටිනා ආභරණ පැළඳීම ගැන, ඇය ලබා තිබුණු ප්‍රසිද්ධිය. ඇය පැළඳූ දියමන්ති මාල, රතුකැට මාල සහ මුතුමාල ගැන පුවත්පත්වල පිටු ගණන් විස්තර පළ වුණා. මම මේ කියන්න යන සිද්ධියට අදාළ වුණේ ඇය සතුව තිබූ එක් මුතුමාලයක්.

යෙදෙන්න රහස් පරීක්ෂණයක් නොමැතිව මං කම්මැලි කමෙන් කාලය ගත කළ දවසක සවස ඇය මා හමුවෙන්න ආවා. මොන්ටේගු වීදියේ මගේ නවාතැනට ඇය ආවේ ඇගේ පෙම්වතා වූ ඇන්ඩෲ බොයිඩ් තරුණයා සමග.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මට ඔබ ගැන කිව්වේ ශේක්ස්පියර් නාට්‍ය කණ්ඩායමේ අධ්‍යක්ෂකවරයකු වන විලියම් ටර්නර් මහත්මයා" ඇය කිව්වා.

"ටර්නර් මහත්මයා මගේ හිතවතෙක්" මං කිව්වා. "ඊයෙ පෙරේදා ඔබට ඇතිවී තිබෙන ප්‍රශ්නය ගැන මං පුවත්පත්වල දුටුවා. ඔබ මගෙන් බලාපොරොත්තු වෙන්නේ......."

"ඔව් මහත්මයා. මං පැමිණියේ ඒ කාරණය ගැන තමයි. මං ඔබට හැම දෙයක්ම මුල ඉඳලම කියන්නම්. මේ ප්‍රශ්නය ගැන එතකොට ඔබට පැහැදිලි වැටහීමක් ලැබේවි.

මගේ අම්මා රොස් පෙළපතේ කෙනෙක්. කාලයක් ඉන්දියානු යුද සේවයේ නිරත වුණු මේජර් ජෙනරාල් රොනල්ඩ් රොස්





තමයි මගේ අම්මාගේ එකම සොහොයුරා. ඔහු විවාහ වුණේ ඉන්දියානු කාන්තාවක සමග. ඔවුනට දරුවන් හිටියේ නැහැ. ඔවුන් එංගලන්තයේ පදිංචියට ආවේ ඉන්දියානු හමුදා සේවයෙන් විශ්‍රාම ලබලා. එතකොට ඔවුන් කළ පළමුවැනි දේ තමයි ඔවුන් සතුව තිබූ වටිනා ආභරණ මුතුමැණික් ඥාතීනට බෙදා දීම. මේ මුතුමාලය රොනල්ඩ් මාමාගෙන් මට තෑගි ලැබුණේ ඒ විදියට. එහි තිබූ මුතුවල වටිනාකම පවුම් හතළිස් දහසත් පනස් දහසත් අතර කියලයි එකල තක්සේරු කර තිබුණේ. එහෙම කිව්වේ මගේ මුතුමාලය හොඳින් පරීක්ෂා කර බැලූ ඇමරිකානු හා යුරෝපීය ආභරණ විශේෂඥයින්.

ඉම්පීරියල් සහ සැවෝයි නෘත්‍ය ශාලාවල එකල රඟ දැක්වුණු, නාට්‍යවල රඟපාද්දී, මං ඔය පරණ මුතුමාලය ඒ විදියටම පැළඳුවා. රීජන්ට් නෘත්‍ය ශාලාවෙත් නාට්‍ය දෙකකට ඒ මාලය එලෙසම පැළඳුවා. එතකොට තමයි මගේ පෙම්වතා වන මේ ඇන්ඩෲ බොයිඩ් මහත්මයා මට යෝජනාවක් කළේ. මාලෙට අඩංගු මුතු ඇට ගණන හතළිහයි. එය තිබුණේ එක වැලකට මුතුඇට පහ බැගින් වූ පොටවල් අටකට. ඒවා දෙපැත්තෙන් එකට සවිකර තිබුණේ රත්රන් ගාංචු මගින්. බොයිඩ් මහත්මයා යෝජනා කළේ එකකට මුතු ඇට අටක් අඩංගු වන මුතු පොටවල් පහක් සිටින සේ සකස් කරමු කියලා. ඒකට ඔහු ඉතාලි ආභරණ සැලසුම්කරුවෙකු වන ගියෝවානි මහත්මයාගේ සැලැස්මකුත් ලබා ගත්තා. ඒ අනුව මුතුවැල් එකට සම්බන්ධ කෙරෙන්නේ මැදින් තිබෙන කුඩා දියමන්ති ඇමුණුම් කටුවක් මගින්. ඒ මගින් ඇතිවෙන අලංකාර පෙනුම නිසා මං ඒකට එක්වරම කැමැති වුණා. අපි මේ කටයුත්ත භාරදෙන්න තීරණය කළේ බොන්ඩ් වීථියේ ඔග්ඩන් සහ සමාගමට.

ඔබ දන්නවා මේ සමාගම ඉතා පරණ ආයතනයක්. අවංකව මෙන්ම විශිෂ්ට අයුරින් කටයුතු කිරීම ගැන ඔවුනට ඉහළ කීර්තිනාමයක් ලැබිල තියෙනවා. එම ආයතනයේ වත්මන් අධ්‍යක්ෂකවරයා වන ජේම්ස් ඔග්ඩන් මහත්මයාත් ක්ෂේත්‍රයේ පිළිගත් කෙනෙක්. ඔහු ලන්ඩන් වාණිජ මණ්ඩලයේ සභාපති තනතුර කිහිප වරක් හෙබ වූ කෙනෙක්. ඔහුගේ ලිපිකරුවන් ගණකාධිකාරීවරුන් වෙළෙඳ සහායකයන් හැමදෙනෙකුම වගේ, අවුරුදු ගණන් මේ

ආයතනයේම සේවය කළ අය. ආභරණ අලුත්වැඩියාව හෝ සුළු සැකසීම් ආදී වැඩ සමහරක් කෙරෙන්නේ, බොන්ඩ් වීදියේ ඔවුන්ගේ ප්‍රදර්ශනාගාරය පිහිටි ප්‍රධාන ගොඩනැගිල්ලේ ම පිටුපස කොටසේ තිබෙන, ආභරණ සැකසුම් මධ්‍යස්ථානයේදී. නමුත් ඔවුන්ගේ ප්‍රධාන කර්මාන්ත ශාලාව පිහිටා තිබෙන්නේ වෙස්ටටන් වීදියේ"

"ඔබේ මාලය යළි සැකසීමේ වැඩ කටයුතු කළේ ජේම්ස් ඔග්ඩන් මහතා විසින්මද?"

"නැහැ හෝම්ස් මහත්මයා" ඇය කිව්වා. "ඔහු ඒ කටයුත්ත පවරලා තියෙන්නේ මේ අංශයේ දක්ෂම ශිල්පියා වන ටිම් මැකින්ටොෂ්ට. ඔග්ඩන් මහතාට ඉන්න කෘතහස්තම කාර්මිකයා වන මැකින්ටොෂ් තමයි, ඔග්ඩන්ට ඉන්න විශ්වාසවන්තම සේවකයා. එංගලන්තයේ සිටින මෙම ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් ගත්තොත්, ඔවුන් අතර ඉහළම තැනක්ලු මැකින්ටොෂ්ට හිමිවෙන්නේ. ඒ නිසා ඔහු මේ කටයුත්ත සියයට සීයක් නිවැරදිව කරන්න ඇති බව මට විශ්වාසයි."

"අලුතෙන් සකස් කළ මුතුමාලය ගැනීමට ඔබ ඔග්ඩන්ලාගේ සාප්පුවට නොගිය බවත්, ජේම්ස් ඔග්ඩන් පැමිණ ඒවා ඔබේ අතටම භාරදුන් බවත් පුවත්පත්වල පළවී තිබුණා. සම්පූර්ණ ඇත්ත ඒකද?"

"ඔව් මහත්මයා" ඇය කිව්වා. "මේ කාලයේ රඟ දැක්වුණේ රෝමියෝ - ජූලියට් නාට්‍යය. තමන් ෂේක්ස්පියර්ගේ නාට්‍ය අතිශයින්ම ප්‍රිය කරන බව ජේම්ස් ඔග්ඩන් මහතා එක දවසක් මා සමගම කිව්වා. රෝමියෝ ජූලියට් නාටකයට අලුත් අර්ථකථනයක් දී ටර්නර් මහතා කළ නව නිෂ්පාදනය ඔග්ඩන් නරඹලා තිබුණෙම නෑ. ඉතින් මගේ ආරාධිත අමුත්තෙකු ලෙස පැමිණ ඉදිරි අසුනකම ඉඳගෙන එය නරඹන්න කියා මං ඔහුට ඇරයුම් කළා.

එදා ප්‍රධාන අමුත්තන් ලෙස නාට්‍යය නරඹන්න ආවේ ඩෙවොන්ෂයර් ආදිපාදවරයා සහ ආදිපාදවරිය. ඒ ළඟ අසුනක් මං ඔග්ඩන් වෙනුවෙන් වෙන් කළා. ඉතින් ඔහු නාට්‍යය නරඹන්න ආවේ අලුතෙන් සකස් කළ මුතුමාලයත් අරගෙන. ඔහු ඒක මගේ දැතටම දුන්නා. හෝම්ස් මහත්මයා; ඔබ මේ නාට්‍යයේ නව නිෂ්පාදනය නරඹලා තියෙනවද නැද්ද කියන කරුණ මං දන්නෙ





නෑ. ඒ නිසා එහි ජවනිකා දිග හැරෙන ආකාරයත් මං කෙටියෙන් විස්තර කරන්නම්. මේකෙ තිබෙනවා බාල් නැටුම් වැනි රැඟුම් සහිත සම්භාෂණයක්. කැපියුලට් පවුලේ අය පවත්වන මෙයට විශාල පිරිසක් සහභාගි වෙනවා. ඒකට එන අය මුහුණ හඳුනාගන්න බැරි වෙන විධියට වෙස් මුහුණු පැළඳගත්, නිල් පැහැති "ඩොමිනෝ" කබා ඇඳගත් අය. ඔළුව වැහෙන්න දමන බොනට්ටුවක් කබායේ කොලරයට මසා ඇති ඩොමිනෝ කබාය, අත් දිගට ඇති, සිල්ක් රෙද්දෙන් මැසූ කබායක් බව ඔබ දන්නවා ඇති.

මේක පැවැත්වෙන්නේ නාට්‍යයේ දෙවැනි ජවනිකාවෙ. නාටකය අනුව මෙකෙදි විශාල සෙනගක් වේදිකාවෙ සිටීම අවශ්‍යයි. ඒ නිසා අමතර නළු නිළියන් වැඩි ප්‍රමාණයකුත් ඒ දර්ශනයට යොදා ගන්නවා. ඔවුන් විතරක් නෙමෙයි. නාට්‍යය වේදිකා ගත කරන්න කටයුතු කරන ශිල්පීනුත් වෙස් මුහුණක් හා ගැළපෙන ඇඳුමක් දමාගෙන ඒ වෙලාවට වේදිකාවට එනවා."

"මේ ඇන්ඩෘ බොයිඩ් මහත්මයත් මේ දර්ශනයට සහභාගි වුණාද?" මං විමසුවා.

"හෝම්ස් මහත්මයා. ඔබ ඒ ප්‍රශ්නය ඇසූ එක හොඳයි." ඇය කිව්වා. "ඔය කාරණය ගැන මම විශේෂයෙන් කියන්නයි හිටියේ. බොයිඩ් මහත්මයා වෘත්තියෙන් නළුවෙක් නෙමෙයි. ඔහුගේ පියා බ්‍රිස්ටල් නගරයේ ව්‍යාපාරිකයෙකු ව සිටියා. ඒ කාලයේ එම ව්‍යාපාරික කටයුතු සඳහායි ඇන්ඩෘ ලන්ඩන් නගරයට සංක්‍රමණය වුණේ. මගේ රඟපෑම් අගය කළ අය අතරින් කිප දෙනෙක්ම මං ගැන විශේෂ අවධානයක් යොමු කළා. ඒ මා විවාහ කර ගැනීමේ අපේක්ෂාවෙන්. ඒ අය අතරින් මගේ හිත ගියේ මේ බොයිඩ් මහත්මයාටයි" මෙහෙම කියූ ඇය ඔහුගේ අතින් අල්ලා ගත්තා. ඔවුන් මුහුණට මුහුණ බලාගෙන සිනාවෙමින් මඳ වේලාවක් සිටියේ නිහඬව.

කතන්දරය වඩාත් පැහැදිලි වීම සඳහා මං එය ඔබට විස්තර කරන්නම්. වොට්සන් ඔබ ඇන්ඩෘ බොයිඩ්ගේ ඡායාරූප දැක තිබෙනවාද මං දන්නේ නෑ. ඔහුත් නළුවෙකු වගේ කඩවසම් කෙනෙක්. අඩි පහයි අඟල් අටක් පමණ උස ඔහුට තිබුණේ සිහින් සිරුරක්. කලක් මලල ක්‍රීඩාවලත් යෙදී ඇති ඔහු බොහොම නිශ්ශබ්ද කෙනෙක්. ගිබ්සන් මෙනෙවිය මෙම විස්තරය කියද්දී

බොයිඩ් සිනාමුසු මුහුණෙන් සිටියේ නිශ්ශබ්දව. නමුත් පසුව ඔහුගෙන් ප්‍රශ්න කරලා මම කාරණා කිහිපයක් දැනගත්තා. එකල පුවත්පත්වල පළවූ තොරතුරු වලින් තමයි ඔහු ගැන කාරණා දැනගන්න ලැබෙන්නේ. පියාගේ ව්‍යාපාරවලින් ආදායමක් ලැබෙන අනෙක් විනෝදකාමී තරුණයන් වගේ, ඔහුත් රංගන ලෝකයට සමීප වී ජීවිතය සැහැල්ලුවෙන් ගතකළ කෙනෙක්. ඔහුට "නාට්‍ය උන්මාදයක්" තිබුණු බවයි සමහර පුවත්පත් පවසා තිබුණේ. නාට්‍ය දර්ශනයට අදාළ ඇඳුමකින් සැරසී, 'අමතර' නළුවෙකු ලෙස මෙම නාට්‍යවල පෙනී සිටීම ඔහුගේ විනෝදාංශයක් වුණාලු. ඒ කිසිම මුදලක් උපයා ගැනීමට නෙමෙයි. තමන්ගේ පෙම්වතිය රඟපාද්දී ඒ සමීපයෙන් රැඳී සිටීමේ අපේක්ෂාවෙන්ලු; ඒ ඇගේ රඟපෑම් වලින් සන්තෝෂයට පත්වන ප්‍රේක්ෂකයන් ඔල්වරසන් නඟද්දී ඒ සමීපයෙන්ම සිටීමට ආශාවෙන්ලු. මෙම නාට්‍යය එදා රඟදැක්වෙද්දීත් නිල්පාට ඩොමිනෝ කබායකින් සැරසී වෙස්මුහුණක් දමාගෙන ඔහු දෙවැනි ජවනිකාවට පෙනී හිටියලු. ඒ අමතර නළුවන් අතරේ කෙනෙකු හැටියට.

මෙම සිද්ධිය වුණේ ජූලි මාසේ හත්වැනිදා දවසක. ගිබ්සන් මෙනෙවිය දෙවැනි ජවනිකාවෙ රඟපාන්නෙ අප්‍රසිද්ධ දූප්පත් තරුණියක වගේ. එතරම් අලංකාර නැති පරණ ඇඳුමකින් සැරසී ඉන්න ඇය, මාලයක් පැළඳගෙන ඉන්නෙත් නැහැ. ඔග්ඩන් මහත්මයා රැගෙනවිත් ඇගේ අතටම දුන්නු අලුත්ම අලංකාර මුතුමාලය, ඇය පැළඳීමට නියමිත තුන්වැනි ජවනිකාවෙදි. එය මේ වෙලාවෙ තබා තිබුණේ වේදිකාව පිටුපස කොටසේ තිබෙන ගිබ්සන් මෙනෙවියගේ සැරසුම් කාමරයේ. වේදිකා සහායකයින් අමතර නළුවන් ලෙස වේදිකාවට පැමිණි නිසා, මේ වෙලාවෙ එහි පිටුපස තිබුණේ බොහොම පාළු බවක්. කිසිම කෙනෙක් නොහිටි තරමයි.

මෙම සිදුවීමෙන් පසුව නම් බොහෝ දෙනෙක් දෝෂාරෝපණය කර තිබුණේ රෙබෙකා ගිබ්සන් මෙනෙවියටමයි. ඇයට ඇඳුම් පැළඳුම් අන්දවා නොයෙකුත් වර්ණ මුහුණේ තවරා "මේකප් දැමීම" කළේ රූත් රෝලන්ඩ් නම් තරුණියක්. ළාබාල නොමේරූ තරුණියක වන රූත් මෙනෙවියට මේ තරම් වටිනා මාලයක් භාරදී ඒ ගැන සම්පූර්ණයෙන්ම අමතක කර රඟපෑමට යාම





ගිබ්සන් මෙනෙවියගේ පැත්තෙන් සිදුවුණු අඩුපාඩුවක් වගේම නොසැලකිලිමත් කමක්. ඒ වගේම රූත් මෙනෙවිය අතින් සිදුවුණෙත් සමාව දිය නොහැකි වැරැද්දක්. නමුත් අප මතක තබාගත යුතු වැදගත් කාරණයක් මෙතැන තියෙනවා. ඒ තමයි වේදිකාව පිටුපස මේ කොටසට කිසිම කෙනෙකුට නිදහසේ ඇතුළු වෙන්න හැකියාවක් නැහැ. ඒ මොකද එතැන ඉන්නවා බොහොම සැරපරුෂ ලෙස රාජකාරි කරන දොරටු පාලකයෙක්. කාගේවත් චාටු බහකට නොරැවටෙන චාලි ග්‍රේ නම් ඔහු, කාටවත් ලිහිල් බවක් නොදක්වන බව ප්‍රසිද්ධ කරුණක්.

ප්‍රධාන නිළිය වන ගිබ්සන් මෙනෙවියට සහ ප්‍රධාන නළුවාට මැදිරි වෙන්වුණු සැරසුම් කාමරය තිබෙන්නේ වේදිකාව පිටුපස වම් පසින්. එහි දකුණු පසින් තිබෙන්නේ අනික් අය - ඒ කියන්නේ සුළු චරිත රඟපාන නළු නිළියන් සහ අමතර නළුවන් සඳහා වූ පොදු සැරසුම් කාමරය.

දෙවැනි ජවනිකාව අවසන් වෙන මොහොත ළං වුණා. එතකොට වෙලාව රෑ දහයට කාලක් පමණ. වේදිකාව පිටුපස මුරකාරයා චාලි ග්‍රේ සැරසුම් කාමරය පැත්තට මේ වෙලාවෙ කඩා වැදුණෙ බොහොම කලබලයෙන්. යමක් කටින් පිට කිරීමට ඔහු සිටියේ හරිම නොඉවසිල්ලකින් බව වේදිකා සහායකයින්ට පෙනුණා. ඊට අමතරව ඔහු තමන්ගේ කබායේ ඉදිරිපස කොටස් දෙක තදින්ම ග්‍රහණය කරගෙන හිටියා. ඒ පිටුපස මොකක් හෝ සඟවා ගෙන සිටි බවත් හිතා ගැනීම අපහසු වුණේ නැහැ. වේදිකා සහායකයන් මේ ගැන ඔහුගෙන් විමසුවත්, හිස දෙපසට වැනූ ඔහු කිසිම පිළිතුරක් දුන්නේ නැහැ. දෙවැනි ජවනිකාව අවසන් වෙද්දී තිරය වැහෙන්න පටන් ගත්තා. ප්‍රේක්ෂකාගාරයෙන් නැඟුණු අත්පොළසන් නාදය මිනිත්තු කිහිපයක්ම තියෙන්න ඇති.

අපමණ සන්තෝෂයකට පත්ව සිටි ගිබ්සන් මෙනෙවිය වේදිකාව පිටුපසට ගියේ මඳ විවේකයක් ගන්න අදහසින්. නමුත් චාලි ග්‍රේ එතැනට කඩා වැදුණේ නොඉවසිල්ලෙන්.

"මැතිනියෙණි! හරිම අවාසනාවන්ත දෙයක් තමයි තව ටිකෙන් සිද්ධ වෙන්නෙ" චාලි ග්‍රේට කෑගැහුණා. "ආව නේද හොර තක්කඩියෙක්. මහා මංකොල්ලයකුත් කරගෙනයි තව ටිකෙන් ඌ පැන ගන්නෙ. එව්වා කොහේද මාත් එක්ක. ඌ හෙමින්ම ලිස්සලා

යන්න හදද්දී මං ඌව බෙල්ලෙන්ම අල්ලා ගත්තා. ඌ පැන ගිය බව ඇත්ත. නමුත් වටිනාම දේ ආරක්ෂා කර ගැනීම මං කරගත්තා. මෙ තියෙන්නේ......... මේ!"

වේදිකා දොරටුවේ මුරකාරයේ මේ කියන්නේ මොකක් ගැනද කියන කරුණ, ගිබ්සන් මෙනෙවියට එක්වරම වැටහුණේ නෑ. එතැන ඔහුගේ කෑගැසීමට කන් දීගෙන සිටි ඇයට හිතුණේ ග්‍රේ බීමතින් දොඩවනවා කියලයි. නමුත් ඊළඟ මොහොතේ කවුරුත් පුදුමයට පත්වුණේ ඔහු කළ ක්‍රියාවෙන්. ඔහු තමන්ගේ කබාය ඇතුළෙන් එළියට ඇද්දේ රෙබෙකා ගිබ්සන් මෙනෙවියගේ සුවිශේෂතම ආභරණය වුණු මුතුමාලය.

"ග්‍රේ! මොකක්ද මිනිහෝ තමුසෙ ඔය කරන විකාර වැඩේ තේරුම?" මේ වෙලාවේ නිළිය සමග සිටි ඇන්ඩ්‍රූ බොයිඩ් මහත්මයාට කෑගැසුණා. "ගිබ්සන් මැතිනියගේ මුතුමාලය අරගෙන මොකක්ද තමුසෙ නටන මේ විගඩම?"

දකින්න ලැබුණු දෙයින් ගිබ්සන් මෙනෙවියගේ මොළය මොන තරම් අවුල් වුණා ද කිව්වොත්, ඇයගේ තොල-කට වෙව්ලුණා. කිසිවක් කතා කරගන්න බැරි වුණා. ඇය තමන්ගේ වටිනා මාලය දිහා බලාගෙන හිටියේ ගොළු වෙලා වගේ.

"මැතිනියෙනි. සිදධ වුණේ මෙකයි" ග්‍රේ අන්තිමේදී ගොත ගහමින් කිව්වා. ඒ මුතුමාලය ගිබ්සන් මෙනෙවියගේ දෑතේ තබමින්. "මැතිනියෙනි. ඔබට තේරෙනවා නෙ, මේ හැන්දෑව මොන තරම් උණුසුම් ග්‍රීෂ්ම එකක් ද කියන එක? මං මෙතැන රාජකාරි කළේ දරාගන්න බැරි පිපාසයකින්. ඒ වුණත් වේදිකාව පැත්තට ඇතුළු කරගත යුතු හැම කෙනෙකුම මං වගකීමෙන් ඇතුළු කර ගත්තා. ඒ ඔවුන් හැම කෙනෙකුගේම අවසර පත්‍ර සෝදිසි කිරීමෙන් පසුව. ඊට පස්සේ මට කරන්න ඒ හැටි වැඩක් තිබුණේ නෑ. ඉවසන්න බැරි පිපාසයක් තිබුණත් මට දොරටුව ළඟින් පිටවී යන්න ක්‍රමයකුත් නෑ.

ඔන්න එතකොට මට දොරටුව ළඟ එළියේ රස්තියාදු වෙවී හිටි මිනිහෙකු දකින්න ලැබුණා. මීට කලිනුත් ඔය හාදයා ඔය හරියේ රස්තියාදු වෙවී ඉන්න හැටි මට දකින්න ලැබී තිබුණා. ඒත් මං ඔහුව කවදාවත් ගණනකට ගත්තෙ නෑ. ඒත් අද හැන්දෑවෙ නම් මට හිතුණා මේ මිනිහගෙන් උදව්වක් ගන්න. මෙතැන ඉඳලා අඩි





දහයක් ගිය තැන තැබෑරුමක් තියෙනවා නෙ. ඉතින් මං ඒ මිනිහට අඩගහලා කාසි කිහිපයක් ඔහු අතට දුන්නා. මං ඔහුට කිව්වා ළඟ තියෙන තැබෑරුමෙන් මට බීර ජෝගුවක් ගෙනැත් දෙන්න කියලා. ඒකෙ ඇති වැරැද්දක් මට පෙනුණෙ නෑ. ඒකෙ වැරැද්දක් නැහැ නේද මැතිනිය?"

"ඔව්. ඒකෙ වැරැද්දක් නෑ කියමුකො" ගිබ්සන් මෙනෙවිය කියා තිබුණේ නොඉවසිල්ලෙන්. "ඊළඟට සිද්ධවුණේ මොකක්ද?"

"ඊළඟට ඒ මිනිහා මං ඉල්ලූ විදියට බීර අරගෙන ආවා" ග්‍රේ කිව්වා. "මං ඒක බිව්වා....... ඊට පස්සෙ ඒ දේ කොහොම සිදුවුණාද කියන්න මං දන්නෙ නෑ. කොහොම වුණත් මං වාඩිවෙලා හිටියෙ මට රාජකාරියට නියමිත මගේ කුටිය තුළ. මං හිතන්නෙ මට බින්දු මාත්‍රයක් නින්ද යන්න ඇති.

දෙවැනි ජවනිකාව පටන්ගන්න හදන බව අඟවන සීනු හඬ මං හිතන්නෙ මට ඇහුණා කියලයි. ඊළඟට කෑදවුම්කාර ළමයා ඔබ තුමිය අමතන හඬත් මට යන්තමින් වගේ ඇහුණා. එතැන ඉඳලා ටික වෙලාවක් යනතුරු සිදුවුණු දේවල් කිසි දෙයක් මගේ මොළේ නෑ: මතකය හිස්.

මං හිතන්නේ එක්වරම මං අවදිවුණා කියලයි. මොකක් හරි දෙයක් සිදුවෙන පිළිවෙළේ වැරැද්දක් තිබෙනවා දෝ කියල මට හීනෙන් වාගෙ දැනුණා. එක මොහොතින් මං උඩ විසිවුණේ සම්පූර්ණ අවදියෙන්. මං දුටුවා මිනිහෙක් හොර ගමනින් බරාදය දිගේ ඉස්සරහට එන හැටි. ඌ මගේ කුටියත් පහු කරගෙන ගමන් කළේ රඟහලෙන් පිට වී යන දොර දිහාවට.

මං ඔහුට කෑගැහුවා; "ඒයි! ඔහොම නැවතියන්! උඹ කවුද? කොහේටද උඹ ඔය යන්නෙ?" මං එහෙම කියද්දී ඌ උත්සාහ කළේ මගෙන් බේරිලා පැනල යන්න. එච්ච කොහේද මාත් එක්ක. ඌ ළඟට පැන්න ගමන් මට අහුවුණේ උගේ කබායේ යට කොටස. මං ඒකෙන් අල්ලා ඌව නවත්වා ගෙන ඌ මගේ දිහාට හැරෙව්වා. මේ මට බීර අරගෙන ආව රස්තියාදු කාරයා බව මං වහාම අඳුනාගත්තා. ඊට අමතරව ඌ මොකක් හරි දෙයක් හංගාගෙන එන බව මං තේරුම් ගත්තා. මං උදව් ඉල්ලා කෑගැහුවා. ඒත් මට උදව් කරන්න කිසි කෙනෙක් මේ කිට්ටුවක හිටියේ නෑ. අර තක්කඩියා මා එක්ක පොරබැදුවේ වෙඩි කෑ කොටියෙකු වගේ. අන්තිමට ඌ

මගේ ග්‍රහණයෙන් ගැලවුණු බව ඇත්තයි. ඒ වුණත් ඌ හොරකම් කරගත්තු දේ අරගෙන පනින්න ඌට මගෙන් ඉඩ ලැබුණෙ නෑ. ඒ ගැන අපි දෙවියන්ටත් ස්තුති කරන්න ඕන. ඔබතුමියගෙ වටිනා මුතුමාලය තමයි අපට බේරගන්න හැකිවුණේ."

දොරටුවේ මුරකාරයා චාලි ග්‍රේට කියන්න තිබුණේ ඔන්න ඔය කතාවයි වොට්සන්. ඔහු කිහිපවාරයක් ඔය කතන්දරය කියල තිබුණා. නමුත් ඒකෙ වෙනස්වීමක් තිබුණෙ නෑ. මේ ගැන ඔබට මොනවද ඒ වෙලාවෙ හිතුණෙ කියල මං රෙබෙකා ගිබ්සන් මෙනෙවියගෙන් විමසුවා.

"මගේ මුතුමාලෙ කැඩුණෙ බිඳුණෙ නැතුව මට ආපහු ලැබුණ නේ" ඇය කිව්වා. "ඒ නිසා ලොකු කැලඹීමකට පත්වෙන්න හෝ කේන්ති ගන්න, ශෝකයෙන් තැවෙන්න තරම් දෙයක් එතැන තිබුණෙ නෑ. සිත කම්පා කරවන සිත් සසල කරවන සිදුවීම් අහන්න ලැබීම, රංගන ක්ෂේත්‍රයේදීම අපට මුහුණ දෙන්න වෙන තත්ත්වයක්. ඉතින් මං ඒක භාර ගත්තේ සැහැල්ලු සිතින්.

කොහොම වුණත් මගේ ඇඳුම් සහ ආභරණ භාරව සිටින, ඇඳීම් පැළඳීම් වලදී මට සහාය වෙන මගේ සේවිකාව රූත් රෝලන්ඩ් ගැන නම් මගේ හිතේ ඇතිවුණේ තරහක්. මගේ ආභරණවල ආරක්ෂාව ගැන කිසිම තැකීමක් නොකර, කාමරයේ දොර විවෘතව තිබියදී ඇවිදින්න යාම ගැන නම්, රූත්ට සමාවක් දෙන්න අමාරුයි. ඒ ගැන ඇයට තදින්ම දොස් පවරන්න ඕන කියල මං හිතාගත්තා. ඉතින් මුතුමාලයත් අතේ තියාගෙන මං ගියේ මගේ සැරසුම් කාමරයට.

කාමරයේ දොර විවෘත කළ ගමන්ම මට දකින්න ලැබුණේ හඬා වැලපෙමින් සිටි රූත්. චාලි ග්‍රේ ඔහු මුහුණ දුන් සිදුවීම විස්තර කරද්දී රූත්ටත් ඒ තොරතුරු අහන්න ලැබිල තියෙනවා. තමන්ගේ නොසැලකිල්ල නිසා සිදුවුණු විපත ගැන ඇය සිටියේ දැඩි කම්පාවකින්."

ගිබ්සන් මෙනෙවිය මේ ගැන ප්‍රශ්න කළාම රූත් රෝලන්ඩ් සේවිකාව වරද පිළිගත්තා. ගිබ්සන් මෙනෙවියගේ අලංකාර රංගනය නැරඹීමට රූත් ඉඳල තියෙන්නේ ලොකු ආශාවකින්. වේදිකාව දෙපසින් පිහිටා ඇති සඳලුතලයකට වී ප්‍රේක්ෂකාගාරයට නොපෙනෙන විදියට නාට්‍යය නැරඹීමට හැකි බව ඇය දැන





සිටියා. සහායකයින් හැම දෙනෙකුම වගේ මේ වනවිට වේදිකාවට ගිහින් සිටි නිසාත් චාලි ග්‍රේ දොරටුව ළඟ මුරට සිටි නිසාත් රූත්ගේ සිතට භයක් ඇතිවුණේ නැහැලු. සැරසුම් කාමරය තුළට මේ වෙලාවෙ කිසිවෙකු ඒවි කියල ඇයට කොහොමටවත් හිතිල නෑ.

හැම දෙනෙකුගේම සිත්වල ලොකු භයක් ඇතිවී තිබුණු බව ඇත්ත. නමුත් දැන් බලනකොට පාඩුවක් සිදුවෙලා නැහැනේ. ඉතින් සේවිකාවට සමාව දුන් ගිබ්සන් මෙනෙවිය ඊළඟ ජවනිකාව සඳහා ඇඳුම් මාරු කිරීමට පටන් ගත්තා. එතකොටයි ඇයට අහම්බෙන් දකින්න ලැබුණේ, ඇගේ කණ්ණාඩි මේසය මත තිබුණු අලංකාර රෝසමල් කළඹක්. ඒක එතැනින් ගෙනැවිත් තැබුවෙ කවුද කියා ගිබ්සන් මෙනෙවිය රූත්ගෙන් විමසුවා. "ඒක ගෙනාවෙ බොයිඩ් මහත්මයා" රූත් පිළිතුරු දුන්නා.

ගිබ්සන් මෙනෙවිය සන්තෝෂයට පත්වුණු බවයි එක්වරම පෙනුණේ. ඇගේ මුහුණ ලැජ්ජාවෙන් රතු වුණා. කොහොම වුණත් ඒ කාරණය අමතක කර දැමූ ඇය ඊළඟ ජවනිකාව සඳහා සැරසීම ඇරඹුවා. ඒකෙ තියෙන්නේ දුක්ඛදායක කාලයකට මුහුණ දෙමින් සිටි වීරවරිය සන්තෝෂදායක වාසනාවන්ත කාලයකට පත් වීම. මේකෙදි තමන්ගේ අලංකාර මුතුමාලය ගෙලේ බඳින්න ඇයට අවස්ථාව ලැබෙනවා.

කොහොම වුණත් යළිත් සාමාන්‍ය තත්ත්වයට පත්වෙන්න චාලි ග්‍රේට තරමක වේලාවක් ගත වුණා. ඔහුගේ හිතේ ඇති වී තිබූ සාධාරණ කෝපය පහ වී ගියේ ඔහු නොඩකවා කළ දෙඩවීම් නිසා. අර රස්තියාදු කාරයා තමන් වෙත බීර ගෙන ආ ජෝගුව අතට ගෙන ඔහු පරීක්ෂා කර බැලුවා. ඒක අඩියේ බීර ස්වල්පයක් තවමත් ඉතිරිවෙලා තිබුණා. පසුව මේක ළඟ තිබූ ඖෂධාලයක ඖෂධවේදියෙකුට පෙන්වනු ලැබුවා. ඒ බීර වලට ක්ලෝරල් නම් නිද්‍රාකාරකය සෑහෙන තරම් මිශ්‍ර කර ඇති බව ප්‍රකාශ කරන්න ඖෂධවේදියාට ගත වුණේ එක් මොහොතයි."

## II

"එදා රාත්‍රි ගිබ්සන් මෙනෙවියගේ හිතේ ඇතිවුණු සන්තෝෂයට මේ හැම දෙයක්ම බලපෑවෙ නැහැ කියලා ඔබට හිතෙනවා ඇති වොට්සන්" හෝම්ස් කීවේ මඳ නිහඬතාවයකට පසුය.

"කාටවත් හිරිහැරයක් හෝ පාඩුවක් නොවී, හැම දෙයක්ම සතුටුදායක ලෙස අවසන් වීම මොන තරම් සැනසීමක් ද" කැටපත ඉදිරියට ගිය ගිබ්සන් මෙනෙවිය කිව්වේ ඇගේ ගෙල වටා තිබුණු මුතු මාලය බැබළෙමින් තිබුණු ආකාරයෙන් සතුටට පත්වෙමින්.

නමුත් ඔවුන්ගේ සිත් දැඩි කම්පාවකට පත් කළ තිත්ත ඇත්ත හෙළිදරව් වුණේ ඊළඟ දවසේ. රීජන්ට් රංග ශාලාවෙදි එදා ඇත්තෙන්ම යම් දෙයක් සිදුවී තිබුණා. ඒ පැහැදිලි කිරීමට අමාරු පුදුමාකාර සිදුවීමක්.

පහුවදා රෙබෙකා ගිබ්සන් මෙනෙවිය යම් තීරණයකට පැමිණියා. වටිනාකම අතිශයින්ම වැඩි ඇගේ මුතුමාලය වැනි දේවල්, නිසි ආරක්ෂාවක් නැති සැරසුම් කාමරවල දමා රඟපෑමට යාම, මොන තරම් මෝඩ කමක්ද කියා ඇයට සිතුණා. වේදිකාවෙ රඟපෑම සඳහා නම් ඉමිටේෂන් මුතුවලින් තැනූ ඉමිටේෂන් මුතුමාලයක් හොඳටම ඇති. ඒ නිසා රීජන්ට් රඟහලේ කොන්ත්‍රාත්තුව අවසන් වෙන තුරු මාලය තමන්ගේ බැංකු සුරක්ෂිතාගාරයේ තබන්න ඇය තීරණය කළා.

එදා මහ දවාලේ දීප්තිමත් හිරු එළියෙන් තමන්ගේ මාලය අල්ලා බැලූ ඇගේ හිතේ ඇතිවුණේ තිගැස්මක්. මාලයේ මුතුවල මොකක් හරි වරදක් තිබෙනවාද කියන සැකයෙන්, ඇගේ ඇඟ එක් මොහොතකට හිරි වැටී ගියා. මාලයත් රැගෙන ඇය වහාම ගියා ගෙදරට කිට්ටුවම තිබූ ස්වර්ණාභරණ සාප්පුවට. තමන්ගේ මුතු මාලය පරීක්ෂා කර බලන මෙන් ඇය ඔවුනට ආයාචනා කළා.

මේ පරීක්ෂාවට ඒ තරම් වෙලාවක් ගතවුණේ නෑ. මේ මාලයේ මුතු ව්‍යාජ ඒවා බව ආභරණ ශිල්පියා කෙළින්ම කිව්වා. ඔහුගේ හිතේ ඒ ගැන කිසිම සැකයක් තිබුණේ නැහැ. මෙය කලින් තිබුණු මාලයට සෑම අතකින්ම සමාන ලෙස, ඉමිටේෂන් මුතු යොදා සකස් කළ ඉමිටේෂන් මාලයක්. වෙන එකක් තබා මේකෙ ගාංචුව පවා කලින් මාලයට සෑම අතකින්ම සමාන ලෙස සකස්කර තිබුණා. කෝපයෙන් මෙන්ම කැලඹීමෙන් ගිබ්සන් මෙනෙවිය බාගෙට වියරු වැටුණා. ඇය වහාම බොන්ඩ් වීථියට ගියේ ජේම්ස් ඔග්ඩන් මහත්මයා හමුවෙන්න.

ඔවුන් දෙදෙනා අතර ඇතිවුණු කතාබහ මොනතරම් සැර පරුෂ, තර්ජනාත්මක, කෝපය පිටවූ එකක්ද කියල ඔබට





හිතාගන්න පුළුවන් නේද වොට්සන්? ලන්ඩන් වාණිජ මණ්ඩලයේ සභාපති ධුරය කිහිප වාරයක් හෙබ වූ ජේම්ස් ඔග්ඩන් මහත්මයා වංචාකාරයෙක්, තක්කඩියෙක් කියල චෝදනා කරන්න ගිබ්සන් මෙනෙවිය කිසිසේත් පසුබට වුණේ නැහැ. තමන්ගේ මිල කළ නොහැකි මුතු ඇට වලට ඉමිටේෂන් මුතු ආදේශ කිරීම මොන තරම් නින්දිත කටයුත්තක්ද කියා ඇය කෝපාවිෂ්ඨව කඩා පැන්නා.

ආභරණ ශාලා හිමියාට මුලින් මේ කිසිදෙයක් තේරුම් ගන්න බැරි වුණා. ඇය මේ කියන්නේ මොකක් ගැනද කියා ඔහු පුදුමයට පත්වුණා. ඔහු ඇය දිගුකළ මුතු මාලය අතට අරගෙන පරීක්ෂා කර බැලුවා. ඇය මේ කියන්නේ සම්පූර්ණ ඇත්තක් බව තේරුම් ගනිද්දී ඔහු භීතියට පත්වුණා. ඔහු මුහුණ දුන්නේ අතිශයින්ම ලැජ්ජා සහගත තත්ත්වයකට. මෙහෙම දෙයක් වුණේ කොහොමද?

කලින්දා හැන්දෑවෙ සාප්පුව වහන්න කලින් ඇගේ මාලය තමන්ගේ භාරයට ගත් ඔහු එය ගෙදර ගෙන ගියා. රංග ශාලාව වෙත පිටත් වෙන්න කලින් තමන් මේ මාලය පරීක්ෂා කර බැලූ බව ඔහුට හොඳට මතකයි. මාලය දැමීමට නියමිත පෙට්ටියට ඔහු එය දැම්මෙ, තමන්ගේ බිරිඳ ඉදිරිපිටදී තමන්ගේ දෑත්වලින්මයි. ඊළඟට ඔහු තමන්ගේ පෞද්ගලික අශ්ව කරත්තයෙන් ගියේ රීජන්ට් රඟහලට ම යි. එහිදී ගිබ්සන් මෙනෙවිය හමුවෙලා මාලය සහිත පෙට්ටිය ඇගේ අතට දුන්නේ තමන්මයි.

මේ හැම දෙයක්ම සත්‍ය බව ඔහු දිවුරා කියා හිටියා. ඔහු පමණක් නෙමෙයි; ඔහුගේ වෙළෙඳසලේ සේවක සේවිකාවනුත් ඒ බව දිවුරා තහවුරු කළා. ඔග්ඩන් මහත්මයා ඔහුගේ නිවස පිහිටි පිකැඩලි දෙසට යන්නට පෙර, මාලය සහිත පෙට්ටිය ඔහුගේ කබායේ ඇතුළු සාක්කුවක දමා ගත් හැටි ඔවුන් දැක තිබුණා.

මේ අවුල ගැන අභිරහස තවත් පටළැවීමකට ලක් කරන ආකාරයේ එක් කාරණයක් කැපී පෙනුණා.

ඔග්ඩන් මහතා මාලය අඩංගු පෙට්ටිය ගිබ්සන් මෙනෙවිය අතට රීජන්ට් රඟහලේදී දුන් බව ඇත්තයි. නමුත් ඒ වෙලාවේ පෙට්ටිය විවෘත කර බලන්න ඇයට බැරිවුණා. ඒකට හේතුව ඒ වෙලාවේ ඇය මුහුණ දී තිබුණු අවිවේකී බව. ඇය කළේ අඩක් විවෘතව තිබුණු සැරසුම් කාමරයේ දොරෙන් ඔග්ඩන් මහත්මයාට කථා කරලා ඔහුට ස්තුති කිරීම පමණයි. මාලය අඩංගු පෙට්ටිය

සහිත පැකට්ටුව ඇය ඒ වෙලාවේ විවෘත කරලා බැලුවේ නැහැ. ඒ කටයුත්ත ඇයට කිරීමට හැකිවුණේ ඊට පැයකට විතර පස්සේ. ඒ වෙනකොට එම පැකට්ටුව ඔග්ඩන් මහත්මයා දවටනයකින් ඔතා තිබුණු ආකාරයෙන්ම තිබුණා. ඇය දවටනය ගළවලා පෙට්ටිය විවෘත කරලා මාලය අතට අරගෙන බැලුවා. සැරසෙන කාමරයේ තිබෙන විදුලි ආලෝකයෙන්, ඇයට මුතුවල කිසිම වැරැද්දක් පෙනුණේ නෑ.

තමන් මුහුණ දීල තිබුණු තත්ත්වයේ භයානක බව ඔග්ඩන් මහත්මයාට වැටහුණේ මිනිත්තු කිහිපයක් ගතවෙද්දී. ඔහු අවුරුදු තිහක් තිස්සේ අවංක බව ගැන ගොඩ නගා ගෙන තිබුණු කීර්තිනාමය එක්වරම විනාශ වෙන්න පටන් අරගෙන. ඔහුගේ මුවෙන් පිටවූ කිසි දෙයක් ගිබ්සන් මෙනෙවිය විශ්වාස කළේ නෑ. තමන්ට සිදුවූ විශාල අලාභය සම්පූර්ණයෙන්ම වහාම ගෙවීමට ඔහු කටයුතු කළ යුතුයි; නැත්නම් තමන් මේ ගැන පොලීසියට පැමිණිලි කිරීමට පසුබට නොවන බව ඇය විවෘතව කිව්වා.

ඔග්ඩන් සමාගම සමග තිබුණු සාකච්ඡාවෙන් පස්සේ ඇය කෙළින්ම ගියේ ස්කොට්ලන්ඩ්යාඩ් එකට. නමුත් කීර්තිමත් පරණ සමාගමක් වුණු ඔග්ඩන් සමාගමත් ඔවුනට සිදුවුණු අපහාසය ඉදිරියේ නිහඬව සිටියේ නෑ

ඔග්ඩන් මහත්මයා ඔවුන්ගේ නීතිඥයින්ගෙන් උපදෙස් ගත්තා. ඔවුන්ගේ තීරණය වුණේ මෙයයි. මාලයේ වටිනාකම ලෙස ගිබ්සන් මෙනෙවිය කියූ පවුම් 50,000 ක මුදල ග්‍රීන්ඩ්ලේස් බැංකුවේ තැන්පත් කෙරෙනවා. ඔවුන් විසින් ඒ මුදල අවුරුද්දක කාලයක් රඳවා ගත යුතුයි. සිදුවුණු වංචාව සහ නියම මුතුමාලය ඒ කාලය ඇතුළත සොයා ගැනීමට නොහැකි වුණොත්, ඒ මුදල සම්පූර්ණයෙන්ම ඇයට හිමිවෙනවා. බැංකුව මගින් ඒ මුදල ඇයට භාරදිය යුතුයි.

ඒක ඉතාම සාධාරණ පියවරක්. එහෙම නේද? ඊටත් වඩා මොනවා කරන්නද? ඒ වගේමයි මෙතැන තිබුණු අභිරහසත්. සැබෑ මුතුමාලයට මොකද වුණේ?

සැබෑ මුතුමාලය ගිබ්සන් මෙනෙවියගේ දෑතේ තමා තැබූ බව ඔග්ඩන් මහත්මයා දිවුරා කියා හිටිය නේ. ඊට අමතරව ඔහු බැංකුවේ පවුම් පනස්දහසක මුදලකුත් තැන්පත් කළානේ. මේ බව පුවත්පත්වල පළවුණා. එතකොට කවුරුත් මේ වංචාවෙන් ජේම්ස්





ඔග්ඩන් නිදහස් කළා. දැන් ඔවුන් කතාබහ කරන්න පටන් ගත්තේ මේ වංචාව කරන්න ඇත්තේ කවුද කියලයි.

ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට ගිබ්සන් මෙනෙවිය මේ පැමිණිල්ල කළාම මේක භාර වුණේ මගේ මිත්‍රයා ලෙස්ට්‍රේඩ්ට. මේ ගැන මා හමු වී උපදෙස් ලබාගන්න කියලා ඔහු තමයි ඇයට උපදෙස් දීල තිබුණේ. ඔවුන් මට දැනුම් දෙද්දී හැම දෙයක්ම සිදුවෙලා ඉවරයි. පරීක්ෂණය පටන් ගත යුත්තේ කොතැනකින්ද? ඒක මට හිතාගන්න අමාරු වුණා.

ඒක සැබෑ මුතුමාලයට සෑම අතකින්ම සමාන පෙනුමක් ඇති නමුත්, වටිනාකමක් නොමැති ඉමිටේෂන් මුතුමාලයක්. මේක කොහොමද ගිබ්සන් මෙනෙවියගේ සැරසුම් කාමරයට ගියේ?. සැබෑ මුතුමාලය මේ මොහොතේ තියෙන්නෙ කා ළඟද? මුරකාරයා මත් කරන්න නිද්‍රාකාරක ඖෂධ දීලා, රීජන්ට් රඟහලට හොරෙන් රිංගූ රස්තියාදුකාරයා ගැන හිතමු. තමන් මේ කරන්නේ අවුරුදු ගණනාවක් බරපතළ වැඩ ඇතිව හිරේ යන අවදානම් කටයුත්තක් බව ඔහු දැනගෙන හිටියද? එහෙම අවදානමක් අරගෙන ඔහු හොරකම් කරන්න ගියේ, කිසිම වටිනාකමක් නැති ඉමිටේෂන් මාලයක් බව, ඔහු දැනගෙන ඉන්න නැහැ. එහෙම බලනකොට මේ සිද්ධියට පටළැවුණු එක් මෝඩයෙක් ඔහු.

මෙතැන කාරණා කටයුතු සිදු වුණු පිළිවෙළ පැහැදිලි කරගන්න මං මුලින්ම ප්‍රශ්න කළේ ගිබ්සන් මෙනෙවියට අඳින්න පළඳින්න උදව් වුණු සේවිකාව රූත් රෝලන්ඩ් මෙනෙවිය ගෙන්.

නාට්‍යයේ පළමු වැනි ජවනිකාවටත් ගිබ්සන් මෙනෙවිය මාලය පැළඳුවේ නෑ. එය කාමරයේ තිබුණා. දෙවැනි ජවනිකාවටත් මාලය පැළඳුවේ නෑ. සීනු නාදවෙලා තිරය විවෘත වෙලා දෙවැනි ජවනිකාව ඇරඹෙන කොටත්, රූත් මෙනෙවිය හිටියේ සැරසුම් කාමරයේ. ඒ වෙලාවේ තමන් මාලය තිබුණු පෙට්ටිය විවෘත කරලා මාලය අතට අරගෙන එහි ලස්සන බැලූ බව රූත් මෙනෙවිය කිව්වා.

මේ අතරේ ඇයගේ හිතේ ඇතිවුණා දෙවැනි ජවනිකාව නරඹන්න ආශාවක්. ගිබ්සන් මෙනෙවියගේ රඟපෑම නරඹන්න රූත්ට යටපත් කරගත නොහැකි ආශාවක් ඇතිවුණාලු. ඒ සඳහා ඇය සැරසුම් කාමරයෙන් පිටවී වේදිකාවට පැත්තෙන් තිබෙන

සඳලුතලයට යා යුතුයි. චාලි ශ්‍රේ ඔහුට නියමිත තැන රාජකාරියේ යෙදී සිටි නිසා, සැරසුම් කාමර තිබෙන පැත්ත ආරක්ෂා සහිතයි කියා රූත් මෙනෙවියට සිතුණලු.

"මං සැරසුම් කාමරයෙන් පිටවෙලා සඳලුතලය වෙත යන කෙටි බරාඳය දිගේ යමින් හිටියේ. එතකොට මට ඇහුණා, මට පිටිපස්සෙන් කාගේදෝ අඩි ශබ්දයක්. ඒ වෙලාවේ බරාඳයේ තිබුණේ මඳ අඳුරක්. ආපසු හැරිල බැලූ මම දුටුවා නිල්පාට ඩොමිනෝ කබායක් ඇඳ ගත්තු කෙනෙක්, ගිබ්සන් මෙනෙවියගේ සැරසුම් කාමරයට ඇතුළු වෙන්න සූදානම් වෙන බව.

ඔහුගේ මුහුණ නොපෙනුණත් මට එක්වරම හිතුණේ මේ ඇන්ඩ්‍රූ බොයිඩ් මහත්මයා විය යුතුයි කියලයි. බොයිඩ් මහත්මයා සහ ගිබ්සන් මෙනෙවිය විවාහ ගිවිසගෙන ඉන්න බව අපි කවුරුත් දැන හිටියා. ඔහු ගිබ්සන් මෙනෙවිය සමග බාල් නැටුම් දර්ශනයට පෙනී ඉන්න බව ප්‍රසිද්ධ කරුණක්. ඒකට යද්දි ඔහු හැමවිටම අඳින්නේ නිල්පාට ඩොමිනෝ කබායක්. ඒ හින්දා මට බය වෙන්න හේතුවක් තිබුණේ නෑ. ඔහු සුපුරුදු විදියට මුහුණ ආවරණය වෙන වෙස්මුහුණ පැළඳගෙනයි හිටියේ. ඔහුගේ අතේ තිබුණා රෝස මල් කළඹක්. මං බරාඳයේ ඈත කෙළවරේ සිට ඔහු දෙස බලා ඉන්න බව බොයිඩ් මහත්මයා දුටුවා. ඔහු අත වැනුවා. ඊළඟට ඔහු තමන්ගේ දකුණු අතෙන් පෙන්නුවේ වම් අතේ තිබුණු මල් කළඹ. එහෙම කරලා ඔහු ඇඟෙව්වේ තමන් එය කාමරය තුළින් තබන්න යන බවයි. එතකොට මං හිස සොලවා එය තේරුම් ගත්ත බව ඇඟෙව්වා. එතකොට ඔහු කාමරයට ඇතුළු වුණා"

ඇය මට කියූ මේ දේ කට උත්තරයක් ලෙස පොලීසියට පවසා තිබුණා. පුවත්පත් මගින් එයට විශාල ප්‍රසිද්ධියක් දී තිබුණා. තමන්ගේ කීර්ති නාමයට ඇති වූ කැළල ගැනත්, තමාට අහිමි වීමට ඉඩ ඇති පවුම් 50,000 ගැනත් ජේම්ස් ඔග්ඩන් මහත්මයාට එක්වරම සිහිවෙන්න ඇති. ඔහු තමන්ගේ නීතිඥයින් මගින් මුතු මාලය හොරකම් කිරීම සහ වංචාවක් සිදු කිරීම ගැන ඇන්ඩ්‍රූ බොයිඩ් මහත්මයාට විරුද්ධව නඩු මගට බැස්සා.

ලන්ඩනයේ විලාසිතා ලෝකයේ ප්‍රකට පුද්ගලයෙකු වුණු ඇන්ඩ්‍රූ බොයිඩ් ගැන මෙම ආරංචිය, පුවත්පත්වලට ඉතාම වටිනා ආරංචියක් වුණා. ඒවායේ පිටු ගණන් පිරුණේ එම





පුවතෙන්. කවුරුත් නොඉවසිල්ලෙන් බලාගෙන හිටියේ බොයිඩ් මේකට දෙන පිළිතුර මොකක්ද කියලයි. නමුත් ඔහුගෙන් ලැබුණු පිළිතුර ගැන කවුරුවත් සෑහීමට පත්වුණේ නෑ.

"රූත් රෝලන්ඩ්ට වෙලා තියෙන්නේ ලොකු වැරැද්දීමක්" බොයිඩ් කීවා. "එදා රාත්‍රියේ මං ගිබ්සන් මෙනෙවියට රෝස මල් කළඹක් අරගෙන ආවෙ නෑ. රෝස මල් නෙමෙයි; මොනම වර්ගයකවත් මල් අරගෙන ආවෙ නෑ. ඩොමිනෝ කබායක් ඇඳගත්තු කෙනෙක් ගිබ්සන් මෙනෙවියගේ කාමරයට ඇතුළු වුණු බවත් රූත් සමහරවිට දකින්න ඇති. නමුත් ඒ මම නම් නෙමෙයි. මං කොහොමද ඔය වෙලාවෙ මල් කළඹක් අරන් සැරසුම් කාමරයට යන්නෙ? දෙවැනි ජවනිකාවට සීනුව වදින්න හුඟක් කලින් ඉඳන් තමයි මං වේදිකාවෙ හිටියෙ. එතකොට තිරය විවෘත කරලත් නෑ. මං එතැන හිටී බව දුටු අය දහදෙනෙකු නම් කරන්න මට පුළුවනි. අනික දෙවැනි ජවනිකාව අවසන් වෙලා තිරය වැහෙන තුරු මං එතැනින් පිටවෙලා ගියේ නෑ."

වොට්සන් ඔහු කියූ පුද්ගලයන් වෙන් වෙන්ව හමුවෙලා මං ඔවුන්ගෙන් විමසා බැලුවා. දහදෙනෙකු ඉන්නවා යයි බොයිඩ් කියූ බව ඇත්ත. නමුත් ඒ දහදෙනාම කිව්වේ එක දෙයක්. දෙවැනි ජවනිකාවට බොයිඩ් සිටි බව සහතිකයිලු. නමුත් දෙවැනි ජවනිකාව පටන් ගන්න කලින් ඉඳන් ඔහු වේදිකාව මත හිටියද කියල, දිවුරා සහතික වෙන්න ඔවුනට පුළුවන් කමක් නැලු. තවත් කාරණයක් මට හැකිවුණා හොයා ගන්න. ඒ තමයි මේ ජවනිකාවට අමතර නළුවන් රාශියක් හිටියත්, නිල්පාට ඩොමිනෝ කබායක් ඇඳගත්තු අය ඉඳල තියෙන්නෙ එකම එක්කෙනයි. ඒ ඇන්ඩ්‍රූ බොයිඩ්.

තමන්ගෙ පෙම්වතා මෙවැනි වංචාවකට කොහොමටවත් සම්බන්ධ නැහැ කියලයි රෙබෙකා ගිබ්සන් මෙනෙවිය සහතික කළේ. ඔහු ගැන ඇයට අංශු මාත්‍රයක සැකයක් තිබුණේ නැහැ.

නමුත් ඔග්ඩන් මහත්මයා දැරුවේ වෙනත් අදහසක්.

"හෝම්ස් මහත්මයා. මේ මුතුඇට ගැනත් මාලයේ ගාංචුව ගැනත් ඉතාම හොඳින් දැනගෙන හිටියේ වෙන කවුද? ඇන්ඩ්‍රූ බොයිඩ් මහත්මයා පමණයි. සැබෑ මාලය වෙනුවට ඉමිටේෂන් මාලයක් ආදේශ කරන්න නම්, එහෙම එකක් සෑදීමට සැබෑ මාලය ගැන හොඳ දැනුමක් තිබිය යුතුමයි. ගිබ්සන් මෙනෙවිය ළඟින්ම

සිටි නිසා බොයිඩ්ට මේ දැනීම ලැබී තිබුණා. ඒ දැනුම උපයෝගී කරගෙන ඔහු ඉමිටේෂන් මාලයක් සාදවා ගෙන තිබුණා. රූත් මෙනෙවිය පැහැදිලිවම දුටුවා බොයිඩ් සැරසුම් කාමරයට පිවිසුණු ආකාරය. ඒ මොකටද? සැබෑ මාලය වෙනුවට ඉමිටේෂන් මාලය ආදේශ කරන්න."

"වාලි ග්‍රේ ගේ බීර ජෝගුවට නිදි බෙහෙත් කලවම් කළ පුද්ගලයා ගැන ඔබ මොනවද හිතන්නෙ?" මං ජේම්ස් ඔග්ඩන් ගෙන් විමසුවා.

"කවුරුත් තේරුම් ගත්ත විදියට ඔහුත් සොර සිතින් ආව කෙනෙක් තමයි" ඔග්ඩන් කිව්වා. "නමුත් බොයිඩ් කර තිබූ වංචාවට ඔහුත් රැවටුණා"

මීළඟට මං ප්‍රශ්න කළේ දොරටුවේ මුරකරු වූ වාලි ග්‍රේ ගෙන්. ලොකු උගත්කමක් නොතිබුණත් ඔහු රීජන්ට් රඟහලේ සේවයට ඇවිත් තියෙන්නේ ගැටවර කොලුවෙකු කාලෙ. ඉතාම අවංක පුද්ගලයෙකු ලෙස ඔහු ප්‍රසිද්ධයි. ඉඳහිට බීර ස්වල්පයක් පානය කළත් ඔහු බේබද්දෙකු නොවන බව රඟහලේ කළමනාකරු මා සමග කිව්වා. සිදුවූ හැමදෙයක් ගැනම ඔහුට පැහැදිලි මතකයක් තිබුණා.

"බොයිඩ් මහත්මයා රඟහලට පිවිසුණු වෙලාව ඔබට මතකද ග්‍රේ?"

"ඔව් මහත්මයා. ඔහු රඟහලට ආවෙ දෙවැනි ජවනිකාව පටන් ගන්නත් සෑහෙන්න කලින්"

"ඔබට ඒක හොඳට මතකයි?"

"හොඳට මතකයි. ඒ මොකද ඔහු නැවතිලා මා එක්ක වචන කීපයක් කතා කරල නේ ගියේ."

"එතකොට ඔහුගේ අතේ ඒ වෙලාවෙ තිබුණේ මොන වර්ගයේ මල් පොකුරක්ද?"

"මොනව අහනවද මහත්මයා. ඔහුගේ අතේ කිසිම මල් පොකුරක් තිබුණෙ නෑ. සැරසුම් කාමරේ තිබී හමුවුණාය කිව රෝසමල් කළඹ මා දුටුවා. ඒක අලංකාර එකක් බව ඇත්තයි. නමුත් එහෙම දෙයක් බොයිඩ් මහත්මයාගෙ අතේ තිබුණෙ නෑ. ඒ ගැන මට දිවුරා සහතික වෙන්න පුළුවන්"

එහෙම නම් මල් කළඹක් අරගෙන රංග ශාලාවට ආව තැනැත්තා කවුද? මං ඒ ගැන කල්පනා කළා. ඔහු කොවෙන්ට් උද්‍යානය තරම්





ඈතකින් මල් කළඹක් අරගෙන ආවද? ඒ ප්‍රශ්නය මට මතු වුණා. එහෙමත් නැත්නම් මල් විකිණීමට තිබෙන දහසකුත් එකක් මල් ශාලාවකින් මිලදී ගත්තද? දවස් කිහිපයක් ගත වී තිබුණු නිසා මේක නිශ්චිතව දැන ගැනීම අමාරු කාරණයක්. මීට අමතරව රීජන්ට් රඟහල සමීපයේත් පාර දෙපැත්තේ මල් විකුණන තරුණියන් ඉන්නවා. බොහොම ඈතක සිට විදින හීයක් ඉලක්කයට වදින්නේ කලාතුරකින්. ඒ වුණත් මට හිතුණා උත්සාහයක් දරල බලන්න. මං සාක්කුවේ දමා ගත්තේ ඇන්ඩෘ බොයිඩ් මහත්මයාගේ සමීප ඡායාරූප දෙකක්. මේ දෙක කෝණ දෙකකින් ගත් පැහැදිලි ඡායාරූප.

මුලින්ම මගේ අවධානය යොමු කළේ රෝස මල් කළඹ පමණක් අලෙවි කළ වෙළෙන්දියන් වෙත. මා ගිය තුන්වැනි තැනින් මට සාර්ථක ප්‍රතිඵල ලැබුණා. ඇගේ රෝසමල් කළඹට නොසිතූ ප්‍රසිද්ධියක් ලැබීම ගැන ඇය සිටියේ සතුටෙන් මෙන්ම ආඩම්බරයෙන්.

"මගේ රෝසමල් කළඹ ගැන ප්‍රශ්න කරන්න, කවුරුත් හෝ කොයි වෙලාවක හරි එන බව මං දැනගෙන හිටියා."

"ඔබ අලෙවි කරන්නේ කොහෙන් ගෙනෙන මල් ද?" මං ඇහුවා.

"මගේ අයියා ඒවා අරගෙන එන්නේ කොවෙන්ට් උද්‍යානය පැත්තේ අලෙවිසලකින්." ඇය කිව්වා. "වේවැල් කූඩවල ගෙනෙන ඒවා මල් කළඹක් ලෙස සකසන්නේ මම"

"එදා අර රෝසමල් කළඹ මිලට ගත් තරුණයා ගැන ඔබට මතකද?"

"මොකද මහත්තයා මතක නැත්තේ? මට හොඳට මතකයි. ඒ මොකද ඒ ඉලන්දාරියා ඇඳුම් ඇඳගෙන සිටියේ අන්ත දුප්පත් විදියට. එහෙම අය කවදාවත් මේ වගේ ලස්සන ලොකු මල් පොකුරු මිලට ගන්නෙ නෑ. ඉඳහිට ගත්තොත් මල් දෙකක් තුනක් විතරයි. බැලූ බැල්මට මට හිතුණේ ඔහු රැකියාව අහිමි වී ඉන්න කම්කරුවෙකු කියලයි. එහෙම කෙනෙක් කොහොමද වටිනා මල් කළඹක් මිලට ගන්නේ? මට එකසැරයක් හිතුණා ඔහු මේක මිලට ගන්නේ වෙන මහත්මයෙකු වෙනුවෙන්ද කියලා. ඒ මොකද සමහර වෙලාවට මහත්වරු තමන්ගේ සේවකයන් එවනවානෙ මල් ගෙනියන්න.

"මේ රෝසමල් කළඹ නම් සිලිං හතරක් වෙනවා" මං ඔහුට කිව්වේ ඔහු එච්චර මුදලක් වියදම් කරාවිද සැක නිසා. එහෙම අය වෙනුවෙන් කානේෂන් හා ඩේසි මල් යෙදූ මිල අඩු මල් පොකුරු තියෙනවා. "අර අතන තියෙන එක සිලිං එකහමාරයි. කැමති නම් ඒක ගන්න" මං කිව්වා. "කමක් නෑ. රෝස මල් කළඹ ම දෙන්න" කියූ ඔහු හෙට්ටු කරන්නේ නැතුව සිලිං හතර ගෙවලා මල් ටික අරගෙන ගියා."

වොට්සන් මං එතකොට ඇන්ඩ්රූ බොයිඩ් මහත්මයාගේ ඡායාරූප අරගෙන ඇයට පෙන්නුවා.

"මෙන්න මෙයා නේද ඔබෙන් මල් මිලට ගත්තු තරුණයා?"

"පිස්සුද මහත්තයා. මෙයා නෙමෙයි" ඇය කිව්වා. "ඒ ගැන මට දිවුරන්න පුළුවනි. මෙයා හැඩකාර ඉලන්දාරියෙක් නේ. නළුවෙක් වගේ. මල් අරගත්තු එක්කෙනාගේ මුහුණ පුරා වැවුණු රැවුළක් තිබුණා. අනික ඇස් දෙක රතු පාටයි. ඇස් එළියට නෙරා ඇවිත් තිබුණේ බේබද්දෙකුගේ වගේ. මට නම් හොඳටම විශ්වාසයි ඒ මිනිහා දවසේ පඩියට කුලී වැඩ කරන කෙනෙක්"

"ඒක ඇන්ඩ්රූ බොයිඩ් ගේ නිදහසට ප්‍රමාණවත් සාක්ෂියක්." හෝම්ස් කීය. "දැන් තමයි ගැටලුව මතුවෙන්නේ වොට්සන්. චාලි ග්‍රේ ගේ සහ මල් වෙළෙන්දිය ගේ සාක්ෂි වල හැටියට, හොරකම කර තිබෙන්නේ අර රස්තියාදු කාරයා විය යුතුයි. මේ තක්කඩි වැඩේ සඳහා ඔහු කොහෙන් හරි නිල්පාට ඩොමිනෝ කබායක් හොයාගෙන තිබෙනවා. එය කුලියට ගත්තද, මස්සවා ගත්තද නැත්නම් කාගෙන් හරි සොරකම් කර ගත්තාද අපි දන්නේ නෑ. නිද්‍රාකාරකය දැමූ බීර ග්‍රේට සැපයීමෙන්ම, අපරාධකාරයා අර රස්තියාදුකාරයා බව තහවුරු වෙනවා.

නමුත් ගැටලුව අභිරහසක් බවට පත් වෙන්නෙ මෙතැනදි. ඔය තරම් මහන්සිවෙලා සොරකම් කරගත්තු මාලෙ ඔහුට පරෙස්සම් කරගන්න බැරි වෙනවා. ඒක ඔහු අතින් ගිලිහී වැටෙනවා"

"නමුත් ඒක නිකම්ම වැටුණා නෙමෙයිනේ හෝම්ස්" මම කීවෙමි. "දොරටු පාලකයා සමග ඇතිවුණු දරුණු සටනේ ප්‍රතිඵලයක් හැටියටයි ඒක හොරාගෙ අතින් ගිලිහෙන්නෙ"

"ඔව් ඔබ කියන දේත් ඇත්ත" හෝම්ස් කිය. "කොහොම වුණත් හොරාටත් අහුවෙලා තියෙන්නෙ සැබෑ මාලය නෙමෙයි;





ඉමිටේෂන් මාලය. දැන් අපට ප්‍රශ්නයක් මතු වෙනවා. එකක් නෙමෙයි ප්‍රශ්න කීපයක්. සැබෑ මුතුමාලයට සාකල්‍යයෙන්ම සමාන බොරු මුතු මාලයක් හැදුවේ කවුද? කොහේදිද? ඒ බොරු මාලය සැබෑ එකට ආදේශ කළේ කොයි වෙලාවෙද? කවුරුන් විසින්ද?"

"පැනල ගිය රස්තියාදුකාරයා සොයා ගත්තා නම් මේ ප්‍රශ්න කීපයකටම පිළිතුරු ලැබෙනවා නේද හෝම්ස්?"

"ඔබට හිතෙන්නෙ එහෙමද? ලෙස්ට්‍රේඩ්ටත් හිතිල තිබුණේ ඔය දේමයි." හෝම්ස් කීය. "ඔහු මල් වෙළෙන්දිය දුන් විස්තර සහ චාලි ග්‍රේ දුන් විස්තර අනුව චිත්‍ර සකස් කරලා පුවත්පත් වල පළ කළා. රීජන්ට් රඟහල අවට තැබෑරුම්වලින් ඔහු විමසා බැලුවා මේ වගේ කෙනෙකු බීර මිලදී ගත්තද කියලා. එක් තැබෑරුම් කාරයෙක් කිව්වලු ඔහු හැමදාම ඔය වගේ මිනිස්සු පන්සීයකට බීර විකුණනවා කියල. විහිළුවට කිව්වා වුණත් ඒකෙත් ලොකු ඇත්තක් තියෙනවා. මාලය හෝ රස්තියාදු කාරයා ගැන හරි ආරංචියක් දෙන කෙනෙකුට පවුම් 500 ක තෑග්ගක් දෙන බව ගිබ්සන් මෙනෙවිය ප්‍රසිද්ධියට පත් කළා. නමුත් සතුටුදායක ප්‍රතිඵලයක් ලැබුණේ නෑ. මේ අතරේ තමයි ජේම්ස් ඔග්ඩන් මහත්මයා මා සොයාගෙන ආවේ.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා" ඔහු කිව්වා. "මං මුහුණ දී තිබෙන අර්බුදය ඔබ දැනටමත් දන්නවා ඇති. නැති වූ මුතුමාලය ගැන සෙවීම රෙබෙකා ගිබ්සන් මෙනෙවිය දැනටමත් ඔබට භාර දී ඇති බව මට දැනගන්න ලැබුණා. මම සිටින්නේ ඇයට විරුද්ධ පාර්ශ්වයේ. නමුත් ඇයට වගේම මටත් එකම ප්‍රශ්නය වෙලා තියෙන්නේ, සැබෑ මුතුමාලයට සිදු වුණේ මොකක්ද කියන එකයි. ඒක සෙවීමට උත්සාහ කරන මෙන් මං ඔබෙන් ඉල්ලා හිටියොත් ඒක ඔබට ප්‍රශ්නයක්ද? ඒ කියන්නේ ඔබේ වෘත්තීය සදාචාරය වගේ ප්‍රශ්නයක් ඇතිවෙනවද?"

"ඔග්ඩන් මහත්මයා. මං එක් පාර්ශ්වයක් වෙනුවෙන් පෙනී සිටින අධිනීතිඥයෙක් නෙමෙයි. මං කරන්නේ ගැටලු විසඳීම සහ අභිරහස් හෙළි කිරීම පමණයි. එහිදී කාට හරි අවාසියක් වෙනවද වාසියක් වෙනවද කියන කරුණ ගැන මං තැකීමක් කරන්නේ නෑ. මාලය සොරකම් කිරීම ගැන කරුණු හෙළි කිරීමට මට හැකි වුණොත් එයින් ඔබටත් ප්‍රයෝජනයක් ලැබේවි."

"බොහොම ස්තුතියි හෝම්ස් මහත්මයා" ඔග්ඩන් කිව්වා. "මේ මාලය වෙනුවෙන් මං පවුම් 50,000 ක මුදලක් ග්‍රීන්ඩලේස් බැංකුවේ තැන්පත් කර ඇති බව ඔබට ආරංචිත් ඇති. අවුරුද්දක් යාමට පෙර මේ ගැටලුව විසඳා ගැනීමට නොහැකි වුණොත් මට ඒ මුදල අහිමිවෙනවා. ඊට පෙර මේ ගැටලුව විසඳන්න ඔබට හැකිවේවා කියල මං ප්‍රාර්ථනා කරනවා.

ඒ කාලය තුළ ඔබ මේ ගැටලුව විසඳුවොත්, ඔබ ඉල්ලුවත් නැතත් මං ඔබට ත්‍යාගයක් පිරිනමනවා. ඒක ඔබ අයකරන වෘත්තීය ගාස්තුවට අඩුවේවිද වැඩිවේවිද කියන කරුණ මට කියන්න බෑ. මේ ගැටලුව විසඳීමට මොනවද ඔබට මගෙන් උවමනා කරන උදව්?"

"මහත්මයා මං කැමතියි ඔබේ ආභරණ වෙළෙඳසල සහ ඒවා සාදන කර්මාන්ත ශාලාව වෙත නෙත් යොමු කරන්න. ඒ තැන්වල ඊකියාව කරන සේවකයන් සමගත් කතාබහ කිරීම අත්‍යවශ්‍යයි. ඒ ගැන ඔබේ විරෝධතාවයක් නැහැ කියල මං හිතනවා?"

"කොහොමටවත් නෑ. වෙන මොනවද ඔබට උවමනා උදව්?"

"දැනට මෙපමණයි. යම් විදියකින් වෙනත් උදව් අවශ්‍ය වුණොත් මං ඔබට දැනුම් දෙන්නම්. දැන් මං සඳහන් කළ පුද්ගලයන් හමුවීමටත් ඒ තැන් පරීක්ෂා කිරීමටත් අවස්ථාවක් ලැබෙන්නේ කවදාටද? කොහොමද?"

"ඔබට හෙටම පුළුවනි ඒ තැන් පරීක්ෂා කරල බලන්න. ඒ වගේම ඔවුන් හමුවන්න. හෙට උදේ ඔබ අපේ ස්වර්ණාභරණ අලෙවි සලට ආවොත් මට පුළුවනි ඒ සඳහා පහසුකම් සලස්වන්න" එහෙම කියූ ජේම්ස් ඔග්ඩන් මගෙන් සමුගෙන පිටවී ගියා.

පසුවදා උදේ මං බොන්ඩ් වීදියේ පිහිටි ඔවුන්ගේ ආභරණ මාලිගයට ගියා. මා සාදරයෙන් පිළිගත් ඔග්ඩන් මහත්මයා මාව භාරදුන්නේ එහි ජ්‍යෙෂ්ඨ කළමනාකරුවාට. එම ක්ෂේත්‍රයේ ප්‍රවීණයකු වුණු ඔහු කාරුණික පුද්ගලයෙක්. දියමන්ති, මුතු සහ අනෙකුත් මැණික් වර්ග ගැනත් රන්, රිදී ප්ලැටිනම් ආදී ලෝහ වර්ග ගැනත් ඔහු මා දැනුම්වත් කළා.

මගේ ගමනේ වැදගත්ම කොටස වුණේ ඔග්ඩන්ලගේ කර්මාන්ත ශාලාව දැක බලාගැනීම සහ එහි ශිල්පීන් හමුවීම. හදිසියට කළ යුතු ආභරණවල අලුත්වැඩියා කටයුතු ආදිය බොන්ඩ් වීදියේ





ඔවුන්ගේ ප්‍රදර්ශනාගාරයේ පිටුපස කොටසේ පිහිටි කුඩා තැනක තමයි සිදු කෙරුණේ. නමුත් ඔවුන්ගේ ප්‍රධාන කර්මාන්ත ශාලාව පිහිටා තිබුණේ වෙස්ටටන් වීදියේ. රිදී රත්රන් ආදී ලෝහ වර්ග උණු කොට අච්චුවලට වත් කෙරෙන නවීන යන්ත්‍ර සූත්‍ර, කැපීම් ඔප දැමීම් කෙරෙන යන්ත්‍ර තිබුණොත් එහි. ආභරණ සැලසුම් කිරීමේ යෙදුණු නිර්මාණ ශිල්පීන් සඳහා වෙන්වුණු කලාගාරයක් වැනි අංශයකුත් එහි තිබුණා. මෙම ස්ථානයේ ප්‍රධානියා වුණු ටිම් මැකින්ටොෂ් හමුවීමටත් මට අවස්ථාව ලැබුණා. වොට්සන් ඔබට මතක ඇති මේ මැකින්ටොෂ් ගැන මං මුලින්ම සඳහන් කළා. ඔහු තමයි ඔග්ඩන්ට ඉන්න විශ්වාසවන්තම සේවකයා. එංගලන්තයේ මෙම ක්ෂේත්‍රයේ ඉන්න ප්‍රමුඛයෙකු වන මැකින්ටොෂ් තමයි ගිබ්සන් මෙනෙවියගේ මාලය පොටවල් ගණන අඩු කරලා යළි සැකසීම කරල තිබුණේ. ගිබ්සන් මෙනෙවියගේ මාලය ගැන මං ඔහු සමගත් සෑහෙන වෙලාවක් කතා බහ කළා. ඊට පස්සේ තමයි මං එතැනින් පිටවෙලා ආවෙ.

කරුණු රාශියක් මගේ ඔළුවට ආවත් ඒවා හැම එකක්ම වගේ එකට පටළැවිලයි තිබුණේ. සමහර කාරණා බොහොම පැහැදිලියි. සමහර ඒවා නොපැහැදිලියි. ඒ වගේම මට සැක සිතෙන තැන් තිබුණා. කල්පනා කරන්න කරන්න ඒ අවුල් තව තවත් පැටළුණා මිසක් ලිහුණේ නැහැ. මෙවැනි වෙලාවට මවිසින් කළ යුතු දේවල් දෙකක් මං හඳුනාගෙන තිබෙනවා. එයින් එකක් තමයි රසායන විද්‍යා ක්ෂේත්‍රයට පිවිසී මං කැමති රසායන ද්‍රව්‍යයක් සංශ්ලේෂණයට උත්සාහ දැරීම. අනික තමයි සංගීත ක්ෂේත්‍රයට පිවිසී දක්ෂ සංගීතඥයෙකුගේ මං කැමති වාදනයක් මගේ වයලීනයෙන් වාදනය කරන්න උත්සාහ දැරීම.

ඔබ දන්නවනේ වොට්සන්, රසායන විද්‍යාවෙ මං කැමතිම අංශය කාබනික රසායන විද්‍යාවෙ ඇරෝමැටික සංයෝග බව. බෙන්සීන් අණුවක තිබෙන හයිඩ්‍රජන් පරමාණුවලට අයඩීන් පරමාණු ආදේශ කිරීම තමයි, කාලෙක ඉඳල මගේ ඉලක්කය වෙලා තිබුණේ. සූර්යාලෝකය වැටෙන එක වැළැක්වූවාම කාමර උෂ්ණත්වයේදී පවා ක්ලෝරීන් සහ බ්‍රෝමීන් හයිඩ්‍රජන් පරමාණු වලට පහසුවෙන් ආදේශ වෙනවා. නමුත් ඇයි අයඩීන් ඒ විදියට සම්බන්ධ වෙන්නෙ නැත්තේ? මං නොයෙක් උත්ප්‍රේරක යොදමින්

මේ කටයුත්ත සපුරාගන්න උත්සාහ කළා. නමුත් සාර්ථක වුණේ නෑ. මං ඒක අත්හැර දැම්මා.

ඔන්න එතකොටයි මට අහන්න ලැබුණේ සාන්ත ජේම්ස් ශාලාවෙ සරසටේගෙ සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට කටයුතු සූදානම් බව. හැම දෙයක්ම අත්හැර දමලා මං ගියා ඒ සංගීතයට සවන් දෙන්න. ඒක නම් ඉතාම මියුරු ප්‍රසංගයක්. වයලීන වාදනයට ස්පාඤ්ඤ ජාතිකයන් දක්ෂ බව ප්‍රසිද්ධ කරුණක්. සරසටේ ඊට දක්වන්නේ පුදුමාකාර දක්ෂ බවක්. ඒකට කන්දීලා ගෙදර ආවාම මගේ හිතට ලොකු සැහැල්ලුවක් දැනුණා. හිතේ තිබුණු කැලඹිලි ගතිය ආතතිය නැතිවී ගිහින් මට හොඳට නින්ද ගියා. පහුවදා උදේ හයට විතර මට ඇහැරුණා. උණුසුම් කෝපි පෝච්චියක් ගෙන්වාගෙන ඒක බිබී මං කල්පනා කළා. එතකොටයි මේ ගැටලුවේ පැටළුණු තැන් ලිහෙන හැටි මට පෙනුණේ.

ඔබට කාරණා තේරුම් ගැනීම පහසුවෙන්න මං ඒවා සරලව පෙළ ගස්වන්නම්. මෙතැන මේ වංචාව කරන්න පුළුවන් පුද්ගලයන් ඉන්නේ හතර දෙනයි. ඒ කවුද?

පළමුවෙන්ම ඉන්නවා ජේම්ස් ඔග්ඩන් මහත්මයා. ඔහුට තමයි ඒක පහසුවෙන්ම කරන්න පුළුවන්. නමුත් දශක ගණනක් මේ ක්ෂේත්‍රයේ සිටි ඔහු හොඳටම දන්නවා සැබෑ මුතු වෙනුවට ව්‍යාජ මුතු යෙදුවොත්, ඒක ඉක්මනින් හෝ පසුව හෝ අහුවෙන බව. ඉතාම විශිෂ්ට කීර්ති නාමයක් හිමි කරගෙන සිටින ඔග්ඩන් නාමය බරතපළ අවදානමකට ලක් කිරීමේ කටයුත්තක් ඔහු කරාවිද? අනික් කාරණය තමා රෙබෙකා ගිබ්සන් මෙනෙවියට ලබාගත හැකි විදියට පවුම් 50,000 බැංකුවක තැන්පත් කරන්න ඔහු පමාවුණේ නෑ; මැලිවුණේ නෑ. එතකොට ඔහු මුලින්ම නිදහස් වෙනවා.

ඊළඟට ඉන්නවා ඇන්ඩ්‍රූ බොයිඩ් තරුණයා. රෝස මල් කළඹ මිලට ගත්තෙ ඔහු නොවන බවට සහතිකයි. ඒ නිසා නිල්පාට ඩොමිනෝ කබායක් ඇඳගෙන, රූත් පිටවුණාට පස්සේ සැරසුම් කාමරයට ගියේ ඔහු නෙමෙයි.

ඊළඟට මේ කාරණයත් හොඳින් හිතට ගන්න. දෙවැනි ජවනිකාව ඇරඹෙන්න තිරය විවෘත කරන්න හොඳටම ළං වෙලා, තත්පර ගණනකට කලින්, ගිබ්සන් මෙනෙවිය ඇගේ සැරසුම් කාමරයට ගිහින් තියෙනවා. ඇගේ වචන වලින්ම කිව්වොත්





ඔග්ඩන් මහත්මයා අතින් ලැබුණු මාලය සහිත පැකට්ටුව ඇය ඒ මොහොතේ විවෘත කරල තියෙනවා. ඊට පස්සේ මාලය භාර වුණේ රූත් රෝලන්ඩ් මෙනෙවියට. නමුත් මාලය අතින් අල්ලා බැලූ රූත් කාමරය ඇතුළෙ ඉන්න ඇත්තෙ තත්පර දහයක කාලයක් පමණයි. ඇය කාමරයෙන් පිටවෙලා යාර කිහිපයක් යද්දි ඇය දුටුවා නිල් කබාකාරයා රෝස මල් කළඹක් අරගෙන කාමරයට ඇතුළුවුණු හැටි.

මල් වෙළෙන්දියගේ සාක්ෂියෙනුත් චාලි ග්‍රේ ගේ සාක්ෂියෙනුත් වැදගත් කරුණක් තහවුරු වෙනවා. ඒ තමයි නිල් කබාකාරයා ඇන්ඩ්‍රූ බොයිඩ් වෙන්න බැරි බව. එතකොට අපට තහවුරු වෙනවා ඉමිටේෂන් මාලය හොරකම් කළ පුද්ගලයා වෙනිං කවුරුවත් නෙමෙයි; අර රස්තියාදු කාරයා බව.

මේ කාරණා හිතට ගත්තොත් ඔබට පුළුවනි එක්තරා වැදගත් කාරණයක් වටහා ගන්න. ඒ තමයි සැබෑ මාලය සොරකම් කර ඒ වෙනුවට ඉමිටේෂන් මාලයක් රස්තියාදුකාරයා එන්න කලින් එතැනට දමන්න, බොයිඩ් තරුණයාට තත්පර දහයක් ප්‍රමාණවත් නොවෙන බව. අනික පහුවෙලා ඒ සොරකම කරන්නත් ඔහුට අවස්ථාවක් නෑ.

බොහොම දෙනෙක් සැක කරලා තිබුණා මේක කරන්න ඇත්තේ රූත් රෙනෝල්ඩ් මෙනෙවිය වෙන්න ඇති කියලා. මේ කිසිම උගත් කමක් නැති, මෝඩ පහේ අවුරුදු විස්සක කෙල්ලකට පුළුවන්ද, මේ ආකාරයේ සංකීර්ණ ආදේශ කිරීමක් සැලසුම් කර ක්‍රියාත්මක කරන්න? ගිබ්සන් මෙනෙවියගේ මුතුමාලයට සෑම අතකින්ම සමාන මුතුමාලයක් සාදවා ගැනීමත් ඉතාම අවදානම් කටයුත්තක්. ඒ නැතත් එහෙම දේකට යන විශාල වියදමක් මේ සුළු පඩියක් ලබන කෙල්ලකට දරන්න පුළුවන්ද? බැහැ. එතකොට ඉතිරි වෙන්නෙ එක්කෙනයි. එහෙම නේද වොට්සන්?"

"ඔව්. නමුත් කවුද ඒ එක්කෙනා?" මා විමසුවේ නොඉවසිල්ලෙනි. එහෙත් හෝම්ස් ඊට පිළිතුරු දුන්නේ තත්පර කිහිපයක නිහඬතාවයකින් පසුවය.

"ඔව්. ඒ එක්කෙනා තමයි නිසැකවම ........... විම් මැකින්ටොෂ් මහත්මයා. ඔග්ඩන් ආයතනයේ විශ්වාසවන්තම සේවකයා" හෝම්ස් කීවේ ජයග්‍රාහී ලීලාවෙනි. "තමන්ගේ සමාගමට

අලුතෙන් සකස් කිරීමට භාරදුන්නු මුතුමාලයට සෑම ආකාරයකින්ම සමාන විධියේ ඉමිටේෂන් මාලයක් හදන්න, අවස්ථාව, දැනුම, දක්ෂකම තියෙන්නේ වෙන කාටද?

මෙම ආභරණ ක්ෂේත්‍රයේම ඉන්නා නිසා ඔහුට බොහොම පහසුවෙන් පුළුවනි, ව්‍යාජ මුතු ඇට ලබාගන්න, කාගේවත් සැකයකට ලක් නොවී. ඊළඟට සැබෑ මාලයේ තිබෙන විධියේම ගාංචුවක්, සැබෑ මාලයේ විධියටම මුතු ඇට පේළි සකස් කරන්න පුළුවන් වෙන කාටද? මේ රටේ ඉන්න දක්ෂම ආභරණ නිර්මාණකරුවෙකු වන ඔහු, මේක තමන්ගේ ගෙදරදීම කරන්න ඇත්තේ කිසිම අවධානමකට ලක් නොවී."

"ඊළඟට මොකක්ද වුණේ?"

"ඊළඟට තමයි ඔහු බොහොම දක්ෂ ලෙස හිතා බලලා සැලැස්මක් සකස් කරන්න ඇත්තේ. ගිබ්සන් මෙනෙවිය ප්‍රධාන නිළිය ලෙස රඟපෑ මේ රෝමියෝ ජුලියට් නාට්‍යය එක දිගට සති ගණනාවක් රඟ දැක්වුණා. ඔහු ප්‍රේක්ෂකාගාරයේ ඉඳල නාට්‍යය නරඹන්න ඇති දෙතුන් වතාවක්. ප්‍රේක්ෂකාගාරයෙන් පිටත රස්තියාදුකාරයෙක් වගේ ගැවසෙන්න ඇති. මීට අමතරව වේදිකාව පිටුපස කොටසට - සැරසුම් කාමර වලටත් යන්න උත්සාහ කරන්න ඇති. මේ හැම අවස්ථාවකදීම ඔහු ඉන්න ඇත්තේ වෙස් මාරු කරගෙන. මේ අදාළ පුද්ගලයන් ගැන ඕපාදූප, තොරතුරු එක් රැස්කර ගන්න ඇති.

අලුතෙන් සකස් කළ මුතුමාලය ඔග්ඩන් මහත්මයා ගිබ්සන් මෙනෙවියට ගෙනැත් දෙන දිනය ගැන, මැකින්ටොෂ්ට හොඳ වැටහීමක් තිබුණා. අවශ්‍ය නම් දිනය ටිකක් එහාට දාගන්න වුණත් මැකින්ටොෂ්ට බැරිවෙන්නෙ නෑ. ඒ නිසා හැම කටයුත්තක්ම හොඳින් අධ්‍යයනය කරන්න ඔහුට කාලය තිබුණා.

මෙම නාට්‍යයේ නිල වශයෙන් නළු තනතුරක් නොලැබුණත් ඇන්ඩ්‍රූ බොයිඩ් අමතර නළුවෙකු වීම හොරාට වාසියක් වුණා. ගිබ්සන් මෙනෙවියගේ පෙම්වතා ලෙස බොයිඩ් පිළිගැනුණු නිසා ඔහුට වේදිකාව මධ්‍යයටත්, එය පිටුපසටත් සැරසුම් කාමර වලට යෑමටත් බාධාවක් තිබුණෙ නෑ. දෙවැනි ජවනිකාවෙදි ගිබ්සන් මෙනෙවිය රඟපාන්නෙ දුක්ඛිතව ඉන්නා තරුණියකගේ චරිතය. ඇය ඒ වෙලාවෙ ආභරණ කිසිවක් පළඳින්නෙ නෑ. එපමණක්





නොවෙයි. නිල්පාට කබායක් ඇඳගත්තු බොයිඩ් ඉන්නෙත් ඒ අසලම. සැරසුම් කාමරය ඒ වෙලාවෙ හිස්.

සමහරු කියන්න ඉඩ තියෙනවා රූත් මෙනෙවිය මුදලක් ලබාගෙන හොරාගෙ උදව් කාරයෙකු හැටියට වැඩ කරන්න ඇති කියල; ඒ නිසයි ඇය සැරසුම් කාමරයේ දොර යතුරු නොදමා අනාරක්ෂිතව තැබුවෙ කියල. අනික අර නිල්පාට ඩොමිනෝ කබායෙ සහ රෝස මල් කළඹෙ කතාව ඇය සහ මැකින්ටොෂ් අතර කල් තබා ඇති කරගත් සැලැස්මක් කියල. නමුත් ඒක එහෙමමයි කියල මං හිතන්නෙ නෑ.

තක්කඩියා බොහොම දක්ෂයෙක්. ඔහුට මේ වගේ දුර්වල උදව්කාරයෙකු අවශ්‍යත් නෑ. අනික රූත් වගේ කෙල්ලක හවුල් කර ගැනීමත් අවදානම් වැඩක් බව ඔහු තේරුම් ගන්න ඇති.

නිල්පාට ඩොමිනෝ කබාය ආවෙ කොහෙන්ද කියන කරුණ හොයා ගන්න පොලීසිය ලොකු උත්සාහයක් දැරුවා. නමුත් ඒක සාර්ථක වුණේ නෑ. මැකින්ටොෂ් විවාහකයෙකු බව මට දැනගන්න ලැබුණා. මාලය ගෙදරදී සකස් කළා වගේ නිල් කබායත් බිරිඳගේ උදව්වෙන් ගෙදරදී මහ ගන්න ඇති.

ඔහුට අවශ්‍ය වෙන තවත් ද්‍රව්‍ය තිබුණා. රස්තියාදුකාරයෙකු, කම්කරුවෙකු ලෙස පෙනෙන්න අබලන් ඇඳුම්, බොරු රැවුලක්, නිද්‍රාකාරක ඖෂධ ආදිය. ඒවත් සූදානම් කරගෙන සැලැස්මත් හිතේ තියාගෙන මැකින්ටොෂ් ක්‍රියාත්මක වුණා. වේදිකාවේ දොරටුපාලයා හිතවතෙකුගෙන් බීර වීදුරුවකට වැඩි දෙයක් නොබොන බව අපි මතක තියා ගන්න ඕන. නිද්‍රාකාරක ඖෂධයක් ලෙස කුඩා බෝතලයකට ක්ලෝරල් ස්වල්පයක් මැකින්ටොෂ් සාක්කුවේ දමාගෙන එන්න ඇති. තැබෑරුමෙන් ගන්නා බීර ජෝගුවකට ඒක කලවම් කර ගෙනැත් දීම අමාරු වැඩක් නෙමෙයි. යම් විදියකින් බීර ජෝගුවක් ගෙනැත් දෙන්න කියලා ශ්‍රේ ඉල්ලා හිටියේ නැතිවුණත්, ඒක මැකින්ටොෂ් සිය කැමැත්තෙන් ගෙනැත් දෙන්න ඉඩ තිබුණා. මුහුණේ බොරු රැවුළක් දමාගත්තු ඔහු ගිහින් මල් කළඹ මිලට ගත්තා. ඒක අරගෙන ඔහු එනතුරු ඔහුගේ බිරිඳ බලාගෙන ඉන්නෙ, රංග ශාලාව පැත්තේ කොහේ හරි අඟු පිළකට වෙලා. ඩොමිනෝ කබාය හා වෙස්මුහුණ තියෙන්නෙ ඇගේ අතේ. බොරු රැවුළ ගළවලා ඇය අතට දීලා ඔහු කබාය

සහ වෙස් මුහුණ අතට ගෙන සඟවා ගන්නවා. මේ හැම දෙයක්ම කරන්නෙ සැකය බොයිඩ් මහතා වෙත යොමු කරන්නත් පොලිසිය නොමග යැවීමටත්.

මත් බෙහෙත වාලි ග්‍රේගේ සිරුරේ ක්‍රියාත්මක වෙන්න පටන් ගත් වහාම මැකින්ටොෂ් රඟහල තුළට රිංගා ගන්නවා. ඩොමිනෝ කබායක් සහ වෙස්මුහුණක් හැඳ පැළඳ ගැනීමටත් ගලවා ඉවත් කිරීමටත් අවශ්‍ය වෙන්නේ තත්පර කිහිපයක් පමණයි. රූත් රෝලන්ඩ් තරුණිය කාමරය තුළ ඉඳලා "හොරෙක්!" කියා කෑගැසුවා නම් ඇයට දරුණු පහරක් එල්ල කිරීමටත් ඔහු බලාපොරොත්තු වුණා වෙන්න පුළුවනි. නමුත් මේ වෙලාවේ ඔහුගේ වාසනාවට ඇය කාමරයෙන් පිටවෙලා. අඳුරේ තිබුණු කොරිඩෝවට පිවිසි ඔහු බොයිඩ් මහතා ලෙසයි රූත් කෙල්ල වරදවා හඳුනා ගත්තේ.

සැබෑ මුතුමාලය හොරකම් කරගත්තට පස්සේ මැකින්ටොෂ් හොරෙන්ම රඟහලෙන් එළියට රිංගන්න ගියා. ඔබට පෙනෙනවා නේද හොර තක්කඩියාගේ සැලැස්ම මොකක්ද කියන එක. ඔහු ඉමිටේෂන් මුතුමාලය කාමරයේ දමල සැබෑ මුතුමාලය හොරකම් කරගෙන ගියා කියල හිතමු. එහෙම නම් ප්‍රසිද්ධ වෙන්නෙ රස්තියාදුකාරයා මාලය හොරකම් කරගෙන ගියා කියලයි. ඒක සනාථ කරන්න මත් බෙහෙත් දැමූ බීරම ප්‍රමාණවත්. රස්තියාදු කාරයාට එරෙහිව මහා කෑකෝ ගැසීමක් එනවා. ඔහු සොයා පොලීසිය රට පීරන්න පටන් ගන්නවා. කවුද දන්නෙ? ඒ රස්තියාදුකාරයා මැකින්ටොෂ් බව හෙළි කෙරෙන හෝඩුවාවක් ඉතිරි වෙන්න පුළුවනි; කවුරුන් හෝ ඔහුව හඳුනාගත්තා වෙන්න පුළුවනි.

නමුත් මොකක්ද සිදුවෙන්නෙ? සැබෑ මාලය සොරකම් කරලා සඟවා ගන්නා ඔහු, ඉමිටේෂන් මාලයත් අතේම තියා ගන්නේ කොයි මොහොතේ හෝ එය බිම දමා යෑමට. ඒ මගින් පොලීසිය සම්පූර්ණයෙන්ම නොමග යවන්න ඔහු අපේක්ෂා කරන්න ඇති.

රස්තියාදුකාරයා හැටියට ඔහු රඟ පෑ භූමිකාවෙන් මොකක්ද වුණේ? ඒ මෝඩ අසරණයා හොරකම් කරගෙන තිබුණේ නොවටිනා ඉමිටේෂන් මාලයක්; මුරකාරයා සමග සටනේදී ඒ මාලයත් ආල පැනල දිව්වා. ඒ හින්දා කවුරුවත් ඔහු ගැන කරදර වුණේ නෑ. මේ අද්භූත රස්තියාදුකාරයා හොයන්න කවුරුවත් එච්චර උනන්දු වුණේ නෑ"





"හෝම්ස් ඔබ නොහිටින්න තව ටිකෙන් මැකින්ටොෂ් පවුම් පනස්දහසක් වටිනා මාලයත් ලබාගෙන තමන්ගේ හොඳ නමත් ආරක්ෂා කර ගන්නවා. මොකක් නිසාද ඔහු මෙවැනි ස්වභාවයකට පත්වෙලා තිබුණේ?" මම ඇසීමි. "අනික් කාරණය කොහේදිද ඔහුව අත් අඩංගුවට ගැනුණේ?"

"මං මේ තොරතුරු ලෙස්ට්‍රේඩ්ට හෙළි කළාම ඔහු වහාම ක්‍රියාත්මක වුණා" හෝම්ස් කීය. "ඔහුව හිරබාරයට අරගෙන තිබුණේ වෙස්ටටන් පාරේ ඔග්ඩන්ලගෙ කර්මාන්ත ශාලාවෙදි. ඔහු පොලීසියට පාපෝච්චාරණයක් කළා. දීර්ඝ කාලයක් තමන්ගේ රැකියාවෙන් උපයාගත් මුදල් ඔක්කොම ඔහු කෙටි කාලයකින් විනාස කර දමලා. ඒ අශ්ව රේස් ඔට්ටු ඇල්ලීමට සහ ජිම්කානා ලොතරැයි මිලදී ගැනීමට. තමන්ගේ දෑත්වල සවියෙන් මහන්සිවෙලා මුදලක් උපයාගන්නෙ නැතුව ලොතරැයිවලට සූදුවලට යොමු වෙලා කෙටි ක්‍රම හොයන්න යන මිනිස්සු, අන්තිමේදී හිඟන්නන් බවට පත්වෙනවා. නැත්නම් පාතාල ලෝකයේ මැරයන් අතින් මැරුම් කනවා"

# ඕලන්ද නෞකාවේ අබිරහස

මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා යෙදුණු අභිරහස් පරීක්ෂණ ගැන කථාන්තර රාශියක් මම ඔබ වෙත ඉදිරිපත් කර ඇත්තෙමි. ඒ අතරින් නෞකාවන්ට අදාළ කථා ද රැසක් ඇති බැව් ඔබට මතක ඇතුවා නිසැකය. මෙයින් මුල් තැනක් ගන්නේ "ග්ලෝරියා ස්කොට්" "ලෝන් ස්ටාර්" "මැටිල්ඩා බ්‍රිග්ස්" "සොෆී ඇන්ඩසන්" "ඇලිසියා" ආදී නෞකාවන් බව අමුතුවෙන් කිවයුතු නැත. මීට අමතරව මගේ මිත්‍රයා මා ද සහභාගී කරගෙන යෙදුණු වික්‍රමයක් ගැන මා ලියූ ලේ සලකුණ කථාවේ සඳහන්ව ඇත. අප දෙදෙනාගේ ජීවිත පවා අවදානමකට ලක්වූ ඒ භයානක සිදුවීම වූයේ "ෆ්‍රීස්ලන්ඩ්" නම් ඕලන්ද නෞකාවට අදාළ පරීක්ෂණයේදීය.

නැව පිළිබඳව ඔබ වෙත විස්තරයක් ගෙන ඒමට "නිව්ස් ඔෆ් ද වර්ල්ඩ්" පුවත්පතේ පළ වූ "ෆ්‍රීස්ලන්ඩ්" සම්බන්ධ විස්තරයක් මුලින්ම ඉදිරිපත් කිරීමට මම කැමැත්තෙමි.

"ස්කොට්ලන්තයේ නිෂ්පාදනය කර කීර්තියට පත් බ්‍රිතාන්‍ය නෞකා අනුගමනය කරමින් මෙම නෞකාව රොටර්ඩෑම් හිදී නිෂ්පාදනය කොට ඇත්තේ 1890 දීය. "ග්‍රේට් ඊස්ටන්" සහ "රෝයල් චාටර්" නම් බ්‍රිතාන්‍ය නෞකා වලට බොහෝ දුරට සමාන වූ මෙය යකඩෙන් ඉදිකරනු ලැබූ, වාෂ්ප එන්ජින් සහිත නෞකාවකි. ටොන් 2719 ක බරකින් යුක්ත වූ මෙය අඩි 320 ක් දිගු වූ අතර එහි එන්ජිමට අශ්වබල 200 ක බලයක් තිබිණ. හදිසි අවස්ථාවකදී රුවල් ප්‍රයෝජනයට ගැනීම සඳහා උස් කුඹ ගස් තුනක් ද තිබීම ෆ්‍රීස්ලන්ඩ් නෞකාවේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයකි.

1851 දී ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් සමීපයේ බැලරට් හි රත්රන් ඉල්ලම් හමුවීමත් සමගම නෞකා ගමනාගමනය ද මහත් විපර්යාසයකට භාජනය විය. යුරෝපයේ සිට ඕස්ට්‍රේලියාව බලා සංක්‍රමණය වූ පිරිස ඉතා වේගයෙන් වැඩිවෙද්දී මගී නෞකාද වැඩි වැඩියෙන් අවශ්‍ය විණි.





යුරෝපයෙන් ඕස්ට්‍රේලියාව බලා ගිය "ෆ්‍රීස්ලන්ඩ්" නැව, 1895 අගෝස්තු 26 වැනිදා මෙල්බර්න් සිට ආපසු ගමන ඇරඹුවේ ඕලන්දයේ රොටර්ඩෑම් වරාය වෙත පැමිණීමේ අරමුණෙනි. නැවේ කපිතාන්වරයා වූයේ ඔවන් මැකෝමික් නම් පළපුරුදු කපිතාන්වරයෙකි. "ෆ්‍රීස්ලන්ඩ්" නෞකාව දින 58 කින් රොටර්ඩෑම් වෙත ළඟාවිය යුතුව තිබිණි.

මෙම නෞකාව ඕස්ට්‍රේලියාවේ සිට ආපසු ආ ගමනේ දී එහි මගීන් නොපැමිණි තරමය. ධාන්‍ය, සත්ත්ව සම් සහ ඛණිජ ඉල්ලම් සහිත පස් ද එහි ගමන් බඩු ලෙස ගෙනැවිත් ඇත. එහෙත් මෙහි තිබූ වටිනාම භාණ්ඩය වූයේ පවුම් දෙලක්ෂ පනස්දහසකට අධික වටිනාකමකින් යුතු රත්රන් කැබලිය. බැලරට් හි පතල්වලින් හාරාගත් ඉල්ලම් දළ වශයෙන් පිරිසිදු කොට ලබාගත් රත්රන් කැබලි මෙලෙස යුරෝපයට ප්‍රවාහණය කිරීම මගී නැව් ආපසු එද්දී සිදුකළ ප්‍රධානම කටයුත්ත ලෙස සැලකේ.

කෙසේ වෙතත් නෞකාව ඕලන්දයේ රොටර්ඩෑම් දෙසට යාත්‍රා කරද්දී අත්ලාන්තික් සාගරයේදී ඊසාන දෙසින් මහා කුණාටුවක් හමා එන්නට පටන් ගෙන ඇත. මුහුදේ රළ උස්ව නැගුණු අතර ධාරානිපාත වර්ෂාවේ අඩුවක් නොවීය. නෞකාව "ලී කොටයක්" මෙන් ගසාගෙන යන්නට පටන් ගත් බැව් එක් නාවිකයෙක් පසුව පැවසීය. සුළං බැදීම අවම කිරීමට කුඹගස් සියල්ල සහ දුම්නළය කපා දැමීමට ඔවුන් පියවර ගත්තේ කපිතාන්ගේ නියෝගය අනුවය. බඹ 75 ක් දිගට නැංගුරම් දම්වැල් නැවේ තවමත් ඉතිරිව තිබූ නිසා සාගරය මැද දීම නැංගුරම් දැමීමට සූදානම් වෙන මෙන් කපිතාන් ඔවන් මැකෝමික් තම නාවිකයනට අණ දුන්නේය. එය ද ඉටු කෙරිණ. නැගෙනහිර දෙසට යාමට තවමත් එන්ජින් ක්‍රියාත්මක වුවද කුණාටුව මගින් නෞකාව තල්ලු කෙරුණේ බටහිරට එනම් එංගලන්තය දෙසටයි. අන්තිමේදී නැංගුරම්වල දම්වැල් ද කැඩීගොස් නෞකාව එංගලන්තයේ නැගෙනහිර වෙරළේ ග්‍රේට් යාමත් වරායට තරමක් දකුණෙන් පිහිටි බෙකල්ස් දිශාවට ඇදී ගියේය. එහි වෙරළ සමීපයේ මුහුදු පත්ලේ වූ ගල්පරයක් මත හිරවී නැවේ ඉදිරි ගමන නැවතිණි. කෙසේ වුවද තවමත් ප්‍රචණ්ඩව පැවැති කුණාටුව නෞකාවට එල්ල කළේ දැඩි තර්ජනයකි.

නවත් පැයක් යාමට පෙර නැව සම්පූර්ණයෙන්ම කුඩු පට්ටම් වී මුහුදුබත්වීමට ඉඩ ඇති බැව් කපිතන් මැකෝමික්ට මෙන්ම අනෙක්

නාවිකයනටද වැටහිණි. ඒ අනුව වහාම නැවෙන් පිටවී ගොඩබිමට යාත්‍රා කිරීමට ජීවිතාරක්ෂක බෝට්ටු යොදා ගැනීමට ඔවුහු තීරණය කළහ. මෙවැනි භයානක කාලගුණ තත්ත්වයක බෝට්ටුවක නැගී වෙරළට ගොඩ බැසීමට යාම ඉතාම අවදානම් කටයුත්තකි. එහෙත් ඔවුනට වෙනත් විකල්පයක් නොතිබිණ. සියලු දෙනාම නැවෙන් පිටවී යනතුරු බලා සිටි කපිතාන්වරයා අන්තිමේදී සිය සහකාර දෙවැනි කපිතාන් සහ ඉතිරිව සිටි නාවිකයන් දෙදෙනෙකු සමඟ බෝට්ටුවක නැඟී නැවෙන් පිටත්ව ගියේය. මේ වනවිට රාත්‍රිය ළඟාවී අඳුරු වැටී තිබූ අතර කුණාටුවද පහ වී යමින් තිබිණ.

පසුදා එතැනට ළඟාවූ එංගලන්ත වෙරළාරක්ෂක සේවයේ නිලධරයනට දැක ගන්නට ලැබුණේ "ෆ්‍රීස්ලන්ඩ්" නෞකාව තවමත් ගල්පරය මත නිරුපද්‍රිතව ඇති බවයි. මේ ගැන ඕලන්ද බලධරයනට දන්වන ලදී. ඔවුහු අප්‍රමාදව එහි පැමිණියහ. නැවේ කපිතාන් ඇතුළු කාර්ය මණ්ඩලයට සිදුවූයේ කුමක්දැයි සොයා බැලීමට වහා පියවර ගැනිණ. මේ අතර "ෆ්‍රීස්ලන්ඩ්" නෞකාව ඕලන්දයේ රොටර්ඩෑම් වෙත ඇදගෙන යාමට ඔවුහු තීරණය කළහ. එහෙත් එය දැවැන්ත කටයුත්තක් වූයෙන් එය සිතූ තරම් ඉක්මනට ක්‍රියාත්මක කිරීමට ඔවුනට හැකි නොවිණි. නෞකාව සිරවී තිබූ ගල්පරයෙන් මුදවා ගෙන ඕලන්දය බලා පිටත්වීමට හැකිවූයේ තවත් පැය 48 කට පසුවය.

මෙම මුහුදු අනතුරෙන් දිවි ගළවා ගැනීමට හැකි වූයේ කපිතාන් ඕවන් මැකෝමික්, ඔහුගේ දෙවැනියා වූ තෝමස් හියුස් සහ අන්තිම මොහොතේ කපිතාන් සමඟ පිටවී ගිය තවත් නාවිකයන් දෙදෙනෙකුට පමණි. තිස්අට දෙනෙකුගේ ජීවිත විනාශ වූ බවට අවසානයේදී නිගමනය කෙරිණි."

මා ඔබට ඉදිරිපත් කළේ නාවික අනතුරු පිළිබඳව එකල පුවත්පත්වල ප්‍රධාන තැනක් ගත් ප්‍රවෘත්තියයි.

"වොට්සන්. ඔබ ඊයේ කාර්ය බහුලව පිටතට ගොස් සිටි නිසා මට මේ කාරණාව ඔබට කියන්නට බැරිවුණා" මගේ මිත්‍රයා කීවේ එක් දීප්තිමත් උදෑසනක අපේ නිවහනේ විසිත්ත කාමරය තුළදීය. තම පිඟන් මැටි පයිප්පයට දුම්කොළ පිරවූ ඔහු ගිනි උදුනේ ගිනි අඟුරක් අඬුවක් මාර්ගයෙන් ගෙන පයිප්පය දල්වා ගත්තේය.





"ෆ්‍රීස්ලන්ඩ්" නෞකාව මුහුණ දුන් අනතුර ගැන ඔබට මතකයි නේ වොට්සන්"

"ඔව්. දැන් ඒක සිදුවෙලා මාසයකටත් වැඩියිනෙ. මොකද ඔබට ඒ ගැන මතක් වුණේ?"

"මට මතක් වුණාම නෙමෙයි. ඕලන්ද තානාපති කාර්යාලයෙන් මට පෙරේදා කැඳවීමක් ලැබුණා. ඔවුන් මට රාජකාරියක් භාර දුන්නා"

"ඒ මොකක්ද?"

"ඕලන්දයේ නාවික කටයුතු පිළිබඳ ප්‍රධානියා ඒ අවස්ථාවට ඇවිත් ගියා. ඔහු තමයි රාජකීය ඥාතියකු වන බර්නාඩ් වැන්රූයන් ආදිපාදවරයා. ආචාර සමාචාර වලින් පස්සේ ඔහු කෙළින්ම කාරණයට බැස්සා. ඔහු එය කියූ ආකාරයෙන්ම ඔබට කියන්න මං උත්සාහ කරන්නම් වොට්සන්.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. දැන් ටික කලකට පෙර අනතුරකට ලක්වුණු "ෆ්‍රීස්ලන්ඩ්" නෞකාව ගැන ඔබට මතක ඇති. එය පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමයි අප ඔබෙන් බලාපොරොත්තු වන උපකාරය"

"ඇයි මහත්මයා ඒ නැව ගල්පරයක් මත හිරවී තිබී ඔබගේ රටේ යාත්‍රා පැමිණ එය ඕලන්දයට ආපසු ගෙන ගියා නේද?"

"ඒ විදියට ඕලන්දයට ගෙන ගිය බව ඇත්තයි. නමුත් දැන් ප්‍රශ්නය වෙලා තියෙන්නේ නැවෙන් අපරදිගට ප්‍රවාහණය කළ රත්රන් කැබලිවලට මොකද වුණේ කියන එකයි. ඔස්ට්‍රේලියාවේ ඉඳලා පවුම් දෙලක්ෂ පනස්දහසක් වටිනා රත්රන් නැවේ ගෙන ආ බව දැන් ලෝකයාම දන්නා රහසක්. නැව රොටර්ඩෑම් වෙත ගෙන යන්න කලිනුත් අප එංගලන්තයේ එකී ගල්පරය අසලට එවූ කණ්ඩායම නැව සෑණික සෝදිසියකට ලක් කළාලු. නමුත් රත්රන් කැබලි සහිත පෙට්ටි එකක්වත් ඔවුනට දකින්න ලැබිල නෑ. ඔවුනට පරීක්ෂා කිරීමට බැරිවුණු තැන් දෙකයි තිබුණේ. ඒ කපිතාන්ගේ කුටිය සහ ඊට යාබද දෙවැනියාගේ කුටිය. ඒ දෙක ඉබි යතුරු දමා වසා තිබුණා. ඒවා කැඩීමට අවසර නොතිබුණු නිසා ඔවුන් ඒ කුටි දෙක පරීක්ෂා කරල නැහැ. නෞකාව රොටර්ඩෑම් වෙත ගෙන ආවාට පසු අර කුටිවල ඉබියතුරු කඩා සෝදිසිකර බැලුවා. නමුත් දකින්නට බලාපොරොත්තු වුණු රත්රන් සහිත පෙට්ටි ඒවල

තිබුණෙත් නැහැ. ඔවුන් මේ ගැන මට පැමිණිලි කළ වහාම මං තීරණයක් ගත්තා. ඒ මේ පිළිබඳ පරීක්ෂණය ඔබට භාරදෙන්න.

හෝම්ස් මහත්මයා. යුදමය වශයෙන් අපේ රටවල් දෙක අතරේ සුළු සුළු අමනාපකම් ඇති බව ඇත්තයි. නමුත් ඔබේ රාජකීයයන් වගේම අපේ රාජකීයනුත් සමීප ඥාතියෝ. අපේ රටවල් දෙක අතර තිබෙන්නේ පැයක් දෙකක් කතා කරලා විසඳාගන්න පුළුවන් ප්‍රශ්න. ඒ නිසා මේ බරපතළ ගැටලුව මට විසඳා දෙන මෙන් මං ඔබට ආයාචනා කරනවා. මං තවත් කාරණයක් ඔබට කිව යුතුයි. මීට කලින් අවස්ථාවකත් ඔබ අපේ රජපවුලට ඇති වූ විශාල ගැටලුවක් සාර්ථක ලෙස විසඳා දුන්නා. ඒක අපට අමතක නෑ. මේ උභතෝකෝටික ප්‍රශ්නයට මුහුණ දුන් වෙලාවෙ අප සිටියේ කළ යුතු දෙයක් සිතාගන්න බැරිව. එම අවස්ථාවෙ "ඇයි ෂර්ලොක් හෝම්ස් මහත්මයාට ඔය කටයුත්ත භාරදෙන්නෙ නැත්තෙ?" කියා අපෙන් විමසුවේ බියට්‍රිස් රජ කුමරියයි. ඒ නිසා මේ ඉල්ලීම කෙළින්ම රජ පවුලෙන් එන ආයාචනයක් ලෙස සලකන්න"

"ආදිපාදතුමනි" මං කිව්වා. "මේ කටයුත්ත නැත්නම් ගැටලුව ගැන සිතීමේදී මා සිහිකිරීම ගැන, බියට්‍රිස් කුමරියට මගේ හෘදයාංගම ස්තුතිය පුද කළා කියන්න. මට හැකි ආකාරයකින් ඔබට උදව් කිරීමට මගේ කිසි අකැමැත්තක් නැහැ. මං මේකට සම්බන්ධ විය යුත්තේ මොන ආකාරයෙන්ද කියා හිතාගන්න මට තවමත් අමාරුයි."

"මෙහෙමයි. මා කලින් සඳහන් කළ අර කුටි දෙක අපේ නිලධරයන් තියුණු පරීක්ෂණයකට ලක් කළේ නැහැ" ආදිපාදතුමා කිව්වා. "ඒවල දොරවල් ඇරලා ඇතුළේ රත්රන් කැබලි සහිත පෙට්ටි තිබෙනවාද කියා බැලුවා පමණයි. කුටි දෙක තියුණු ලෙස පරීක්ෂා කරන්න අපේ අයටත් උවමනා වුණා. නමුත් මා ඊට තදින්ම විරුද්ධ වුණා. ඒ මොකද එහි යම් යම් හෝඩුවාවන් තිබුණොත් ඒවා මැකී යා හැකි නිසා. මේ කටයුත්ත ඔබට භාරදීමට මා අදහස් කරන බව මං ඔවුනට කිව්වා."

"ඔබ ක්‍රියාකර තිබෙන ආකාරය ඉතාම ඥානාන්විතයි ආදිපාදතුමනි" මං කිව්වා. "නැවේ කපිතාන්ගේ සහ දෙවැනියාගේ ජීවිත ගැලවුණු බව අපට අහන්න ලැබුණා. රන් කැබලි නැතිවීම ගැන ඔවුන් මොනවද කියන්නේ?"





"කපිතාන් මැකෝමික් හා දෙවැනියා හියුස් දෙදෙනාම කියන්නේ, ඒ ගැන ඔවුන් කිසිදෙයක් නොදන්නා බවයි. ඒ වෙලාවෙ ඔවුන් සිතුවේ කාගේත් ජීවිත ගලවා ගැනීම ගැන පමණලු. ඒක හරි. නමුත් ගල්පරයක හිරවී තිබූ නැවේ ගබඩා කාමරවල රත්රන් තිබූ බව දැනගෙන හිටියේ මේ නැවේ කාර්ය මණ්ඩලය පමණයි. දැන් පෙනෙන හැටියට ඒ අයගෙන් හතර දෙනෙකු හැරෙන්න අනික් අය ජීවිතක්ෂයට පත්වෙලා."

"නැව මුහුදුබත්වීම ගැන විධිමත් පරීක්ෂණයක් පැවැත්වුණේ නැද්ද?"

"සාමාන්‍යයෙන් මෙවැනි වෙලාවකදී පැවැත්වෙන ආකාරයට සාක්ෂි විභාගයක් පැවැත්වුණා" ආදිපාදතුමා කිව්වා. "නමුත් එහිදී ඇසූ ප්‍රශ්න ගැන වත් දුන් පිළිතුරු ගැන වත්, මං කොහොමටවත් සෑහීමකට පත්වුණේ නෑ. ඒ විභාගය පැවැත්වූ වයස්ගත නිලධරයන් ඉතාම අදක්ෂයන් කියලයි මට හිතෙන්නේ. මෙතැන මොකක් හරි ලොකු වංචාවක් සිදුවෙලා ඇති බව මට ඉවෙන් වාගේ වැටහෙනවා. නැව විනාශයට පත්වෙලා සම්පූර්ණයෙන්ම මුහුදු පත්ලටම ගිලුණා නම් ඒක වෙනත් දෙයක්. එවිට සිදුවුණු අලාභය කොයිතරම් විශාල වුණත්, අපි ඒ ගැන අමතක කර දමනවා. නමුත් දැන් තත්ත්වය ඊට වඩා වෙනස්. මුහුදේ නොගිලී ගල්පරය මත රැඳුණු නැවේ තිබූ රත්රන් වලට මොකද වුණේ?"

"ඔබට හිතෙන්නේ නැව අත්ලන්තික් සාගරයට ඒමටත් පෙර රත්රන් කාට හෝ විකුණා මුදල් ලබාගන්න ඇති කියලද?"

"එහෙම විය යුතුයි හෝම්ස් මහත්මයා" ආදිපාදතුමා කිව්වා.

"නව ගල්පරය මත හිරවුණේ බෙකල්ස් වෙරළ අසල. එදා රෑ එළිවෙන කොටම ඔය රත්රන් අඩංගු පෙට්ටි ටික නැවෙන් ගොඩට බාගත්තා කියා හිතන්න අමාරුයි නේද ආදිපාදතුමනි. විශේෂයෙන්ම මේක ඔවුන් නන්නාඳුනන ප්‍රදේශයක්. මේ රටේ කිසිවෙකුගේ උදව්වක් නැතිව රාත්‍රියේ පැය කිහිපයක් තුළ මෙවැනි දෙයක් කළ හැකිද? විශේෂයෙන්ම අයහපත් කාලගුණයක් සහ වැහි කුණාටු තිබූ කාලයේ?"

"අපේ අය අතින් සිදුවූ අඩුපාඩුවකුත් මේ අවස්ථාවේ ඔබට කිවයුතුයි. හෝම්ස් මහත්මයා. එංගලන්තයේ වෙරළාරක්ෂක සේවය එවූ පණිවුඩ මගින් අපේ අය ඉක්මනින් එතැනට පැමිණි

බව ඇත්තයි. නමුත් ඔවුන් "ෆ්‍රීස්ලන්ඩ්" නෞකාවේ ඇතුළත තියුණු සෝදිසියකට ලක් කළේ නෑ. ඔවුන් බැලුවේ නැව හිරවූ ගල්පරයෙන් බේරා ගත යුත්තේ කොහොමද කියලා; අනික නැව ඉක්මනින් මුහුදේ ගිලී යාමේ අවදානමක් තිබේවිද කියලා. පැය කිහිපයක් ඇතුළත නැව ආපසු ඇදගෙන යාමේ අරමුණෙන් මේ අය ඉක්මනින් ආපසු ආවා.

මේ කටයුත්තට ආවේ නාවුක ඉංජිනේරුවරුන් හා කාර්මිකයන්. වටිනාකමින් අධික දෙයක් නැවේ ගබඩාකර තිබූ බව ඔවුන් දැන හිටියේ නෑ. නැවේ කුටිවල කවුරුන් හෝ හිරවී සිටිනවාද කියා නම් ඔවුන් හොයා බැලුවාලු. එහෙම කිසිවෙක් ඉදල නෑ. මළසිරුරු හමුවුණෙත් නෑ. නැවේ ආරක්ෂාවට දෙදෙනෙකුවත් නවත්වා ආවෙ නැත්තෙ ඇයි කියා මං ඔවුන්ගෙන් විමසුවා. පණිවුඩය ඕලන්දයට ලැබුණු වහාම ඔවුන් වේගයෙන් එංගලන්තය බලා යාත්‍රා කළේ එහෙම සූදානමක් ඇතුව නෙමෙයිලු. ඔවුනට ලැබුණු පණිවුඩයෙන් කියැවුණේ ඕලන්ද නැවක් අනතුරට පත්වී ඇති බව. ජීවිත ගලවා ගැනීමක් ගැන හිතලා එහෙම වෙලාවක ඉක්මනින් පිටත් වී ආ එක ගැන දොස් කියන්නත් බෑ"

"මේ කපිතාන්වරයා සහ ඔහුගේ සේවකයන් මීට කලිනුත් මේ නෞකාවෙන් ඕස්ට්‍රේලියාවට ගිහිං ඇවිත් තියෙනවද? ඔවුන් මීට කලිනුත් රත්රන් ප්‍රවාහණය කළාද?"

"ඔව් හෝම්ස් මහත්මයා." ආදිපාදතුමා කිව්වා. "මීට පෙර දෙතුන් වතාවක් ඔවුන් ඕස්ට්‍රේලියාවට මගීන් ප්‍රවාහණය කර ආපසු ආවා. නමුත් රත්රන් ගෙන ආවේ එකම එක් වතාවක් පමණයි. ඒ මීට මාස අටකට පෙර ගිහින් ආ වෙලාවේ. ඒ වතාවේ ගෙන ආ රත්රන් පෙට්ටි සියල්ල නියමිත තැන්වලට කිසිදු අඩුවක් නැතිව භාර දී තිබුණා. ඔවුන් කිසිම වංචාවක් කළ බවට පැමිණිල්ලක් හෝ සැකයක් නැහැ."

"ආදිපාදතුමනි. ඔබ ඔය විස්තර කළේ එම පරීක්ෂණය අවසන් වූ වහාම තත්ත්වයද? නැත්නම් ඊයේ පෙරේදා මේ සම්බන්ධයෙන් අලුතෙන් යමක් දැනගන්නට ලැබුණාද?"

"හෝම්ස් මහත්මයා. ඔබ ඒ කාරණය තේරුම් ගත්තේ කොහොමද කියලා මට හිතාගන්නත් අමාරුයි" ආදිපාදතුමා කිව්වා. "කපිතාන් සහ ඔහුගේ දෙවැනියා ලැගුම් ගෙන හිටියේ





ඈම්ස්ටඩෑම් නුවර නැව් සමාගමට අයත් නිවසක. ඒ ඔවුන් උපතින් ස්කොට්ලන්ත ජාතිකයන් නිසා. ඔවුන් කාලෙන් කාලෙට රොටර්ඩෑම්වල නිවාසවලත් පදිංචි වී සිටිනවා. කාලෙන් කාලෙට ඔවුන් තමන්ගේ ගම්රටවල් වන ස්කොට්ලන්තයට ගිහින් එහෙත් රැඳී සිටිනවා. අනෙක් සේවකයන් දෙදෙනා ඕලන්ද ජාතිකයන්.

පහුගිය කාලයේ මෙන්න මේ විදියේ ආරංචියක් පැතිර ගිහින් තිබුණා. එනම් නැව අනතුරට පත්වීම ගැන කපිතාන්ගෙන් හා දෙවැනියාගෙන් නිදහසට කරුණු විමසන බවත්, නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම ගැන, ඔවුනට චෝදනා එල්ල වෙන බවටත්. මේකෙ සත්‍යතාවයක් නැත්තෙම නෑ. ඒ ගැන රජයේ ඉහළ නිලධරයන් සාකච්ඡා කරමින් සිටියේ. නමුත් ඊට කලින් ෂර්ලොක් හෝම්ස් මහතා ලවා නෞකාව තියුණු පරීක්ෂාවකට ලක් කළ යුතු බව මම ඔවුනට කිව්වා. නමුත් මේ අතරේ........"

"ඔව්.......?"

"නැවේ කපිතාන් මැකෝමික්, ඔහුගේ දෙවැනියා, නාවිකයන් දෙදෙනා ඇතුළු හතරදෙනාම අතුරුදන් වෙලා. ඔවුන් ආගිය අතක් නෑ. ඒකෙන් අපේ හිත්වල ලොකු සැකයක් ඇතිවුණා. වහාම ඔබ හමුවීමට මං තීරණය කළේ එවිටයි."

මෙම රත්රන් අතුරුදන්වීම ගැන කපිතාන්වරයා මොන ආකාරයකින් හෝ සම්බන්ධද කියලා මගේ හිතෙත් සැකයක් ඇතිවෙලයි තිබුණෙ වොට්සන්. නමුත් ඔහු ඊට පටළැවෙන්නේ කුමන ආකාරයට ද කියලා හිතාගන්න අමාරුයි. ඒ නිසා මුලින්ම නෞකාවේ අර කුටි දෙක පරීක්ෂා කරන්න ඕනෑ කියලා මං තීරණය කළා. මං ඒ බව ආදිපාදතුමාට කිව්වා"

"ඒක ඉතාම හොඳයි හෝම්ස් මහත්මයා. ඔබ ඉක්මනට එන තරමට හොඳයි. ඔබේ පැමිණීම සඳහා විශේෂ අධිවේග යාත්‍රාවක් ලබාදෙන මෙන් මං අපේ තානාපතිවරයාට දැනුම් දෙන්නම්. "ෆ්‍රීස්ලන්ඩ්" නෞකාව දැන් තිබෙන්නේ රොටර්ඩෑම්වල, විශේෂ ආරක්ෂාවක් යටතේ. ඔබ එහි පැමිණෙද්දී මං එතැනට ඇවිත් ඉන්නම්. හෝම්ස් මහත්මයා. ඔබ දැනගත යුතු වෙනත් කරුණු මොනවා හරි තියෙනවාද?"

"මෙම නෞකාවල කපිතාන් සහ දෙවැනියා ලෙස ඕලන්ද ජාතිකයන් යොදා නොගෙන, බ්‍රිතාන්‍ය ජාතිකයන් යොදා ගැනීමට ඔබ තීරණය කළේ ඇයි?" මං විමසුවා.

"ඒක මගේ තීරණයක් නෙමෙයි." ආදිපාදතුමා කීවා. "නමුත් ඒ ගැන මගේ විරුද්ධත්වයක් තිබුණේ නැහැ. ඊට හේතුව මීට ප්‍රථම අවස්ථා කිහිපයකදීම මේ නැව් සමාගමට අයත් නැව් මහ මුහුදේදී අවාසනාවන්ත අනතුරුවලට ලක්වී තිබුණා. ඒ හැම වෙලාවකම නැව් පාලනය කළේ ඕලන්ද කපිතාන්වරු. දෙවැනියා තවත් රටක කෙනෙක්. නැවේ කාර්ය මණ්ඩලය ඕලන්ද ජාතිකයන්. මිත්‍රශීලී අයුරින් ඔවුන් පාලනය කිරීම කපිතාන් අතින් හරිහැටි සිදුවී තිබුණේ නෑ. සමහර වෙලාවලදී ඒ කපිතාන්වරු ගෙන තිබූ තීරණ හරිම අදූරදර්ශීයි. කිහිප විටක්ම නැව් විනාශයට පත්වෙලා, ඉන්දියන් සාගරයේ සහ ශාන්තිකර සාගරයේ අතුරුදන් වුණා. ඔවුන් ගැන කිසිම තොරතුරක් දැනගන්න ලැබුණේත් නැහැ. අනික් අතට බ්‍රිතාන්‍ය නාවුක කපිතාන්වරුන්ට, දක්ෂ ලෙස නැව් හැසිරවීම ගැන හොඳ කීර්ති නාමයක් ලැබී තිබෙනවා. මේ ප්‍රශ්නය ඇතිවෙන තුරු ඔබේ රටේ කපිතාන්වරුන්ගෙන් අපට කිසිම ගැටලුවක් ඇතිවෙලා නෑ" එහෙම කියූ ආදිපාදතුමා අසුනෙන් නැගිට්ටේ මගෙන් සමුගැනීමට සූදානමෙන්."

"ඉතින්......... ඔබ කවදද රොටර්ඩෑම් බලා යන්නේ?" මම ඇසීමි.

"හෙට උදේ පාන්දරම යාමට යාත්‍රාව සූදානම් බවට ඕලන්ද තානාපති කාර්යාලයේ පණිවුඩකරුවෙකු පැමිණ දැනුම් දුන්නා"

"ඔබ මගේ පැමිණීමත් අපේක්ෂා කරනවද හෝම්ස්?"

"ඉන්ෆ්ලුවන්සා රෝගය බරපතළ ලෙස පැතිරයමින් තිබෙන මේ දිනවල මා සමඟ පැමිණීම ඔබට අපහසු බව මා දැන හිටියා වොට්සන්. මගේ උදව්වට එනවාට වඩා අසරණ රෝගීන් වෙනුවෙන් යමක් කළ හැකි නම් ඒක වටිනවා. අනෙක් කාරණය, එහිදී මට සිදුකිරීමට තිබෙන්නේ නෞකාවේ අර කුටි දෙක පරීක්ෂා කර බැලීම පමණයි. රත්රන් ගෙන ආ ගබඩා කාමරත් මා සෝදිසි කළ යුතුයි. නමුත් ඒවායින් එතරම් ප්‍රයෝජනයක් ලැබේවි කියා මා හිතන්නේ නෑ"

"එහෙනම්. ඔබට සුභ ගමන්" මම ඔහුට අතට අතදී සුභ පැතුවෙමි.

* * *





ශීත ඍතුව පැමිණීමත් සමගම පොදු මහජනතාවට මුහුණ දීමට සිදුවන විශාල ප්‍රශ්නයක් වන්නේ ශ්වසන පද්ධතියට අදාළ රෝගාබාධයන්ය. මීට අමතරව ඉන්ෆ්ලුවන්සා රෝගය වසංගත තත්ත්වයෙන් පැතිරී යාමට පටන්ගතහොත් එය ඉතා බරපතළ තත්ත්වයකි. ශල්‍ය ප්‍රතිකාර කිරීම තාවකාලිකව අත්හැර දැමූ මම, ඉන්ෆ්ලුවන්සා රෝගීනට ප්‍රතිකාර කිරීමට ලන්ඩනය පුරා දිව ගියෙමි. යළිත් වරක් මගේ මිත්‍රයා දැකීමට මට හැකිවූයේ දින තුනකට පසුවය.

ඔක්ස්ෆඩ් වීථියේ රෝගීන් දෙදෙනෙකු පරීක්ෂා කළ මට බේකර් වීදියේ නිවසකින්ද කැඳවීමක් ලැබී තිබිණ. ඒ කුඩා දරුවෙකු පරීක්ෂා කිරීම සඳහායි. ඔහුටද ප්‍රතිකාර ලබාදුන් පසු මගේ සිතට සැනසීමක් දැනිණ. මඳ විවේකයක් ලබාගැනීම සඳහා අපේ නිවහනට ගොස් හෝම්ස් හමුවී කතාබහ කිරීම යෙහෙකැයි මට සිතිණි.

"ඔබ මේ වෙලාවේ ආ එක ගැන මට සන්තෝෂයි වොට්සන්" ඔහු කීවේ මා සාදරයෙන් පිළිගනිමිනි. "මං ආපහු ආවේ ඊයේ රෑ" ගිනි උදුන සමීපයෙන් හිඳගන්නා මෙන් සංඥා කරමින් ඔහු කීය.

"කොහොමද. ඔබ ඕලන්දයට ගිය කටයුත්ත සාර්ථකද?" ඔහුගෙන් විමසුවෙමි.

"මං හිතූ විදියමයි වොට්සන්. මට පරීක්ෂා කරන්න ඉතිරි වෙලා තිබුණේ යතුරු දමා තිබුණු අර කුටි දෙක විතරයි. ආදිපාදතුමා කියූ විදියමයි. ගබඩා කාමරවල වැදගත් කමක් ඇති හෝඩුවාවන් කිසිවක් තිබුණෙ නෑ. රත්රන් කැබලි දැමූ පෙට්ටි තබා, හිස් පෙට්ටියක කැබැල්ලක් වත් තිබුණෙ නෑ. නැව්පතියාගේ දෙවැනියා වූ තෝමස් හියුස්ගේ කුටියෙනුත් වැදගත් යමක් මට හමුවුණේ නෑ. බැලූ බැල්මට කපිතාන් මැකෝමික්ගේ කුටියත් එහෙමයි. තමන්ගේ නැව විපතට පත්වෙන්න ඔන්න මෙන්න කියා තිබියදී, නැව අත්හැර දමා යන නිලධරයෙකුගේ කාමරය ගැන ඔබට හිතාගන්න පුළුවන් නේද? යකඩෙන් තනා යතුරු දමා තිබූ ලාච්චු හැම එකකම අගුළු කඩා මං ඒවා තියුණු සෝදිසියකට ලක් කළා. හුගක් ඒවල තිබුණේ විවිධ රටවල මුදල්, එම රටවලට පිවිසීමේදී සම්පූර්ණ කළ යුතු රෙගුලාසි පිළිබඳ පොත්, ඊටම අදාළ ලේඛන ආදිය. තවත් සමහර ලාච්චු මාස ගණනාවකින් විවෘත

කර නොමැති මලකඩ පිරුණු, කෑමීන් ගැවසුණු ඒවා. කොහොම නමුත් මං මගේ උත්සාහය අත් හැරියේ නෑ. අගුළු දමා තිබූ එක් ලාච්චුවක තිබී මට හමුවුණා කුඩා පාර්සලයක්.

ඒක සීල් මත්ස්‍ය සමකින් තෙතමනය නොවදින සේ ආවරණය කර තිබූ දින පොතක්. එහි පිටු ගණනාවක යම් යම් මුදල් ප්‍රමාණ සටහන් කර තිබුණා. තවත් සමහර පිටුවල රහස් සංකේත ක්‍රමයක් යොදාගෙන රහසිගත භාෂාවකින් යම් යම් දේ ලියා තිබුණා. ඒ දිනපොත මා ගෙන එනවාට ඕලන්ද බලධරයන් කැමැත්තක් දැක්වූයේ නැහැ. ඒ නිසා එම පිටුවල සමීප ඡායාරූප ලබාදෙන මෙන් මම වැන්රූයන් ආදිපාදතුමාගෙන් ඉල්ලා සිටියා. හෙට වෙද්දී ඒවා මා අතට පත්වේවි. එතකොට මං ඔබට පෙන්වන්නම්. ඡායාරූප ශිල්පියෙකු තමන්ගේ කාර්යාලයට ගෙන්වලා, දින පොතේ පිටු තමන් ඉදිරියේ ඡායාරූප ගත කරවන බවයි ඔහු කිව්වේ."

"හෝම්ස්. ඔබට හිතෙන්නේ ඒ රහස් භාෂාවෙන් ලියා තිබෙන දේ තේරුම් ගැනීමට හැකිවුණොත්, මේ අවුල ලිහා ගත හැකියි කියලද?"

"ඇත්තෙන්ම ඔව් වොට්සන්. ඔබ දන්නවා නේද යුද්ධ පවතින කාලවලට, එක් හමුදාවක් තමන්ගේ මිත්‍ර පක්ෂයට යවන රහස්‍ය පණිවුඩ ගැන. මෙතැනදී යොදා ගෙන තිබෙන්නේ අන්න ඒ වගේ ඉතාම සංකීර්ණ රහස්‍ය භාෂාවක්."

"තමන්ගේ දිනපොතක එවැනි භාෂාවකින් මොකක් සටහන් කළා කියල හිතන්නද?"

"ඒ තමන් දිනපොතේ ලියා ඇති දේ කාට හරි කියවන්න ලැබුණොත් ප්‍රශ්න ඇතිවේවි කියා ඔහු දන්නා නිසා."

"ඔබට ලැබුණේ එපමණද?"

"තවත් එක් දෙයක් ලැබුණා'

"ඒ මොකක්ද?"

"එය මට හමුවුණේ යකඩ ලාච්චුවේ අඩියට ඇලී තිබිලා" හෝම්ස් කීය. "ඔහුගේ දිනපොත සහිත පාර්සලයට යටින් ලාච්චුවේ තිබූ මලකඩවලට මෙය ඇලී තිබුණා" කී හෝම්ස් තම කාමරයට ගොස් කවරයක් ගෙන ආවේය. "මේ ගැන ඔබට මොනවද හිතෙන්නෙ වොට්සන්?"





එය ප්‍රමාණයෙන් තරමක් දිගු වූ ලියුම් කවරයකි. ලියාපදිංචි තැපෑලෙන් ලිපිලේඛන යැවීමට භාවිත කරන ආකාරයේ අඟල් 3 × 8 ප්‍රමාණයේ මෙම කවරය මුලින් සුදු පැහැති කවරයක් වන්නට ඇත. නමුත් දැන් එයට තිබුණේ දුඹුරු පැහැයකි. කවරය මත අංක පේළි කිහිපයක් ලියා තිබිණි. හෝම්ස්ගේ උත්තල කාචය ඉල්ලා ගෙන මම එම සටහන පරීක්ෂා කර බැලීමි. එය යම්කිසි මුදල් ප්‍රමාණ ගැන සටහනක් බවත් අන්තිමේදී මුදල් ප්‍රමාණ එකට එකතු කොට තිබූ බවත් දැගත හැකි විය. මම ඒ බව හෝම්ස්ට කීවෙමි.

"මගේ හිතවත් වොට්සන්. ඔය මුදල් ප්‍රමාණ හෝ ඒවායේ එකතුව අපට වැදගත් නෑ. ඔබ බලන්න ඕන ඔය ලියුම් කවරයේ අනෙක් පැත්ත"

මම වහාම කවරය අනෙක් පස හැරවීමි. එය කලකට පෙර තැපැල් කරන ලද ලිපියක් සඳහා යොදාගත් කවරයක් බව පැහැදිලි විය. එයට ඇලී තිබූ තුනී මලකඩ තට්ටුව නිසා ලිපිනය කියවීම තරමක් අපහසු විය. පසුව ඇඩි උත්සාහයක් දැරූ විට එය කියවීමට හැකියාව ලැබිණ. එහි මෙසේ සඳහන් විය.

"මාටින් ඩැල්රිම්පල්"

කොල්බර්ට් වත්ත

අංක 117 ක්වීන් මේරි උද්‍යානය

ග්ලාස්ගෝ"

මා එය කියවන ආකාරය මගේ මිත්‍රයා බලා සිටියේ මහත් සතුටෙනි.

"මේකෙ වැදගත්කම මොකක්ද හෝම්ස්?"

"ඕකෙ වැදගත්කමද? තවම නම් මට ඒ කාරණය හරියටම නිශ්චිතව කියන්න බෑ වොට්සන්. නමුත් මට මෙහෙම හිතෙනවා. අර අතුරුදන්වුණු කපිතාන් මැකෝමික් ගැන සොයා බැලීමක් කරනවා නම්, අපි පටන් ගන්න ඕන ඔන්න ඔය ලිපිනයෙන්"

"ඇයි ඔබ එහෙම හිතන්නෙ?"

"මොනම ආකාරයක හෝ හෝඩුවාවක් අප ළඟ නැති වෙලේ මෙහෙම දෙයක් ලැබුණු එකත් සුභ ලකුණක්. ඔබ දන්නවද වොට්සන්. ඕලන්දයට යාමට පෙර මං කපිතාන් මැකෝමික්ගේ ඉතිහාසය හොයල බැලුවා."

"හැබැට? මොනවද ඔබට දැනගන්න හැකිවුණේ?"

"මේ කාරණා මට දැනගන්න හැකිවුණේ ග්ලාස්ගෝ සරසවියෙන් ලන්ඩන් සරසවියට, පර්යේෂණ සඳහා පැමිණ සිටින මහාචාර්ය සැමුවෙල් රොජර්ස්ගෙන්. ඔහු සහ මැකෝමික් යාන්ත්‍රික ඉංජිනේරු පීඨයේ එකට උගත් අය. මැකෝමික් ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ, ඉංජිනේරු අංශයේ තමයි අධ්‍යාපනය ලබල තියෙන්නේ. එහි යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ ඉහළම ලකුණු ලබාගනිමින් ඔහු ප්‍රථම පංතියේ ගෞරව සාමාර්ථයක් ලබල තියෙනවා. ඒ බොහොම ළාබාල තරුණයෙකු හැටියට. පසුව සරසවියේ කථිකාචාර්ය මණ්ඩලයට බැඳුණු ඔහු ආචාර්ය උපාධිය ලබාගෙන තියෙන්නේ කෙටි කාලයක් ඇතුළත. පසුව ඔහු මැංචෙස්ටර් විශ්වවිද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු පීඨයේ කාලයක් පර්යේෂණවල යෙදිල තියෙනවා. පසුව ජර්මනියේ මියුනික් සරසවියේ ඉංජිනේරු පීඨයට බැඳුණාලු. එහිදී ඔහු පර්යේෂණ කරලා තියෙන්නේ ලෝක ප්‍රකට විද්වතෙකු වුණු මහාචාර්ය කොන්රඩ් වොන් බ්‍රෝන් සමඟ. මැකෝමික් කළ නව සොයා ගැනීම් දෙකකට පේටන්ට් අයිතිය ඔහුට තියෙනවා. ඊට අමතරව යුරෝපයේ යාන්ත්‍රික ඉංජිනේරුවරුන්ගේ විද්‍යායතනය පිරි නමන ඩැරල් ශ්වයිට්සර් රන් පදක්කම මැකෝමික් දෙවරක්ම හිමි කරගෙන තියෙනවා"

"මේ මිනිහා එහෙනම් නාවුක කපිතාන්වරයෙකුට වඩා විද්වත් ඉංජිනේරුවෙක්?"

"හරියට හරි." හෝම්ස් කීය. "ඉංජිනේරු ක්ෂේත්‍රයේ මේ තරම් කීර්තිනාමයක් ලැබූ ඔහු, අන්තිමට ඒ හැමදෙයක්ම අත්හැර දමා නාවික ක්ෂේත්‍රයට බැඳිලා තියෙනවා. ඔහුට තිබුණු ඉංජිනේරු විද්‍යා දැනුම, අනෙක් නවීන විද්‍යාවන් සහ ගණිතය පිළිබඳ හසල දැනුම නිසා, ඉතා කෙටි කාලයකින් ඔහු කපිතාන් තනතුර දක්වා උසස්වීම් ලබල තියෙනවා. එතකොට ඕනම කෙනෙකුගේ හිතේ ඇතිවෙන ප්‍රශ්නය තමයි, මේ තරම් තියුණු බුද්ධියක් ඇති පුද්ගලයෙකු මුළු ඉංජිනේරු ක්ෂේත්‍රයම අත්හැර දමා සම්පූර්ණයෙන්ම වෙනස් ක්ෂේත්‍රයකට පිවිසුණේ ඇයි කියන එක. ඒකටත් පිළිතුර මට ලැබුණා. මොන තරම් උගතෙකු වුණත් මැකෝමික් ධනයට දැඩි කෑදරකමක් දැක්වූ පුද්ගලයෙක්ලු. පර්යේෂණවල යෙදීමට ඔහුට විශාල වශයෙන් මුදල් වියදම් වුණාලු. ඒ නිසාලු ඔහු විශාල ධනයක් උපයාගන්න රැකියාව වෙනස් කළේ.





"මනුස්සයින් හිටි ගමන් එහෙම දේවල් කරනවා හෝම්ස්." මම කීවෙමි. "හොඳම උදාහරණය ඔබ. වෛද්‍ය විද්‍යා අංශයෙන් අධ්‍යාපනය ලබන්න පටන්ගත් ඔබ අන්තිමට කොහෙන්ද කෙළවර වුණේ? අවසන් ඉලක්කය මුදල් උපයාගැනීම නොවුණත්, අපරාධ පරීක්ෂණය පිළිබඳ විශේෂඥයෙකු වීමට ඔබ තීරණය කළා. එහෙම නේද?"

"හරි හරි මිත්‍රයා" හෝම්ස් කීවේ සිනාවක් නගමිනි. "එතැනදි ඔබ මට කලින් නියම පොට අල්ලා ගත්තා. එතැනින් ඉදිරියට යන්න මට පුළුවන් කමක් නෑ"

"හොඳයි. මේ ලියුම් කවරයේ තිබෙන ග්ලාස්ගෝ ලිපිනය සහ ඩැල්රිම්පල් කියන පුද්ගලයා අපට වැදගත් වෙන්නෙ කොහොමද?" මම ඇසීමි.

"ඒක හොඳ ප්‍රශ්නයක් වොට්සන්. නමුත් ඒකට නිශ්චිත පිළිතුරක් දෙන්න තවමත් මට හැකියාවක් නෑ. අපි ඔය ස්ථානයට ගිහිල්ලම බලන්න ඕන"

"ඔබ හිතන්නෙ ඕලන්දයෙන් පැන ආ කපිතාන් මැකෝමික් ඇත්තේ ඔය ලිපිනයේ කියලද?"

"ඒක කියන්නත් බෑ." හෝම්ස් කීය. "ඊයේ ඕලන්දයේ සිට ආපසු එන අතරේ, මං ස්කොට්ලන්ඩ්යාඩ් එකට ගිහිං අපේ මිත්‍ර ස්ටැන්ලි හොප්කින්ස් හමුවුණා. ඔබ දන්නවනේ. පොලිසියේ සිටින රහස් පරීක්ෂකයන් අතර තරමක බුද්ධිමතෙකු ලෙස මං සලකන්නේ ස්ටැන්ලි හොප්කින්ස් පමණක් බව. මං ඔහුට වැඩක් භාර දුන්නා. කපිතාන් මැකෝමික් නාවික හා ඉංජිනේරු ක්ෂේත්‍රවලට දී ඇති ලිපින හොයාගෙන, ඒ තැන්වල ඔහු ඉන්නවාද කියල හොයල බලන්න වහාම පියවර ගන්න කියල. ඊට අමතරව මං ඔහුට කිව්වා ලොයිඩ්ස් ආයතනයෙන් මැකෝමික්ගේ ඡායාරූපයක් හොයා ගන්න; ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ මහා අපරාධකාරයන්ගේ ඡායාරූප අතර මෙවැනි කෙනෙකුත් ඉන්නවාද කියා පරීක්ෂා කර බලන්න කියල."

"එතකොට හෝම්ස් ඔබ හිතන්නේ, මේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ විද්වතා අපරාධකාරයෙකු වීමට ඉඩ ඇතියි කියලද?"

"ඒක මට හරියටම කියන්න බෑ මිත්‍රයා. නමුත් ඒක එකපාරටම බැහැර කරන්නත් බෑ. අසාමාන්‍ය ලෙස විශිෂ්ට ප්‍රතිභාවක් පෙන්වන

බුද්ධිමතුන් එච්චර ලේසියට අපරාධවලට යොමු වෙන්නේ නැති බව ඇත්ත.

නමුත්....... නමුත් අපට මහාචාර්ය ජේම්ස් මොරියාටි ගැන අමතක කරන්නත් බෑ නේද? ද්විපද සමීකරණ ප්‍රමේයයේ සිද්ධාන්තය මුලින්ම ඉදිරිපත් කළේ ශ්‍රීමත් අයිසැක් නිව්ටන් බව ඇත්ත. අවුරුදු දෙසීයකට ආසන්න කාලයක් එය අවිවාදයෙන් විද්‍යා ලෝකයේ පිළිගැනුණා. නමුත් ඊළඟට ඒ සිද්ධාන්තය අභියෝගයකට ලක් කරමින්, මොරියාටි විධිමත් ශාස්ත්‍රීය නිබන්ධයක් ඉදිරිපත් කළා. මොරියාටි ඊට පසු උල්කාපාතයක චලනය ගැන තාරකා භෞතික විද්‍යාත්මක න්‍යායක් ඉදිරිපත් කළා. එය බිඳ දමමින් මතයක් ඉදිරිපත් කරන්න කාටවත් හැකිවුණේ නෑ. එහෙම කෙනෙකු අපරාධ ක්ෂේත්‍රයට යොමුවේවි කියල කවුද විශ්වාස කරන්නේ?"

"හෝම්ස් ඔබ කියන කාරණාව සම්පූර්ණ ඇත්ත" මම කීවෙමි. "ඉතින් ඔබ මීළඟට මොකක්ද කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"හොප්කින්ස්ට යමක් හොයාගන්න හැකිවුණත් නැතත් මං යනවා ග්ලාස්ගෝ"

"මේ ලියුම් කවරයේ තිබෙන ලිපිනය හොයාගෙන?"

"ඔව්"

"මේ ලිපිනයෙන් ඔබ වැදගත් තැනකට යොමුවේවි කියල ඔබට විශ්වාසයිද?"

"මෙහෙමයි වොට්සන්. මේ වෙලාවෙ අපට වෙන මොකුත්ම හෝඩුවාවක් නෑ. "ෆ්‍රීස්ලන්ඩ්" නෞකාවේ ගෙන ආ රත්රන්වලට මොකද වුණේ? ඒකයි මට විසඳීමට භාරවෙලා තියෙන ගැටලුව. මේ අතරේ ඒ අතුරුදන්වීමට අදාළ පුද්ගලයෙකු ආගිය අතක් නැතිවුණාම? මේක බොහොම ඈත ඉඳන් නොපැහැදිලි ඉලක්කයකට විදින හීයක් වගෙයි. ඒක ගිහින් හරියටම ඉලක්කයේම ඇමිණේවි කියලා මගේ ලොකු විශ්වාසයක් නෑ. නමුත් මට වෙන විකල්පයකුත් නෑ......."

මේ අතරේ ඔහුගේ කථාවට බාධා කරමින් කිසිවෙකු දොරට තට්ටුකරන හඬක් ඇසිණ. හෝම්ස් එයට දුන් පිළිතුර සමඟ ඇතුළට මුලින් පැමිණියේ හඩ්සන් මහත්මියයි. නිල ඇඳුමකින් සැරසී සිටි කිසිවෙකු ද ඇය පසුපස පැමිණියේය.





"හෝම්ස් මහත්මයා. ඕලන්ද තානාපති කාර්යාලයෙන් ඔබ හමුවෙන්න කෙනෙක්......." ඇය කීවාය.

"මහත්මයා. මගේ ප්‍රධානියා මේක ඔබට භාරදෙන්න කිව්වා" අමුත්තා හෝම්ස් දෙසට ලොකු කවරයක් දිගු කළේ ආචාර කරමිනි. "කරුණාකර මෙය ලැබුණු බවට මෙම පොතේ අත්සන් කර දෙන්න"

කවරය මුද්‍රා තැබූ එකක් විය. ඒවා පරීක්ෂා කළ හෝම්ස් පණිවුඩකරුවාගේ ඉල්ලීම පරිදි අවශ්‍ය අත්සන ලබා දුන්නේය. ඉන්පසු හිස නමා ආචාර කළ අමුත්තා පිටවී ගියේය.

"මෙතැන තියෙන්නේ වැන්රුයන් ආදිපාදතුමා මා වෙත එවන්න පොරොන්දු වුණු ඡායාරූප වෙන්න ඇති" හෝම්ස් කීවේ කවරය විවෘත කරමිනි. අනතුරුව ඔහු එය තුළ තිබූ ඡායාරූප මට පෙන්වීය.

"එහි ලියා තිබූ දේවල් මේ ඡායාරූපවල පැහැදිලිව පෙනෙනවා" ඔහු කීය. "නමුත් මේ සංකීර්ණ ගුප්ත ලියවිල්ලේ අඩංගු දේ හෙළිකර ගැනීම, එච්චර පහසු කටයුත්තක් වෙන්නෙ නෑ."

"විශේෂයෙන්ම ඔහු ඉංජිනේරු හා ගණිත ශාස්ත්‍රයේ විද්වතෙකු නිසා?" මම ඇසීමි.

"අන්න හරි. ඒ කාරණය නිසා අපේ ගැටලුව වඩාත් සංකීර්ණ වෙනවා" ඔහු කීය.

මේ වෙලාවේ යළිත් වරක් අපේ කතාබහට බාධා ඇතිවිය. ඒ කිසිවෙකු තරප්පු පෙළ දිගේ උඩුමහලට පැමිණෙන පියවර හඬ අසන්නට ලැබීමෙනි.

"සැකයක් නෑ. මේ නම් එන්නෙ අපේ මිත්‍ර ස්ටැන්ලි හොප්කින්ස්" හෝම්ස් කීය. "ඔහුට මොනවා හරි සතුටුදායක ආරංචියක් ලැබිලා වෙන්න ඇති"

පැමිණියේ හොප්කින්ස් බවට හෝම්ස් කියූ අනාවැකිය නිවැරැදි වුවත් ඔහු කියූ අනික් කරුණ සාර්ථක නොවූ බැව් පෙනිණ.

"සුභ සන්ධ්‍යාවක් හෝම්ස් මහත්මයා" හොප්කින්ස් කීවේ කාමරය තුළට ඇතුළුවෙමිනි. "ඔබ හෙට උදේම පිටත්වෙන්න ඉඩ ඇති නිසයි මං මේ හැන්දෑවෙම ආවෙ.

ඔබ කියූ ඕවන් මැකෝමික් සහ තෝමස් හියුස් ගැන අපරාධ පරීක්ෂණ ක්ෂේත්‍රයේ ලේඛනවලත්, නාවුක ක්ෂේත්‍රයේ කාර්යාලවලිනුත් මං හොයා බැලුවා. ඔවුනට එරෙහිව කිසිම අයහපත් දෙයක් කිසිම තැනක වා[illegible]ා වී නැහැ. ඔවුන් දෙදෙනා පැදවූ

"ෆ්‍රීස්ලන්ඩ්" නෞකාව ඉංග්‍රීසි ඔඩයේදී පසුගිය මාසයේ අනතුරට පත්වූ කරුණ තමා වැදගත් පුවතක් ලෙස තිබුණේ.

අපකීර්තිමත් මැරවරයින්ගේ ඡායාරූප අඩංගු ලිපිගොනුවල ඒ දෙදෙනාගේ ඡායාරූප තිබෙනවාද කියා මං සොයා බැලුවා. එවැනි සැක කටයුතු එක් ඡායාරූපයක්වත් මට දකින්න ලැබුණේ නැහැ. සතුටුදායක තොරතුරක් ඔබ වෙත ගෙන ඒමට නොහැකිවීම ගැන මට කනගාටුයි. ඉතින් මොකක්ද ඔබ මීළඟට කරන්න බලාපොරොත්තු වෙන්නේ?"

"හෙට උදේ මම ග්ලාස්ගෝ බලා යනවා"

"එහෙනම් ඔබට උදව් ලබාගත හැකි කෙනෙකු ගැන මං කියන්නම්" හොප්කින්ස් කීය. "එහේ තිබෙන අපරාධ පරීක්ෂණ ශාඛාවේ ප්‍රධානියා ලෙස මෙහෙන් යැව්වේ රොබට් මැක්ලීලන්ඩ්. මෙහේ ඉඳිද්දී ඔහු මගේ යටතෙයි පුහුණුව ලැබුවේ. දක්ෂ ඒ වගේම ප්‍රියමනාප කෙනෙක්. ලන්ඩනයෙදි ඔබට ඔහුව මුණ ගැහෙන්න අවස්ථාවක් ලැබුණා කියල මං හිතන්නෙ නෑ. කියන්න ඔහු ගැන මං ඔබට කිව්ව කියල. ඔහු පුළුවන් හැම සහයෝගයක්ම ඔබට දේවි."

"ඔබට ස්තුතියි හොප්කින්ස්. මං හිතන්නේ ඔහුගේ සහයෝගය මට අවශ්‍ය වේවි" හෝම්ස් කීය.

"වොට්සන් දොස්තර මහත්තයත් හෙට උතුරට යනවද?"

"මගේ මිත්‍ර වොට්සන්ට මේ ගමනට මං ඇරයුම් කරන්නෙ නෑ" හෝම්ස් කීවේ සිනාමුසු මුහුණෙනි. "මේ දවස්වල පැතිර යන ඉන්ෆ්ලුවන්සා වසංගතය වෙනුවෙන්, අපේ දොස්තර මහත්මයාට විශාල වැඩ කොටසක් පැවරිලා. මේ දැන් ඇවිත් ඉන්නෙත් රෝගීනට ප්‍රතිකාර කරන්න ගිහිං එන ගමන්. මගේ හිතවත් මිත්‍රයා මා ළඟ නොමැතිවීම මට විශාල පාඩුවක්. නමුත් මේ ගමන ඉතා කෙටි එකක් වේවි කියලයි මට නිකමට හිතෙන්නෙ. ඒ මොකද ගැඹුරටම සොයා බැලිය යුතු හෝඩුවාවන් කිසිවක් මට තවමත් ලැබිල නැහැනෙ"

"මගෙන් කෙරෙන්න ඕන වෙන යමක් තියෙනවා නම් මට විදුලි පුවතක් එවන්න හෝම්ස් මහත්තයා. ඔබට ශුභ ගමන්" කී පොලිස් නිලධරයා අපෙන් සමුගෙන පිට වී ගියේය.

"හෝම්ස්. මං හිතන්නේ දැන් මමත් ගියොත් හොඳයි කියලයි" මම කීවෙමි. "හෙට ගමනට ඔබ සූදානම් විය යුතුයිනෙ. කොයි වෙලාවටද ඔබ යන්නෙ?"





"උදැසනින්ම - ඒ කියන්නෙ පාන්දර පහට පිටත්වෙන දුම්රියක් තියෙනවා. ඒකෙ ගියොත් හොඳයි කියලයි මට හිතෙන්නෙ. දින දෙකක් ගතවෙද්දි මට ආපසු එන්නත් ලැබේවි."

ඔහුට ශුභ පැතූ මම නිවසෙන් පිටත් වී ආවෙමි.

* * *

වසංගත රෝගය පැතිර ගියේ අප සිතුවාට වඩා ඉක්මනින්ය. මෙම රෝගය කුඩා ළමයිනට බොහෝ හිරිහැර කිරීමට ඉඩ ඇතැයි වෛද්‍යවරුන් කී අනාවැකිය නිවැරැදි නොවිණි. එය වාසනාවක් විය. අනපේක්ෂිත ලෙස වඩාත් හිරිහැර සිදුවූයේ වයස්ගත අයටයි. නිදන්ගත රෝගවලින් පීඩා විඳිමින් ලෙඩ ඇඳට වී සිටි වයස්ගත අයට, මෙම රෝගය විපත් ගෙන ආවේය. කෙසේ වෙතත් වෛද්‍යවරුන්ගේ දැඩි කැපවීම නිසා රෝගය ක්‍රමයෙන් මැඩ පවත්වා ගැනීමට හැකි විණි.

රෝගීන් ගැනම සිතමින් කාලය ගත කළ මට දින ගණන් ගතවී යනු නොදැනිණ. එක් දිනක සැන්දෑ කාලයේ මගේ මිත්‍ර හෝම්ස් මගේ නිවහනට පැමිණියේ මා කිසිසේත් ඔහු අපේක්ෂා නොකළ මොහොතකය.

"වොට්සන්. ඔබට බේකර් වීදියම අමතක වෙලා වගෙයි. මං හිතුවා ඔබ ඒ පැත්තෙ ඒවි කියලා" මගේ මිත්‍රයා කීවේ සුවපහසු අසුනක හිඳගනිමිනි.

"හෝම්ස්! ඔබ ඉක්මනටම ආපහු ඇවිත් නේද? දවස් කීයක් ගතවුණාද? රෝගීන්ට ප්‍රතිකාර කරන්න එහෙ මෙහේ දිවුවා මිසක් ඔබත් ඔබේ පරීක්ෂණයත් මට සම්පූර්ණයෙන්ම අමතක වුණා. කොහොමද වැඩ කටයුතු සාර්ථකද?"

රෝගීනට කෙරුණු ප්‍රතිකාර ගැන විමසමින් මඳ වේලාවක් ගත කළ ඔහු, තම අසුන ගිනි උඳුන වෙත ළං කරගෙන පයිප්පය දල්වා ගත්තේය. ඔහුට කීමට තිබූ කථාව ඔහු ඇරඹුවේ ඉන්පසුවය.

"ග්ලාස්ගෝ බලා ගිය මම මුලින්ම ගියේ අර පොලිස් පරීක්ෂකවරයා හමුවෙන්න. ඒ හොප්කින්ස්ගේ මිත්‍රයා - මැක්ලීලන්ඩ්. හොප්කින්ස් ඔහුට විදුලිපුවතක් යවල තිබුණා මට උදව් කරන්න කියලා. ඉතින් ඒ පැත්තෙන් මගේ කටයුතු පහසුවුණා. ඕලන්දයෙන් මට උපදෙස් ලැබුණේ මේ පරීක්ෂණය කරද්දී ඉතාම

රහසිගතව එය කළ යුතු බව. ඉතින් මං කටයුතු කළේ ඒ විදියටයි. මං ඔහුට මෙහෙම කිව්වා.

"මැක්ලීලන්ඩ් මහත්මයා. මට එක්තරා පුද්ගලයෙකු ගැන තොරතුරු හොයාගන්න උවමනා වෙලා තියෙනවා. ඔහු මේ ස්කොට්ලන්ත ජාතිකයෙක්. ඔහු වංචාවක් කළ බවට තවමත් පැහැදිලි සාක්ෂියක් නෑ. නමුත් ඔහු සිටි තැනින් අතුරුදන් වෙලා. තනියම නෙමෙයි; ඔහුගේ හොඳම මිත්‍රයෙකු සමඟ. මං සොයන පුද්ගලයාගේ නම කපිතාන් ඕවන් මැකෝමික්. ඔහු නෞකා කපිතාන්වරයෙක්. ඔහුගේ මිත්‍රයාගේ නම තෝමස් හියුස්. ඔබට මෙවැනි නම් තියෙන පුද්ගලයන් ගැන අහන්න ලැබිල තියෙනවද?"

"අපරාධ සම්බන්ධයෙන්ද? නැත්නම් සාමාන්‍ය ප්‍රවෘත්තියකද?"

"මොන ආකාරයෙන් හරි?"

"අපරාධයක් සම්බන්ධයෙන් නම් මගේ මතකයේ හැටියට එහෙම කෙනෙකු ගැන මට අහන්න ලැබිල නෑ" මැක්ලීලන්ඩ් කිව්වා. "නමුත් ඔය නම තියෙන දක්ෂ ඉංජිනේරුවෙකු ගැන නම් මං පුවත්පත්වල කියවා තිබෙනවා. තමන්ගේ ක්ෂේත්‍රයේ දක්ෂකම් පෙන්වූ ඔහු පසුව එංගලන්තයට සංක්‍රමණය වුණාලු. එක්කෝ මැංචෙස්ටරයට නැත්නම් ලන්ඩනයට. ඊට පස්සේ දීර්ඝ කාලයක් මට ඔහු ගැන කිසිවක් අහන්න ලැබුණේ නෑ. ඔය නමම තියෙන ඔබ කියන නාවික කපිතාන්වරයා පැදවූ නැව, අනතුරකට භාජනය වූ ආරංචියත්, මං කලකට පෙර පුවත්පතක කියෙව්වා මතකයි. නමුත් කෙළින්ම අපේ ක්ෂේත්‍රයට අදාළ නැති නිසා, මං ඒ ගැන වැඩි අවධානයක් යොමු කළේ නෑ. එතකොට සිටි තැනින් අතුරුදන්වෙලා තියෙන්නේ මේ පුද්ගලයාමද?"

"ඔව්. නමුත් ඔබටත් ඔහු ගැන ඒ තරම් තොරතුරක් ලැබිලා නැත්නම් ඒ කාරණාව අපි දැනට අමතක කරමු."

"වෙන මොනවද ඔබට දැනගන්න උවමනා?"

"ඊළඟට මට දැනගන්න උවමනායි, මගේ පරීක්ෂණවලදී මට දැනගන්න ලැබුණු ලිපිනයක් ගැන තොරතුරු." එහෙම කියූ මම මගේ දිනපොත එළියට අරගෙන එහි ලියා තිබූ ලිපිනය කියෙව්වා.

"නම මාටින් ඩැල්රිම්පල්, කොල්බර්ට් වත්ත, අංක 117 ක්වීන් මේරි උද්‍යානය, ග්ලාස්ගෝ"





"එහෙනම් ඩැල්රිම්පල් මොකක් හරි ප්‍රශ්නයකට මැදි වෙලාද?" පොලිස් නිලධරයා විමසුවා.

"මැක් මහත්තයා. මට ඉස්සරවෙලාම කියන්න; ඔබ ඔහු අඳුනනවාද?"

"මං ඔබට හැමදෙයක්ම කියන්නම් හෝම්ස් මහත්මයා" මැක්ලීලන්ඩ් කිව්වා. "ඔහු තරමක් ප්‍රසිද්ධ කෙනෙක්. මට ඔහු දකින්න ලැබිල නැහැ. නමුත් ඔහු ගැන තොරතුරු නම් අහන්න ලැබිල තියෙනවා."

"මොනවද ඒ තොරතුරු?"

"ඔහු ප්‍රසිද්ධියට පත්වෙලා තිබෙන්නේ කලාකෘති එකතු කරන්නෙකු හැටියට" මැක්ලීලන්ඩ් කිව්වා. "සුප්‍රසිද්ධ චිත්‍රශිල්පීන් ඇන්ද තෙල්සායම් සිතුවම් එකතු කිරීම තමයි ඔහුගේ විනෝදාංශය. එංගලන්තයේ ප්‍රංශයේ ඉතාලියේ ආදී රටවල පසුගිය ශතවර්ෂ වල විසූ සුප්‍රසිද්ධ චිත්‍රශිල්පීන්ගේ චිත්‍ර ඔහු මිලට ගන්නවා. ඊට අමතරව පෞරාණික අරුමෝසම් බඩු, මුතුමැණික් ආදී ආභරණත් ගන්නවා. නමුත් ඒවා කිසිවක් මිලට ගන්නේ විකිණීමට නෙමෙයි. මේවා මිලට ගන්න ඔහු වරින්වර විදේශ සංචාරවල යෙදෙන බවත් මට අහන්න ලැබුණා. එහෙම ගියාම ඔහු පැරණි සිතුවම් සොයමින් දීර්ඝ කාලයක් විදේශවල ගත කරනවාලු."

"කොයිතරම් කාලෙක ඉඳගෙනද ඔහු මේ කටයුත්ත කරන්නේ?"

"මං හිතන්නේ එච්චර කාලයක් නැහැ." මැක් මහත්තයා කිව්වා. "මං එහෙම කිව්වේ ඔහු ග්ලාස්ගෝවල පදිංචියට ඇවිත් ඒ තරම් කාලයක් නැති නිසයි. දීර්ඝ කාලයක් මෙහේ හිටියාද කියන එකත් මට හරියටම කියන්න බෑ. නමුත් මට ඔහු ගැන අහන්න ලැබිලා මාස හත අටකට වැඩි වුණේ නැහැ"

"මොනවද ඔබට අහන්න ලැබුණේ?"

"ඔබ ඔය කියූ ක්වීන් මේරි උද්‍යානයේ ඉඩම ඔහු මිලට ගත්තේ අවුරුද්දකට පමණ කලින් විය යුතුයි. ක්වීන් මේරි උද්‍යානය කියන්නේ ධනවත් වැදගත් අය පදිංචි පළාතක්. ඒක ඒ තරම් ජනාකීර්ණ එකක් නෙමෙයි. කොල්බර්ට් වත්ත කියන්නේ සර් ඩග්ලස් කොල්බර්ට් නම් ප්‍රභූවරයාට අයත්ව තිබූ නිවස සහිත ඉඩම. දිගු කලක් අසනීපෙන් සිටි වයසක කොල්බර්ට් මියගියාට

පස්සේ ඔහුගේ බිරිඳ ගේ විකුණා දමලා ඇගේ දරුවන් පදිංචි ලන්ඩනයට සංක්‍රමණය වුණා."

"ඒ නිවස ඉතාම හොඳ එකක්ද?"

"බොහොම පරණ අබලන් එකක් බවයි මට අහන්න ලැබුණේ. මාටින් ඩැල්රිම්පල් ඒක කඩා දමලා නිවසක් අලුතෙන්ම ඉදි කළාලු. ඒක පරණ තාලේ එකක් නෙමෙයි. බොහොම නවීන එකක්. හොරුන්ට ඇතුළුවෙන්න බැරි වෙන විදියට ස්වයංක්‍රීයව නාදවෙන විදුලි සීනු පවා එහි තිබෙනවාලු"

"හැබෑට? ඔබට කොහොමද මේ තොරතුරු අහන්න ලැබුණේ?" මං ඇහුවා.

"මේ පුද්ගලයා වටිනා පුරාවස්තු මිලට ගන්න කෙනෙකු බව මං ඔබට කිව්ව නේ හෝම්ස් මහත්මයා" මැක්ලීලන්ඩ් කිව්වා. "ඒ වටිනා දේ ආරක්ෂා කිරීමට සුදුසු විදියට තමයි නිවස ඉදිකර තිබෙන්නේ. ඒ නිවසේ සාලයට සම්බන්ධව විශේෂ සුරක්ෂිතාගාරයක් තිබෙනවාලු. ඒකට මහා දැවැන්ත රක්ෂණයක් ඔහු අරගෙන තිබෙනවා. අපේ පොලීසියේ පරීක්ෂකයෙක් කියනවා, රක්ෂණ සමාගමේ ග්ලාස්ගෝ ශාඛාව පවත්වාගෙන යන්නෙත්, ඩැල්රිම්පල් ගෙවන විශාල රක්ෂණ මුදලෙන් කියල"

"ඔබේ පොලිස් පරීක්ෂකයා කොහොමද මේ තොරතුරු දැනගෙන තියෙන්නෙ?"

"ඩැල්රිම්පල් ඔහුගේ විදේශ සංචාර සඳහා යාමට සූදානම් වෙද්දී, ඔහු රක්ෂණ සමාගමට ඒ ගැන දැනුම් දෙනවලු. ඉතින් ඔවුන් මෙතැනට ඔවුන්ගේ ආරක්ෂක නිලධරයන් පිරිසක් එවනවා. ඒ අය තමන්ගේ කටයුත්තට පොලීසියේ සහයෝගයත් ලබාගන්නවා" මැක්ලීලන්ඩ් කිව්වා.

"මැක් මහත්මයා" මං කිව්වා. "මං කැමතියි ඔබේ ඔය පොලිස් නිලධරයා හමුවෙලා කතා කරන්න. මොකක්ද ඔහුගේ නම?"

"ඔහුගේ නම ජෝ රැන්කින්. ඔහු හමුවෙලා කතාකරල බලන්න කියල මං ඔබට යෝජනා කරන්නයි හැදුවෙ. හෙට උදේම ඔබේ හෝටලයට ඇවිත් ඔබව හමුවෙන්න කියල මං ඔහුට දැනුම් දෙන්නම්. ඔබ කොහේද නවතින්නෙ?"

"ග්ලැඩ්ස්ටන් හෝටලයේ"

"බොහොම හොඳයි. මං ඔහුව හෙට උදේම එවන්නම්"





ඉතින් ඒ සාකච්ඡාව ඒ විදියට අවසන් වුණා වොට්සන්. මේ ඩැල්රිම්පල් කියන ධනවතා එක්ක කපිතාන් මැකෝමික්ට තියෙන ගනුදෙනුව මොකක්ද කියල මට හිතුණා. දෙදෙනාම ස්කොට්ලන්ත ජාතිකයන් නිසා පරණ හැඳුනුම් කමක් ඇති. සමහරවිට එකට විද්‍යාලයේ ඉන්න ඇති. ඩැල්රිම්පල්ට ලැබුණු ලියුමක කවරයක් කපිතාන් මැකෝමික්ගේ රහසිගත ලාච්චුවේ අඩියට ගියේ කොහොමද? ඔය ආදී දේවල් මගේ ඔළුවට ආවා."

"ඔබ ඒ ලියුම් කවරය තවදුරටත් පරීක්ෂා කරල බැලුවෙ නැද්ද හෝම්ස්?"

"විශිෂ්ටයි මගේ මිත්‍රයා. ඔබ ඔය ප්‍රශ්නය අහවි කියල මට හිතුණා." හෝම්ස් කීය. "එදා ග්ලාස්ගෝ බලා යන්න කලිනුයි මං ඒක පරීක්ෂාවට ලක් කළේ. ඒක ග්ලාස්ගෝ පළාත් පාලන· අධිකාරිය මගින් ඩැල්රිම්පල්ට එවූ ලියුමක කවරය. ඒක මට දැන ගැනීමට හැකිවුණේ ඒ බව කුඩා අකුරෙන් ලියුම් කවරයේ ලියා තිබුණු නිසා. ඒ තීන්ත දුර්වර්ණ වීමත් කවරය මත තැවරී තිබුණු මළකඩ තට්ටුවක් නිසා මුලින් බැලූ බැල්මට එය පෙනුණේ නැහැ. නමුත් කාචය යොදාගෙන පරීක්ෂා කරද්දී එය පහසුවෙන් දැකගත හැකි වුණා.

ඉතින් මම පළාත් පාලන අධිකාරියටත් ගිහින් විමසා බැලුවා. ඒක විශේෂ කවරයක් නෙමෙයිලු; කාට හරි ලියුම් යැවීමේදී භාවිත කරන සාමාන්‍ය කවරයක්ලු.

පහුවදා උදේ පොලිස් පරීක්ෂක රැන්කින් මා හමුවෙන්න ආවා. හැඩිදැඩි සිරුරක් තිබුණු ඔහු ප්‍රසන්න පුද්ගලයෙක්. ඔහු සැරසී හිටියේ කතාකරගෙන ගියේ බොහොම වේගයෙන්. ඔහු සැරසී හිටියේ නිල ඇඳුමෙන් නෙමෙයි.

"මම ජෝ රැන්කින්. උප පොලිස් පරීක්ෂක. මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයද?" ඔහු කිව්වේ සුහද අයුරෙන් අතට අත දෙමින්.

"ඔබ හමුවීම මට සතුටක්. මෙහෙන් ඉඳගන්න. ඔබ කැමති ඉස්සර වෙලා කෝපි කෝප්පයක් බීල ඉන්නද? නැත්නම් දුම් බොනවා නම්........"

"නැහැ මහත්මයා. ඔබට ස්තුතියි. දුම්බීම නම් මං කොහොමටවත් කරන්නෙ නෑ. ඔබට කරදරයක් නැත්නම් මේ සීතල දවස්වල කෝපි කෝප්පයක් බීමට ලැබීම අනර්ඝයි"

හෝටල් සේවකයා කැඳවා කෝපි ගෙන එන්න නියම කරලා මං කතාව ඇරඹීමට සූදානම් වුණා. නමුත් මට පෙර ඔහුම ඒ මාතෘකාවට පිවිසුණා.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ඔබට දැනගන්න උවමනා මොකක් ගැනද කියන එක මට අපේ මැක්ලීලන්ඩ් මහත්මයා කිව්වා. ඔබට උවමනා මාටින් ඩැල්රිම්පල් මහත්මයා ගැන තොරතුරු දැනගන්න. එහෙම නේද?"

"ඔව්"

"මං දන්න හැම දෙයක්ම කියන්නම්" රැන්කින් කිව්වා. "ඔහු ඔය වත්ත මිලට ගත්තේ අවුරුද්දකට පමණ කලින්. පස්සේ ඒකෙ තිබුණු පරණ වලව්ව කඩා ඉවත් කරලා අලුත් නිවසක් ඉදිකළා. ඒක කළේ මැංචෙස්ටර්හි ඔහු හඳුනන ඉදිකිරීම් සමාගමක් මගින්. ඔහුට ඉංජිනේරු ක්ෂේත්‍රය ගැනත් පුදුමාකාර දැනුමක් තිබෙනවාලු. මේ ගෙදර ඉදිකළේ ඔහු සතු සිතුවම් හා අනෙක් වටිනා වස්තුව ආරක්ෂා කරන්නලු"

"ඔබ එතැනට ගිහිං තියෙනවද?"

"ඔව් හෝම්ස් මහත්මයා. පොලිස් නිලධරයෙකු ලෙස මට එතැනට යන්නට ලැබුණා. ඒ මිසක් වෙන කිසිකෙනෙකුට එතැනට යන්න ලේසියෙන් බෑ. වත්ත වටේටම ආරක්ෂක වැටක් තිබෙනවා. ගේට්ටුවේ ආරක්ෂක භටයන් ඉන්නවා."

"ඒ ගෙදරද ඔහු පදිංචි වෙලා ඉන්නේ?"

"එහෙමත් නෑ. නමුත් ඒක කෙනෙකුට දරු පවුලක් සමඟ පදිංචි වෙලා ඉන්න හොඳටම ප්‍රමාණවත්. ඔහු විවාහකද නැද්ද ළමයි ඉන්නවාද නැද්ද කියලා කවුරුවත් දන්නෙ නෑ. කොහොම වුණත් සමහර කාලවලට ඔහු මෙහේ නැවතී ඉන්නවා. සමහර කාල වලට විදේශ සංචාර වල යෙදෙනවා. ඒ චිත්‍ර සහ පෞරාණික භාණ්ඩ මිලදී ගන්න කියලයි ආරංචිය. කොහොම වුණත් ඔහු විදේශ ගතවෙද්දී එතැන ආරක්ෂා කිරීමට රක්ෂණ සමාගමට දැනුම් දෙනවා. ඔවුන් එතැන ආරක්ෂා කරන්නේ, දේපළ ආරක්ෂා කර දෙන ආරක්ෂක සේවා සමාගමක උදව් ඇතුවයි. මේ කටයුත්තට ඩැල්රිම්පල් විශාල මුදලක් මාස්පතා වියදම් කරනවා. ඔහුගේ සුරක්ෂිතාගාරයේ තිබෙන වස්තුව කොයි තරම් වටිනවා ඇත්ද කියලා ඒකෙන් හිතාගන්න පුළුවනි."

"එතකොට පොලීසිය කොහොමද මේකට සම්බන්ධ වෙන්නේ?"





"හෝම්ස් මහත්මයා. ඔබ ලන්ඩනයේ ඉඳල ආව නිසා මේ කාරණාව දන්නේ නැතුව ඇති. එහෙමත් නැත්නම් ලන්ඩනයෙත් මේ ක්‍රමය ක්‍රියාත්මක වෙනවාද කියල මං දන්නේ නෑ.

අලුතෙන් පත්වුණු පොලිස් කොමසාරිස්තුමාගෙ යෝජනාවක් අනුවයි මේ අලුත් ක්‍රමය ඇරඹුවේ. මුලින් මේක පටන් ගත්තෙ අත්හදා බැලීමක් හැටියට. ඩැල්රිම්පල් මහත්මයාගෙ නිවස, බැංකු හෝ අනෙකුත් සුරක්ෂිතාගාර, වගේ තැන්වලින් ඉල්ලුවොත් අපි ඔවුනට ආරක්ෂාව ලබාදෙනවා. හැබැයි ඒ සඳහා ඔවුන් පොලිස් සේවයට විශේෂ අමතර ගෙවීමක් කළ යුතුයි. එහෙමය කියලා පොලීසිය ආයුධ තියාගෙන එතැනට වෙලා මුර කරන්නේ නෑ. අපි කරන්නේ වරින්වර එතැනට මුර සංචාරයේ යෙදීම පමණයි. රක්ෂණ සමාගමත් මේ කටයුත්ත අපෙන් බලාපොරොත්තු වෙනවා. අපේ පැමිණීම එතැන ඉන්න ආරක්ෂක භටයන්ටත් ලොකු පහසුවක්."

"එහෙනම් ඔබත් මේ සුරක්ෂිතාගාරයේ රාජකාරියට ගිහින් ඇති?"

"ඔව්. මම දෙතුන් වරක් ගිහින් තියෙනවා." රැන්කින් කිව්වා. "අපට කරන්න කියලා අමුතු වැඩ රාජකාරි ගොඩක් නැහැ. වත්තට ඇතුළුවෙන තැන ගේට්ටුවේ ආරක්ෂක මුරපොළ පහුකරලා ගියාම ඊළඟට තියෙන්නේ නිවසේ ප්‍රධාන දොරටුව. එතැනත් ඉන්නවා ආයුධ තබාගත් භටයන් හා රක්ෂණ සමාගමේ නිලධරයන්. ඒකෙ දොර විවෘත කරලා ඔවුන් අපට යන්න දෙන්නේ, අප පොලිස් නිලධරයන් බව සැක හැර දැනගත්තට පස්සේ. එතැනින් අපි පිවිසෙන්නේ දිග සාලයකට නැත්නම් පැසේජයකට. ඒක දිගේ ගියාම තිබෙනවා දොරක්. ඒකෙන් ඇතුළුවෙන්නේ විසිත්ත කාමරයකට. ඒක තරමක් ලොකු එකක්. ඒකෙ තිබෙනවා සෝපා, පුටු මේස ආදිය සහ පොත් සහිත රාක්කයක්, පුවත්පත් තැබූ රාක්ක ආදිය. මේක තිබෙන්නේ ආරක්ෂක නිලධරයන්ට ඇවිත් මඳ වේලාවක් ගතකිරීමට, අවශ්‍ය වුණොත් හිඳ ගැනීම සඳහා කියල මට අහන්න ලැබුණා. නමුත් කිසි කෙනෙක් එතැන රැඳෙන්නේ නැහැ. ඒක මහ පාළු තැනක්. ගියත් ඉක්මනටම ආපහු යනවා. මේ විසිත්ත කාමරයේ ඈත කෙළවරක තමා සුරක්ෂිතාගාරයට ඇතුළුවෙන දොරටුව තියෙන්නේ"

"ඔබ ඒකටත් ගියාද?"

"සුරක්ෂිතාගාරයේ ඇතුළත නම් මට දකින්න ලැබිල නැහැ හෝම්ස් මහත්මයා. ඒක දකින්න ලැබුණු අය ඉන්නේ එක්කෙනයි. ඔහු රක්ෂණ සමාගමේ ඉහළ නිලධරයෙක්. සුරක්ෂිතාගාරයේ බිත්ති සම්පූර්ණයෙන්ම වැහිල තියෙන්නේ පෞරාණික තෙල්සායම් සිතුවම් වලින් කියල ඔහු කිව්වා. ඊට අමතරව විදේශීය පුරාවස්තු තැනින් තැන තිබෙනවාලු. විශාල පෙට්ටගම් තිබෙනවාලු, පෞරාණික රත්රන් කාසි හා ආභරණ මුතුමැණික් ආදිය ඇමූ. ඔහුට ඒවායේ ඇතුළත දකින්න ලැබිල නැහැ. නමුත් ඒ බව සඳහන් දැන්වීම් පෙට්ටිවල අලවා තිබෙනවාලු.

සුරක්ෂිතාගාරය එකම දිග ශාලාවක් නෙමෙයිලු. ඒක 'L' අකුරෙ හැඩයේ එකක්. දිගට තිබෙන ශාලාව කෙළවර වම් පැත්තට තවත් කොටසක් තිබෙනවාලු"

"කෝ ඒ රක්ෂණ නිලධාරියා දැන්?"

"ඔහු ඒ කාලෙම නිව්යෝක් නගරයේ ප්‍රධාන කාර්යාලයට මාරුවෙලා ගියා.

මේ අවස්ථාවේ හෝටල් සේවකයා කෝපි ගෙන ආ නිසා අපේ· කතාබහ මඳ වේලාවකට නවත්වන්න සිදුවුණා. අප ඉන්පසු කතාව ඇරඹුවේ ඔහු දොර වහගෙන පිටත්වී ගියාට පස්සේ.

"හොඳයි රැන්කින් මහත්මයා" මං කිව්වා. "ඔබ කියූ සුරක්ෂිතාගාරයට හොරුන්ට ඇතුළුවිය නොහැකි වන පරිදි ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වෙන විදුලිසීනු සවිකර ඇති බව මැක්ලීලන්ඩ් මහත්මයා මා සමඟ කිව්වා. ඒක ඇත්තක්ද?"

"ඇත්තෙන්ම ඔව්." රැන්කින් කිව්වා. "ඒවාට විදුලි බලය සැපයෙන්නේ මොන ආකාරයටද මං දන්නේ නෑ. නමුත් විදුලි සීනු තිබෙන කතාව ඇත්තක්. ඒවා නාදවෙන ආකාරය මට අහන්න ලැබිල තියෙනවා. රක්ෂණ නිලධරයෙක් වරක් මට පෙන්වීම සඳහා විදුලි සීනුවක් නාද වෙන්න සැලැස්සුවා. ඒවා ගිනි නිවන හමුදාවේ සීනු වගේ හරි ශබ්දයි."

"එතකොට මේකට ජනේල නැද්ද?"

"වාතාශ්‍රය ලැබීමට කුඩා – ඒ කියන්නේ අගල් 12 ක් පමණ දිග අගල් 3 ක් පමණ පළල කවුළු තිබෙනවා ඉතාම ඉහළින්. ඒ කියන්නේ වහල ලෙස තිබෙන කොන්ක්‍රීට් ලැල්ල සමීපයෙන්.





නමුත් ඒවා සොරෙකුට ඇතුළුවීමට ප්‍රමාණවත් නෑ. ඒ බව පිටතට පෙනෙනවා."

"ඒකට ආලෝකය ලැබෙන්නෙ කොහොමද?"

"වහලේ තිබෙන කොන්ක්‍රීට් ලැල්ලේ තැන්තැන්වල ඝන වීදුරු තහඩු සවිකර ඇති බවයි ඔවුන් කියන්නේ. ඒවා බිඳගෙන සොරුන්ට ඇතුළු වීමට නොහැකි විදියට ගනකම් යකඩ කුරුවලින් ග්‍රිල් සවිකර තිබෙනවාලු. ඊට අමතරව දැල්වෙන විදුලි පහන්"

"රැන්කින් මහත්මයා" මං ඔහු ඇමතුවේ ඔහු මඳ වේලාවක් නිහඬව සිටි නිසා. "ඔබ ඔය කියන ආකාරයේ සුරක්ෂිතාගාර ලෝකයේ තවත් තැන්වල තිබෙනවා. ඇමරිකා එක්සත් ජනපදය ඔවුන්ගේ රත්රන් සංචිත ආරක්ෂා කිරීමට මේ ආකාරයේ සුරක්ෂිතාගාර යොදා ගන්නවා. දකුණු අප්‍රිකාවේ දියමන්ති අධිකාරිය, එංගලන්ත මහ බැංකුව, ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරය සහ ඉතාලියේ ඩාවින්සි කෞතුකාගාරය තවත් තැන් කිහිපයක්. ඔස්ට්‍රේලියාවේ භාරත රත්රන් ඉල්ලම් පිරිසිදු කළ පසු සාදන රන් කැබලි ගබඩා කිරීමටත් මෙවැනි සුරක්ෂිතාගාරයක් මෙල්බර්න්හි මෑතකදී ඉදිකළ බව මට අහන්න ලැබුණා. නමුත් කෙනෙකු සතු මෙවැනි පෞද්ගලික සුරක්ෂිතාගාරයක් ගැන මට මේ අහන්න ලැබුණෙ පළමුවැනි වරට."

"ඩැල්රිම්පල්ට මෙය ඉදිකර දුන් ඉංජිනේරුවාට ඔය අංශය ගැන හොඳ දැනුමක් තිබෙන්න ඇති" රැන්කින් කිව්වා.

"මහත්මයා. ඒ කොහොම වුණත්" මං කිව්වේ පොලිස් නිලධරයා අමතමින්, "මං කියූ අර තැන් බොහොමයක් ඉබි යතුරු දමා යතුරුවලින් අගුළු දමන ඒවා නෙවෙයි. ඒවායේ දොරවල් විවෘත කිරීමට රහස් අංක සහිත අගුළු යොදා තිබෙනවා. නමුත් ඒක සංකීර්ණ දිගු අංකයක්. දොර විවෘත කිරීම භාර නිලධරයන් කිසිකෙනෙකු මුළු අංකයම දන්නේ නෑ. ඒ කටයුත්ත භාර හතර දෙනෙකු ඉන්නවා කියල අපි හිතමු. එක් එක්කෙනා වරින්වර ගිහින් තමන්ගේ අංක කරකවල එනවා. ඒ සියලුදෙනාගෙම සහභාගිත්වයෙන් තමා දොර විවෘත කෙරෙන්නේ"

"ඔය කතාව මමත් අහල තියෙනවා හෝම්ස් මහත්මයා. මෙතැන තිබෙන්නෙත් අංක කරකවන දොරක් මිසක් ඉබියතුරු දමන දොරක් නෙමෙයි."

"එතකොට අංක කරකැවීම කරන්නේ?"

"ඒක කරන්නේ ඩැල්රිම්පල් පමණයි. ඒ මොකද ඔහුනේ තනි අයිතිකාරයා"

"ඔහුට ඒ අංකය අමතක වුණොත් දොර ඇරලා හමාරයි. එහෙම නේද?"

"හෝම්ස් මහත්මයා. මෙතැන මට ඔබට කියන්න බැරිවුණු කාරණා දෙකක් තියෙනවා. එයින් පළමුවැනි එක තමයි - රහස් අංකය සහිත මේ දොරට එකපාරටම ළංවෙන්න බෑ. එහෙම කෙනෙකු ළංවීම අවහිර වෙන විදියට, නැත්නම් කෙනෙකු පිටත ඉඳල ඩැල්රිම්පල් කරකවන අංක බලා ගැනීම වළක්වන්න, පිටත දොරක් තියෙනවා. ඒක ඇරගෙන ඇතුළට ගිහින් ඒ දොර වසාගෙන තමයි අංක සහිත තැටි තියෙන අගුළ වෙත ළඟාවෙන්නෙ."

"මොකක්ද දෙවැනි කාරණය?"

"දෙවැනි කාරණය තමා වැදගත්ම කාරණය"

"ඒ මොකක්ද?"

"හෝම්ස් මහත්මයා. ඔබ පුදුමයට පත්වේවි. මේ අගුළේ අංක කිසිවක් නැහැ"

"දෙයියෝ සාක්කි! මොනවා? එහෙනම් අංක සහිත තැටි කරකවන එකක් ගැන ඔබ මෙතරම් වෙලා මට කිව්වේ මොකක්ද?"

"අංක කිසිවක් නැති බව ඇත්තයි." රැන්කින් කිව්වා. "ඒ වෙනුවට එහි තියෙන්නේ ඉංග්‍රීසි හෝඩියේ අකුරු!"

"මොකක්?"

"ඔබත් මාත් ළදරු පාසලේදී උගත් ඉංග්‍රීසි හෝඩියේ අකුරු"

"රැන්කින් මහත්මයා. මට නම් හිතෙන්නේ ඔබ මට විහිළු කරනවා......."

"........ කිසිම විහිළුවක් නෑ. මං මේ කියන දේ සම්පූර්ණ ඇත්ත. ඒක ඔබේ ඇසින්ම දැකගන්න මං ඔබට අවස්ථාවක් සලසා දෙන්නම්. ඔබ දන්නවා බැංකු සුරක්ෂිතාගාරවල ඇති උපරිම ආරක්ෂිත අගුළක තිබෙන්නේ අංක දොළහයි. ඒක කරකවන තැටි හතරකින් නේ ක්‍රියාත්මක වෙන්නේ. එහෙම නේද?"

"ඔව්. ඔබ නිවැරැදියි. එක් තැටියකින් අංක තුනක් කරකවමින් පුද්ගලයන් හතර දෙනෙකු විසින් අංක 12 ඇතුළත් කරනවා"

"මේ අගුළ තවත් වැඩියෙන් දියුණු කළ එකක්. මේකෙත් කරකැවීම සඳහා තැටි හතරක් තියෙනවා. නමුත් මේකෙදි මුල්





වාර තුනේදී ඉංග්‍රීසි අකුරු හතර බැගින් යොදන්න ඕන. අන්තිම වාරයේ අකුරු පහක් යෙදිය යුතුයි"

"ඔබ කියූ දේ මට එච්චර පැහැදිලි නෑ මහත්මයා. කොහොම වුණත් ඔය විදියේ අගුළක් ගැන මං ජීවිතේට අහල නෑ" මට කියැවුණා. "ඔය කතන්දරය ඇත්ත කියල ඔබට හොඳටම විශ්වාසද? ඕක ඔබේ ඇසින්ම දුටුවද?"

"ඔව් මහත්මයා ඔව්." රැන්කින් කීවේ අප්‍රමාණ සතුටකින්. "මට ඒ අවස්ථාව ලබා දුන්නෙ මං කියූ අර රක්ෂණ නිලධාරියා. ඉංග්‍රීසි හෝඩියේ අකුරු 26 ම සහිත තැටියක් වුණොත් ඒක ප්‍රමාණයෙන් ඉතා විශාල වෙනවානෙ. ඒ නිසා ඔවුන් කරල තියෙන්නෙ අකුරු 11 ක් පමණක් අඩංගු කුඩා තැටි හතරක් යෙදීම. ඔහු ඒක ක්‍රියාත්මක කර මට පෙන්නුවා.

ඒක ක්‍රියාත්මක කරන්නෙ මෙහෙමයි. එක් එක් තැටියක් වරකට එක් අකුර බැගින් අකුරු හතරක් කරකවලා "ENTER" කියන බොත්තම ඔබනවා. ඊළඟට යළි යළිත් තවත් තුන් වතාවක් මෙකම කරනවා. එතකොට අකුරු 16 ක් ලැබෙනවානේ. අන්තිමට හතරවැනි තැටිය තවත් එක් වරක් කරකවා අකුරක් යොදලා, අර ඇතුළු කිරීමේ බොත්තම යළිත් යොදනවා. එතකොට ඔක්කොම අකුරු 17 යි"

"එතකොට දොර ඉබේම විවෘත වෙනවද?"

"ඒ හරිය මං දුටුවෙ නැහැ හෝම්ස් මහත්මයා. මට පෙන්වූ පුද්ගලයාත් ඒක ඇකල නැහැ. ඩැල්රිම්පල් ඒ හරිය නම් කාටවත් හෙළි කරන එකක් නැහැ. මෙපමණ දුරක් හෙළිකරල තියෙන්නෙත් තමන්ගේ දොරේ ඇති උපරිම සුරක්ෂිත බව රක්ෂණ සමාගමට ඒත්තු ගැන්වීම සඳහා"

"එපමණද ඔහු පෙන්වා දීල තියෙන්නේ?"

"රක්ෂණ නිලධරයාගේ නම කීත් බ්‍රවුන්. ඩැල්රිම්පල් මොහුට කිව්වලු ඕනෙම විදියකට අකුරු යොදමින් තැටි කරකවල, දොරේ අගුළ ඇරගන්න පුළුවන්ද කියල උත්සාහ කරන්න කියල. බ්‍රවුන් හත් අට ගමනක් උත්සාහ කරල අන්තිමට බෑ කියල තියෙනවා. එතකොට ඩැල්රිම්පල් කිව්වලු අකුරු 17 එකිනෙකට වෙනස් වෙමින් යොදන්න පුළුවන් සම්භාවිතාවය මිලියන ගණනක් කියල. ඊට පසු බ්‍රවුන්ට පිටත දොරින් එළියට යන්න කියල ඒ දොර වසාගෙන

තැටි වල අකුරු කරකවා ඩැල්රිම්පල් අර සුරක්ෂිතාගාරයේ දොර විවෘත කරගෙන තියෙනවා.

ඔහු ඒ දොර බාගෙට ඇරගෙන බ්‍රවුන්ව එතැනට කැඳවා කිව්වලු; "මම ඇතුළට ගිහිං දොර වහගන්නවා. මිනිත්තු පහක් ඉඳල ඔබට පුළුවනි යළිත් වරක් අකුරු යොදමින් උත්සාහ කර බලන්න. මං ඔබට මිනිත්තු 20 ක් දෙන්නම්. පුළුවන් නම් දොර ඇරගන්න බලන්න. ඔබ ඒ විදියට දොර ඇරියොත් මං ඔබට දෙනවා පවුම් 100 ක තෑග්ගක්. බැරිවුණොත් මිනිත්තු 20 කින් පස්සෙ මං එළියට එනවා."

"ඊළඟට මොකක්ද සිදුවුණේ?" මං ඇහුවා රැන්කින්ගෙන්.

"මොනවා කියනවාද ෂර්ලොක් හෝම්ස් මහත්මයා" රැන්කින් කීවා. "පවුම් 100 ක තෑග්ගක් දෙනවා කිව්වාම අර මිනිහා ක්‍රියාත්මක වුණේ කඩියෙක් වගේලු. මිනිත්තු 20 ක් ඔහු සම්පූර්ණ උත්සාහය යෙදුවාලු. නමුත් අර දොර එක කෙස් ගහක් හෙළවිලා නෑ. අන්තිමට ඩැල්රිම්පල් දොර ඇරගෙන එළියට ඇවිත් තියෙනවා. ඔහු සිනාවෙමින් කියල තියෙන්නේ;

"ඔබ කළ උත්සාහය මං අගය කරනවා. නමුත් ඔබ මාසයක් උත්සාහ කළත් දොර නම් ඇරගන්න හැකිවෙන්නෙ නෑ"

කොහොම හරි ඔන්න ඕකයි හෝම්ස් මහත්මයා එතැන තත්ත්වය"

"රැන්කින් මහත්මයා" මං ඔහු ඇමතුවා. "පළමුවෙන්ම මං ඔබට කියන්න ඕන මේ ඩැල්රිම්පල් කියන පුද්ගලයා මං අත්‍යවශ්‍යයෙන්ම දැක ගත යුතු කෙනෙක්. ඒකට අවස්ථාවක් ඔබ මට ලබාදිය යුතුමයි. අනික මේ කියන ඩැල්රිම්පල් මොනම අපරාධයකට හෝ සම්බන්ධයි කියල තවමත් නිශ්චිතව කියන්න මට අමාරුයි. නමුත් ඔබ මට මේ විස්තර කළේ මෙපමණ කලක් මං අසා නොතිබුණු අපූරුම තාලේ අගුළක් ගැන. ලෝකයේ නවීන දේවල් කොතෙකුත් බිහිවෙනවා. දිනපතාම ඒ දේ සිදුවෙනවා. කොහොම වුණත් මේක මගේ සිතේ දැඩි උද්‍යෝගයක් ඇති කළා. මං ස්කොට්ලන්තයට ආවේ අපරාධ පරීක්ෂණයකට මිසක් නවීන විද්‍යාවේ හාස්කම් නරඹන්න නෙමෙයි. ඒ වුණත් මේ දොර අගුළ ගැන හොඳ දැනුමක් ලැබුවොත්, ඒක අනාගතයේදීවත් මට ප්‍රයෝජනවත් වීමට ඉඩ තියෙනවා. මං කැමතියි ඒක දැකගන්න මට අවස්ථාවක් ලැබෙනවා නම්. ඔබට හැකිවේවිද ඒකට අවසරයක් ලබාගන්න?"





"එතැන තියෙන්නෙ මේ වගේ තත්ත්වයක් හෝම්ස් මහත්මයා" රැන්කින් කිව්වා. "අපට ඕක පරීක්ෂා කර බැලීමේ කටයුත්ත කරන්න වෙන්නෙ මාටින් ඩැල්රිම්පල් මේ රටේ නැති කාලෙක. ඒ කියන්නෙ ඔහු විදේශ ගතවුණු වෙලාවක. එහෙම කාලවලට ඔහු තමන් ග්ලාස්ගෝ වල නොමැති බව රක්ෂණ සමාගමට දැනුම් දෙනවා. එතකොටයි ඔවුන් ඇවිත් නිවසේ ඉදිරිපස කොටසේ ඔවුන්ගේ කාර්යාලය ඇරලා වැඩ කටයුතු අරඹන්නේ.

අනික් අතට ඩැල්රිම්පල් මේ රටේ ඉන්නවා නම්, කිසි කෙනෙක් ඒ ගෙදර ගැවසෙනවට ඩැල්රිම්පල් කැමති නැහැලු. ඒ මොකද ඒක ඔහුගේ පෞද්ගලික ජීවිතයට බාධාවක් නිසා. එවැනි කාලවලට සිටින්නේ වත්තේ ප්‍රධාන දොරටුවේ හැමදාමත් ඉන්න ආරක්ෂකයින් පමණයි. එතැනින් අපට යාමට හැකිවෙන්නේ පොලීසිය ලබා දෙන විශේෂ අවසර පත්‍රයකින් පමණයි. පොලිස් කොමසාරිස්තුමාට කථා කරලා මං ඔබට විශේෂ අවසර පත්‍රයක් සූදානම් කරගන්නම්. නමුත් ඩැල්රිම්පල් මේ කාලෙ මෙහේ ඉන්නවද නැද්ද කියන එක තමා මම දන්නෙ නැත්තෙ"

"ඒක දැනගැනීම එච්චරම අමාරුද?"

"රක්ෂණ කාර්යාලයට පෞද්ගලිකවම ගිහින්, එහි ප්‍රධානියාගෙන් විමසා බැලිය යුතුයි. දුරකතනයෙන් විමසුවාට ඔවුන් මේ වගේ රහසිගත කාරණා හෙළිකරන්නේ නෑ"

"කොයි වෙලාවටද මට මේ ගැන දැනගන්න පුළුවන් වෙන්නේ?" මං ඇහුවා.

"අද හවස් වෙන කොට ඒ කරුණ මට දැන ගැනීමට හැකිවේවි කියලයි මං හිතන්නේ. අද හැන්දෑවෙ හයට පමණ මේ හෝටලයට ඇවිත් මං ඒ කාරණය ඔබට කියන්නම්"

එහෙම කියූ රැන්කින් මගෙන් සමුගෙන පිටවී ගියා.

ඔහු ගියාට පස්සෙ කල්පනා කරද්දි මට හිතුණේ මේ අපූරු අගුළ ක්‍රියාකරන ආකාරය දැකගන්න වොට්සන්ටත් අවස්ථාක් ලබාදුන්නොත් හොඳයි නේද කියලයි.

"ඔබට කියන්න වොට්සන් තවත් එක්තරා සුවිශේෂ කාරණයක් මගේ හිතට ආවා. ඒ තමයි මේ මාටින් ඩැල්රිම්පල් කියන නමෙන් පෙනී ඉන්නේ කපිතාන් ඕවන් මැකෝමික් විය නොහැකිද කියලා?"

"ඒ මොකද හෝම්ස් ඔබට එහෙම හිතුණේ?"

"පළමුවැනි කාරණය ඩැල්රිම්පල් මෙහේ ඉන්නෙ කාලෙකට පමණයි. අනික් කාලවලට විදේශ සංචාරවල. කපිතාන් මැකෝමික් කාලෙකට නැවේ කපිතාන් හැටියට කටයුතු කරනවා. අනික් කාලෙට කොහේ ගියාද කියල නෑ. එතකොට මේ දෙන්නම එක්කෙනෙක් වෙන්න බැරිද?

දෙවැනි කාරණය තමයි "ෆ්රීස්ලන්ඩ්" නෞකාවෙන් අතුරුදන්වුණු අතිවිශාල රත්රන් තොගය. ඒකෙ වටිනාකමේ හැටියට ඒක සඟවා තබන්න උපරිම ආරක්ෂාවක් තිබෙන සුරක්ෂිතාගාරයක් නැතුවම බෑ. ඩැල්රිම්පල්ට තිබෙන්නේ එවැනි සුරක්ෂිතාගාරයක්.

ඔහු ප්‍රකෝටිපතියෙකු කියල අහන්න ලැබුණා. තමන් මිලට ගන්නා පුරාවස්තු හෝ වටිනා චිත්‍ර විකිණීමක් ඔහු කරන්නෙත් නෑ. නමුත් මේ තරම් ධනයක් ඩැල්රිම්පල්ට ලැබුණෙ කාගෙන්ද කොහොමද කියන එක ගැනත් කිසි ආරංචියක් නෑ."

"ඔබ කියන කාරණා ඇත්ත තමා" මම කීවෙමි. "ඉතින් ඊළඟට මොකක්ද සිදුවුණේ?"

"අර පොලිස් නිලධරයා රැන්කින් එදා හවස මා නැවතී සිටි ග්ලැඩ්ස්ටන් හෝටලයට ආවා.

"හෝම්ස් මහත්මයා" ඔහු කිව්වා. "ඩැල්රිම්පල්ගේ සුරක්ෂිතාගාරය බලන කටයුත්ත අපට අද හෙටම කරන්න ලැබෙන්නෙ නෑ. ඒක දින කීපයකට කල් දමන්න අපට සිදුවෙනවා."

"ඒ මොකද?"

"ඔහු මේ දවස්වල ග්ලාස්ගෝ නගරයේ ඉන්නවාලු ඉතින් ඔහු ක්වීන් මේරි උද්‍යානයේ නිවසට නිතර යනව එනව ඇති, එහි පදිංචිවෙලා නැත්නම්"

"ඔව්. එහෙම නම් කරන්න දෙයක් නෑ" මං කිව්වා. "මං ආපහු ලන්ඩනයට යනවා. නමුත් ඔහු මෙහෙන් පිටවී ගිය වහාම මට අවස්ථාවක් ලබාදෙන්න. මේක අත්‍යවශ්‍ය කටයුත්තක්.

එතැනට ඇතුළුවීමට පොලිස් අවසර පත්‍රයක් ලබා ගැනීමේදී මට පමණක් නෙමෙයි; මගේ හිතමිත්‍ර දොස්තර ජෝන් වොට්සන්ටත් අවසර පත්‍රයක් ලබාගන්න. ඔහු තමා මගේ පරීක්ෂණ කටයුතු හැම එකකදිම මට සහාය වෙන්නේ. අත්‍යවශ්‍ය කටයුත්තක් නිසා





ඔහුට මෙවර මා සමඟ එන්න හැකිවුණේ නෑ. මං ඔබට අප ගැන තොරතුරු සියල්ල දෙන්නම්. දිනයක් ලැබුණු වහාම අපට විදුලි පුවතකින් දන්වන්න."

"ඒ කටයුත්ත මං නොවැරදීම කරන්නම් හෝම්ස් මහත්මයා. ඔබට දැන ගැනීමට අවශ්‍ය තවත් මොනවා හරි කාරණා තියෙනවද?"

"ඔව්. මාටින් ඩැල්රිම්පල් මොකක් හරි කල්ලියකට සම්බන්ධ කෙනෙක්ද? ඔහුට කවුරු හරි උදව්කාරයො ඉන්නවද?"

"ඔහු ගැන හොයා බලන්න කවදාවත් අපට අවශ්‍යතාවයක් ඇතිවුණේ නෑ." රැන්කින් කිව්වා. "ඒ මොකද ඔහුට එරෙහිව කාගෙන්වත් කිසිම පැමිණිල්ලක් නොලැබුණු නිසා. ඔහු ළඟින් ආශ්‍රය කරන හිතවත් මිත්‍රයෙක් නම් ඉන්නවා. මං හිතන හැටියට ඔහුගේ නම ස්මිත්"

"ඔවුන්ගේ බාහිර පෙනුම මොන වගේද?" මං ඇහුවා. "ඔවුන් හරිහැටි දැකල තියෙන ඔබේ රක්ෂණ මිත්‍රයා හමුවෙන්න අවස්ථාවක් ලබා දෙනවා නම් මං කැමතියි"

"මීළඟට ඔබ ග්ලාස්ගෝ වෙත ආවම ඒ අවස්ථාව මං ලබා දෙන්නම්" රැන්කින් මට පොරොන්දු වුණා.

"හෝම්ස් ඔබ කියන්නේ මේ කටයුත්තට මගේ පැමිණීමත් අවශ්‍යයි කියලද?"

"ඇත්තෙන්ම ඔව් මගේ හිතවත් වොට්සන්." මගේ මිත්‍රයා කීය. "ඔබේ පාඨකයන් කැමැති වේවි මේ කතන්දරය අවසන් වුණු ආකාරය දැනගන්න. මේ සුරක්ෂිතාගාරය "ෆ්රීස්ලන්ඩ්" නෞකාවට සම්බන්ධද කියන කාරණය අපි තවමත් දන්නෙ නෑ. ඔය කියන සුරක්ෂිතාගාරය එයට සම්බන්ධ නම්, ඒක ඔබ දැක නොතිබීම පාඩුවක් විය හැකියි. අපට ඒ තරම් දිගු කාලයක් ග්ලාස්ගෝ ගමනට ගත කරන්න වේවි කියල මං හිතන්නේ නෑ. වැඩිම වුණොත් දින තුනක් ගතවේවි. ඇයි ඔබට එන්න අපහසුද?"

"නෑ මම එන්නම්"

"ඔබට ස්තුතියි මිත්‍රයා. මම දැනගෙන හිටියා ඔබ එන බව. අපට ලැබෙන්නේ කෙටි දැනුම් දීමක්. සූදානමින් ඉන්න"

මට ශුභ රාත්‍රියක් පැතූ හෝම්ස් ඉක්මනින් මගේ නිවසෙන් පිට වී ගියේය.

* * *

අඟහරුවාදා දිනයක සවස් යාමයේ හෝම්ස් වෙත විදුලි පුවතක් ලැබී තිබිණි.

"වොට්සන්. අපි අදම පිටත්වුණොත් හොඳයි. මං කල්පනා කළා අද රෑ දහයට පිටත්වෙන තැපැල් දුම්රියෙන් ග්ලාස්ගෝ බලා යන්න"

"ඔබේ මිත්‍රයා මොනවද දන්වල තියෙන විස්තර?" මම ඇසීමි.

"මොකුත් නෑ" හෝම්ස් කීය. "විදුලි පුවතක් නෙ ඔහු එවල තිබුණෙ.

"වහාම එන්න - රැන්කින්" කියල දන්වා තිබුණා. මට හිතෙනවා ඩැල්රිම්පල් ග්ලාස්ගෝවලින් පිටවෙලා යන්න ඇති කියලා."

එදා රාත්‍රී තැපැල් දුම්රියේ පළමුවැනි පංතියේ මැදිරිවල පවා සෑහෙන සෙනඟක් සිටි බව දක්නට ලැබිණි. එබැවින් හෝම්ස්ට සහ මට නිදහසේ කතාබහ කිරීමට අවස්ථාවක් නොවිය. සතුටුදායක ලෙස කෙටි නින්දක් ලබා ගැනීමටද මට හැකි නොවිණි. සතිය පුරා මා මුහුණ දුන් අවිවේකී බව නිසා මට ඇවැසිව තිබුණේ හොඳ නින්දක් නිඳා ගැනීමටයි. එහෙත් දුම්රිය මැදිරිය තුළ තිබූ ඝෝෂාව හා දැඩි උණුසුම මට සිහිකළේ ඉන්දියාවේ දුම්රිය ගමනක් මිස එංගලන්තයේ දුම්රිය ගමනක් නොවේ. නිඳිකිරමින් සිටි මට හරිහැටි නින්දක් නොලැබිණි.

"මං රැන්කින්ට කිව්වා දුම්රියපොළට එන්නෙ නැතුව දවල් 11 ට කෙළින්ම ග්ලැඩ්ස්ටන් හෝටලයට එන්න කියලා" මගේ මිත්‍රයා කීවේ අප දුම්රිය පොළෙන් පිටවීමට සූදානම්ව වේදිකාව දිගේ ඇවිද යන අතරය. "වොට්සන් මට පෙනෙනවා ඔබට හුඟක් මහන්සි බව. අපි හෝටලයට ගිහිං උදේ ආහාරය ඇණවුම් කරමු. පැය දෙකක කෙටි නින්දක් ලබා ගන්න අපට කාලය ඇතිවේවි"

ග්ලැඩ්ස්ටන් හෝටලයේ උදේ ආහාරය ඉතා ප්‍රණීත එකක් විය. අපි කුස පුරා ආහාර ගත්තෙමු. ඒ නිසා මගේ කාමරයේ ඇඳේ වැතිරුණු විගස මට නින්ද යන්නට ඇත. උදේ දහයමාරට පමණ මා අවදි වූයේ මගේ මිත්‍රයා පැමිණ මගේ කාමරයේ දොරට තට්ටු කළ ශබ්දයෙනි.

"මට සමාවෙන්න වොට්සන්" හෝම්ස් කීය. "ඔබට තදින්ම නින්ද ගිහිල්ලයි තිබුණෙ. කොහොම වුණත් එකොළහට එනවා කියූ අපේ මිත්‍රයා උදේ දහය වෙද්දි ආවා. මෙපමණ වෙලාවක්





මං ඔහුගේ කතාවට කන් දුන්නා. ඔහු කියන්නේ තවත් පමා නොවී අපි වහාම පිටත් වී යායුතු බව. ඔබට සූදානම් වෙන්න මං දෙන්නම් පැය භාගයක කාලයක්. ඒ අතරේ මා කළ යුතු වැදගත් කටයුත්තක් තියෙනවා. වොට්සන් සූදානම් වෙලා මගේ කාමරේට එන්න"

මිනිත්තු විස්සක් ගතවෙද්දී මම හෝම්ස්ගේ කාමරයට ගියෙමි.

"මම ජෝ රැන්කින්" හැඩිදැඩි පොලිස් නිලධරයා අසුනෙන් නැගිට මට අතට - අත දුන්නේය. "වොට්සන් මහත්මයා අඳුනා ගන්න ලැබීම ගැන සන්තෝෂයි. ඔන්න මං ඔබටත් එක්ක අවසර පත්‍රයක් ලබා ගත්තා"

"ඔබට ස්තුතියි"

මිනිත්තු පහක් ගතවෙද්දී හෝම්ස් ආපසු පැමිණියේය.

"මං ගියේ හෝටලයේ මුළුතැන් ගෙයට" හෝම්ස් කීය. "දවල් කෑම තවමත් සූදානම් නැතිලු. ඔය කියන තැනට අපි යද්දිත් දවල් දොළහට කිට්ටු වේවි. ඒ නිසා ක්ෂණිකව කෑමට ගන්න පුළුවන් "සැන්ඩ්විච්" පාර්සලයක් ඔතල දෙන්න කියල මං ඔවුනට කිව්වා"

කෑම පාර්සලය එකතු කරගෙන එකොළහමාරට පමණ අපි හෝටලයෙන් පිටත්වීමු.

"රැන්කින්. ඔබ මා සමඟ කියමින් සිටි කරුණු මගේ මිත්‍රයාටත් කියන්න" හෝම්ස් කීවේ පොලිස් නිලධරයා අමතමිනි.

"හෝම්ස් මහත්මයාට විදුලි පුවතක් යවන්න මං තීරණය කළේ මේකයි." රැන්කින් කීය. "මාටින් ඩැල්රිම්පල් පහුගිය සතියේ මෙහේ ගැවසුණු බව මට දැනගන්න ලැබුණා. ඒ කාලෙට ඔහු ක්වීන් මේරි උද්‍යානයේ නිවසට නිතරම යනව එනවා. සමහර වෙලාවට එක දිගට එහි පදිංචිව ඉන්නවා. නමුත් මෙවර නම් තත්ත්වය වෙනස් වෙලා. ඉරිදා උදයේ ඔවුන් එහි ගිය බව ගේට්ටුවේ ආරක්ෂක භටයන් දැකල තියෙනවා. ඔවුන් වත්තට ඇතුළුවෙලා තියෙන්නෙ කුලීරියකින්. පැය කාලකින් හිස් කුලීරිය පිටවෙලා ගියාලු. නමුත් ඊට පසු ඔවුනට මිත්‍රයන් දෙන්නා දකින්න ලැබිල නෑ. අද උදෙත් මං ඔවුන්ගෙන් විමසුවා. මිත්‍රයන් දෙන්නා දකින්න ලැබුණු බවට ආරංචියක් නෑ"

"සමහරවිට ඔවුන් රහසේම ග්ලාස්ගෝ වලින් පිටවෙලා ගිහින්ද දන්නෙ නෑ?" හෝම්ස් කීය.

"ඒක එහෙම වෙලා කියල මං හිතන්නෙ නෑ" රැන්කින් කීය. "ඔහු මේ නගරයෙන් පිටවෙලා යද්දි රක්ෂණ ආයතනයට අනිවාර්යයෙන්ම දැනුම් දෙන බවයි එතැන ඉන්න මගේ මිත්‍රයා කිව්වෙ"

"එතකොට ඔබට හිතෙන්නෙ මෙතැන මොකක් සිද්ධවෙලා කියලද?"

"ඩැල්රිම්පල්ගෙ යාළුවාගෙ නම ස්මිත් කියලයි අපට ආරංචි" රැන්කින් කීය. "මං කලිනුත් කිව්ව වගේ මේ දෙන්නට විරුද්ධව කාගෙන්වත් කිසිදාක පැමිණිල්ලක් තිබුණේ නෑ. ඒ නිසා ඔවුන් ගැන හොයා බලන්න අපට කිසිම හේතුවක් තිබුණෙ නෑ. අනික් කාරණය තමයි ඔවුන් බොහොම අප්‍රසිද්ධියේ ජීවත් වෙන්න නැඹුරු වුණු අය. කවදාවත් සමාජය ඉදිරියට ආවෙ නෑ.

නමුත් මේ ස්මිත් මොකක් හරි වංචනික ව්‍යාපාරයකට සම්බන්ධද කියන සැකය, ග්ලාස්ගෝවල ව්‍යාපාරිකයෙකුට ඇතිවුණාලු. ඔහු මේ ගැන බීඩ නම් ඔහුගේ මිත්‍ර උප පොලිස් පරීක්ෂකවරයෙකුට පැවසුවාලු. ස්මිත් කියන පුද්ගලයා නිතර වරායට යන එන, නාවිකයන් සමග සබඳතා පවත්වන අයෙකු බව බීඩ්ට පෙනී ගිහින් තියෙනවා. ඔහු සිතන්නේ ස්මිත් මොනවා හරි වටිනා දේවල් වංචනිකව රට ඇතුළට ගෙනෙනවා, නැත්නම් රටෙන් පිට කරනවා කියලයි"

"මොන වගේ දේවල්ද?" මම ඇසීමි.

"දියමන්ති වගේ පහසුවෙන් හංගාගෙන යන්න පුළුවන් දේවල්" රැන්කින් කීය. "ඒ මොකද ඉතාම වටිනා චිත්‍ර ඔවුන් දැනටමත් මේ රටට ගෙනෙනවා නේ. ඒ කටයුත්තට කොහෙන්ද හෝම්ස් මහත්මයා ඔවුනට මේ හැටි සල්ලි?"

"ඒක නම් මටත් හිතාගන්න අමාරුයි" හෝම්ස් කීය. "මට දැනගන්න උවමනා කාරණය මේකයි රැන්කින්. මේ වෙලාවෙ අපි වහාම ක්‍රියාත්මක විය යුතුයි කියල ඔබ කියන්නෙ මොකක් නිසාද? මට ඒක කෙටියෙන් කියන්න"

"මට හිතෙන්නෙ වැඩේ ගැස්සිලා"

"ඒ කියන්නෙ?"

"මෙතැන සල්ලිකාරයා ඩැල්රිම්පල්" රැන්කින් කීය. "අනෙක් මිනිහ හවුල් කාරයෙක් නෙමෙයි; හිතවත් සේවකයෙක්. සමහරවිට හවුල්කාරයෙක් වෙන්නත් බැරි නෑ"





"ඔව්. ඉතින්?"

"ස්මිත් කියන තක්කඩියා ඩැල්රිම්පල්ව මරා දමලා වටිනා දේවල් අරගෙන මෙහෙන් පැනලා ගිහින් වෙන්න ඇති. මට හිතෙන්නේ එහෙමයි"

"නමුත් ඔය තරම් ආරක්ෂාව යෙදූ ගේට්ටුවක් තිබියදී.....?"

"මුරකපොල්ලෙන් යන්න එන්න බැරි අනික් මිනිස්සුන්ට විතරයි. ඒ දෙන්නාට ඒකෙ අවහිරයක් නෑ."

"එතකොට සුරක්ෂිතාගාරයේ අර දොරෙන් ඇතුළුවීම පිටවීම?"

"ඒවට උවමනා සාත්තරේ දන්නෙ ඒ අයනේ. ඒ දොර ඇරගෙන පිටවෙන්න ඩැල්රිම්පල්ට එක මිනිත්තුවක් ගතවෙනවා කියල මං හිතන්නෙ නෑ"

"රැන්කින් මහත්මයා. ඔබ කියන හැම දෙයක්ම තර්කානුකූලයි" හෝම්ස් කීය. "ඔබ හිතන්නේ ස්මිත්, ඩැල්රිම්පල්ව මරා දමල පැනල ගිහින් කියල නේ. ඔවුන් රක්ෂණ සමාගමට දැනුම් නොදීමට හේතුව ඒකෙන් පැහැදිලි වෙනවා. ඔය කියන විධියට අපරාධයක් සිදුවෙලා නම්....... අපි කොහොමද මේ කියන පුදුමාකාර සුරක්ෂිතාගාරයට ඇතුළු වෙන්නෙ?"

"හෝම්ස් මහත්මයා. මෙන්න මේ කාරණය මං ඔබට මතක් කරන්නම්" රැන්කින් සිනාමුසු මුහුණෙන් කීවේ දබරැඟිල්ල ඔසවා හෝම්ස්ට අනතුරු අඟවන අයුරෙනි. "ඔබේ ඔය පුළුල් නළලට ඇඟිල්ලෙන් තට්ටු කරලා හොඳට මතක් කරලා බලන්න. මොකක්ද එදා ඔබ මගෙන් ඉල්ලා හිටියේ? මොනවද එදා මං ඔබට පොරොන්දු වුණේ?"

"හරි හරි මිත්‍රයා. ඔබ කියන දේ හරි" හෝම්ස් කීය. "මේ සුරක්ෂිතාගාරයේ අද්භූත දොරටුවේ පුදුමාකාර අගුළ මටත් දොස්තර වොට්සන්ටත් දැකගන්න උවමනාය කියල මං කිව්වා. ඒකට ඔබට පුළුවන් විධියට උපකාර කරන්න ඔබ එකඟ වුණා"

"හෝම්ස් මහත්මයා. අන්න එහෙම කතා කරන්න කෝ" රැන්කින් කීවේ අතිශය සතුටෙනි. "මං ඔබට පොරොන්දු වුණේ පුදුමාකාර දොර අගුළ පෙන්වීම පමණයි. ඉස්සරහ හන්දියෙන් වම් පැත්තේ පාරට හරවන්න" ඔහු උපදෙස් දුන්නේ කුලීරථයේ රියැදුරාටයි.

එම මංසන්ධියේ තිබූ පුවරුවක, ඊතලයක් යොදා "ක්වීන් මේරි උද්‍යානය, ඇතුළුවීම පදිංචිකරුවන්ට පමණයි" යනුවෙන් සඳහන්ව තිබිණි. එම පාර දිගේ අප සැතපුම් දෙකක් පමණ ගමන් කරන්නට ඇත. එහි තිබූ ප්‍රමාණයෙන් විශාල වූ ඉඩම්වල මධ්‍යයේ මන්දිර දක්නට ලැබිණ. එයින් බොහොමයක් පැරණි ඒවා බැව් මම දුටුවෙමි. නවීන ක්‍රමයට ඉදිකළ දෙමහල් නිවාස තිබුණේ දෙකක් හෝ තුනක් පමණි.

"අන්න අරක තමා කොල්බර්ට් වත්ත" රැන්කින් කීවේ ඉදිරියෙන් දිස් වූ දෙමහල් නිවසක් දෙසට අත දිගු කරමිනි. ගස් කොළන් ඝනව වැවී තිබූ එම වත්ත වටා උස් ආරක්ෂක වැටක් ද ඉදි වී තිබිණි.

"වත්තට ඇතුළුවෙන ගේට්ටුව ඔය ඉස්සරහින් තියෙන්නෙ" රැන්කින් කීවේ රියැදුරාටයි. "කරත්තෙ ඒ ඉදිරිපිට නවත්වල අපව බස්සවන්න. ඊට පස්සෙ ඔබට පුළුවනි ආපහු යන්න. ඒ මොකද අපි ආ කටයුත්තට කොතරම් වේලා ගතවේද කියල අපට කියන්න බෑ."

"මං පැය දෙකකින් හෝ තුනකින් ආපහු එන්න උවමනාද මහත්මයා?" රියැදුරා විමසුවේය.

"එපා - අපේ වැඩේ කොයි වේලාවෙ ඉවරවේවිද කියල කියන්න බෑ. ඔහොම නවත්වන්න. හරි"

අපේ දිවා ආහාරය ලෙස ගෙන ආ කෑම ද්‍රව්‍ය අඩංගු මල්ල දකුණතින් ගෙන මම රියෙන් බැස්සෙමි. හෝම්ස්ගේ අතේ තිබුණේ ප්‍රබල කාච, රසායන ද්‍රව්‍ය සහ සියුම් දේ අල්ලන අඬු ආදිය ගෙනගිය කුඩා මල්ල පමණි.

අපේ අවසර පත් අතට ගත් රැන්කින් මුර කපොල්ල වෙත ගොස් ඒවා පෙන්වා අවසර ලබා ගත්තේය. ඉන්පසු ආරක්ෂක භටයා ගේට්ටුවේ අගුළ යතුරකින් විවෘත කොට අපට යෑමට ඉඩ සැලැස්විය.

ඉන්පසු අපි තිදෙනා ඉදිරියට ගියෙමු. නිවසට ඇතුළුවන දොරට අප සමීප වෙද්දීම අප දිශාවට එල්ල කොට තිබූ ප්‍රබල විදුලි පහනක් ස්වයංක්‍රියව දැල්විණි. ඒ මොහොතේම නිවසේ තැන් කිහිපයක විදුලි සීනු නාද වීමට පටන් ගත්තේය.





"හෝම්ස් මහත්මයා." රැන්කින් කීය. "මං ඔබට කලින් කිව් දේවල් තමයි ඔය අහන්න දකින්න ලැබෙන්නේ. හොඳ ඒවා නව ඉස්සරහට"

යතුරු කැරැල්ලේ යතුරු කිහිපයක් කරකවා දොරේ හැඬලය පහත් කළ සැණින් එය පහසුවෙන්ම විවෘත විය. සීනු හඬ නැවතිණි. නමුත් අප විසිත්ත කාමරයට පිවිසෙද්දීම වෙනත් ආකාරයක ශබ්දයක් ක්‍රියාත්මක වීම ඇරඹිණි. තත්පර පහකට පමණ වරක් ඇසුණු එම ශබ්දය සමාන වූයේ එකල මා ඉන්දියාවේ කෝවිල්වල අසා තිබූ ඝණ්ඨා නාදයටයි.

"මෙතැනින් ඉදිරියට යන්න කලින් අපි මෙතැන පරීක්ෂා කරල ඉඳිමු" හෝම්ස් කීය.

අපට කලින් අසන්නට ලැබුණු ආකාරයෙන්ම එය විශාල විසිත්ත කාමරයක් විය. තම කාච අතට ගත් හෝම්ස් ඉතා ඉක්මනින් ඔහුගේ පරීක්ෂණ ඇරඹුවේය.

එහි ප්‍රධාන මේසයක් සහ ඒ අවට පුටු පහක් හෝ හයක් තිබිණි. මේසය මත තීන්ත කුප්පියක්, කටුපෑන් කිහිපයක්, තීන්ත පොවන කඩදාසියක් සහ ලියන කඩදාසි අසුරා තිබූ ෆයිල් කවර කිහිපයක් විය. හෝම්ස් මේ සෑම එකක්ම පරීක්ෂා කර බැලුවේ සෑහෙන වේලාවක් ගත කරමිනි. එහෙත් ඔහුට සෙවූ කාරණා දක්නට නොලැබුණු බැව් හෝම්ස්ගේ මුහුණෙන් මම තේරුම් ගතිමි. මේසය සමීපයේම පොත් රාක්කයක් විය. එහි ප්‍රමාණයෙන් තරමක් විශාල පොත් විස්සක් තිහක් පමණද කුඩා කථා පොත් පනහක් පමණද තිබූ බැව් මම දුටුවෙමි. මේ මේසය සහ පොත් රාක්කය තබා තිබුණේ මෙහි කාලය ගතකළ රක්ෂණ නිලධරයන් සඳහා බැව් රැන්කින් කීවේය.

හෝම්ස්ගේ ඉල්ලීම අනුව පොලිස් නිලධරයා වරකට ලොකු පොත් පහක් හෝ හයක් ගෙන මේසය මතින් තැබීය. මගේ මිත්‍රයා ඒවා තියුණු ලෙස පරීක්ෂාවට ලක් කළා මිස අපට කිසිවක් පැවසුවේ නැත. තම කබා සාක්කුවෙන් සටහන් පොත හා පැන්සල එළියට ගත් ඔහු එම පොත් පරීක්ෂා කර බලමින් කරුණු සටහන් කරගත් අයුරු අපි දුටුවෙමු. මෙම පොත් විවිධ විෂයයන්ට අයත් ඒවා විය. එංගලන්තයේ ඉතිහාසය, ක්‍රිස්තියානි ධර්මය, රසායන විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, මිශ්‍ර ලෝහ, ලේඛකයන්ගේ ජීවිත කථා,

කුඩා දරුවන්ගේ ගීත, ගොල්ෆ් ක්‍රීඩාව, ග්‍රීක නාට්‍ය කලාව, පෙරදිග ආත්මාරක්ෂක සටන් ක්‍රම ආදී ග්‍රන්ථ මේ අතර විය. හෝම්ස් මේ පොත් පිටුවෙන් පිටුව පෙරළා බැලවේ අප පැමිණි කටයුත්ත අමතක වූ විලසිනි. මෙවැනි අවස්ථාවල ඔහුට කිසිදු හදිසියක් නොමැති බැව් මම දැන සිටියෙමි. එහෙත් අප මිත්‍ර පොලිස් නිලධරයා වෙතින් නම් දක්නට ලැබුණේ නොඉවසිලිමත් බවකි.

මේ අයුරින් පැයකට කිට්ටු කාලයක් පොත් පරීක්ෂා කළ හෝම්ස් තම අසුනෙන් නැගිට්ටේ සටහන් පොත කබා සාක්කුවට දමා ගනිමිනි.

"මට සමාවෙන්න මහත්වරුනි" හෝම්ස් කීවේ තම ඔරලෝසුව අතට ගෙන වේලාව පරීක්ෂා කරමිනි. "විවිධ විෂයයන්ට අයත් පොත් කියවා, පෙරළා බලන්න පටන් ගත්තම කාලය ගත වෙනවා දැනුණේ නෑ. මේක ඇත්තෙන්ම හොඳ කුඩා පුස්තකාලයක්"

මීළඟට අප ගමන් කළේ අපේ ගමනේ අවසන් ඉලක්කය වූ සුරක්ෂිතාගාරයේ දොරටුව වෙතයි. මා කලින් සඳහන් කළ අයුරෙන් එය පිටත හා ඇතුළත දොරවල් වලින් සමන්විත විය. පිටත දොර මෘදු ලී වලින් තැනූ සැහැල්ලු දොරක් වූ අතර එයට අගුළු නොතිබිණි. එහෙත් පොළොවේ සිට අඩි පහක් පමණ ඉහළින් අඳුරු කළ කුඩා වීදුරු කැබැල්ලක් එයට සවිකොට තිබූ අයුරු දැකිය හැකි විය. මෙම දොර විවෘත කරගත් විට අප පිවිසුණේ කුඩා කාමරයක් වැනි තැනකටයි. කුඩා දොර විවෘත කළ වහාම සීනුවක් නාදවීමට පටන් ගත්තේය. ඒ සමගම දීප්තිමත්ව දැල්වුණු විදුලි පහන් දෙකක් ස්වයංක්‍රීයව ක්‍රියාත්මක විය.

"මෙන්න මේක තමයි හෝම්ස් මහත්මයා මං ඔබට කියූ පුදුමාකාර දොර" රැන්කින් කීවේ සුරක්ෂිතාගාරයේ දොරට අත දිගු කරමිනි. අපි නිහඬව ඒ දෙස බලා සිටියෙමු.

බැලූ බැල්මට එහි තිබුණේ බැංකු සුරක්ෂිතාගාරවල දක්නට ලැබෙන ලෝහයෙන් සෑදූ අධි ආරක්ෂිත දොරක පෙනුමය. එහෙත් අංක කරකැවීම සඳහා තිබූ තැටි සහිත අගුළ ප්‍රමාණයෙන් විශාල විය.

"මේ බලන්න මහත්වරුනි මං කියූ කාරණාව" රැන්කින් කීවේ එම අගුලේ තැටි තම දකුණු අතේ මහපටැඟිල්ලෙන් පහසුවෙන් කරකවමිනි.





සුදු පසු බිමක කළු පැහැයෙන් තිබූ ඉංග්‍රීසි හෝඩියේ අකුරු පැහැදිලිවම දැකගත හැකි විය.

"හෝම්ස් මහත්මයා බලන්න ඔබත් උත්සාහ කරලා. මේ තැටි හතරෙන් අකුරු 17 යි කරකවන්න උවමනා" රැන්කින් කීය. "මෙන්න මේ විදියට එක තැටියකින් එක අකුරක් බැගින් අකුරු හතරක් කරකවලා "ENTER" කියන බොත්තම ඔබනවා. ඒ විදියට හතර වාරයක් කළාම අකුරු දහසයයි. අන්තිමට එක අකුරක් පමණක් කරකවා බොත්තම ඔබනවා. ඔක්කොම අකුරු දහහතයි. මේ බලන්න"

ඔහු එසේ කොට අන්තිමට දොරේ හැඬලය පහත් කළේය. එහෙත් දොර විවෘත වූයේ නැත.

"ඔබ කියූ දෙය ඇත්තයි රැන්කින්" හෝම්ස් කීය. "මේක නම් මහ පුදුමාකාර අගුළක්. මෙහෙම දෙයක් ගැන මං ජීවිතේටම අහල නෑ. මේක දක්ෂ ඉංජිනේරුවෙකුගේ විශිෂ්ට නිර්මාණයක්. වොට්සන්. ඔබත් කැමැති ඇති මේකෙ අකුරු කරකවලා උත්සාහයක් දරල බලන්න"

හෝම්ස්ගේ ඉල්ලීම අනුව මමද අකුරු 17 කරකවා උත්සාහයක් දැරීමි. එහෙත් එයින් ප්‍රයෝජනයක් වූයේ නැත.

"මේක බොහොම හිතල බලල විසඳන්න ඕන ගැටලුවක්" හෝම්ස් කීය. "මෙතැන තියෙන අකුරු ටික අපි මුලින්ම ලියාගෙන ඒවට අවධානයක් යොමු කරල බලමු" එසේ කී ඔහු සටහන් පොතේ තිබූ කඩදාසියක් ගෙන එය දිගහැර අකුරු ක්‍රමානුකූලව සටහන් කර ගත්තේය.

A B C D H J O R S U W

"හැම තැටියකම තියෙන්නේ මේ අකුරු එකොළහමයි, එකම පිළිවෙළට" ඔහු කීය. "අකුරු එකොළහකින් අකුරු 17 ක් යොදනවා කියන්නේ සමහර අකුරු අපට දෙවරක් යොදන්න වෙනවා. සමහරවිට අකුරක් හෝ දෙකක් තුන්වරක් නැත්නම් හතරවරක් යෙදෙනවා වෙන්නත් පුළුවනි" මගේ මිත්‍රයා කීය.

"ඒ වගේම සමහරවිට අකුරක් හෝ දෙකක් කොහොමටවත් පාවිච්චි නොවෙනවා වෙන්නත් පුළුවනි" මම කීවෙමි.

"විශිෂ්ටයි වොට්සන්" හෝම්ස් කීය. "ඔබේ ඒ අදහසත් නිවැරැදියි. රැන්කින්ට අහන්න ලැබුණා වගේ මේ අකුරු යොදන්න පුළුවන් ආකාරවල සම්භාවිතාවය මිලියන ගණනක් ඇති."

"ඒක තමයි හෝම්ස් මහත්මයා මං කලින් ඔබට කිව්වේ මේක ඉතාම සංකීර්ණ ගැටලුවක් කියලා" රැන්කින් කීය. "අවුරුද්දක් මෙතැන ඉඳගෙන උත්සාහ කළත් කිසි වැඩක් වෙන්නෙ නෑ"

මේ අතර මගේ මිත්‍රයා ළමා ගීත උරුහම් බාමින් ඉතා සැහැල්ලුවෙන් අගුළේ අකුරු යෙදීමට පටන් ගත්තේය. පැය කාලක් පමණ අපි එතැන බලා සිටියෙමු.

"මේක නම් හරියන වැඩක් නෙමෙයි" මා කීවේ මගේ කුසගින්නද ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙන අයුරක් දැනෙද්දීය. "එහෙනම් මං ගිහින් එළියෙන් වාඩිවෙලා ඉන්නම්. ඔබට කැමති වෙලාවක්......."

"මමත් එනවා. අපි යමු එළියට" හෝම්ස් කීය. "ඉස්සර වෙලා අපි අර සුවපහසු පුටුවල වාඩිවෙලා බඩ පිරෙන්න මොනවා හරි කමු. ගැටලුව ලිහාගන්නා ආකාරය ඊට පස්සේ කල්පනා කරමු."

අපි දහවල් ආහාරය ගැනීමට පටන් ගත්තෙමු. අවසානයේ එම පාර්සලයේම තිබූ බෝතල්වලින් සිසිල් බීමද පානය කළෙමු.

"වොට්සන්. ඔබ කුඩා කාලයේ ළදරු පාසල් ගියාද?" හෝම්ස් ඇසීය.

"ඇත්තෙන්ම ඔව්. ඇයි එහෙම ඇහැව්වේ?"

"අර පොත් ගොඩේ තිබුණු ළමා ගී පොත දුටුවාමයි මට ඒක මතක් වුණේ. ඒ කාලෙ ඔබ ඉගෙන ගත් ළමා ගී මොනවද ඔබට මතක?"

"ඔය කවුරුත් කියූ ගී තමා මාත් ඉගෙන ගත්තේ. මට දැන් ඒවා මතකත් නෑ. කෝ බලන්න..... දෙකක් තුනක් මතක් වෙනවා.

Jack and Jill went up the hill........;

Mary Mary quite contrary;

Mary had a little lamb;

ඔව තමයි මට මතක. ආ තවත් තිබුණනේ.

Old Mac Donald had a farm.......... එතකොට

Little Jack Horner sat in a corner."

"ඔබට මතක එච්චරද? ඇයි

Are you sleeping, are you sleeping brother John?"

හෝම්ස් මිහිරි ලෙස එය තාලයට ගායනා කළේය. "මගේ සහෝදර ජෝන් වොට්සන් ඉන්නෙ නිදිමතේ නිසා ඒ ගීතය මෙතැනට අපූරුවට ගැළපෙනවා"





"ඔය ළමා ගීත මෙතැනට වැදගත් වෙන්නෙ කොහොමද හෝම්ස් මහත්මයා?" රැන්කින් විමසුවේය.

"මගේ මිත්‍ර දොස්තර වොට්සන් දන්නවා මම සංගීතයට මොන තරම් ආසා කරන කෙනෙක්ද කියලා. අපි ඒ ක්ෂේත්‍රයට මුලින්ම පිවිසෙන්නේ ළමා ගීත ගායනා කරලා. ඒක තමයි හැමෝගෙම සංගීතයේ පදනම"

"මහත්මයා. මං ඇහුවේ ඒවා මේ ගැටලුව විසඳීමට වැදගත් වෙන ආකාරය" රැන්කින් ඇසීය.

"හරි. මේක අහන්න" හෝම්ස් කීය. "අවුල් වූ මනස නිරවුල් කිරීමට සංගීතයට මෙන්ම ගීතවලට තියෙනවා පුදුමාකාර ශක්තියක්. මට විසඳන්න අමාරු ගැටලු ලැබුණාම මං කරන්නේ පුටුවක ඉඳගෙන මගේ වයලීනය අරගෙන ඒක වාදනය කරන එක. සමහරවිට පැය ගණනක් මං එහෙම කරනවා. ඒක බොරුද වොට්සන්?"

"සම්පූර්ණ ඇත්ත" මම ඊට එකඟවූයෙමි. "පැය ගණනක් නෙවෙයි; සමහරවිට දින ගණනක් කිව්වොත් වඩාත් නිවැරැදියි"

"අන්න හරි." හෝම්ස් කීය. "මගේ වයලීනය නැති නිසා මං මේ වෙලාවෙ ළමා ගීතවල තාලවලට උරුහම් බානවා"

අප පුටුවල ඉඳගෙන සිටිද්දීම හෝම්ස් ඒ කටයුත්තේ යෙදුණේ ඉහළ පහළ සක්මන් කරමිනි. මට නිදිමතක් දැනුණෙන් මම අසුනේ ඉඳගෙනම දෙනෙත් පියා ගතිමි.

මට පැයක පමණ වේලාවක් නින්ද යන්නට ඇත. මා දෙනෙත් හැර බලද්දී හෝම්ස්වත් රැන්කින්වත් දක්නට නොලැබිණි. ඔවුන් ගැන සොයා බැලීමට යාමට මා සූදානම් වූවා පමණි. පොලිස් නිලධර රැන්කින් එක්වරම කෑගසාගෙන මා සිටි තැනට දිව ආවේය.

"වොට්සන් මහත්මයා! වොට්සන් මහත්මයා! අපි දොර ඇරගත්තා! ඉක්මනට යමු! හෝම්ස් මහත්මයා ඔබව කැඳවාගෙන එන්න කිව්වා. ඔහු නම් අති දක්ෂයෙක්.......!"

මම රැන්කින් සමග හෝම්ස් සිටි තැනට ගියෙමි. ඔහු අර දොරේ හැඬලය අතින් පහත් කරගෙන එය ඇතුළට තල්ලු කිරීමට උත්සාහ දරමින් සිටියේය.

"අගුළ නම් අපි ඇරගත්තා වොට්සන්" හෝම්ස් කීවේ ආපසු හැරී මා දෙස බලමිනි. "නමුත් මේ දොර ඇතුළට තල්ලු කරන්න බැරි විදියට ඇතුළෙන් මොකක් හරි අවහිරතාවයක් තියෙනවා."

"ඔබ නම් අති විශිෂ්ටයෙක්! ඔබ අමාරුම වැඩේ කරගෙන!" මට කෑගැසිණ. "දොර තල්ලු කරන්න අමාරු නම් අපිත් ඔබට උදව් වෙමු." මා කීවේ රැන්කින්ටයි.

අප දෙදෙනාම හෝම්ස්ට සහාය වෙද්දී දොර සම්පූර්ණයෙන්ම විවෘත විය. ඒ සමගම දොරට හේත්තු වී තිබූ යමක් "දඩාස්" ගා බිම ඇද වැටෙන ශබ්දයක් අපට අසන්නට ලැබිණි. කුමක්ද ඒ? මෙතෙක් වේලා දොරට හේත්තු වී තිබූ මිනිස් මළසිරුරක් බිම වැටී කාමරය තුළට පෙරළී ගියේය!

"දෙයියෝ සාක්කි!" මට පමණක් නොව රැන්කින්ටද කෑගැසිණ. එහෙත් හෝම්ස් පුදුමයට පත්ව නිහඬව බලා සිටියේය.

මිනිත්තු කිහිපයක් අප නිහඬව ගල් ගැසී බලා සිටියේ කිසිවක් කතා කර ගත නොහැකිවය. මේ අප කිසිසේත් දැකීමට බලාපොරොත්තු වූ දසුනක් නොවේ. මිනිත්තු කිහිපයක් යද්දී සිහි එළවා ගත් රැන්කින් මළසිරුර දෙසට පහත් වී එහි මුහුණ පරීක්ෂා කර බැලීය.

"මෙයා නම් ඩැල්රිම්පල් වෙන්න බෑ." රැන්කින් කීය. "මේ මිටි නටෙට තියෙන කෙනෙක් නෙ. හරි. මෙයා වෙන්න ඇති ස්මිත්. ඩැල්රිම්පල්ගෙ සහායකයා......."

"......... මං හිතන්නෙ තවත් කෙනෙක් මේක ඇතුළෙ ඉන්නවා" මේ වනවිට සුරක්ෂිතාගාරය තුළට පිවිස සිටි හෝම්ස් කීවේ එහි ඈත කෙළවර දෙසට අත දිගු කරමිනි. "මට පෙනෙනවා කකුල් දෙකක්. අපි යමු බලන්න"

අපි වහා එදෙසට දිව ගියෙමු. රැන්කින් කලින්ද සඳහන් කර තිබූ අයුරෙන්, සුරක්ෂිතාගාරය සෘජුකෝණාස්‍රාකාර කාමරයක් නොවීය. එහි ඈත කෙළවරේ වම් පැත්තට තවත් අංගනයක් තිබුණේ 'L' අකුරේ හැඩය සිහිගන්වමිනි. එළියට දිගු වී තිබුණේ ඒ තුළ බිම ඇද වැටී සිටි පුද්ගලයාගේ දෙපා බැව් අපි දුටුවෙමු. උඩුබැලි අතට වැටී සිටි ඔහුගේ දෙනෙත් විවෘතව තිබිණි. කෙසේ වෙතත් ඔහු මියගොස් පැය ගණනාවක් ගතවී ගොස් තිබූ බැව් පහසුවෙන්ම තේරුම් ගත හැකි විය. ඔහුගේ නළල මධ්‍යයේ තුවාලයක් තිබූ අතර එයින් ගලා ගිය ලේ, පොළොවේද මළසිරුර මතද කැටි ගැසී තිබිණි.





"හෝම්ස් මහත්මයා. මෙන්න මෙයා තමයි ඩැල්රිම්පල්" රැන්කින් කීය. "ඒ ගැන නම් මට කිසිම සැකයක් නෑ. ඔහු උසින් අඩි හයකට වැඩි හැඩිදැඩි සිරුරක් ඇති අයෙකු බව මට අහන්න ලැබුණා."

"මං හිතුවාත් හරි මහත්වරුනි" හෝම්ස් කීය. "මෙයා ඩැල්රිම්පල් යන නමෙන් පෙනී හිටියට මෙයා ඇත්තෙන්ම කපිතාන් ඕවන් මැකෝමික්. අනතුරට ලක්වුණු ෆ්‍රීස්ලන්ඩ් නෞකාවේ කපිතාන්වරයා තමයි මොහු. එතකොට ඔබ ස්මිත් නමින් හැඳින්වූ අර පුද්ගලයා තමයි කපිතන්ගේ දෙවැනියා තෝමස් හියුස්"

"හෝම්ස් මහත්මයා. ඔබ කොහොමද මොහුව හඳුනාගත්තේ?"

"පහුගිය කාලෙම මං ඔහු ගැන සොයද්දී ඔහුගේ ඡායාරූප ගණනාවක් පරීක්ෂා කළා. ඔහු මේ වගේ පුදුමාකාර අගුළක් නිර්මාණය කිරීමේ පුදුමයකුත් නෑ. ඒ මොකද ඔහු කීර්තිමත් යාන්ත්‍රික ඉංජිනේරුවෙක්"

"කොහොම වුණත් මිත්‍රයන් දෙදෙනා අතර මොකක් හරි අමනාපයක් ඇති වෙලා වෙන්න ඇති" මම කීවෙමි. "මේ තියෙන්නේ කපිතාන් මැකෝමික්ට ඔහුගේ මිත්‍රයා වෙඩි තැබූ රිවෝල්වරය."

චිකාගෝවේ නිෂ්පාදනය කරන ස්මිත් ඇන්ඩ් වෙසන් වර්ගයේ අති නවීන රිවෝල්වරයක්" හෝම්ස් කීවේ එය කඩදාසි කැබැල්ලකින් අල්ලා ඉහළට ඔසවා බලමිනි."

"මහත්වරුනි. අපි මෙතැන පරීක්ෂා කර බලන්න කලින් අපි මේ මළසිරුරු එළියට අදිමුද?" රැන්කින් විමසන්නට ඇත්තේ එතැන තිබූ අප්‍රසන්න පරිසරය නිසා විය යුතුය.

"මට පැය කාලක් දෙන්න රැන්කින්" හෝම්ස් කීය. "මරණ සිදු වී ඇති ආකාරය නම් පැහැදිලියි. නමුත් අපි මේ සියල්ල නිවැරැදිව සටහන් කරගත යුතුයි. මේ ටේප් පටිය ඔය පැත්තට අල්ලන්න"

මගේ මිත්‍රයා රූ සටහන් අඳිමින්, කරුණු ඉතා වේගයෙන් ලියා ගත් අයුරු අපි බලා සිටියෙමු. මළසිරුරු දෙකේම සාක්කු පරීක්ෂා කළ ඔහු, ඒවායේ තිබූ දෑ එළියට ගෙන මේසය මතින් දැමීය. අනතුරුව මෘත ශරීර දෙක දොරෙන් එළියට ගෙන විසිත්ත කාමරයේ එම කෙළවරේම බිත්තියට සමීපව තැබුවෙමු.

විවෘත කර ගැනීමට මෙතරම් දුෂ්කර වූ යකඩ දොර ඒ අයුරින්ම නිශ්චලව තිබිණ. තම කාචය අතට ගත් හෝම්ස් ඇඩි උනන්දුවකින්

ප්‍රථමයෙන් පරීක්ෂා කර බැලුවේ දොරේ සංකීර්ණ අගුළය. එහි කරකවන තැටි ආදී සියල්ල සංවෘත ලෝහ පෙට්ටියක් තුළ තිබූ බැවින් එම පරීක්ෂාවෙන් එතරම් පලක් අත් නොවූ බැව් ඔහු පසුව මා සමඟ කීවේය.

විසිත්ත කාමරයේ දක්නට ලැබුණු ආකාරයේ පොත් රාක්කයක් මෙහි ද විය. එහෙත් මෙහි තිබුණේ පොත් 4 ක් හෝ 5 ක් පමණි. ඒ අතර කලින් මා දුටු ළමා ගීත පොතේම තවත් පිටපතක්ද, රසායන විද්‍යාව, ඉතිහාසය ආදී පොත්ද දක්නට ලැබිණ. එයින් ළමා ගී පොත අතට ගත් හෝම්ස් එහි පිටු කිහිපයක් පෙරළා බැලීය.

"මේ පුද්ගලයා මේ ආකාරයට විශිෂ්ට කලාකෘති එකතු කළේ මොන හේතුවක් නිසාද කියල හිතාගන්න අමාරුයි නේද හෝම්ස් මහත්මයා?" රැන්කින් කීවේ සුරක්ෂිතාගාරයේ බිත්තිවල සවිකර තිබූ තෙල් සායම් සිතුවම් නරඹමිනි.

"ඔහු මේවාට දැඩි ආදරයක් දැක්වූ කලා රසිකයෙක් බවට සැක නෑ" මම කීවෙමි. "මේ හැම චිත්‍රයකම යටින් එය සිතුවම් කළ ශිල්පියාගෙ නම සහ රට ලියලා තියෙන්නෙ ඒ නිසා වෙන්න ඇති"

එහි තිබූ සිතුවම් අතර බොටිෂෙලීගේ "වීනස්" නම් චිත්‍රය, දේගස්ගේ "මල් කළඹක් අතින් ගත් නැට්ටුක්කාරි", ගේන්ස්බ්‍රොගේ "උදැසන සක්මන", රෙම්බ්‍රාන්ට්ගේ "සිමියොන් ඉන්ද ටෙම්පල්, නයිට් වොච්" ආදී සුප්‍රකට චිත්‍ර තිබූ බැව් තවමත් මට මතක ඇත. මීට අමතරව ෂෝන් ඉන්ග්‍රෙස්, පියරේ රෙනොවා, ෆ්‍රැන්සිස්කෝ ඩි ගෝයා ආදීන්ගේ දුර්ලභ සිතුවම් සිය ගණනක් එතැන තිබූ බැව් හෝම්ස් කීය.

අනතුරුව හෝම්ස් තම අවධනානය යොමු කළේ 'L' හැඩයට තිබූ අනෙක් අංගනයේ තිබූ බිත්ති අල්මාරි වෙතය. ඒවා කිසිවක් අගුළු දමා නොතිබිණි. තවමත් පෙට්ටිවල අසුරා තිබූ රත්රන් කැබලි අති විශාල ප්‍රමාණයක් ඒවායේ ගබඩා කොට තිබූ අයුරු අපි දුටුවෙමු.

"ෆ්‍රීස්ලන්ඩ්" නෞකාවේ ගෙන ආව රත්රන් මේවා වෙන්න ඇති. ඔවුන් දෙදෙනා අතර ගැටුමට හේතුවුණේ මේවා වෙන්නත් පුළුවන්" හෝම්ස් කීය. "සමහරවිට මෙතැන ගබඩාකර තිබෙන ධනයෙන් විශාල කොටසක් ඉල්ලා තෝමස් හියුස් තර්ජනය කළාද දන්නෙ නෑ.





කොහොම වුණත් හියුස් මැකෝමික්ට වෙඩි තියල තියෙන්නෙ පිටිපස්සෙ ඉඳන්. රැන්කින්, මේ කාරණය ඔබට වැදගත් වේවි. රිවෝල්වරය මැකෝමික්ගෙ හිසට බොහොම ළං කරලා තමයි එය ක්‍රියාත්මක කරල තියෙන්නෙ. මැකෝමික්ගේ හිසේ පිටුපස කෙස් පවා පිළිස්සිලා"

මීළඟට අපි යළිත් වරක් සුරක්ෂිතාගාරයේ ඉදිරි දොර දෙසට පැමිණියෙමු. දොරට ළංව බිත්තියට සවිකොට තිබූ යකඩ ලාච්චුවක් වෙත රැන්කින් අපේ අවධානය යොමු කළේය. එහි ලොකු ලේබලයක් අලවා තිබිණි. එහි මෙවැන්නක් සඳහන් විය.

## දියමන්ති සහ රතුකැට

"හෝම්ස් මහත්මයා. මේවා ඔහු මිළට ගන්න ඇත්තේ රත්රන් විකිණූ සල්ලි වලින්. අපි බලමු ඒවත්" කී රැන්කින් ලාච්චුව විවෘත කිරීමට උත්සාහ කළේය. එහෙත් එය පහසුවෙන් විවෘත නොවිණි.

"මේක යතුරු දාලත් නෑ. මොකද මේක මෙච්චර තද?" කී රැන්කින් කකුලක් බිත්තියට තබා එයට තම උපරිම ශක්තිය යෙදුවේ එය විවෘත කරගැනීමටයි.

"එපා එපා!!......." හෝම්ස් කෑගැසුවේ යාර තුනක් පමණ ඈත සිටයි. "ඕක නවත්වන්න රැන්කින්!"

මගේ මිත්‍රයා එසේ කියන විටත් ප්‍රමාද වූවා වැඩිය. රැන්කින් යෙදූ බලයට ලාච්චුව විවෘත වූයේ මහ හඬක් නංවමිනි. ඒ සමගම සුරක්ෂිතාගාරයේ ලෝහ දොර දුන්නකින් ක්‍රියා කළාක් මෙන් එක් ක්ෂණයකින් වැසී ගියේය. ඒ වැසුණේද මහ හඬක් නංවමිනි.

"මොකක්ද ඒ වැඩේ තේරුම?" මට කෑගැසිණ.

"ඒක ආරක්ෂක උපක්‍රමයක්" හෝම්ස් කීවේය. "සතුරෙක් මේකට බලෙන් ඇතුළුවෙලා ආයුධ එල්ල කරලා තර්ජනය කළොත් ඔහු උගුලක හිර කරන්න මැකෝමික් සැලසුම් කළ උපක්‍රමයක්. බොහොම දක්ෂ සැලසුමක්. මේකෙ තියෙන්නෙ රිපීටර් ඔරලෝසුවක යාන්ත්‍රණයට සමාන තාක්ෂණයක්. ලාච්චුව එළියට ඇදීමෙදී ආපහු එතිලා එක් ක්ෂණයකින් දුන්නේ ගබඩා වූ ශක්තිය නිදහස් වෙනවා. බොහොම දක්ෂ වැඩක්."

"ඒ වුණත් දැන් අපි මේක ඇතුළෙ හිරවුණා නේද?" රැන්කින් ඇසුවේ සුදුමැලි වූ මුහුණෙනි.

"තත්ත්වය ඒ තරම් බරපතළය කියල මං හිතන්නෙ නෑ" මා කීවේ සැහැල්ලුවෙනි. "මේ දොර මොකක් හරි සූත්‍රයක් යොදල විවෘත කරගන්න හෝම්ස් මහත්තයට පුළුවන් වුණානේ. යළිත් දොර විවෘත කරගැනීමටත් ඔහුට යොදන්න තියෙන්නෙ ඒ උපක්‍රමයමයි"

"තවත් පමා නොවී අපි උත්සාහ කරල බලමු" හෝම්ස් කීවේ වහා දොර වෙත පැමිණෙමිනි.

"ඒ මොකද මළමිනී දෙකක් මේක ඇතුළෙ දින දෙකක් තුනක් තිබුණා. ඒ නිසා මෙතන වාතාශ්‍රයත් එච්චර පිරිසිදු නෑ. රැන්කින් ඔය විදුලි ලාම්පුව මේ අගුළ දෙසට හරවන්න"

ඒ අනුව මේසයක් උඩ තබා තිබූ පහන දැල්වූ රැන්කින් එය හෝම්ස් සිටි තැනට ළංකොට එහි ආලෝකය අගුළ වෙත යොමු කළේය. මගේ මිත්‍රයා එම බැරෑරුම් කටයුත්ත ඇරඹුවේ ළමා ගීතයක් ගායනා කරමින් සැහැල්ලු ආකාරයෙනි.

"වොට්සන් ඔබට මං කියල තියෙනවද මං දන්නෙ නෑ. මං ඉතා කුඩාම කාලයේ අකුරු ඉගෙන ගත්තෙ සරේහි රිච්මන්ඩ් විද්‍යාලයේ. අපට සංගීතය ඉගැන්නුවේ ග්‍රේස් බාතොලමියුස් නම් ලන්දේසි ජාතික මෙනෙවියක්." හෝම්ස් කීය. "ඇය හරි සැරයි. අපට කටපාඩම් කරගන්න කියා ඇය ළමා ගීත කළු ලෑල්ලේ රටහුණු වලින් ලියනවා. ඊළඟට ඇය පියානෝව වාදනය කරද්දී අපි ඒවා ඇය සමඟ ගායනා කළ යුතුයි. ඇය අපට ඉගැන්නූ එක් ගීතයක් තමා

"John Brown's baby had a cold upon his chest.......and we rubbed him down with camphorated oil."

හෝම්ස් මෙලෙසින් ගීත ගායනා කළේ සිතේ ඇතිවී තිබූ පීඩනයෙන් මිදීමට බැව් මම තේරුම් ගතිමි. එබැවින් නිහඬව ඔහුට සවන් යොමු කළා මිස මම කිසිවක් නොකීවෙමි. එහෙත් කැලඹීමට පත්ව සිටි රැන්කින් වියරුවෙන් මෙන් දොඩවමින් ඉහළ පහළ සක්මන් කළේය.

හෝම්ස් දොර අගුළේ තැට් කරකවා, ENTER බොත්තම තද කරමින් යළි කරකවමින් මිනිත්තු දහයක් පමණ ගත කළේය. කිහිපවාරයක්ම දොර අගුළේ හැඬලය පහතට තල්ලු කර බැලීය. එහෙත් දොර විවෘත නොවිණි. මේ වන විට ඔහුගේ ගීත ගායනය මෙන්ම උරුවම් බෑම ද නැවතී තිබිණ.





"මොකද හෝම්ස් මහත්මයා ප්‍රශ්නෙ?" මෙතෙක් වේලා නිහඬව සිටි රැන්කින් ඇසීය. "කලින් ඔබ ආපු සූත්තරේට අගුළ ඇරෙන්නෙ නැද්ද?"

"ඒක තේන්නං ප්‍රශ්නෙ" හෝම්ස් කීය. "දැන් මේක විවෘත වෙන්නෙ නැත්තෙ ඇයි කියල මට හිතාගන්න අමාරුයි. අපි තවත් උත්සාහ කරල බලමු"

කබා සාක්කුවේ තිබූ පයිප්පය අතට ගත් ඔහු එය දල්වා ගෙන අසුනක හිඳගත්තේය. අනතුරුව නළල රැළි කරගෙන කල්පනා කළේය.

මිනිත්තු කිහිපයකට පසු හෝම්ස් තම කටයුත්ත යළිත් වරක් ඇරඹුවේය. තැට් කරකවමින් මෘදු හඬින් ඔහු තමාටම යමක් කියාගත්තේය. තවත් පැය තුන්කාලක් පමණ වෙහෙස වුවද ඔහුගේ උත්සාහය සාර්ථක වූයේ නැත. ඔහුගේ නළලට ඩහදිය දමා මුහුණ පුරා ඩහදිය ගලා ගියේය.

"මං කළ මෝඩ වැඩෙන් තමයි මේ ඔක්කොම. එහෙම නේද?" පොලිස් නිලධරයා කෑගැසුවේ වියරු වැටුණු පුද්ගලයෙකු විලසිනි. "අන්තිමට ස්මිත්ට වුණා වගේ අපටත් මේක ඇතුළෙ හිරවෙලා මැරෙන්න සිද්ධ වේවිද දන්නෙ නෑ"

එම කරුණ මගේ සිතට ද දැනෙන්නට පටන් ගත්තේ භීතියට පත් පොලිස් නිලධරයා එය පැවසූ පසුවය. මගේ පිට කොන්ද දිගේ හිරිවැටීගෙන යන ආකාරයක් දැනිණ. අනතුරුව ඩහදිය ගලා ගියේ මුළු සිරුරම සීතල කරමිනි. අප දොර විවෘත කරද්දී ඇද වැටුණු පුද්ගලයාගේ මළ සිරුර මගේ සිතේ මැවී පෙනිණ. අපද දැන් මේ උගුලේ හිරවී ඇත්තේ ඔහු හිරවූ ආකාරයටමය. මීළඟට දොර විවෘත කිරීමට සමත් වන අයට අප තිදෙනාගේම මළ සිරුරු හමුවනු ඇත.

"මට වැරදුණේ කොතැනද කියල හිතාගන්න මට බෑ වොට්සන්" හෝම්ස් කීවේ අතිශය කලකිරීමට පත් හඬෙනි. "ඔය දොර විවෘත කරන්න මම කලින් යෙදූ අකුරු 17 ඒ විධියටම යෙදුවා. ඒත් කිසිම ප්‍රයෝජනයක් නෑ"

"මේ තත්ත්වය පිටත කෙනෙකුට දැනුම් දෙන්න අපට කිසිම ක්‍රමයක් නෑ" රැන්කින් කීවේ දැඩි කම්පාවකට පත් හඬෙනි. "මේකෙ දුරකතනයක් ඇත්තෙත් නෑ. අපි කොයිතරම් දොරට තඩි බෑවත් ඇහෙන මානයක කිසි කෙනෙක් ඇත්තෙත් නෑ."

"දැන් ඉතින් වෙන කරන්න දෙයක් නෑ" හෝම්ස් කීය. "අපි ගෙනාපු කෑමවල ඉතිරිව තිබෙන දේවල් කාල බීල ඉඳිමු. හොඳින් කල්පනා කරන්න හැකිවෙන්නේ මොළයේ රුධිර සංසරණය යථා පරිදි සිදුවුණොත් විතරයි. බඩගින්නේ හිටියොත් ඒක සිදුවෙන්නෙ නෑ"

මළසිරුර ඉවතට ගෙනගිය පසු,එළියේ තිබූ ආහාර ගෙන ආ මල්ල මා සුරක්ෂිතාගාරයට ගෙන ආවේ, එතරම් සිතා බලා නොවේ. ඒ මල්ල රැන්කින් එතැනට ගෙන ආවේය. කෑම රුචියක් නොතිබුණ ද අපි ඒ කෑම බීම ආහාරයට ගත්තෙමු.

අප මේ උගුලේ හිරවී මේ ආකාරයෙන් කාලය පැය තුනකට වඩා ඉක්ම ගොස් තිබිණ. අගුළ විවෘත කර ගැනීමේ අරමුණෙන් හෝම්ස් දොර සමීපයේ ගත කළ කාලය පැය දෙකහමාරකට වැඩි වන්නට ඇත.

"අද අපි මෙහේ එන බව මගේ ප්‍රධානියා මැක්ලීලන්ඩ් මහත්තයට කියල එන්නත් මට බැරිවුණා" රැන්කින් කීය.

"ඔහු ආව කියල මොනව කරන්නද?" මම ඇසීමි. "දොරටුව අරින සූත්තරේ ඔහු දන්නෙත් නැත්නම්"

"අපි මෙකෙ හිරවෙලා ඉන්න බව තේරුම් ගත්තොත් ඔවුන් මේකෙ දොර කඩාගෙන හරි අපව බේරාගනීවි" රැන්කින් කීය.

"දොර කඩන්න වෙන්නේ පුපුරන ද්‍රව්‍ය යොදලා දොර පුපුරවා හැරීමෙන් පමණයි" හෝම්ස් කීය. "ඒ මොකද දොර සාදා තිබෙන්නේ එකට පෑස්සූ වානේ තහඩු හයකින්. කලින් දොර පරීක්ෂා කළ වෙලාවෙ මං ඒක දුටුවා"

"හෝම්ස් මහත්මයා" පොලිස් නිලධරයා කීය. "මං මේ ඔබේ දැනුමට අභියෝග කරන්න හදනවා නොවෙයි. දොර විවෘත කිරීමට ඔබ යෙදූ සූත්‍රය මොකක්ද? මං කැමතියි ඒක දැනගන්න"

"ඒක ඇත්තයි හෝම්ස්" මම කීවෙමි. "මාත් කැමතියි ඒක දැනගන්න."

"ඔය කාරණය ඔබට රහසක් කරන්න මගේ බලාපොරොත්තුවක් තිබුණෙ නෑ" හෝම්ස් කීය. "මට උවමනා වුණේ මේ ප්‍රශ්නය සාර්ථකව විසඳලා අපේ හෝටලයට ආපහු ගිහින් විවේකීව මේ ගැන ඔබට හැමදෙක්ම කියන්නයි. නමුත් අවාසනාවක හැටි. ඒ දේවල් ඒ අයුරින්ම සිදුවුණේ නෑ. පරාජය කියන එක ජයග්‍රහණය පසුපසම එළවනවා. දැන් අපට වෙලා තියෙන්නේ ඒක.





දොර විවෘත කරන්න කලින් මං අර විසිත්ත කාමරයෙදි කළ කී දේවල් ඔබ දකින්න ඇති. මං එතැන තිබුණු පොත් හැම එකක්ම පරීක්ෂා කළා. ඒ මොකක් හරි රහස් ලේඛනයක් එතැන තිබේද කියල දැනගන්න අරමුණෙන්. නමුත් එහෙම දෙයක් තිබුණෙ නෑ. නමුත් මගේ අවධානය දිනාගැනීමට සමත්වුණු එක් පොතක් තමයි ළමා ගීත අඩංගු පොත. ප්‍රමාණයෙන් විශාල ඒ පොතේ එක් පිටුවක එක් චිත්‍රයකුත් සමග තිබුණේ එක් ගීතයක් පමණයි. වැඩිහිටියන් ගැවසෙන තැනකට මොකටද ළමා ගී පොතක්? අන්න ඒ කාරණය මගේ හිතේ සැකයක් ඇති කළා. ඉතින් කාවයෙන් සෝදිසි කරමින් මං ඒකෙ පිටුවක් ගණනේ පරීක්ෂා කළා. එතකොට එහි 49 වැනි පිටුවේ තිබුණු ගීතයක් වෙත මගේ අවධානය යොමු වුණා. ඒකට හේතුව අනෙක් සෑම පිටුවක්ම පිරිසිදුව පැහැදිලිව තිබෙද්දී මේ පිටුවේ විතරක් දූවිලි සහ කුණු තැවරී, යන්තමින් සීරී තිබීම. ඩැල්රිම්පල් හෝ කවුරු හරි ඒ පිටුව කිහිප වාරයක් පෙරළා තිබෙන බව පැහැදිලියි. ඒ මොකටද? තමනට අමතක වූ යමක් නිතර සිහියට නගා ගැනීම සඳහා."

"මොකක්ද ඒ ගීතය?"

"ඒ මං ඔබට මඳ වේලාවකට කලින් ගායනා කළ ගීතය...... John Brown's baby........... බාතොලමියුස් ගුරුතුමිය මට ඉගැන්වූ ගීතය. මේ අගුලේ සැඟවුණු අකුරු දාහත මේකෙ ඇති කියලා මගේ සිතේ විශ්වාසයක් ඇතිවුණා.

ඒ ගීතය ඔබට මතක නම් වොට්සන්, ඒකෙ පළමුවැනි පදය තුන්වරක්ම ගායනා වෙනවා. පළමුවැනි පදයට අකුරු 9 යි.

J B B H A C U H C

**J**ohn **B**rown's **B**aby **H**ad **A** **C**old **U**pon **H**is **C**hest
John Brown's Baby Had A Cold Upon His Chest
John Brown's Baby Had A Cold Upon His Chest

**A**nd **W**e **R**ubbed **H**im **D**own **W**ith **C**amphorated **O**il

ඉතින් මම මුල් පදයේ වචනවල මුල් අකුරු දෙවරක් යොදන්න උත්සාහ කළා. නමුත් ඒක කොහොමටවත් සාර්ථක වුණේ නෑ. අන්තිමේදී මං මුල පදයත් හතරවැනි පදයත් යෙදුවා. අකුරු 17 යි! එක්වරම "ක්ලික්" ශබ්දයෙන් අගුළ ඇරුණා"

"ඔබේ නුවණ අති විශිෂ්ටයි හෝම්ස් මහත්මයා" රැන්කින් කීය. "ඔය වගේ දෙයක් කවුරු කොහොම හිතාගන්නද?"

"හෝම්ස් මහත්මයාගේ දක්ෂකම ගැන කිසිම පුදුමයක් නෑ" මම කීවෙමි. "නමුත් මට තිබෙන පුදුමය, ඔබ දැන් ඒ අකුරුම යෙදුවාම ඇයි අගුළ ඇරෙන්නෙ නැත්තෙ?"

"අන්න එක තමයි මට හිතාගන්න බැරි?"

"ඔහු ඒ සඳහා වෙනත් ගීතයක අකුරු 17 ක් යෙදුවද දන්නෙ නෑ?" රැන්කින් කීය.

"එහෙම කළා කියල හිතන්න අමාරුයි" හෝම්ස් කීය. "පිටතින් යෙදුවත් ඇතුළතින් යෙදුවත් අගුළක තිබිය යුත්තේ යම්කිසි ස්ථාවර අංක හෝ අකුරු සංඛ්‍යාවක් පමණයි"

"එහෙම නම් පළමුවැනි සැරේ දොර ඇරගන්න.ඔබ යෙදූ අකුරු පෙළ මේ වාරයේ කොහොමද වැරදුණේ?" මම ඇසීමි.

"අන්න ඒක තමයි මට හිතාගන්න බැරි"

"හෝම්ස් මං කැමතියි ඔබ ඒ ගීයේ සියලුම පද යළිත් වරක් ගායනා කරනවා අහන්න" මම කීවෙමි.

"හරි ඔන්න අහගන්න.........

**J**ohn **B**rown's **B**aby **H**ad **A** **C**old **U**pon **H**is **C**hest...../// 
**A**nd **W**e **R**ubbed **H**im **D**own **W**ith **C**amphorated **O**il"

"වැරදියි! වැරදියි!! වැරදියි!!!" මට කෑගැසිණ. "මේ වාරයේ ඔබට එක වචනයක් වැරදිලා...... And we rubbed him නෙමෙයි; So we rubbed him. පළමුවැනි වචනය And නෙමෙයි So! කලින් සැරේ හරියට යෙදුවත් මෙවර ඔබට වැරදිලා!"

"මොනවා? මං දෙවැනි වාරයේ යොදල තියෙන්නේ ඒ විදියට ද?" කී හෝම්ස් දොර දෙසට පැන්නේය. මම ඔහු සිටි තැනට විදුලිපහන ළං කළෙමි. හෝම්ස් ගීතය ගායනා කරමින් දෙවැනි පදයට So යන වචනය යොදා තැටි කරකැවීය.

"ක්ලික්" හඬින් අගුළ විවෘත වූයේ අප ඉමහත් සන්තෝෂයටත් සැනසීමටත් පත් කරමිනි.

"වොට්සන් මගේ මිත්‍රයා. ඔබ අප ගලවා ගත්තා!" කී හෝම්ස් මා තරයේ වැලඳ ගත්තේය.

"අපේ ජීවිත ගලවා ගැනීම ගැන අප ඔබට ණය ගැතියි වොට්සන් මහත්මයා!" රැන්කින් කීවේ දරාගත නොහැකි සතුටකින්





කඳුළු වගුරුවමිනි. "තව ටිකෙන් කවුරුවත් නොදැන අපි මේක ඇතුළෙම මියයන්න තිබුණා"

තවත් පමා නොවී දොර තල්ලු කරගෙන අපි එළියට පැමිණියෙමු. විසිත්ත කාමරයට ඇද දැමූ මළසිරුරු තවමත් එලෙසම තිබිණි. කිසිවක් දැන නොසිටි වත්තේ ඉදිරි ගේට්ටුවේ සේවකයෝ තවමත් පෙර ලෙසම රාජකාරියේ යෙදී සිටියහ.

සුරක්ෂිතාගාරයේ දොර නැවත වරක් වසා දැමීමේ අවදානමක් තිබූ බැවින්, එය විවෘතව තිබියදීම පොලිස් පරීක්ෂක මැක්ලීලන්ඩ් කැඳවීමට අපි තීරණය කළෙමු. ඉදිරි ගේට්ටුවේ සේවකයෙකු ඒ සඳහා යවන ලදී.

මේ කථාන්තරයේ තවත් ඔබට පැවසීමට ඇත්තේ කරුණු ඉතා ස්වල්පයක් පමණි. "ෆ්‍රීස්ලන්ඩ්" නෞකාවේ අබිරහස හෙළි කරදීම ගැන ඕලන්දයේ වැන්රූයන් ආදිපාදවරයා ඉමහත් සතුටට පත් විය. ඔහු අපට තෑගිබෝග පිරිනැමුවේ නිර්ලෝභී අයුරෙනි. අප මුහුණ දී තිබූ භයානක තත්ත්වය ගැන ඇසූ ආදිපාදවරයා හෝම්ස්ට පමණක් නොව පොලිස් නිලධර ජෝ රැන්කින්ටද මටද තෑගිබෝග පිරිනැමුවේය.

"හෝම්ස්. මෙතැනදී මට තේරුම් ගන්න බැරි කාරණය මේකයි" මා විමසුවේ පසුව දිනයක බේකර් වීදියේ නිවහනේ අප කතාබහ කරමින් සිටි අවස්ථාවකය. "තෝමස් හියුස් අර සුරක්ෂිතාගාරයේ හිරවෙලා හිටි කාලය දින තුනක් නැත්නම් උපරිම හතරක්නෙ. ඔහු කොහොමද මේ තරම් ඉක්මනට මියගියේ? කෑමවත් වතුරවත් නැතුව මීටත් වඩා දුෂ්කර කටුක පරිසරවල, මිනිස්සු සති ගණන් ජීවත්වෙලා තියෙනවා. විශේෂයෙන්ම නාවිකයන් එවැනි තත්ත්වවලට මුහුණදීලා මරණාසන්න වෙලා, දිවි ගළවාගත් හැටි ගැන සත්‍ය කතා, අප කොයිතරමක් අහල තියෙනවද? නමුත් තෝමස් හියුස් ඉතා කෙටි කාලයකින් මියගියා?"

"මට හිතෙන හැටියට ඒකට හේතුව මේකයි වොට්සන්. ඔබ කියන ආකාරයට සාගරයේ අතරමංවූ නාවිකයන්ගේ සිත්වල කුමන හෝ නෞකාවකට තමන්ව දකින්න ලැබිල තමන්ව බේරා ගනීවි කියල හිතේ බලාපොරොත්තුවක් තියෙනවා. ඒ නිසා ඔවුන් මැරි මැරී ජීවත් වෙනවා. නමුත් මෙතැන එහෙම තත්ත්වයක් නෑ. දොර විවෘත කිරීමේ අංකය දැන හිටියේ ඩැල්රිම්පල් හෙවත්

මැකෝම්ක් පමණයි. ඔහු මියගිහින්. ඉතින් තමන්ට ජීවිතය ගලවා ගන්න කිසිම ක්‍රමයක් නැති බව හියුස් නිවැරදිව තේරුම් ගත්තා. අපි හිතමු කවුරු හරි ඇවිත් ඔහුව ගලවා ගත්තා කියල. එහෙම වුණත් මිනීමැරූ ඔහුට කෙළින්ම යන්න වෙන්නෙ පෝරකයට. ඉතින් තමන් කළ අපරාධය ගැන තැවි තැවී කම්පාවෙන් සිටි ඔහුට හෘදයාබාධයක් වැළඳීම පුදුමයක් නෙමෙයි"

"හෝම්ස් මට හිතෙනවා ඔහු මේක ක්ෂණික කෝපයෙන් කළ ඝාතනයක් නෙමෙයි කියලා. ඔහු ඒ දේ කරන්න ඇත්තෙ දොර විවෘතව තිබියදී පැන යා හැකි තත්ත්වයක් තිබියදී"

"ඇත්තෙන්ම ඔව් වොට්සන්. ඔහු කරන්න ඇත්තෙත් අපේ රැන්කින් කළ වැරැද්දමයි. පිටවෙන්න සූදානම් වෙද්දී ඔහුට හිතෙන්න ඇති ලාච්චුවේ දියමන්ති සහ රතුකැටත් අරගෙන යන්න."

"කොහොම වුණත් එදා නම් අපට මරණ භය කියන්නෙ මොකක්ද කියන එක හොඳට දැනුණා" මම කීවෙමි.

"ඒක ඇත්ත" හෝම්ස් කීය. "මොනවා වුණත් මේ තරම් හොඳින් මා දැන සිටි ළමා ගීතයක එක වචනක් පැයක් දෙකක් ඇතුළත අමතක වීම ගැන මං ලැජ්ජා වෙනවා. ඔය විදියේ පටළැවීමක් වළක්වාගන්න තමයි කපිතන් මැකෝම්ක් ළමා ගීත පොත් දෙකක් සුරක්ෂිතාගාරය ඇතුළත හා පිටත තබන්න ඇත්තේ. එහෙම පොතක් අතේ දුරෙන් තිබියදී මං මේ විදියට වරද්ද ගත්තා කියල හිතුවාම....... කවදා හරි දවසක මං මේ විධියට කලබලයෙන් නොසැලකිල්ලෙන් වැඩ කළොත්, ඔබ මේ සිද්ධිය මට මතක් කළ යුතුයි වොට්සන්....... "ජෝන් බ්‍රවුන්ස් බේබි" කියල ඔබ කිව්වොත් මට හැම දෙයක්ම මතක් වේවි"